ආචාර්ය ගුරුළු ගෝමින් විසින්

විරචිත

# අමාවතුර

නම් වූ, සම්බුද්ධ චරිතයෙහි

**පූර්ව භාගය.**

විද්‍යෝදය පරිවෙණාධිපති

ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක ස්ථවිරපාදයන් වහන්සේගේ

ශිෂ්‍ය වූ

**හෙන්ද්‍රික් ජයතිලක අප්පුහාමි විසින්**

ලිපිදොෂ ශුද්ධකොට ග්‍රන්ථිපදවිවරණ ලියනලදින්

ශාස්ත්‍රාලෝකයන්ත්‍රයෙහි

මුද්‍රිතයි.

ශ්‍රී. බු. 2427.

# අ මා ව තු ර.

අමා එව් වතුර "**අ මා ව තු ර**" හෙවත් (ආශ්චර්‍ය්‍ය අද්භූතවූ සර්වඥ චරිතයෙන් රචනාලද) කලණ මිතුරු වියත් තෙපලින් අමෘත ප්‍රවාහ යේ (සකල ජන්මීන් කෙරෙහි) මාධුර්‍ය්‍ය රස ජනක බැවි මෙහි ශබ්දසාරජන්‍ය ගුණවිශෙෂ හෙයින් **අ මා ව තු ර** නමි.

මේ වනාහි ගද්‍ය පද්‍ය සඞ්ඛ්‍යාත උභය කාව්‍යයන් අතුරෙන් ගද්‍ය කාව්‍ය යෙක් විය.

කෙසේද යත්;

"අපාදං පදසන්තානං ගද්‍යං තත්තු ත්‍රිධා මතම්
වෘත්තකොත්කලිකාප්‍රාය වෘත්තගන්ධිප්‍රභෙදතඃ"

ගද්‍යයතෙම (ඡන්දස්හි කියනලද) පාද රහිතවූ පදපරම්පරාවයි; ඒ (ගද්‍ය)වනාහි වෘත්තකය උත්කලිකාප්‍රායය වෘත්තගන්ධිය යන ප්‍රභෙදයෙන් තුන්පරිද්දෙකින් * දන්නාලදී-යි කියනලද ගද්‍ය කාව්‍යයන් අතුරෙන් මේ ගද්‍යය වෘත්තක නම් වේ.

එහි ලක්ෂණ නම්;

"අකඨොරාක්ෂරං ස්වල්ප සමාසං වෘත්තකං මතම්
තත්තු වෛදර්භරීතිස්ථං ගද්‍යං හෘද්‍යතරං භවෙත්"

රළුඅකුරු රහිතවූ මද සමස් ඇත්තේ වෘත්තක නමැයි දන්නාලද්දේය; ඒ (වෘත්තක නම්) ගද්‍යය වනාහි විදර්භලක්ෂණයෙහි පිහිටියේ ඉතා මධුරවන්නේය.

තවද මේතෙමේ පරිච්ඡෙද බන්ධනයෙන් විශිෂ්ට හෙයින් මහාකාව්‍යයෙකි.

කුමාරෝදය; චන්ද්‍රොදය; සූර්‍ය්‍යොදය; උයන්කෙළි; රිතු; ගිරි; දූතප්‍රයාණ; සඞ්ග්‍රාම; විවාහ; විරහාදීන් සම්බන්ධවූ විස්තරකථාවෙනුදු විචිත්‍රවිය·

මෙහි වර්ණනාකරණලද කථාවනම් සකලසත්වයන් කෙරෙහි උත්පීතව පැතිරසිටි මහාකරුණා ගුණැති අප තිලෝගුරු සම්මාසම්බුදුනු මෙයින් සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මතෙහි සුමෙධ නම් තාපසව දිවකුරුබුදුන් හමුව අතටපත් නිවන්සැපය සමස්තසත්වානුග්‍රහය නිසා හැරපියා අපරිච්ඡින්නවූ පූර්වාපරකොටි ඇති සංසාර දුගියට වැද පැරුම්පුරා බුදුව ස

---

* ගද්‍ය කාව්‍යයෙහි ආඛ්‍යායිකාය කථාය යන විභෙදය පමණැයි දණ්ඩාචාරීන්ගේ මතයයි.

කලඹුවනවලයෙහි සැරිසැරූ සංසාරබාහුකයන් දශකුසල කම්පථයට නගා පරමරමණීයවූ අමාමහනිවන් පැමිනවූ පරිදියි.

බෞද්ධචරිතයන් දැනීමෙහි වඩනාලද අභිරති ඇත්තවුන්ට අභික්‍රාන්ත නොයෙක් බෝධිසත්ව චරිතයන් ප්‍රකාශිතවූ ගද්‍ය පද්‍ය යන නා නා ප්‍රකරණයන් සුලභ නමුත් තදනන්තරයෙහි ස්වභාෂාවෝද්ග්‍රහණය කටැව්වූවන්ට මෙසේ සුඛාවබොධවූ වාඞ්මය මධුර කොමලත්වයෙන් උපලක්ෂිතවූවෝ බහුලනොවෙත්. එහෙයින්ම මෙම ප්‍රකරණය පඨන පාඨනය කරන්නන්ට සිංහලවාක්‍ය ගැලපීමෙහි විසාරද පටුත්වයක් ලැබියහැක්කේය.

ඒපණකුත් නොව පුරාණයෙහි පැවැත්තාවූ ද වර්තමාන කාලයෙහි පවත්නාවූද සිංහලභාෂාවෙහි විශෙෂ විභාග දැනගැන්මට මෙවැනි ප්‍රසස්ත ප්‍රකරණයක් ලැබීම දුෂ්කරයි.

මෙහි කර්තෘ වූ ගුරුළුගෝමී ආචාර්‍ය්‍යවරයා කවර කාලෙක ජීවත් වූ කෙනෙක්දැයි කිසි තැනෙක නොපැණෙන හෙයින් මෙම ප්‍රකරණයාගේ වයෝවෘද්ධත්වය ප්‍රමාණකොට නොකිය හැක්කේය. එසේ වූයෙහිත් මෙයින් වර්ෂ 1500 කින් පූර්වයෙහි සිටි කෙනෙකැයි ඇදහියයුතු කථාඇතොත් කියත්. දැනට වර්ෂ 700කින් පූර්වයෙහි කරණලද සිද්ධාන්ත සංග්‍රහයෙහි සමහර ව්‍යාකරණලක්ෂණයන්ගේ ස්ඵුටීකරණය පිණිස මෙම ප්‍රකරණයෙන් වාක්‍ය රාශියක් හා මෙමආචාර්‍ය්‍යවරයාගේ නාමයත් උදාහෘත හෙයින්ද මේ තුමා ඉතා පුරාතනයෙක් බැව් හැඟෙයි. ඒ ගත්නාලද වාක්‍ය නම් "මහසුප්. මිහඟුවම්. සැරියුත්. ඉදුනු. විසසම්. එලඹ බුදුන් කරා." යනාදියයි.

මෙසේ පුරාණත්වයෙන්ද ප්‍රෞඪත්වයෙන්ද ඉතාමහත්වූ මෙම අමෘතප්‍රවාහයෙහි නොවියත් ලිපිකරුවන්ගේ ප්‍රමාදදීයෙන් පුනරුත්පත්ති දෙෂයන් නිසා මෙයින් ඵල ලැබීම සම්බාධව තුබුන හෙයින් උඩ පාත දෙරටින් පොත් රාශියක් සපයා ගෙණ ඒ දෙස් හැකි පමණින් බැහැර කොට පරිච්ඡෙද 4කින් යුත් මෙම පූර්වභාගය මහජනයා කෙරෙහි කරුණාවෙන් මෙසේ මුද්‍රාඞ්කණය කරවීමු.

H. Jayatilaka.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

# අමාවතුර

## 1 වෙනි පරිච්ඡෙදය.

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති—යනු විස්තරකරත් බුදුගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත් නොපිළිවනින් එහි "පුරිසදම්මසාරථි" යන පදය ගෙණ අපබුදුනු පැරුම්පුරා බුදුව දෙව්රම්වෙහෙර පිළිගෙණ එහි වෙසෙමින් තුන්ලෙව්හි සැරිසැරූ විෂමපුරුෂයන් දමා අමාමහනිවන් පැමිනවූ සේ නොවියත්හුදීජනයන් සඳහා සියබසින් මා විසින් සැකෙවින් දක්වනු ලැබේ.

අප බුදුහු අතීතයෙහි සාරාසඞ්ඛ්‍ය කප් සුවහස් මතුයෙහි "සුමෙධ" නම් මහතවුසක්ව දිවකුරු බුදුන් හමුව අතටපත් නිවන් සැප පියා මහකුළුණින් ගොර බිරම් සසරවැද පැරුම් පුරා—

පඤ්චායුධ ජාතක සුතනු ජාතකාදිය බිහිසුණු දරුණු වනරකුසත් දම්දෙස්නෙන් දමා පන්සිල්හි පිහිටුවමින්, දෙවධම්ම ජාතක තයොධම්ම ජාතකාදිය රකුසන්දමා සුගී මොක්මගට පමුනුවමින්, මහාසුතසොම ජාතක ජයද්දිසජාතකාදිය මිනීමස්කන නරයකුන් දමා රජයෙහි පැවිජියෙහි පිහිටුවමින්, සුවණ්ණමිගජාතක මහාමොරනර ජාතකාදිය තමන්බැඳූ වැද්දන් දමා ලොවුතුරා සැපත් වලඳවමින්, ඉල්ලීසජාතක ක්ෂුධාභොජන ජාතකාදිය මහ මසුරන් දමා මහදන් දෙවමින්, මතකභත්තජාතක ධොනසාඛ ජාතකාදිය පාණාතිපාතයෙහි දොස් දක්වමින්, තුන්වන සීලවීමංස ජාතක පස්වන සීලවීමංස ජාතකාදිය අදත්තාදානයෙහි දොස් දක්වමින්, ලොහකුම්භි ජාතක මහා නාරදජාතක සසප ජාතකාදිය පරදාරසමාගමයෙහි දොස් දක්වමින්, චෙතීයජාතක තක්කාර

ජාතකාදිය මුසවාදයෙහි * දොස් දක්වමින්, කුම්භ ජාතක භද්‍රඝට ජාතකාදිය සුරාපානයෙහි දොස් දක්වමින්, වනනාරොහ ජාතක සන්ධිභෙද ජාතකාදිය පිශුණවචනයෙහි දොස් දක්වමින්, නන්දිවිසාල ජාතක සුජාතජාතකාදිය පරුස වචනයෙහි දොස් දක්වමින්, තිත්තිරජාතක අකාලරාවි ජාතකාදිය සම්ඵප්‍රලාපයෙහි දොස් දක්වමින්, දූරාජාන ජාතක ඉන්ද්‍රිය ජාතකාදිය සතුන් සතන්හි දිලිනැගි රාගිනි නිවමින්, එකපණ්ණජාතක තිලමුට්ඨි ජාතකාදිය කෝ්ගිනි නිවමින්, මාතඞ්ගජාතක මහාබොධි ජාතකාදිය මිසදිටුහි බැඳි සතුන් සම්දිටුහි පිහිටුවමින්, සඑවජාතක නඞ්ගුට්ඨ ජාතකාදිය මිථ්‍යා තපස්හි දොස් දක්වමින්, සෙතුකෙතු ජාතක උද්දාලජාතකාදිය කොහොන්පිළිවෙත්හි දොස් දක්වමින්, පාරාපතජාතක රුචිරජාතකාදිය ලොලතාවයෙහි දොස් දක්වමින්, බ්‍රහ්මදත්තජාතක අට්ඨිසෙනජාතකාදිය යාචඤායෙහි දොස් දක්වමින්, ගිජ්ඣජාතක චතුවාර ජාතකාදිය දුර්වචස්හි දොස් දක්වමින්, සාලිජාතක කොකාලිජාතකාදිය අනිමුඛරතාවයෙහි දොස් දක්වමින්, මහිලාමුඛජාතක මනොජජාතකාදිය විපක්‍ෂසේවායෙහි දොස් දක්වමින්, භිමසෙනජාතක කටාහජාතකාදිය විකත්‍ථණයෙහි දොස් දක්වමින්, සුවණ්ණහංසජාතක මහාවාණිජ ජාතකාදිය අතිලොභයෙහි දොස් දක්වමින්, කූටවාණිජ ජාතක මච්ඡජාතකාදිය කූට ව්‍යවහාරයෙහි දොස් දක්වමින්, ලාභගරු ජාතක ලොසක ජාතකාදිය ලාභොත්පාදනයෙහි හා ලාභාන්තරායකරණයෙහි දොස් දක්වමින්, සම්මොදමානජාතක භරුජාතකාදිය කලහයෙහි දොස් දක්වමින්, මකසජාතක රොහිණී ජාතකාදිය බාලතාවයෙහි දොස් දක්වමින්, සච්චංකිර ජාතක ගොධ ජාතකාදිය අනිෂ්ටවාසයෙහි දොස් දක්වමින්, වාරණජාතක ගජකුම්භජාතකාදිය අලසතාවයෙහි දොස් දක්වමින්, දධිවාහනජාතක සීලානිසංසජාතකාදිය අසත් සමාගමයෙහි දොස් හා සත්සමාගමයෙහි අනුසස් දක්වමින්, අලීනචිත්තජාතක පදමානවක ජාතකාදිය දූෂිවූව රජකෙණෙරමින්, උරගජාතක කුලාවකජාතකාදිය නා ගුරුළු මුළු රක්මින්, බරපත්තජාතක දද්දභජාතකාදිය ගිනිවැද මියනා රජුන්නුදු මුහුදුවැද මියනා සිවුපාවුන්නුදු වලක්වමින්, ජුසජාතක මූසිකජාතකාදිය රජනට වන අනාගතභය වලක්වමින්, රාජොවාදජාතක අනෙක රාජොවාද ජාතකාදිය රාජානුසාසනාවෙන් සත්නට සෙත්කෙරෙමින්, මහාසාරජාතක බන්ධනමොක්ඛ ජාතකාදිය බන්ධනගත සත්‍වයන් බන්ධනයෙන් මුදමින්, කච්ඡපජාතක ජවන

* මුසාවාද-සීද. මුෂාවාද-සීද. උඩරට පොත්.

සකුණජාතකාදිය දුඃඛිත සත්වයන් සුඛිත කෙරෙමින්, මහාසු පිනජාතක අට්ඨසද්ද ජාතකාදිය සශෝක සත්වයන් නිශෝක කෙරෙමින්, දසන්නකජාතක කාමජාතකාදිය සරෝග සත්වයන් නිරෝගකෙරෙමින්, කුසජාතක භොජාජානීය ජාතකාදිය තමන් ගෙණඳුන් රුපුරජනට අභයදෙමින්, ගුණජාතක කුරුඞ්ගමිගජාතකාදිය උපකාරයන්ට ප්‍රත්‍යුපකාර කෙරෙමින්, මහාඅස්සාරොහ ජාතක පලාසජාතකාදිය මඳඋපකාරයෙක්හි පැහැද සත්නට අධිරාජ්‍යය දෙමින් මහානිධාන පාමින්, වට්ටකජාතක මච්ඡජාතකාදිය ගිනෙහාත් නස්නා සත්නට ලැව්ගිනි නිවා මහවැසි වස්වමින්, අසදෘශජාතක මහාඋම්මග්ග ජාතකාදිය යමක්හු වෙරින් ලේනොසොල්වා කැටක්ගෙණ ලුනුබඳනා කවුඩු සෙනඟක්සෙ සින්ද හීයක්ගෙණ ලුහුබඳනා වඳුරුසෙනඟක් සෙසින්ද රුපුරජ සෙනඟ බුදුවූදවස් බූත් මරසෙනඟ සෙසින්ද ලුහුබැඳපියා සත්නට සෙත්කෙරෙමින්, මාතුපොසක ජාතක සාලිකෙදාර ජාතකාදිය සතන් මවුවටන් පියවටන් දැහැමෙහි පිහිටුවමින්, සොමදත්තජාතක මත්තකුණ්ඩලී ජාතකාදිය දිලිනැගි පුත්‍රසොක නිවමින්, සුජාතජාතක තක්කාලජාතකාදිය පිතෘශොක සන්සිඳුවමින්, මතරොදනජාතක උරගජාතකාදිය සිනැහැති මල්බෑයනුදු උරෙහිදූ දරුවනුදු මළකලැ දොම්නස් නොකෙරෙමින්, අනනුසොචියජාතක දසරථජාතකාදිය මළනට වලප්නාසතන් සදම් දෙස්නෙන් අස්වසමින්, තිත්තුකජාතක සුරුචිජාතකාදිය පැණ වෙසෙස්දක්වමින්, පුණ්ණනදීජාතක ගාමණිචණ්ඩ ජාතකාදිය පැණ විසඳමින්, සුසීමජාතක දද්දරජාතකාදිය ලදරුවක්ව එක් රැයකින් ත්‍රිවෙද නිමවාගෙණ තොප අතවැස්සන්ට මෙසේකියයි ආචාර්‍ය්‍යහට වෙදයොදාදෙවමින් වක්ව ගල්මුදුනකින් බස්නා හොයක්සෙ පන්සියයක් දෙනාහට ත්‍රිවෙද ප්‍රතිපාදනය කෙරෙමින්, සම්භවජාතක සත්තුභත්ත ජාතකාදිය පැණ විසජනෙන් සතුන් සොම්නස් මහවිල්හි ගලා සනහමින්, පරොසහස්සජාතක සිරිකාලකණ්ණි ජාතකාදිය නුවනැතියනටද [illegible] නාටද සඞ්ග්‍රහ කෙරෙමින්, සාධිනජාතක නිමිජාතකාදිය විජයන් රතඅර දෙව්ලො ගොස් දෙව්යන් තුස්මින්, ශෘගාලජාතක ඛුල්ලපලොභන ජාතකාදිය ජඤරාගයෙහි [illegible]ක්වමින්, තක්කජාතක නලිනීජාතකාදිය ස්ත්‍රීලීලාවලොකනයෙහි දොස් දක්වමින්, මුදුලක්ඛණජාතක සංකප්ප ජාතකාදිය ප්‍රභවස්ථයෙහි බැලීමෙහි දොස්දක්වමින්, ආසංකජාතක උම්මදන්ති ජාතකාදිය ස්ත්‍රී රූප දශීනයෙහි දොස් දක්වමින්, මොරජාතක කක්කාරු

ජාතකාදිය ස්ත්‍රීශබ්දයෙහි දෙස්දක්වමින්, පුප්ඵරත්තජාතක අල
ම්බුසා ජාතකාදිය ස්ත්‍රීශරීරස්පර්ශයෙහි දෙස්දක්වමින්, කනවෙරු
ජාතක අට්ඨාන ජාතකාදිය ස්ත්‍රීසංසර්ගයෙහි දෙස් දක්වමින්,
කුම්මාසපිණ්ඩජාතක ගඟමාලජාතකාදිය තමන් අනන්තරජන්ම
යෙහි එක්දවසක් දුන්දනින්හා එක්රැයක් රැකිසිලින් රජසපු
වැලඳූපරිදිකියා සතුන් දන් සිල්හි පිහිටුවමින්, ආදිත්තජාතක
දසබ්‍රාහ්මණ ජාතකාදිය විශෙෂ දාන දෙමින්, කුම්භකාරජාතක
භික්ඛාපරම්පර ජාතකාදිය පසේබුදුන් පුදමින්, සංඛජාතක
මහාජනක ජාතකාදිය සත්දවසක් නිරාහාරව මහමුහුදුපිහිණ
නකළුදු දිව්බොජුන් පිළිකෙව්කොට පෙහෙවස්ම රක්මින්, තෙ
ලපත්තජාතක සමිද්ධිජාතකාදිය දිව්‍යරූප ඉන්ද්‍රියභෙදකොට නො
බලමින්, ගන්ධාරජාතක කණ්හජාතකාදිය තවුස්පැවිජිව පන්සිල්
මාත්‍රයක් රක්නාලදපවා බලවත් අපිස් සතොස්බවට පැමිනෙ
මින්, කාකජාතක භද්‍රසාල ජාතකාදිය නෑයන්ට වැඩකෙරෙමින්,
දුම්මෙධජාතක අයකූටජාතකාදිය ලෝවැඩ කෙරෙමින්, ධජවි
හෙඨකජාතක මහාකණ්හජාතකාදිය සසුන්වැඩ කෙරෙමින්,
නිග්‍රොධමිගජාතක නන්දිමිගජාතකාදිය සදහම්දෙස්නෙන් දරු
ණුරජුන්දමා හැමසත්නට අභයදානය දෙමින්, සරභඟජාතක
සඞ්කිච්ච ජාතකාදිය තමන් පොලොප්පලා පෑ නරකදුක වෙව්
ලනසතුන් තදනතඥානයෙන් අස්වසමින්, ජවනහංස ජාතක
වලාහක අස්සජාතකාදිය මරණමුවපත් මිනිසුන් පියෝයෙන් පිරි
න්තරවමින්, සච්චංකිරජාතක චුල්ලපදුම ජාතකාදිය දියෙන් මි
යනුවන් ජලදුගීයෙන් නගමින්, සරභමිග ජාතක මහාකපි ජා
තකාදිය නරාවලහුනුවන් නරක ප්‍රපාතයෙන් උඩරවමින්, මහා
කපිජාතක සුජාතජාතකාදිය මරණමුවපත් වඳුරන් වළබමුවපත්
වෙනෙදනන් ගඟමුහුදු පරතෙරට පමුනුවමින්, අබ්භන්තර ජා
තක ලොකස්සප ජාතකාදිය උග්‍රතපසින් ශක්‍රභවන කම්පිත
කෙරෙමින්, අකිත්ති ජාතක භිසජාතකාදිය ගිහිසපුව උරසක්
මල්දූක තපොවන එළඹෙමින්, මඛාදෙවජාතක විසය්හ ජාත
කාදිය පඤ්චකාමයෙහි ගුණ විසම්ශ්‍ර අමෙධ්‍යසෙ ගරහමින්, සො
මනස්සජාතක සුසීමජාතකාදිය වළප්නානෑයන් යමපලුත්සේ
පියා තම වල් නික්මෙමින්, සොනකජාතක දරිමුඛ ජාතකාදිය
ලැව්ගිනිගත් වනගහණයෙකින් නික්මෙන ඇතක්හු සෙයින්
රජසපුවපියා නික්මෙමින්, උදචනී ජාතක චිත්තසම්භූත ජාතකා
දිය කාමපඞ්කයෙහි ගැලීගිය සතුන් නගා පැවිජිනලයෙහි පිහි
ටුවමින්, චන්දකින්නර ජාතක සාමජාතකාදිය තමන් මියනසෙ

විදි රජුන් කෙරෙහි දොම්නස් නොකෙරෙමින්, මහාඛන්තිවාදි ජාතක චූලධම්මපාල ජාතකාදිය තමන් කවුමතිගායෙන් සපා අත්පාද කන් නාසාද කප්වා විලුඹින් කඩුසිළින් ලෙහි ඇනමරණ රජුන් කාලියගලුවන්සේ දක්මින්, මහාසීලවජාතක එකරාජ ජාතකාදිය ඇමති මවුලූ අතළුරුකොට දහස් පැහැර ගෙණ තමන් සොහොන් වල ඕගල් බත්කොට ගැළු දෙරතුරෙහි එල් වූ රජුන් ප්‍රියපුතුන්සේ දක්මින්, ඛදිරඟාරජාතක සසජාතකාදිය දන්දෙනු සඳහා දිලියෙන ගිනිමැදට පුල්පිපුම්විලටසේ වදිමින්, සීලවජාතක ඡද්දන්තජාතකාදිය තමන්ට වධකළ වැද්දන්ට සිය අනින් සරස් විහිදිනා දළ කඩාදෙමින්, භූරිදත්තජාතක සඞ්ඛපාලජාතක චම්පෙය්‍ය ජාතකාදිය තණපතක්සේ දිවිපියා පොළෝ පෙරළෙන්නාක් සෙයින් සිල්පොපියමින්, වෙලාමජාතක මන්ධාතු ජාතකාදිය සත්නට රුවන්වහරේ වස්වමින්, කුරුධම් ජාතක සිවිජාතක විසය්හජාතක වෙස්සන්තර ජාතකාදියදන් වහරේ වස්වමින්, මහෞෂධ පණ්ඩිත කල්හි විධූරපණ්ඩිත කල්හි සෙනකපණ්ඩිත කල්හි කෙව්ලිරජ කල්හි හස්රජකල්හි ගිරා සෙනෙව් කල්හි සුවණ්ණමොනර කල්හි රුරුමුව කල්හි කුකුරු කල්හි සුපත්කපුටු කල්හි තුඩිලගුරු කල්හි සත්නට දහම්වහරේ වස්වමින්, කුදාල සමාගමයෙහි හස්තිපාල සමාගම යෙහි ජොතිපාල සමාගමයෙහි අයොඝර සමාගමයෙහි චූලසුතසොම සමාගමයෙහි මූගපක්ඛ සමාගමයෙහි සතුන් සීලාදිගුණයෙහි පිහිටුවමින්.

මෙසේ තමන් බෝසත්කල්හිම "පුරිසදම්මසාරථි" වන බැවින් නොයෙක් දෑ කෙළ සූවහස්හි දුද්දාන්ත සත්‍වයන් දමා සීලසමාධි ප්‍රඥාලක්‍ෂණ ගුණධර්මයෙන් පිරිපසමින්, සතකත්‍යාභ්‍යාස නෛරන්තරාභ්‍යාස දීර්ඝකාලාභ්‍යාස විසින් බොධිසම්භාර ධර්මයන් මුහු කුරුවමින්, දෑම් අමනුසඳහා සවන් ක්‍ෂණ ගබ්නන්වාගෙණ වස්තුරු අත්බැවින් සැව තුසීපුරයෙහි උපන්නු.

[මෙතෙකින් නොවියත් නුදිජනයන් සඳහා කරණලද අමෘත ප්‍රවාහයෙහි] දුද්දාන්තදමනා නම් පළමුවෙනි පරිච්ඡෙදයනිමි.

## 2 වෙනි පරිච්ඡෙදය.

මෙසේ ඔවුන් තුසීපුරයෙහි ඉපිද සත්පණස්කෙළ සැටලක්‍ෂයක් අවුරුදු දෙව්සැප වලඳා වැඩවසනකල්හි දසදහස් ලෝදෑහි දෙව් බඹනු පූර්වනිමිත්ත දැක එක් සක්වළෙක මූළදී බුදුවන

මගතෙක් කොයි වෙසෙහොයි බලනුවෝ අපමහබෝසතානන් දැක තුසීපුරට ගොස් වැඳ මුදුනෙහි ඇඳිලිබැඳ බුදුවන්නට කාලැයි ආරාධනා කළෝ.

එකල්හි මහබෝසතාණෝ පඤ්චමහාවිලෝකනාවලෝකනය කොට බුදුවනනට කල්බව දැන දෙව්පිරිස් පිරිවරා නඳුන්උයන් වැද තුසීපුරයෙන් සැව දඹදිව මැඳුම්පියස කිඹුල්වත්නුවර ඔක්කාවස්කුල අබරණ සුදෙවුන් මහරජහුපිණිස මහාමායා දෙවිරු පිනිකුස පිළිසිඳගත්හු. මහාමායාදෙවී ඇසළ පුණුපොහොයට සත්දවසක් ඇතිකල පටන්ගෙණ දෙව්නුවරක් සෙයින්සදනලද කිඹුල්වත්පුරයෙහි දෙව්පිරිස් බඳු මහපිරිස් පිරිවරා සැණකෙළි පොහොදවස් ගඳදියෙන් නහා මල්ගඳවිලවුන් ගෙණ සව්බරණින් සැදී සතර ලක්‍ෂයක් ධනවිසදා මහදන්දී වරහොජන වළඳා පෙහෙව දිවව්මන් පරයන සිරියහන් ගබඩාවට වැද සිරියහන් මතුයෙහි හෙව නිදන්ට වත්නි මෙබඳු සවප්නායක් දුටු. කිසේයයත්, සතරවරම් මහරජහු අවුදු ඇය යහනින් නගාගෙණ හිමවත් පියසට ඇර සැටයොදුන් රත්ගල්තෙලෙහි පිහිටි සත්යොදුන් මහ සල්රුකක්යට බහා තබා එකත්පස්ව සිටියෝ. එකල්හි ඔවුන්ගේ දෙවිහිඅවුදු දෙවිය අනුදත් දහනලාවට ඇර මිනිස්මළ අරණසඳහා නහවා දිවපිළි හඳවා දිව ගඳවිලවුන් ගන්වා දිවමල් පලඳවා පයට නුදුරුතන්හි එක්රිදිපව්වෙක් ඇති එහි ඇතුළ රත්විමනෙක් ඇති ඒව්මන්හි පැඳුම්දෙසට හිස්ලා දිවයහනක් පනවා ඒ යහන්හි වඩා හෙවුහු.

එකල්හි අප මහබෝසතාණෝ සරා වලාගබක් සෙයින් සුදු ඇත්වෙසක් දක්වා එයට නුදුරුතන්හි එක් රන්ගලෙක් ඇති ඒගල්හිසඅරා එයින්බැස රිදීපව්වට නැගී උතුරුදිසායෙන් අවුදු රිදීදමක් බඳු අතින් සුදුපියුමක් ගෙණ කිලරන්විමනට වැද මෑනියන් හොත් යහන් තුන්යලක් පැදකුණුකොට දකුණුඇලයෙන් කුසයට වනනවුත් වැනි වූහු.

මෙසේ ඇසළපුණුපොහොය උතුරුසලනැකතින් මවුකුස පිළිසිඳගත්හු. එකල්හි දෙවී පිබිද [තමන් විසින් දකිනලද] සවප්නය රජහට සැලකළා. රජු සිවුවේදේ ගෙවාදත් බමුණන් සුසැටදෙනෙකුන් ගෙන්වාගෙණ මහත් භොගදී සත්කාරකොට සිනකියා කිමෙක්වෙයි පිළිවිත. බමුණෝ මහරජ නාගේ දෙවියකුස ගබපිහිටිය පිතෙක් නට උපදී ගේ ගිහ්ගෙයි සිටියේ නම් සක්විතිරජවෙයි, පැමිජිවූනම් බුදුවෙයි කීහු. ඔවුන් මවු කුස පිළිසිඳගත් විගස දසදහස් ලෝදා එකපැහැර කම්පිතවිය.

දසදහසක්සක්වළ අපමණ ආලෝකවිය, ඒසොභා දක්නට කනනු ඇස්ලදහ, ඒරැව් බිහිරණු ඇසූහ, ගොළුහු ගායනා කළහ; කුදුහු සෘජුසිරුරු ඇතිවූහ, බන්ධනගත සත්වයෝ බන්ධනයෙන් මුක්තවූහ, හැම නිරය ගිනි නිවීය, පෙතයන්ගේ සා පිපාස සන්සිඳුන, තිරිසන්ගති සත්නට භයනැතිවිය, හැමසතුන්ගේ රෝග සන්සිඳුන, හැමසත්හු ප්‍රියතෙපුල් ඇතිවූහ, අසසු මිහුරු ආකාරයෙන් කුලති, ඇත්හු සොම්නස්ව ගජ්ජනාකෙරෙති, සිංහයෝ නාදකෙරෙත්, හැමබෙරහු තමතමන්ගේ ධවනිවූනුවහ; නොසොල්වෙනලද දෙව්මිනිසුන්ගේ පලඳනා නානාරැව් පිළිරැව්දී ගුගුළහ, හැමදෙසෙහි පහන් පැහැවිය, හැම සත්නට සුවජනවමින් සුවද මෙලෙක් සිහිල් සුලඟ හැමීය, අකාල මෙඝ නගා වැසිවට, පොළොවිනුදු දියනැගින, පොළෝතෙලෙහි ඇවිදි පක්ෂීහු ආකාශයෙන් යනගමන් පීහ, ගඟා ගෝ නොගොස් සිටියාහ, මහමුහුදු දිය මිහුරුවිය, හැමතැන් පස්පියුමෙන් සැදුම්ලද, දියෙහි ගොඩනි පුෂ්පයෝ විකසිතවූහ, හැම්රුක් හැමලියෙහි කඳවෙළෙප ශාඛායෙහි පස්පියුම් පිපීය, පොළෝතල ගල්තල බිඳ මතුමතුයෙහි සත්සත්බුමුව දඬු පියුම් නික්මින, අහස පියුම්වියත්වී, හාත්පස්හි මල්වැසි වට, ආකාශයෙහි දිව බෙර ගුගුළහ, සියලු දසදහසක් සක්වළවට වූහුවූමල් ගුලාවක් වැනිවී, පෙලාබැඳි මල්කලඹක් වැනි විය, සදතුබූ මල් අස්නක් වැනිවිය, එකිඑකී මාලා මාලිනී විය, තෙව්නා වල්විදූනා ඇතිවිය, පුෂ්ප ධූප ගන්ධ පරිවාසිතවිය, පරම සෞභාග්‍යප්‍රාප්තවී.

මෙසේ පිළිසිඳගත් මහසත්හුගේ පිළිසඳ පටන්ගෙණ මහබෝසතානන්ටද මෑනියන්ටද උපද්‍රව වලකනුසඳහා මේසක්වළ සතරවරම් මහ [දෙව්] රජහු කඩුගත් අත්ඇතිව ඇතුළු සිරියහන් ගැබ රැකවල්ගත්හ. තුබූ දසදහක්සක්වළ සතළිස් දහසක් සතරවරම් මහ [දෙව්] රජහු සහපිරිවරින් අවුදු ගබ්දොර පහදොර පටන්ගෙණ සක්වළගල්දක්වා වටා අරක්ගත්හු. මෑනියෝ සුවපත්වූවා නොලෙඩ සිරුරු ඇතනි ඇතුළුකුස නැබමඩුලු බලා පලක්බැඳ වැඩහුත් පුතනුවන් පහන්පැහැඇති මිණ රුවනෙක්හි ඇවුනු රත්පලහුයක් සෙයින් දක්නාහු දසමස් අවසන්හි දෙමවුපියන්කරා යා යටිව සුදෙවුන් මහරජානන්ට සැලකළා. රජානෝ කිඹුල්වත් නුවර පටන්ගෙණ දෙව්දැහැ නුවර දක්වා මඟ සමකරවා සුදුවැලිහොවා කෙසෙල්ගස් හිඳුවා පුන්කලස දදපෙළින් සදා දෙව්න් ගනරන්මුවා සිව්ගෙයෙක්හි සුදුමෙලෙක් යහන්හි වඩාහිඳුවා දහසක් ඇමතනන්ලවා සිව්ගෙය ගන්වා

මහත් පිරිවරින් නගා යවුහු. දෙනුවර මැද දෙනුවර වැස්සන්ගොස් සැණකෙළෙනා ලුම්බිනිවන නම් මගුල්සල්වනයෙක් ඇති.

එකල්හි ඒ සල්වනය මුල පටන්ගෙණ ශාඛාග්‍රය දක්වා මලින් සැදුම්ලද. ශාඛාඅතුරෙහිදු මල්අතුරෙහිදූ පස්වණක් භමර ගණත්හා නත් විසිතුරු ලිහිණිගණයෝ මියුරුරසයෙන් කූල්මින් ඇවිදිති. සියලු ලුම්බිනීවනය තවුතිසා දෙව්නුවර සිත්ලියවනය වැනිවිය. ඒ [වනය] දක්නාහා දෙවීත්ට සල්වන කෙළෙනා රිසි උපන. ඇමැතෙතා දෙවීත්ගෙණ සල්වනයට වන්හ. දෙවීහි කෙළෙමින් ගොස් මගුල් සල්මූලට එළඹ සල්අත්තක් ගතැටි වූහ. සල්අත්ත හුයාපී වේඅග බඩක්සෙයින් නැමී දෙවීත්අතට උපගතවිය. ඔවුන් සල්අත්ත ගත්විගස කම්ජවාතයෝ චලිත වූහ. එකල්හි ඇමැතෙතා වටා කඩතුරාබැඳ පිටත්ව සිටියානුය.

ඔවුන් සල්අත්තම ගෙණ සිටියවුන් කුසින් බෝසතානෝ ප්‍රසූත වූහ. එකෙණෙහි සුදවස්වැසි රත්මහබඹු අවුදු රන්දැලින් බෝසතානන් පිළිගෙණ මෑනියන් පෙරටසිට දෙවිය සොම්නස්වා, මහානුභාව සම්පන්න පිතෙක් තිට උපනැයි කිහ. සෙසුසත්හු මව්කුසින් නික්මෙනකල අසුචිමුසුව නික්මෙති. මොහුවනාහි බණපළගෙකින් බස්නා මහතෙර කෙනෙකුත් සෙයින් දෙයත් දෙපා දික්කොට සිටම මව්කුස කිසිදූයකින් මුසුනොව පිරිසුදුව විසාරදව කසීවතෙක්හි වසාතුබූ දූරගමිණී රුවනක් සෙයින් දිලියෙමින් මව්කුසින් නික්මුනුහු. ඔවුන් එසේ පිරිසුදු සිරුරු ඇතිදූ බෝසතානන්ටත් මෑනියන්ටත් සත්කාර සඳහා අහසින් දෙදියධාරාවෙක් නික්ම මෑනියනුදු බෝසතානනුදු සැනාහැවී.

එකල්හි මහබෝසතානන් රන්දැලින් පිළිගෙණ සිටි මහබඹුන් අතින් සතරවරම් මහරජහු මගුල්සම්මතවූ සුවපහස්ඇති අඳුන් දිවිසමින් පිළිගත්හු. ඔවුන් අතින් මගුල්මහඇමතියෝ දුහුල් සුඹුලුවෙන් පිළිගත්හු. මිනිසුන්අතින් බැස පොළොව වැඩසිට පැදුම්දිසා බැලූහ. ඒ දෙසෙහි අනත් අපරිසේ ලෝදැහි එක් හෙළිවිය. එහි දෙව්මිනිස්සු ගඳින් මලින් පුදා, මහාපුරුෂය මෙහි තොපහා සම කෙනෙකුදු නැති. තටවැඩිසිටි කෙනෙක්නම් කොහිදැයි කීහු. මෙසේ සිවුදිගද සිවුඅනුදිගද ඌර්ධ්ව අධොයන දශදිශාබලා තමත්හා සුදුසු කෙනෙකුන් නොදැක උතුරු දිශාබලා සත්පියවරක් නගා වැඩසිටියෝ. එකල්හි මහබඹු තුන්යොදුන් පමණ සේසත් මුදුනට වැඩිය. සුයාමනාම් දෙව්රජ තුත්ගවු පමණ වල්විදුනා සැලීය. සන්තුසිතනාම් දෙව්රජ මිණි වටාපත් සැලීය. සක් දෙවුරජ එක්සිය විසිරියන් විජයතුරාසක්

පිඹ. සෙසුදෙව්යෝ රුවන්කරඬු රුවන්සෙමෙර මිණිවොටුනු ගෙණ පිරිවැරූහ. බෝසතාණෝ සත්පියවර වැඩ සිට අනන්තාපරිසේ ලෝදැගි තමන් හා සමකෙනෙකුන් නැති පරිදි හැමදෙනාහට තමන් ඇඟවූ පරිදි දක්වමින් "අග්ගොහමස්මිලොකස්ස" යනාදීන් [අශීතකෙශර] සිංහනාද කළා හා මවුකුස පිළිසිඳගත් කල්හි සෙයින්ම මවුකුසින් ප්‍රසූතවූ කල්හිදු දෙතිස් පූර්ව නිමිත්තයෝ පහළවූහු. එකල්හි දෙනුවර රජදරුවෝ බෝසතානන් ගෙණ කිඹුල්වත්නුවරම ගියෝ. එ දවස් තුලුදෙව් සෑමියාණෝ සුදෙවුන් මහරජානන් ගෙයිදිම වලඳා දිවාවිහාර සඳහා තවුතිසා දෙව්නුවර ගොස් නඳුන්උයන්හි සමවත් සමවැද නැඟාහු සැණකෙළෙනා දෙව්පිරිස් දැක මෙවැනි සොම්නසෙක් නොපට යම් කලෙක නූවූව්රිය කවර කාරණෙකින් මෙසේ සැණකෙළිවූදැයි පුළුවුත්හු. එසඳ දෙව්යෝ සුදොවුන් මහරජහු පුතනුකෙනෙක් උපන, ඔවුන් බෝමැඩ හිඳ බුදුව දම්සක් පවත්වයි, ඔවුන්ගේ අනන්තවූ බුබලීලා බලම්හ, බණ අසම්හ යි සොම්නස් වූම්හයි කීහු. තවුස්පාණෝ දෙව්යන් බස් අසා වහ වහා දෙව්ලොවින් බැස රජගෙට වැද පැනවූ අස්නෙහි වැඩහිඳ "මහරජ තා පුතනුකෙනෙක් උපන්හුල ඔවුන් දක්මහ"යී කීහ. එකල්හි රජ කුමරපළඳනාවෙන් සැදි පුතනුවක් වඩා ගෙණ තවුස්පානන් වඳනට එලවීය. එකෙණෙහි බෝසතානන් දෙපත්ල පෙරළී සෑමියානන් මුදුනෙහි පිහිටිය. ඒ අත්බැව බෝසතානන්ගෙන් වැඳුම් ගන්නට නිසි කෙනෙක් මුළු තුන්ලොව ඇත්තාහු නොවෙති ඉදින් නොදැන බෝසතානන් හිස සෑමියානන් පාමුලට එලවූහු නම් ඔවුන් හිස සත්කඩක්ව පැලෙයි. එකල්හි සෑමියාණෝ හුනස්නෙන්නැගී බෝසතානන් වැන්දූහ. රජ ඒ පෙළහර දැක තමා පුතනුවන් වැන්ද. සෑමියාණෝ අතීතයෙහි සතළිස් කපක් හා අනාගතයෙහි සතළිස් කපක් හා මෙසේ අසූකපක් දැකිත්. ඔහු බෝසතානන්ගේ රූපසම්පත් දැක බුදුවෙයි හොයි බුදුනොවෙයි හොයි බලන්නාහු ඒකාන්තයෙන් බුදුවන සේ දැක සතුටුව සෙන්නට වන්හ. ඉක්බිති මම මොහු බුදුවූවන් දකිම් හොයි නොදකිම් හොයි බලන්නාහු අතුරෙහි තමන් මිය අරුතෙලෙහි උපදනා සේ දැක ඒ උතුමා දකිනු නොලබම් යි වළප්නට වන්හ. ඇමැතියෝ ඒ දැක වහන්ස කුමට සෙව කුමට වළප්ව යී පුළුවුත්හ. මොහු බුදුවන සේ දැක සතුටුව සෙම්. මා ඔවුන් නොදක්නා සේ දැක රැහැණිව වළප්මියි කීහු. ඉක්බිති බෝසතානන් පස්වන දවස් නහවා පායින් ගත්වා රජගෙයි සිවුදැඟඳින් පිරිබඩකොට ලදපස්

මල් ඉස ඟිඳිනා හසුත් පනවා සිවු වේදේ ගෙවා දත් බමුණන් අටනුරාසියක් දෙනා ඇර ඟිඳුවා කිරිබත් වලඳවා සත්කාර කොට ලකුණු බැලවූහු. හැමදෙනම සමග හුන් ප්‍රධාන බමුණන් අට දෙනා කෙරෙන් සත්දෙනෙක් බෝසතානන්ගේ දෙතිස් මහා පුරුෂ ලකුණු දැක මේ දරු ගිහිගෙයි සිටියේ සක්විතිරජවෙයි, පැවිජ්වූව බුදුවෙයි කීහු. ඔවුහු අටදෙනාහට ලදරු සුදත් නම් බමුණු දරු බලා එකානතයෙන් බුදුවෙයි කී.

එක්දවසක් රජුන්ගේ වප්මගුලෙක්විය. එ දවස් මුළුනුවර දෙවිනුවරක් සේ සැදූහ, රජ දෙව්පිරිස් බඳු මහරජපිරිස් පිරිවරා නික්මෙන්නේ පුතනුවන් වඩාගෙණ කෙත් වත් අබියස ගනසා දඹරුක්පයෙක්හි යහන් සලසා පුතනුවන් එහි වඩා හොවා උඩ විසීතුරුවියන් බඳවා වට කඩතුර බඳවා රැකවල් දී සව්බරණින්සැදි ඇමති දහස්පිරිවරා කෙතට ගියෝ. එසඳ බෝසතානන් පිරිවරා හුන් කිරිමවුහු රජුන්ගේ ඉසුරුබලන්ට ජවනිකාවෙන් පිටත්වූහ. බෝසතානෝ ඈතුළුවටන කිසි කෙනෙකුත් නොදක හොත් තැනින් නැගී පළක් අවුලුවා වැඩහිඳ අනා පන්සී හවා පළමුවන ධ්‍යාන නිපදවූ කල්හි කිරිමවුනු ඇතුළුවටනට වැද බලනාහාහු ඒ පෙළහර දැක ගොස් රජහට කීහු. රජ වෙලෙව්ව අවුදු දඹරුක නොපියා පළක් බැඳ යහන් මතුයෙහි උන් බෝසතානන් දැක පුතනුවෙනි මේ දෙවන වැඳිමය යි බැස හෙව වැඳී. ඉක්බිති බෝසතානෝ පෙරඩමස සඳසෙයින් වැඩී සත්ඇව්රිදි විශපැමින සක්දෙව්රජහුගේ යෙදුමෙන් විශ්වකර්මයා විසින් මවා දෙන ලද සොමිසිනිල් පහන් දිය පිරුණු පස්පියුමෙන් සැදුම්ලත් සත් රුවන්මුවා පොකුණෙහි සහපිරිවර්ත් දිය කෙළ ක්‍රමයෙන් වැඩී සොළොස්ඇව්රිදි විය පැමිනා මුළුලොවට එක්රජවූහු. එකල්හි පියමහරජාණෝ හිමත් ගිමත් වසන් යන තුන්රිතුවට නිසිකොට දිවවිමන් පරයන තුන්පහයක් කරවා එකී එකී කුලයෙන් එකී එකී රජකුමරියන් සඳ, එවන්නේය යි නෑයන්ට හසුන් දුන්හ. එකල්හි රජදරුවෝ සිදුහත්කුමර සිවුමැලිය ලදරුය කිසි සිල්පයක් දන්නේ නොවෙයි සංග්‍රාමයෙක් වී නම් කුමක් කෙරෙයි අපි අප දරුවන් නොදෙම්හ යි කීහු. එ පවත් අසා මහබෝසතානෝ මාගේ සිල්ප බැලියවියත් අත් සත් දවසකින් එන්නේයයි නුවර බෙර පියව්කරවා සත්වනදවස් රජාඟනයෙහි මඩුවක් කරවා මඩුවෙහි මහපිරිස් පිරිවරා වැඩහිඳ දහසක් පිරිමින් දුනුදිය නගනා දුන්නක් ගෙන්වාගෙණ යට දුනුමුඩාව වම්පය මහපටඇඟිලි පිට තබා [පළමු] හුන්සේම හිඳ දුනුදිය නගා අත්පොළා මුළු

ලොකයෙහි වැටෙන තාක් සිල්ප දක්වූහු (ඒ දක්වූ පරිදි සරභඞ්ග ජාතකයෙහි ආ නියායෙන් දතයුතු.)

එකල්හි ශාක්‍යරජදරුවන් විසින් සාදා දෙනලද සතළිස්දහසක් නළුවන් පිරිවරා නන්විසිතුරු මිණිරැසින් අලු රුවන්විමන්බඳු තුන් පහයුස්හි නැටුම් ගදවුගත් සුරවමියන්බඳු වරවමියන්ගේ මදලස් වහස්බැල්මෙන් පිනා පිනා මහත් සම්පත් අනුභවකරන්නාහු එක් දවසක් උයන්කෙළනට යා යුතුව පහසින්බැස රුවන්රියඅරා සිවුරඟසෙනඟ පිරිවරා උයන් වඩනාහු ජරාරු දැක නැවත දෙවෙනවට ව්‍යාධිරු දැක තුන්වනවට මළරුදැක එසේම සතරවනවට පැවිජිරු දැක උයන්ගොස් දෙව්පිරිස් පිරිවරා නඳුනුයන් වන් සක්දෙව්රජහුගේ ලීලාවෙන් උයන්කෙළි කෙළ මඟුල්පොකුණෙහි සනහා මඟුල්සලවට වැඩහිඳ. විස්කම් දෙව්පුත්හු විසින් මඟුල්කපු වෙස් ගෙණ දසදහසක් දිවසළුවෙන් හිසවෙළා මිණිඔටුනුපලඳවා සව්බරණින් සදනලද්දානු පසඟතුරුරැවින් හා මඟුල්ගීත් දශදිශාපූරමින් රුවන්රිය අරා යසසිරින් වොරජමින් නුවරවැද කිසාගොතමිය විසින් කියනලද නිබ්බුතපදයත් අසා සුවහස් වටනා මුත්හර දී පහතල අරා සිරියහන්හි වැඩහොත්හු. එකල්හි දිවසරන්බඳු සතළිස්දහසක් නළුවෝ සව්බරණින් සැදී පසඟතුරු ගෙණ මහපුරිසා පිරිවරා සිට නැටුම් ගදවුත් පැවැත්වූහු. එකෙණෙහි මහබෝසතාණෝ නිදන්නට වන්හ. ඔවුත් නිදන බව් දැක නළුවෝ තමනමන් ගත් පසඟතුරුහැර වැතිර හෙව නිදන්ට වන්හු. එකල මහබෝසතාණෝ පිබිද යහන්මත්තේ පළක් බැද වැඩහුන්නාහු ගඳතෙල දිලියෙන පහනින් නිදිගත් මාගමුන් නැහැ හඬවනුන් මුවෙන්වැගෙන කෙලින්තෙත් සැරු ඇතියවුන් දත්කනුවන් කස්නාවුන් වළප්නාවුන් වලකට ඇතියවුන් නොමුවහ රහස් පියෙස් ඇතියවුන් දුගඳවා විගිඳුනාවුන් දැක සංවෙගකොට ශක්‍රභවනයක්බඳු මහල්තලය අමුසොහොනක් සේ වටහා ගියකල්හි මුළුනුන්ලෙව්හි ගිනිගත්ගෙයකසේ දැක අද මා පැව්ජිවනනට ගියමැනවැයි සිනා යහනින් නැගී ගොස් හිණිගෙයි හොත් සන්මහඇමැතා පොබයාගෙණ අසෙකු සදා ගෙණඑනුකොට අස්හලට නාගා යවූහු. ගේ ගොස් දිලියෙනපහන්ඇති සමන්මල්වියන්යට රමණීබිම් පියසෙහිසිටි කනනකනම් අස්රජහුදැක ඉතාතැකුළුකොට සදන්නට පටන්ගත්හ. එසඳ අස් අද ම හිමි මහබිනික්මන් කටැව්ව දැයි සතුටුව මහත්සේ කුල්නට වන. පැතිරගිය ඒ හඬ දෙව්යෝ කිසිකෙනෙකුන් ඇසිය නුදුන්හු. බෝසතාණෝ රහල්කුමරුන් දැක පහයින් බැස අශවයා කරා එලඹ මේ රෑ තෝ මා තරව්‍ා, මම්

මූඑලෝ තරවම් යි නැගී අසුපිට වැඩළුත්හ. ඒ අස් දිග අටළොස්
යානා, දිගට සුදුසු උස ඇත්තේය බල ඇත්තේය ජව ඇත්තේ
ය උණු කුල්නා හඩ හෝ ඇක්මෙන හඩ හෝ මුළුනුවර පැතිර
යන බියෙන් දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් කුල්නාහඩ
නොපැවැත්ත දුන්හු ඇක්මෙන පියවරට අත් දිගුකොට අත්
ලෙහි ඇක්මවාගත්හු. මහබෝසතාණෝ අසුපිට ගිද සන්මහඇ
මැතහා අසු වල ගන්වාගෙණ පසළොස්පෑ ගිය වේලෙහි මහදො
ර අබියසට වැඩියෝ. එකල්හි රජ බෝසතානන් යම් කවරවේ
ලෙක නුවර දොර විවරකරවා නික්ම යන බියෙන් යුවලදොරඳුව
රියෙහි එකි එකි දොරබියෙලි දහස් දහස් පුරුෂයන් මිස විවරනො
කටහැකි පරිදෙද්‍දන් කරවී. බෝසතාණෝ වනාගි ඇත් ගණනින්
කෙළදහසක් ඇත්නට බල ඇතියවුහු පුරුෂගණනායෙන් කෙ
ළලක්‍ෂයක් පුරුෂයන්ට බල ඇතියවුහු මෙසේසිතූහ. ඉදින් දොර
විවරනොවි නම් මම් අසුපිට හුනොහාම්ම වල්පත ගෙණ සිටි සත්හු
හා සමග අසු දෙකලවෙයින් හැදවාගෙණ අටළොස් හත් පවුරු
පැන යෙමි සිතූහු. සන්මහඇමති ඉදින් දොර විවරනොවී නම්
මම් ම හිමියා මා දසරුයෙහි හිදුවාගෙණ අස්රජ දකුණු කිසිලෙල
න් ගෙණ පවුරුපැන යෙමි සිනි. අස්තෙමේද ඉදින් දොරවිවර
නොවීනම් ම හිමියා පිට හිදුවාගෙණ වල්හි ගත් සත්හු හා සමග
පවුර පැන යෙමි සිනි. එකල්හි දෙවියෝ දොර විවරකළෝ.

එ කෙණෙහි මරදෙව්පුත් අවුදු අහස සිට සිදුහත්කුමර අත්සත්දව
සකින් තට සත්රුවන් පහළවෙයි දෙදහසක් කොදෙව් හා සමග
සතරමහදිවින් සැදුම් ලද සක්වළ එක්රජකෙරෙයි නොයා නව
ත යී කීහ. එකල්හි බෝසතාණෝ තෝ කවරහයි පිළිවිත. මම්
මරදෙව්පිත්මි යී කීකල්හි මට සත්රුවන් පහළවනබැව් දනිමි. මම
රජ නොකැමැත්තෙම් දසදහස් ලෝද ගුගුරුවා බුදුවෙමියි වද
ළෝ. එසඳ මර මෙතැන් පටන් තට කාමාදි තුන්විතර්කයෙන්
යම් විතර්කයෙක් උපනානම් දනිම් යී නොසිසිත් හසර බලනුයේ
යක් සෙයින් පානොවී. බෝසතාණෝ අතට පත් සක්විතිර
ජය අලුයම කෙලපිඩක් සෙයින් පියා ඇසළපුණු පොහොදවස්
නුවරින් නික්ම සිට නුවර බැලියවිවූහු. එකෙණෙහි මහපොළොව
කුඹල්සකක් සෙයින් කැඩී ඔවුන් නුවරබලා සිටිවිය. ඔවුන් නුවර
බලා නැවති අසුපිට ගිද මහත්පෙළහරින් මහත්පිරිවරින් වඩින්,
එකල්හි දෙවියෝ බෝසතානන් පෙරට සැටදහසක් මිණිදඬුවැ
ට පහන් නැගූහ. පිටිපසඳු දකුණත් පසඳු වමත් පසඳු සැට සැට
දහස් මිණිදඬුවැට පහන් නැගූහු. සෙසුදෙවියෝ සක්වළගබ පිරි

සක්වළ මුවවිට දක්වා අපමණ මිණිදඬුවැට පහත්ගෙණ සිටියෝ
තුබූ දෙවියෝද නා ගුරුළු ගජඹ ආදීහුද දිවගඳින් දිවමලින් දිවඳු
මින් දිවසඳුන්සුණෙනන් පුදමින් යෙති. පරසතු මදාරා ඈ දිවකුසු
මින් මහමෙව්වැසිදහරින් මෙන් අහස්කුස පිරිනා, පෙරටත් පිටිප
සත් දකුණත්පස්හිඳු වමත්පස්හිඳු අටසැටදහස් දිව පසඟතුරු
හා දිවගදවු පැවැත්ත. සෙසු දෙවියෝ පසඟතුරු ගෙණ සක්
වළ මුවවිට දක්වා සිටියහ, ඒ හඬ මුහුදුකුස මහමේ ගැජුන්සෙ
යින් යුගඳුරුපව්වෙහි රළ ගැසෙනා හඬ සෙයින් පොළෝ තෙ
ලෙහි පටන්ගෙණ අකනිටා බඹලොව දක්වා එක කොලා
හල විය. එබඳු සොභාවෙන් වඩනාහු ඒ රෑ තුන්රජයක් ඉක්ම
තිස් යොදුනකින් මත්තේ අනොමා ගඟතෙරට පැමිනියෝ.
ඒ අස් වනාහි නැබින් තුබු සක්නිබමෙන්හි ඇව්ජිනාක්හු සෙ
යින් සක්වළ මුවව්ටියෙහි ගෙණ සක්වළගැබ වටාලා පෙර
වරු බත්වේලේ අවුදු සිටිනට තිසි ජව ඇතියේ එදා දෙව් බඹ නා
ගුරුළු ආදීන් විසින් අහස සිට වුහුටු ගඳමල්හි ගැලීගිය සිරුරුඇ
තිව දිවකුසුම් කඬායනුයෙව් ලස්ව තිස්යොදුනක් තැන්මගියේ.
එකල්හි මහබෝසත් ගංතෙර වැඩසිට මේ කිනම් ගඟෙකැයි ඇ
මැත්තා පිළිවිස අනෝමා නමැයි කීයෙන් අපගේ පැවිජි අනො
මාවෙයි අලාමක වෙයි අස්හට විලුම්සත්කොට අසු අටඉස්බක්ප
මණ පළල් ගඟපැන පරතෙර ගොස් සිටි කල අසුපිටින් බැස රි
දීපටක් බඳු වැලිපිට වැඩසිට පලඳනාද අසුද සන්මහඇමැත්තාහ
ට දක්වා දී පැවිජිනොවීදී ඔහුට සමු දී සිට මේ කෙහේ මහණහට
සරුප්නොවෙයි තමන් ඉසකේ කපන්නට නිසසක් නැත්තෙන්
දකුණතින් කඩුව ගෙණ වමතින් මුහුලසහාසමග කෙහෙගෙණ
සිඳ ඉදින් මම බුදුවෙම්නම් අහසසිටිවයි බුදුනොවෙම්නම් බිමට
බසිවයි අහසට වුහුටු කෙස්දා යොදනක්පමණ තැන් නැගී අහ
ස සිටියේය. සක්දෙව්රජ යොදුන්පමණ රුවන්කරඬුවෙකින් කෙ
ස්දාපිළිගෙණ මෙරමුදුන තවුතිසාදෙව්නුවර සිළුමිණිසෑ පිහිට
වී. එසඳ මහසත් මේ මා හත් කසීවත් මහණහට සරුප්නොවෙ
යි සිතිය. එකෙණෙහි මහබඹ මහණ පිරිකර ඇරදක්වා දී, සිව්
රුහැඳ පෙරව උතුම් පැවිජිවෙස් ගෙණ හැමසංවර ඉටාගත්ක
ල්හි හැලවූ සළුසඟලදු හිසිත්පිළිගෙණ බඹලොවට ඇර දො
ලොස්යොදුන් සළුමිණිසෑ පිහිටවී. මහබෝසතාණෝ පැවිජිව
අනුපියඅඹවනයට වැද පැවිජිසුවයෙන් උපන් සොම්නසින් ස
තියක් එහි දවස් ගලවා පෙරවරු පයින් තිස්යොදුනක් තැන්
ගොස් රජගහනුවර වැද ගෙපිළිවෙළින් අහරසිඟත්. එකල්හි

මුළුනුවර මහසත්හුගේ රුදස්හෙන් නාලාගිරිහු වත් රජගහනු
වර සෙයින් අසුරන්වත් දෙව්නුවරසෙයින් උලෙලවී. නුවරවැස්
සෝගොස් මහරජ මෙසේවූ සත්වයෙක් නුවරට වැද අහරසිඟයි
ඔහු දෙව්යෙකුබව නොදනුම්හ බඹකු ගුරුළෙකු මිනිසෙකුබ
වත් නොදනුම්යි සැලකළෝ රජ සිහිමැඳුරෙහි සිට බලනුයේ
මහපුරිසා දැක විස්මිතව මම මොහු දෙව්යෙකුබව නොදනිමි
බඹ යක් නා ගුරුළු මිනිස්බැව් නොදන්මි තොපට උපායක්කිය
මි "මුහුපස්සේ යව ඉදින් දෙවියෙක් බමෙක් වීනම් නුවරින්නි
ක්ම දෙව්ලෝ බඹලෝ බලා යෙයි නාගෙක් වීනම් පොළොව කි
මිද යෙයි ගුරුළෙක් වීනම් අහස පියා පැහැරයෙයි යකෙක්වීනම්
නොපැණී යෙයි මිනිසෙක් වීනම් ලද අහර ඇර එක්තැනෙක
හිඳ වළඳකෙරෙ"යි යෙදී, හේ යැපෙන පමණ අහර සිඟාගෙ
ණ වම් දොරින් නික්ම පාණ්ඩව නම් පව් අබියසට එළඹ රුක්සේ
වලල්ලෙහි වැඩහිඳ අහර වළඳන්ට ආරම්භකළෝ. පෙරඹවුන්
ගඳ ඇල්සාලේ බත් නන්අගරසෙන් වැළඳූවන්ට ඇසනොපහළ
විරී අහර අතපහරත්ම අතුණුපෙරළි කටින් නික්මයන පමණ
පිළිකුල් උපන.

එකල්හි අහර පිළිකුල් සඟුභාවනාකොට පස්විකා වැළඳූහ.
පසුපසෙසහි ගිය දූතයෝ දුව ගොස් එ පවත් රජහට සැලකළහ.
රජ වෙලෙව් ගොස් මහසත් කරා එළඹ දැක පැහැද නම් ගොත්
පිළිවිස පෙර තමා සබඳබැව් දැන තමාගේ රජය ඔවුන්ට පිළිපෙවී
මහරජ මට රජයෙන් කම්නැති අනට පත් සක්විතිරජය පියා ආ
යෙමි දූන් බුදුවනාට යෙම්යී වදළහ. රජ තෙපි ඒකාන්තයෙන්
බුදුවව නොප බුදුවූ කල පළමුකොට මාගේ විජිතයට වඩනේ
මැනවැයි අයදිය. මහසත්හු රජහට පිළිනදී ගොස් කලම් තව්
සා හා උදම් තව්සා හා දෙතව්සන්ගේ අසපුවට එළඹ ඔවුන්ගේ
සමයෙහි නිවන් නැති සේ දැක එහි ඉඳ රුවාරු අටසමවත් උප
යා උරුවෙල්දනව් ගොස් නිල්දලනර හෝතෙර රමණී සල්
වෙනෙක වෙසෙමින් සහවුරුඅදක් පොළෝ පෙරළනුවන් සෙ
යින් අහස ගැටලනුවන් සෙයින් කිසිකෙනෙකුහුදු විසින් නො
කොටහැකි කෙළපත් මහත් වියඞ කොට එයින් නික්ම ගම් නී
යම්ගමට පැමිණ සිනිඳු අහරින් සිරුරු සතපාගෙණ වෙසගපුණු
පොහොදවස් පස්මහ සිනිනදැක විචාරා පා සිව්රු ගෙණ වේලා
බලා අජපල් නුගරුක්මුල්හි සවණක්රසින් දිලියෙමින් වැඩහුන්
හු. එකල්හි උරුවෙල්දනව්වෙහි සෙනානී නම් නියම්ගම්හි
සෙනානිනම් කෙලෙඹියා දූ සුජාතානම් දූරී තමා වියපත් කල්හි

ඉදින් මම් සමාන කුලදරුවක්හු කෙරේ වැස කුලුදුලේ පුතෙකු ලදිම්නම් තට ලක්‍ෂයක් ධනැවිසදෑ කිරිබත් දෙම්යි නුගදෙවියා අයද බරණැස් සිටුහු කෙරේ වැස යසනම් පුතෙකු ලද කල්හි දහසක් දෙනුන් වැල්මීවෙනෙහි කවා ඔවුන් කිරි දෙව පන්සියයක් දෙනුන් පොවා ඔවුන් කිරි දෙව දෙසිය පණස්දෙනෙකු පොවා ඔවුන් කිරි දෙව එක්සිය පස්විසිදෙනෙකු පොවා ඔවුන් කිරි දෙව සූසැටදෙනෙකු පොවා ඔවුන් කිරි දෙව දෙතිස් දෙනෙකු පොවා ඔවුන් කිරි දෙව සොළොස්දෙනෙකු පොවා ඔවුන් කිරි දෙව අටදෙනෙකු පොවා මෙසේ කිරි ගෙණ බොල් මිහුරු ඕජස් ඇතිවූ කල වෙසඟපුණුපොහොදවස් උදයම නැඟී ඒ අටදෙනුන් කිරිදෙවනා සඳහා මූදෑලු වස්සන් දෙනුන් තනමුලට ලඟ නොවන කල්හි එලවූ නවමු බඳුන් පිරි කිරිවැහුනු කල්හි ඒ පෙළහරදුටු සුජාතා සියඅතින් කිරිගෙණ නවමු බඳනෙහි කිරි එව අගරු දෙව්දුරු සඳුන් කලුවැල් දර උදෑ කිරිබත් පිසන්නට පටන් ගත්. බත් පැසෙන කල්හි මහත් මහත් බුබුලු නැගී දක්‍ෂිණාවෘතතව ඇවිදදී එක ටිකෙකුදු පිටත නොයෙයි. උදුනෙන් මඳ දුමෙකුදු නොනැගෙයි එකල්හි සතරවරම් මහරජහු අවුදු උදුන සතරදෙස රැකවල් ගත්හ. සක්දෙව්රජ අවුදු දෑ බට පෙණහෙලි නඟා ගිනි දල්වයි. මහබඹ ලූප් මුදුනට කොට සේසත් නගා සිටියේය. දශදහසක් ලෝදෑහි දෙවියෝ දෙව්ලෙව්හි මිනිස්ලෙව්හි ඇති තාක් ඕජස් තමන්ගේ ආනුභාවයෙන් දඬුවැල්බෑ මී පෙළා මී ගනනවුන් සෙයින් ගෙණ ඒ බඳනෙහි ඕත්හු. සුජාතා ඒ අසිරිමත් පෙළහර දැක පුනුනම් දැස කැඳවාබැණ මෙතෙක් කල් මෙවැනි මහපෙළහරක් නුදුටුවිරිම් අපගේ දෙවතාවා අද අපට ඉතා පහන්වන. වෙලෙව්ව ගොස් දෙවොල් හැමදවයි එහි නඟා යවූ. හෝ වෙලෙව්ව අජපල් නුගමුලට ගොස් රුක්මුල්හි පැදුම් ලෝදෑ බලා වැඩහුන් මහසත්හු ශරීරයෙන් නික්මෙන සවණක් රසින් සියලුරුක සත්රුවන් රුකක් සෙයින් දිලියෙන සේ දැක අද අපගේ දෙවතාවා රුකින් බැස සියඅතින් කිරිපිඩු පිළිගන්නාට උන්හනැයි බියපත්ව ගොස් සුජාතාවට සැලකළා. හෝ ඇය තෙපුල් අසා සතුටුව ලක්‍ෂයක් වටනා ගණරන් පයක් කිරිබතින් පුරා රන්තලියෙන් පියාලා සුදු පිළියෙකින් වසා තොමෝ සව්බරණින් සැදී කිරිබත් පය තමා සියමුදුනේ තබාගෙණ මහත් පිරිවරින් මහත් පෙරහරින් නුග රුක්මුලට යනනී මහසත්හු දැක සොම්නසින් පිනා රුක් දෙවියා යන සිතින් දුටු තැන් පටන්ගෙණ නතු නතුවෙමින් ගොස් හිසින්

කසුත්පය බහාගෙණ පියන් ගලවා රන්කොතුරුයෙන් සුව
ඳ මලින් වැසූ දියගෙණ අත එව බත්පය අත බහා තබා බැසගෙ
ව වැඳ යම්සේ මාගේ මනොරථය මුදුන්පත්ද එසෙයින්ම තොප
ගේ මනොරථය නිපදීවයි බැණ සුවහස් වටනා රන්පය මහසත්
හට පියා පැදකුණුකොට ගියා. එකල්හි මහසත් ගුනාස්නෙන්
නැගී බත්පය ගෙණ නිල්දලා හෝතෙරට ගොස් හැම මහබෝ
සතුන් බුදුවන දවස් සනාන සූපිතිථ් තොට පය බහා තබා
දියට බැස සනහා සිවුරු හැඳ පෙරවැ පැදුම්දෙස බලා වැඩහිඳ
එකුන් පණස් පිඩක් කොට වලඳා රන්පය ගෙණ ඉදින් මම අද
බුදුවෙම්නම් මේපය උඩුහෝ බලා යේවයි බුදුනොවෙම්නම් යටි
හෝ බලායේවයි දියපිට විහිද. ඒ පය හෝ මැදට ගොස් දියපිටි
න් හෝමැද උඩුහොය බලා අසූහතක්තැන් ගොස් එක්සලාවැටු
මෙක්හි ගැලී මහාකාල නාරජහුගේ භවනයට වැද පෙර තුන්
බුදුන් වැලඳූ තුන්පය මතුකොට එයට යටව සිටිකල්හි මහසත්
ඒ හෝ තෙර සුපිපි සල්වෙනෙහි දිවාවිහාරකොට සවස දෙ
වියත් විසින් සල්වෙනෙහි පටන්ගෙණ බෝමැඩ දක්වා පළල
අටඉස්ඹක් තැන්හි රුවන් පවිරුහා රුවන්වැලි සියෝ රුවන්බිම්
හි රුවන් කලස තබා දිව මහනෙලින් සදා තන්හි තන්හි රුවන්
තොරණ මල්තොරණ නගා රුවන්ඇගෑ මල්ඇගෑ නගා එහි
මිහුරු රැවින් හඬන මිණි කිකිණිදැල් බහාලා නන් විසිතුරු දද
පෙළින් හා සේසතින් සැදූම්ලද මගින් දෙව් බඹ නා ගුරුළු ආදී
න් විසින් වහරේ සෙයින් ඉස්නා දිවකුසුම් පුද ලබමින් දිවනැටු
ම් ගදවූ පවත්නාකල දශදහසක් ලෝද එක් මලස්නාක් සෙයින්
ද එක් ගඳකිළියක් සෙයින්වී සාධුකාරශබ්දයෙන් එකනින්නාදවූ
කල්හි පුන්පැරුම්සෙත්බමුණ දූන් අටමිටක් පමණ කුසතණ
ගෙණ බෝමැඩට එලඹ දකුණු දෙසෙහි උතුරුදිශාබලා වැඩ
සිටියෝ.

එකෙණෙහි දකුණුසක්වළ බැස රසාතෙලෙහි ගැලී ගියාක්
වැනිවිය. උතුරුසක්වළ නැගී බවඅග්හි පහරනනක් වැනි විය.
ඔහුමෙතැන්හි හිඳ බුදුවෙන්ට නොතැත්වනැයි මහබෝරුකපැද
කුණුකොට පැළදෙසෙහිද උතුරුදෙසෙහිද වැඩසිට එසෙයින්
ම ගැලෙන නැගෙණ සේ දැක පැදුම්දෙසට එලඹ නොඇලල
සිටි සේ දැක මේ හැමබුදුන් විසින් අවිජහිත කෙලෙස්පඳුරු වි
දහනතැනැයි තණ අග්හි ගෙණ සලාලා එවිගස නිපන් තුදුස්
හත්තන පළමතුයෙහි මහබෝකඳට පිටදී පැදුම්දසබලා දැම්
දැමූවමැනවිත් බුදුවම්ස නොනැගෙම්සි සිවුරගවර ඉටා වැඩ

හුන්හු. එකල්හි සක්දෙව්රජ එක් සලක් පිඹි කල දශදහසක් යොදුන් තවුතිසා දෙව්නුවර පැතිර සාරමසෙකින් සන්හිඳෙන බවනි ඇති එක්සිය විසිරියන් විජයතුරාසක මහදුරිසා පෙරට පිඹිමින් සිටියේය. එසෙයින්ම පන්සිකා දෙව්පිත් බෙළුවපාඬුව නම් තුන්ගව් පමණ වීණාව ගෙණ වයමින් සිටියේය. සුයාම නම් දෙව්රජ තුන්ගවු පමණ වල්විදුනා ගෙණ සලමින් සිටියේය. සන්තුසිතනම් දෙව්රජ මිණිතල්වැට ගෙණ සලමින් සිටියේය. මහබඹු පුන්සඳක් බඳු සේසත් වඩා සිටියේය. මහාකෙළනාරජ අසූ දහසක් නළුවන් පිරිවරා සතුති කෙරෙමින් සිටියේය. දෙතිස් දෙව්කුමරියෝ දිව්කුසුම් පිරූ රුවන්සුමුගු ගෙණ දුදමින් සිටියාහ. සියලු දශදහසක් සක්වළ දෙවියෝ සැණවෙස් ගෙණ හාත්පස්හි දදපෙළ කෙහෙළිපෙළ මල්දම්පෙළ පුන්කලසපෙළ මිණිදඹුවැටපෙළ අටමගලාපෙළ ගෙණ පොළෝ තෙලෙහි පටන් අකනිටා බඹලෝ දක්වා අනුරු නැතිව සිටියෝ. එකල්හි මරදෙව්පිත් සිදුහත් කුමරු මාගේ විසය ඉක්මවියටි වන, ඔහු කාමවිසය ඉක්ම නොයා දුන මැනවැයි දහසක් අත් මවා ගිනිගෙණ දිලියෙන නොයෙක් ආයුධ ගෙණ යෙල සියයක් යොදුන් ගිරිමෙව්ලා නම් ඇතු නැගී පෙරට දොළොස් යොදුන් දකුණත්පස්හිදු වමත්පස්හිදු දොළොස් දොළොස් යොදුන් පිටිපසින් සක්වළගල දක්වා සිටින නවයොදුන් නොයෙක් වෙස් ගෙණ නොයෙක් අවි ගත් අත් ඇති පොළෝ පැලියන්නාක් වැනි හඩ ඇති මර සෙනඟ පිරිවරා දශදහසක් යොජනෙහි පටන් ගෙණ සෙන සුවහස් බස්නා කලක් බඳු ඝොර බිරම් මහහඩින් මුළුලොව එකනින්නාද කෙරෙමින් සිදුහත් කුමරු ගණුව අනූව විදුව පය ගෙණ පරසක්වළ පියව යි ඇනාවමින් එයි. ඔහු එසේ මරසෙනඟ ගෙණ එත් එත් දශදහස් ලෝදූහි දෙව් බඹහු නතු නතුව දෙසෙහි නැගී පැලහ. මහාකෙළ නාරජ පොළෝ කිම්ද පන්සියයක් යොදුන් මන්දෙරික නම් නාගභවනයට ගොස් දෙහොහින් මූනූනා පියාලා හොත්තේය. සක්දෙව් රජ විජයතුරා සක පිටට කොට ගෙණ ගොස් සක්වළ මුවවිටියෙහි සිටියේය. මහබඹු සේසත් එකස්කොට හෙලා පියා බඹලෝ බලා ගියේය. මෙසේ හැම දෙව් බඹුන් පැලූ කල්හි මහසත් එකලාව හිඳ පිටිපසින් එන මරසෙනඟ දැක මෙතෙක් දෙනා මා හුදකලාහු හා සමග යුධයට එති, මෙහි මාගේ කිසි නෑ කෙනෙකුත් ඇතනාහු නොවෙති දශපාරමිතාවෝ මා විසින් බොහෝ කලක් පුරුදු යොධයන් වනනාහ එ බැවින් පාරමිතා බලයෙන්

මර බල මැඩ පිය මැනවැයි පැරුම් සිඹිදිමින් වැඩහුන්හ. එකල්හි මර පිරිස් ගල් සෙල් සෙයින් වැතිරෙමින් අවුලූ වටාගත්හු. එකල්හි මෙසින් ම මොහු ලූහුබැඳ පිය මැනවැයි මරහු විසින් මවනලද මහඝුලඟ සතර දෙසින් නැඟී යොදුන් දෙයොදුන් තුන් යොදුන් පමණ ගල්කුළුහු උදුරා අහසට නගා ලා වනදහඝුදු රු කුහුදු එසෙයින් ම උදුරා අහසට නගා ලා සුන් සුන් කෙරෙමින් ගොස් මහසත්හු කරා පැමිණ සිවුරෙහි කොණකුත් සලනනට නොපොහොසත්ව ගියෝ. ඉක්බිති දිරෙහි ගලා මරා පිය මැන වැයි වලාකුළු දහස් සුවහස් නගා පොළො සිල්කොට පියනනා සේ වස්වනලද වැසි වනඟිස් ගලමින් ගොස් මහසත්හුගේ සිවුරෙහි පිනිබිඳක් සා දියබිඳක්ද නොහෙළීය. ඉක්බිති පහණවැසි වස්වන මරහු විසින් මවනලද මහත් මහත් ගල්කුළුහු දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණ දිවමල් වගුල බවට ගියෝ. ඉක්බිති අවි වැසි වස්වනලද මරහු විසින් මැවූ නානාවිධ ආයුධයෝ දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණ දිවමල්දම් බවට ගියෝ. එසෙයින් ම මවනලද අඟුරුවැසිදු දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණ දිවමල්බවට ගියෝ. එසෙයින්ම මවනලද හළුවැසිදු දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පා මුලට වැද දිවසඳුන් සුණු බවට ගියෝ. එසෙයින් ම මවනලද සියුම් වැලි වැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණ දිවකුසුම් රෙණු බවට ගියෝ. එසෙයින් ම මවනලද කලල්වැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පාමුල දිවගඳබවට ගියෝ. ඉක්බිති සිදුහත් කුමරු බවා ලූහුබැඳ පිය මැනවැයි මරහු විසින් මවනලද සිවුරඟින් යුත් මහඅඳුරු මහසත්හු කරා පැමිණ හිරුරසින් බුන් බහලාන්ධකාර සෙයින් අතුරුදහන් වී. මෙසේ මරහු මේ නව මහා වැසෙසන් මහසත්හු නොනට සේ දැක කෝ ගිනින් දිලී මෙරනල් සක්වළගල් පවා කිලිල් සෙයින් කඩනනට පොහොසත්වූ තමාගේ චක්‍රායුධය මහසත්හට වුහුට. යේ ගොස් මහසත්හු මුදුනේ මල්සත් සෙයින් සිටියේය. එකල්හි මර පිරිස් විසින් විහිදුනාලද ගල්කුළුහුද අවි සුවහස්හුද දුමමින් දිලියෙමින් අහසින් ගොස් පැරුම් සිඹිදිමින් හුන් මහසත්හු කරා පැමිණ දිවකුසුම්ව වගුළෝ. දෙව්යෝ සක්වළ මුවවිටියෙහි සිට කර නගා නගා සිදුහත් කුමරහුගේ රූපසුව නටහොසි නොනට හොයි බලත්. එකල්හි මරදෙව්පිත් කෙළවරට නකාගත් චක්‍රායුධයෙන්දු කරණු දූ නැති සේ දැක මහසත්හු කරා

එලඹ සිදුහත්කුමර තෙල පළඟින් නැගී යා පළඟ තා නොගත්තේය මා ගත්තේය යි කීය. කියග මාරය පැරුම්පිරූ මහබෝසතුන් බුදුවන දවස් පැමිනෙන පළඟ තා ගැතිබවට දෙස්හු කවරහ යි කීහ. මොහු හැමදෙන ම දෙස්හ යි මර සෙනඟහට හත පෑ කල්හි මරපිරිස් වැසියන් විසින් මම් දෙස්මි මම් දෙස්මි යී පොළොව පැලී යන පමණ හඬ නැගූ කල්හි මරහු විසින් සිදුහත් කුමර තට දෙස්හු කවරැ යි කීයෙන් මට මෙතැන දෙස් කියන්නට නිසි සිතක් ඇති කෙනෙක් ඇතතාහු නොවෙති යී කියා සෙසු අත්බැව් හැර වෙසතුරු අත්බැව සතසනු මහදන් දුන් තැන් පටන්ගෙණ, සිව්රුගැබින් දකුණත් නෙරා පැරුම් බිම් බලා රැව් දි හඬා දූන් සුමට නොබැණ්ගි පොළොවට අත දිගුකළහ· එවිට මහපොළොව දහස් සූවහස් රැව් විනිද හැඬුහ. එ සඳ යෙලසියයක් යොදුන් ගිරිමෙව්ලා නම් ඇත් දන බිම එව බැස හෙව මහපුරිසා සරණ ගියේ. මරදෙව්පිත් බිය පත්ව මරපිරිස් හා සමග ගත් ගත් අව් පිළි පලඳනා පියා පැලා. එකල්හි දෙව් බඹහු පලා යන මරපිරිස් දූක මර පැරදී ගියයි සිදුහත්කුමරු ජය ගනිය ජයමගුල් කරම්හ යි නාසින් කරා නායි යවූහු. ගුරුළුන් ගුරුළුන් කරා යවූහු. දෙව්යන් දෙව්යන් කරා යවූනු. බඹුන් බඹනු කරා යවූනු. මෙ සෙයින් දශදහසක් ලෝද, වැසි දෙව් බඹනු සතුටු සොම්නස්ව ජයමගුල් ගොස් අසමින් ගඳ මල් ගෙණ අවුදු මහසත්හු පිරිවැරුහ. මෙසෙයින් මහපුරිසා හිරු නොඉප්සෙන තුරු මාරවිජයකොට පෙරයම්හි නොයෙක් ඉකුත් දූ කෙළ සූවහස්නි නොපැකිල පවත්නා පූවෙණිවස්නුවන ලදින්, මැඳුම්යම්හි අනත් අපරිසේ ලෝදැගි තම තමන් කළ කැමින් දුක් විඳිනා සුව විඳිනා සතුන් නිරවසෙස්නෙන් දක්නා දිවස් නුවන උපයා, අලුයම්හි දෑළොස් අඟින් යුත් පිළිසමුපාවට විවට විසින් අනුලොම් පිළිලොම් විසින් සිම්දුත් දශදහසක් සක්වළ දිය පොළොව අවසන් කොට දෑළොස් වටෙක කම්පිත විය. මහසත් වනාහි දශදහසක් ලෝද, ගුගුරුවා අරුණු නැගෙණ වේලෙහි සව් කෙලෙස් පහා බුදුවී.

එකල්හි පැදුම් සක්වළ මූවව්ටියෙහි සිට නැගූ දදයෙහි අක් පැළසක්වළ මූවව්ටියෙහි ලෙලෙයි. පැළසක්වළ මූවව්ටියෙහිසිට නැගූ දදයෙහි අක් පැදුම්සක්වළ මූවව්ටියෙහි ලෙලෙයි. උතුරුසක්වළ මූවව්ටියෙහි සිට නැගූ දදයෙහි අක් දකුණුසක්වළ මූවව්ටියෙහි ලෙලෙයි. දකුණුසක්වළ මූවව්ටියෙහි සිට නැගූ දදයෙහි අක් උතුරුසක්වළ මූවව්ටියෙහි ලෙලෙයි. පොළෝ තෙ

ලෙහි සිට නැගූ දදයෙහි අක් අකනිටා බඹලොව ලෙලෙයි. අකනිටාබඹලොව සිට නැගූ දදයෙහි අක් පොළෝතෙලෙහි ලෙලෙයි. එදා දශදහසක් සක්වළ එක් දදවනයක් සෙයින්ද එක් මල්අස්නක් සෙයින්ද එක් ගඳකිළියක් සෙයින්ද එක් මල්කලඹක් සෙයින්ද සැදුම්ලදී. මෙසෙයින් බුදුහු ගිනිගත් යපිඩෙක්හි අබ්බාසෙයින් තමන් සතන්හි සිටි කෙලෙස් වාසනලවත් නොතබා මහ නුවනින් කඩා සව්නේ දැන "අනෙක ජාති සංසාරං" යනාදි විසින් උදන් ඇනුහු [මෙතෙකින් නොවියත් භූදිජනයන් සඳහා කරණලද අමෘතප්‍රවාහයෙහි] සචසනතාන දමනා නම් දෙවෙනි පරිච්ඡේදය නිමි.

---

# 3 වෙනි පරිච්ඡේදය.

මෙසේ බුදුව උදන් අනා හිඳ මම් මේ සිවුරුසැකි කප්සුවහසක් මේ පළඟ සඳහා හිස් කඩා දින්මි. ඒ තාක් කල් මේ පළඟ සඳහා ඇස් උපුටා දින්මි. හදමස් උපුටා දින්මි. රන්ලිය සෙයින් චොර ජනා දරුවනුදු නවයොව්නෙන් හොබනා අඟනනුදු අත්හට දස් කොට දින්මි මෙහිම හිඳ මාරවිජය කෙළෙමි. මා මෙහි හුන් නානුගේ මනදෙළ පිරිනා. මේ පළඟින් දැන් නොනැඟ මැනවැයි අනේ කෙළ සුවහස් සමවත් සමවැජම්න් සතියක් එහිම වැඩහුන්හු. එකල්හි ඇතම් දෙව්කෙනෙක් සිදුහත් කුමරු නව පළඟ නොපියයි බුදුනුවූයේ දොහෝ යි සිතූහු. එකල්හි බුදුහු දෙවියන්ගේ අදහස්දැන අහසට නැගී ඇඟින් යුවල යුවල කොට ගිනිකඳ දියකඳ විහිදුවමින් සවණක් රැස් විරම්න් යමාමහ පෙළහර දක්වා දෙවියන්ගේ කුකුස් හැර අහසින් බැස මහබොයින් ඉසානදෙසෙහි වැඩසිට මේ රුක්මුල්හි හිඳ බුදුවීමි යි සිවුරුසැකි කප් සුවහසක් පිරූ පැරුමෙහි පල ලද තැන් සත්දවසක් එක් ඉරියව්යෙන් වැඩසිට ඇසිපිය නොහෙලා පස්පෑ දිස්නා දිගු පුළුල් ඇසින් පිදූහු. ඉක්බිති බෝ පළඟ හා නුවනින් පිදූතැන් හා දෙඅතුරෙහි දෙවියන්මැවූ පැළ පැදුම්දික්හි රුවන් සක්මන්හි සත්දවසක් සක්මන් කළෝ. ඉක්බිති මහබොයින් වයඹ දෙසෙහි දෙවියන් මැවූ රුවන්ගෙයි වැඩහිඳ සත්දවසක් දහම් සිම්දියෝ. මෙසේ සතර සතියක් බෝමැඩ දවස් යවා අජපල්නුගමුලට එළඹ එහි වැඩහිඳ සත්දවසක් සමවත් සුව අනුභව කළෝ. එකල්හි මාරකන්‍යාවෝ තිදෙන බුදුන් කාමපාසයෙන් බැඳ ගෙණ

සම්භ සි අවුදු තුන්දෙන තුන්සියක් විලස් දක්වා නොයෙක් ලීලායෙන් භාවභාවයෙන් පෙලඹිය නොහැකිව පැරද ගියෝ. ඉක්බිති මුදලිඳු විල්තෙරට එළඹ මිදෙල්රුක් මුල්හි වැඩහුන්හු. එකල්හි මුදලිඳුනාරජ විලින් නැගී දසඇග හැසී ගැවසී සිටි නිල් වදුල් දක බුදුනට වැසි සුලඟ මැසි මදුරු පිරිපත් වලකනු සඳ හා වටා සත්දරණපටක් එව පණයෙන් සොයාගෙණ සිටියේය. බුදුහු පිළිම්ණිමුවා ගඳකිළියෙන්හි වසනුවත් සෙයින් දරණගැබ සත්දවසක් සමවත් සුවයෙන් දවස් යැවූහු. ඉක්බිති කිරිපලු වනයට එළඹ කිරිපලුරුක් මුල්හි වැඩහිඳ සත්දවසක් සමවත් සුවයෙන්ම දවස් යවූහු. මෙසේ සත්සතිය එකුන්පණස් දවසක් අහරකිස නැතිව සමවත් සුවයෙන් දවස් යවූ කල්හි සක්දෙව්රජ අමාඅරළු ඇර දින. ඒ වැලඳූ කල්හි බුදුනට සිරුරුකිස ඇති විය. ඉක්බිති ඔහුම දුන් නාලිය දැහැටි වලඳා අනොතත්ත විල දහතලා පැනින් මුව දෙව එම රුක්මුල්හි වැඩහුන්හු. එ සඳ තපස්සු භල්ලුක නම් දෙබෑ වෙළඳෝ පන්සියයක් ගැලින් බඩු ගෙණ කිරිපලුවනය වෙතින් යෙත් පෙර ඔව්න් නෑවූ දෙව්දුවක් ඒ වනයෙහි වසන්නී ඔව්න් ලවා බුදුනට දත් දෙව්යපිව ඔව්න්ගේ පන්සියයක් ගැල් නැබ දක්වා පොළොව ගලාපිව. ඔව්න් ගඳමල් දුම් පුදා දෙව්යන් අයදනට වන් කල්හි දෙව්පිරිස් පිරිවරා අහස සිට දෙව්දූ බුදුන්ගේ අපමණ ගුණ කියා බුදුනට දන් දෙනුකළා. ඔව්හු මීපිඩු ගෙණ බුදුන් කරා එළඹ මීපිඩු පිළිගන්නට අයදියහ. මහබඹහු දුන් පය බුදුහු කිරිපිඩු පිළිගත්නා දවස් අතුරුදන් විය. කිරිපිඩු පිළිගත් පය නාලෝ වැසියනට සෙත් නිසා නා විමන් ගියේ. බුදුහු කිමෙකින් මීපිඩු පිළිගණිම් හොයි සිතූහු. එසඳ සතරවරම් රජහු ඉඳුනිල්මිණිමුවා සතරපයක් එළවූහු. බුදුහු ඒ පා නො පිළිගත්හ. එකල්හි මුගුවන් පැහැ ඇති සෙල්මුවා සතරපයක් එළවූහු. බුදුහු සතරදෙව්පුතුන් කෙරෙහි අනුකම්පායෙන් සතරපය පිළිගෙණ මතු මනොහ තබා එකක් වේවයි ඉටූහ. සතරපය මුවවිටි පැණෙන සතරහිරක් ඇති එක් පයක් විය. බුදුහු ඒ පයින් මීපිඩු පිළිගෙණ වලඳා අනුමෙවුනි කොට බුත්සරණ දහම්සරණ දෙක පිහිටිවූහ. ඔව්හු පුදනනට නිසි වතෙක් ඇරවූහු. බුදුහුද ජලවුල් අත්ලෙන් හිස් පිරිමැද කෙස්දා දී වදාළහ. ඔව්හු රුවන් කරඬුයෙන් පිළිගෙණ රතයෙහි වඩා තබා පුදකෙරෙමින් සියනුවර ඇර දාගැබකොට දා නිදන්කළුහ.

බුදුහු හුනස්නෙන් නැගී අජපල් නුගමුලට එළඹ එහි වැඩ

හිඳ තමන් පිළිවුදු දහම් ගැඹුරුසේ සතුන් කෙලෙස් බැරිසේ
සිතත් සිතත් බුදුනට දහම් දෙසම්හ යන සිත් නො උපන. එ
කල්හි මහබඹු බුදුන්ගේ අදහස් දැන මුළුලෝ නැසිනැයි දසද
හසක් ලෝදා උපුල්වා මහහඬින් හඬා දසදහසක් සක්වළ දෙව්
බඹපිරිස්හු දික්කළ අතක් වක්නොකරණ තුරු අවුදු බුදුන් පෙර
ට පෙණී බුදුන් වැඳ අඬදැනිව මුදුනෙහි ඇඳිලි බැඳ දම් දෙසුව
මනාසේයට ආරාධනා කළෝ. එසඳ බුදුහු බුදුඇසින් දසදහස
ක් ලෝ බලනුවෝ විනෙජනයන් දැක මහ බඹහු අයජනෙන්
ගිවිස පළමු කාහට දම් දෙසම් හොයි සිතා ආළාරක නම්ද උදරම්
නම්ද දෙමහතව්සෝ නුවන ඇතියවූහයි බලනුවෝ ඔවුන් එය
ට පෙරටුව මිය අරුතල ගිය සේ දැක පස්වග සඟුන් තමහට ව
හල් සේ සිතා ඔව්හු කොයි වෙසෙති හොයි බලනුවෝ බරනැ
ස නිසා ඉසිපතන්හි වසනුවන් දැක එයට ගොස් ඔවුන්ට දම්සක්
පැවැත්වූව මැනවැයි කිහිපදිනක් බෝමැඩ අබියෙස්හි වැස ඇ
සළපුණු පොහොදවස් බරනැස් වඩනට අටළොස්යොදුන් මග
පිළිපන් බුදුහු අතරමග උපකනම් ආජීවකයක්හු දැක මත්තේ
ඔහුට වන වැඩ දැක තමන් බුදු පරිදි වදාරා එදවස් සවස්වේලෙ
හි ඉසිපතන් වැඩියෝ. පස්වග සඟහු බුදුන් වඩනවුන් දුරින්
දැක මේ ඉසුරුකුලෙහි ඉපිද සිනිදුඅහර වලඳා පිරිහුන් සිරුරුඇ
තිව පහත් ඉඳුරන් ඇතිව රත්වන්ව එයි මුහු නොදවඳුම්හ උතු
ම්කුලෙහි උපන්බැවින් හිඳිනා අසුන් දෙම්හ යි අස්නක් පනවා
තුමූහු කතිකා කොට ගෙණ හුන්හු. බුදුහු ඔවුන්ගේ අදහස් දැන
හැම සතුන් කෙරෙහි පැතිරසිටි මෙත්සිත් හකුළුවා ඔවුන්කෙරෙ
හි පැවැත්වූහ. ඔව්හු බුදුන් වඩූත් වඩූත් තමන්ගේ කතිකායෙහි
නොපිහිටියෝ හුනස්නෙන් නැගී ගොස් වැඳ පා සිවුරු ගෙණ
වඩා හිඳුවා පා දෙවා බුදුබව නොදනනාහු නම් කිය කියා බෙ
ණෙති. එකල්හි බුදුහු මහණෙනි මට නම්තුදු ආවුසොවාදයෙ
නුදු ව්‍යවහාර නොකරව් මම් රාත්මියි තමන් බුදුවූ බැව් හඟවා
පැනවූ උතුම් අස්නෙහි හිඳ දශදහසක් ලෝදාහි දෙව් බඹ පිරිස්
පිරිවරා වැඩහිඳ පස්වග මහසඟුන් අමතා දම්සක් පැවතුම්සුත
දෙසූහු. ඔවුන්කෙරෙහි කොණ්ඩඤ්ඤ මහතෙරහු සෝවාන්වූහ
අටළොස් කෙළක් බඹහු රාත්වූහ. අසඞ්ඛ්‍යයක් දෙවියෝ සෝ
වාන් සැදෑගැමි අනාගැමි වූහ. බුදුහු එහිම වස් එළඹ තුබූ සතර
දෙනාහට සතරදවසක් අවවාදකොට සෝවාන්කළෝ. විසෙනි
ය පස්දෙනාහට අනත්ලකුණු සුත් දෙසා රාත්කළෝ. එකල්හි
බරනැස යසනම් සිටිදූරියෙක් හිමන් ගිමන් වසන් [යන] තුන්

ජිතුවට කරණලද තුන් පහාගි නළුපිරිස් පිරිවරා උඩුමහලෙන්
යටිමහල් නොබැස වසනුයේ එදවස් රෑ නැටුම් ගදවුන් විඳි
මින්ම හෙව නිදනුයේ පිබිද තමන් තමන් ගත් පසගතුරුයෙහි
වැතිරහෙව නිදන මාගමුන්ගේ විකාර දැක සංවෙග ඇතිව හො
ත් යහනින් නැගී රුවන් මරවැඩිසගල පයින් ගෙණ පහයින් බැ
ස නුවරින් නික්ම ඉසිපතන් ගොස් අලුයම්හි විහාරයෙන් නික්ම
අබවස්හි දිලියෙන පහන් රුකක් සෙයින් සිට සක්මන් කරණ
බුදුහු දැක "මොබ එව යස"යි වදාළ කල්හි නිසකව අවුදු වැද
දම්දෙසුම් අසා සෝවානව්. අලුයෙහි සොයමින් ආ පියහට දෙ
සූ දෙස්නෙන් පිය සෝවාන් විය. ඔහු සබඳ සෙසු සිටුදරුවෝ
සිවුපණස් දෙනෙක් ඔහු පැවිජි වූහ යනු අසා ඉසිපතන්
ගොස් දැක බුදුන් කෙරෙන් බණ අසා එහිභික්ඛුභාවයෙන් පැවි
ජිව රහත්වූහු. මෙසේ ලොකයෙහි බුදුන් ඇතුළුව රහතුන් එක්
සැටදෙනෙකු නිපන් කල්හි බුදුහු වස්වැස පවරා මහණෙනි අ
නව් සැරිසරනුහට එලඹෙව් දෙදෙනෙක් එක්මගකින් නොයව්
ගිය ගිය තැන් දම් දෙසව් සත්වැඩසාහවයි සඟුන් සැටදෙනා ඒ
ඒ තැන් නගා යවා තුමූ උරුවෙල්දනව් වඩනාහු අතරමග කපු
වනළුයත්හි කෙළනට ගිය රජකුමරුවන් තිස්දෙනාහට දම් දෙ
සා සෝවාන් සැදැගැමි අනාගැමිකොට එහිභික්ඛුභාවයෙන් පැවි
ජිඳි සැරිසරනුවට නගායවා උරුවෙල්දනව් එලඹ තුන්දහස්පන්
සියසොළොස් පෙළහරක් දක්වා තව්ස් දහස් පිරිවරණලද උ
රුවෙල් කසුප් ගයාකසුප් නදීකසුප් නම් තුන්මහතව්සන්ගේ
දූලද බිඳ එහිභික්ඛුභාවයෙන් පැවිජිඳි ගයාසිසයෙහි වැඩහිඳ ආ
දිත්තපරියාය සූතත් දෙසා රහත්කොටගෙණ රහත්සඟුන් දහස්
පිරිවරා බිම්සර මහරජහට දුන් පිළිනයෙන් මිදෙනු සඳහා රජ
ගහනුවර අබියෙස්හි යටිවනා උයන් වැඩියෝ.

එකල්හි රජ බුදුහු වැඩිය පරිදි උයන්පලලා අතින් අසා දෙ
ළොස්නුහුවක් බමුණන් හා ගෘහපතීන් පිරිවරා අවුදු තරුපිරිවරණ
ලද සුපුන් සඳක් සෙයින් සඟපිරිස් පිරිවරා සවණක් ඝන බුදුරසි
න් දිලියෙමින් වැඩහුන් බුදුන් දැක සක්ලකුණෙන් විසිතුරු පතු
ල් වැඳ සහපිරිවරින් එකත්පස්ව හුනා. එකල්හි ඒ පිරිස් අතුරෙ
න් ඇතම් කෙනෙක් කිමහෝ මහණ උරුවෙල්කස්බන් නිසා බ
ඹසරවස් සෙරෙයි හොයි උරුවෙල්කස්බෝ මහණහු නිසා බඹ
සරවස් සෙරෙයි හොයි සිතූහු. බුදුහු ඔවුන්ගේ අදහස් දැන
කාස්බ ජනයන් සිත කුකුස් හර යී වදාළෝ. එකල්හි උරුවෙල් ක
සුප් මහතෙරහු හුනස්නෙන් නැගී බුදුන් වැඳ බුදුහු මට ගුරුහ

මම් බුදුන්ගේ සව්යෙම්යි අහස්හි තලයක් පමණ තැනට නැඟී
දුම දුමා දිලියෙමින් සක්මන් කෙරෙමින් අතුරුදන් වෙමින් අහ
සින් බැස බුදුපා වැඳ තමන් සව්පරිදිහගවා දෙවනවට අහස්හි
දෙතලයක් පමණතැනට නැඟී තුන්වනවට තුන්තලයක්පමණ
තැනට නැඟී සතරවනවට සතරතලයක් පමණ තැනට නැඟී
පස්වනවට පස්තලයක් පමණ තැනට නැඟී සවනවට සතලයක්
පමණ තැනට නැඟී සත්වනවට සත් තලයක් පමණ තැනට
නැඟී දුමදුමා දිලී හෙව හිඳ සිට සක්මන්කොට අතුරුදන්පැමින
පෙළහර දක්වා අහසින් බැස බුදුනු මාගේ ගුරුහ මම් බුදුන්ගේ
සව්යෙම්යි බුදුන්පාවැඳ එකත්පස්ව හුන්හ. එකල්හි මුළුපිරිස්වැ
සියෝ ඒ පෙළහරදුක බුදුහු මහානුභාව ඇතියවුහ දුලදගෙණ
රාත්මියි වැටෙන උරුවෙල් කස්බන්පවා දුලදබිඳ බුදුන්විසින් දම
නලදහයි බුදුන්ගේ ගුණ වැණුහු. බුදුහු මොහු දැන් මතු දැමූ
යෙම් නොවෙම් අතිතයෙහිදු දැමූයෙම් ඔවුන් මියුලුනුවර අහා
තිනම් රජක්ව ගුණනම් නිවටක්හු කරා එලඹ මෙලෝ නැති
කම්නැති දුලද ගෙණ වැටෙන කල්හි තමන් බඹලොව ඉසිවෙ
සින් අවුදු දම්දෙසා දුලද බුත් පරිදි දක්වමින් “මහානාරදකාසස
පජාතක”ය දෙසා සිවුසස් වදාළහ.

එසඳ බිම්සරමහරජ එකොළොස් නුහුවස්දෙනා හා සමග
සෝවාන්විය, එක්නුහුයෙක් වැඳ සරණගියෝ, රජ බුදුන්කෙ
රෙහි හිඳ තමාගේ පස්වනදෙළක් පිරුණුසේ කියා සරණගොස්
සෙටදවසට පවරා හුනස්නෙන් නැඟී බුදුන් වැඳ පැදකුණු කො
ට නුවරගියෝ. අලුයම්හි බුදුන් දුටු නුදුටු අටළොස් කෙළක්
රජගහවැසියෝ බුදුන් දක්නට උදයම නුවරින් නික්ම යට්
වනඋයන් ගියෝ තුන්ගවුමග නොපොහොනුවිය. සියලුයට්ව
න උයන් මිනිසුන් විසින් අතුරු නැතිවිය. මහජනයෝ තමන්
ගේ ඇස්පසුරෙන් බුදුන්ගේ රුමුහුදු පිහිණා පරතෙර නොදැකක
හෙත්, මෙසේ දෙතිස්වරලකුණෙන් සැදුම්ලද අසූ අනු ව්‍යඤ
නයෙන් දිලියෙන බුදුන්බඳ බලන මහජනා උයනදු මගදු
අතුරුනැතිව හැසී ගැවසී ස්ව් කල්හි එක් පැවිජ්කෙනෙකුනුදු
නික්මෙන්නට අවසරනොවී. එකල්හි සක්දෙව්රජ බුදුන් ස
ඟුන් සුන්බත් වන බියෙන් යහපත් මනව්වෙසක් මවාගෙණ
බුදුන් පෙරමගට බැස සිට දෙවානුභාවයෙන් අවසරකොටගෙ
ණ බුදුන්ගේ ගුණ වණා යසගී කියමින් පෙරටුව ගියේ. මහජන
යෝ ඔහුගේ රුසිරි දැක අපි මෙවැනි දරුවකු යම් කලෙක නු
දුටුවිරුම්හ මේ කෙසේ වූ දැරියෙක හොයි කීහ, එකල්හි දෙ

විරජ තෙම බුදුන්ගේ මෙහෙකරු පරිදි කීහ. බුදුහු සක්දෙව් රජ අවසරකොට දුන් මග පිළිපැද මහණ දහස් පිරිවරා රජගෙට වත්හ. රජ බුදු පාමොක් මහසඟනට දන් දී වහන්ස මම තුණුරුවන් විනා වාසය කරනනට නොහැකෙකමි වේලේ වූව මැනව නොවේලේ වූව මැනව බුදුන් කරා එළඹෙමි සී, යටිවන උයන් ඉතා දුර මේ මාගේ වේළුවන උයන් නොද දුර නොද ආසනනය යන එන කලට සුවය බුදුනට රිසි සේවස්නට මාගේ මේ උයන් පිළිගන්නේ මැනවැයි රන්කොතුරුයෙන් මලින් ගඳින් වැසුනු මිණිවන් පහන් දිය ගෙණ වේළුවන උයන් දෙනුයේ බුදුන් අත දිය ඔත. බුදුහු උයන් පිළිගත් විගස බුදුසස්නෙහි මුල් බටහ සී මහපොළොව ගුගුළ. දඹදිව්තෙලෙහි වේළුවන උයන තබා පොළොව ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති, ලක්දිව මහවෙහෙර තබා පොළොව ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති. බුදුහු වේළුවන උයන පිළිගෙණ රජහට අනුමෙවෙනි කොට හුනස්නෙන් නැඟී සඟුන් පිරිවරා වේළුවන උයන් වැඩියෝ. එකල්හි සැරියුත් මහමුගලන් දෙදෙන දෙසිය පණස් දෙනෙකුන් ගෙණ බුදුන් කරා එළඹ එහිභික්ඛුභාවයෙන් පැවිජිව සහපිරිවරින් රාත්ව අගසව් තන් පත්වූහු. මෙසේ බුදුහු වේළුවනඋයන්හි සත්වැඩ සාහමින් වසන කල්හි සුදෙවුන් මහරජාණෝ ම පුතනුවෝ බුදුව දම්සක් පවත්වා රජගහ නිසා වේළුවනඋයන්හි වෙසෙති යනු අසා එක් මහ ඇමැතනක්හු දහසක් පුරුෂයන් පිරිවරා රජගහානුවර ගොස් සුදෙවුන් මහරජාණෝ තොප දක්නැටියහ සී ම පුතනුවන් ගෙණ අව මැනවැයි නගා යවූහු. හේ ඉතා මැනවැයි සුදෙවුන් මහරජානන්ගේ තෙපුල් මුදුනෙන් පිළිගෙණ දහසක් පුරුෂයන් සමග වහාම සැටයොදුන් මග ගෙවා ගොස් බුදුන් පිරිස් මැද වැඩහිඳ දම් දෙසන වේලායෙහි වෙහෙරට වැද රජුගේ හසුන් දැන් තබම්හයි පිරිස් අනතයෙහි සිට බුදුන් කෙරෙන් බණ අසා සහපිරිවරින් රාත්ව නොබැණ බුදුන් කෙරේ විසී. රජාණෝ එම නියායෙන් අනික් අට වරෙක්හි දහස් දහස් පුරුෂයන් පිරිවර දී ඇමැනනන් අට දෙනෙකුන් යවූහු. ඔහු හැමදෙනා [බණ අසා] රාත්ව පැවිජී වී නොබැණ බුදුන් කෙරෙහි ම විසූහු. රජාණෝ අස්නකුදු ඇර ක්යන කෙනෙකුන් නොලදින් එතෙක් දෙනා කෙරෙහි මට සිනැහැනනක් නැතෙතන් මට හස්නකුදු ඇර නොකිහ මා කිවාක් කරතෙනක් කවරහොයි බලනුවෝ තමන්ගේ හැම කායඹී සා

ධනයෙහි ඇතුළත් විස්වස් ඇති පුතනුවන් හා එක් දවස් උප
න් වැලිකෙළියෙහි පටන් ගෙණ ඔවුන් හා පුරුදු සබඳ "කාලු
දැසි"නම් ඇමැතනක්හු දැක ඔහු කැඳවා ගෙණ ම පුතනුවන් දැ
කකැටිව නව වරෙක නව දහසක් පුරුෂයන් දී නව ඇමැතනකු
යැවීම් එකකු අවුදු හස්නකුදු නොකිහ, දිවියෙහි නියත නැ
ති මා දිවි ඇති විගස ම පුතනුවන් ඇර මා දක්වන්නට නිසෙස
හිදැයි කිහ. මහරජ මම් පැවිජි වනනට අවසර ලැබෙ නම් නි
සෙසම්යි කීය. තෝ පැවිජිව හෝ නොපැවිජිව හෝ ම පුතනු
වන් ඇර මා දක්වාලන්නට නිසෙසහිදැයි කිහ. ගේ ඉතා මැන
වැයි රජුනන්ගේ අසුන් ගෙණ රජගහනුවර ගොස් බුදුහු දම්
දෙසන වේලෙහි පිරිස් අනතයෙහි සිට බණ අසා සහපිරිවරින්
රාත්ව එහිභික්ඛුභාවයෙන් පැවිජි වී. ඔහු සතට දවසක් ගිය කා
ල මැදින්දින පුර පොහෝ දවස්හි හිමන්කල් ඉකුතෙත්ය වසන්
කල් පතෙත්ය පොළෞ්තල නීතණයෙන් ගැවසීගතෙත්ය වන
ලැව් මල් පිපියේය වඩනට නිසි කලැයි අමතා බුදුන් කරා එ
ලඹ සැට ගයකින් බුදුහු කුලනුවරට එලඹිය මනා පරිදි කියා
ගමන් පැනවූහු. එකල්හි බුදුහු කිම උදය මිහුරු රසයෙන් ගමන්
වනෙනහිදැයි වදාළෝ. එසඳ මහතෙරහු වහන්සේ මොබ පිය
සුදෙවුන් මහරජුනෝ මොබ දැකකැටියහයි කීහු. මැනව උදා
ය නෑයනට සඞ්ග්‍රහ කරම්හයි බික් සඟනට සැලකරව යී වදා
ළෝ. මැනව වහන්සේ යී ගොස් සඟනට සැලකළහ. සඟහු
අවුදු බුදුන් පිරිවැරූහු. බුදුහු අඟු මගධ දෙරට වැසි කුලදරුව
න් දශ දහසක් දෙනා හා කිඹුල්වත් වැසි දශ දහසක් දෙනා හා
මෙසේ විසි දහසක් සඟුන් පිරිවරා හස්ගණ පිරිවරණලද හස්රජෙ
කු සෙයින් රජනහ නුවරින් නික්ම එක් දවසකට එක් යොදුනක්
බැගින් රජගහනුවරින් සැටයොදුන් කිඹුල්වත් නුවරට යොජ
නෙන් යොජනෙහි වෙහෙර වෙසෙමින් දෙමසෙකින් ගිය මැන
වැයි නික්මුණාහුය. මහතෙරහු බුදුහු නික්මුණු පරිදි රජහුට
සැලකළ මැනවැයි අහසින් ගොස් රජගෙයි පා මුල වූහු. රජු
නෝ මහතෙරුන් දැක සතුටුව මහරහපලක් මතෙත් වඩා හිඳු
වා තමහට සුතුකොට තුබූ නන් රස බොජුනෙන් පය පුරා දුන්
හ. මහතෙරහු හුනස්නෙන් නැඟී යන ආකාර දක්වූහු. හිඳ
වළඳන්නේයයි කියෙන් බුදුන් කරා ගොස් වළඳම්හයි කීහු.
බුදුහු කොය පුතනුවෙති කීයෙන් විසි දහසක් සඟුන් පිරිවරා
තොප දක්නට නික්මුණාහ යි කීහු. රජුනෝ සතුටුව තොපි
වළඳව් ම පුතනුවන් මේ නුවරට එන තැන් දක්වා මොබින්

බත් ගෙණ වඩවයි කීහ. මහතෙරහු ගිවිසූහ. රජානෝ මහතෙරුන් වලඳවා පය ගද සුනෙනත් උලා පියා උතුම් බොජ්නෙන් පුරා බුදුනට දෙවයි මහතෙරුන් අත තුබූහ. මහතෙරහු හැම දෙනා දක්නා සේ පය අහසට විහිද තුඹු අහසට නැගී බත් ඇර බුදුන් අත තුබූහ. බුදුහු වැලඳූහු. ඒ නියායෙන් මහතෙරහු දවස දවස බත් ගෙණ යෙති. බුදුහු අතරමග පියමහ රජානන්ගේ ම බත් වැලඳූහු. මහතෙරහු බුදුන් බත් වැලඳවූහු. ඉක්බිතෙන් මහතෙරහු දවස දවස බුදුහු මෙතෙක් තැන් වැඩියහ මෙතෙක් තැන් වැඩියහයි බුදුන්ගේ ගුණ කියා සියලු රජකුලත් බුදුන් නුදුටුහුද බුදුන් කෙරෙහි ප්‍රසාද ඉපදවූහු. එයින් ඔවුනට බුදුහු කුල පහදවන්නන් කෙරෙහි අග තනතුරු වදාළෝ. සැහැ රජහු බුදුහු වැලතට වැඩි කල්හි අපගේ නෑ උතුමා දැකුම්හ සී රුස්ව බුදුන් වහස කරනනට නිසි තැනක් බලනහාහු නිග්‍රොධ නම් සාක්‍ය රජහුගේ උයන රමණී සේ දැක ඒ සදනනට යොදා තුඹු ගද මල් ගෙණ පෙරමගට යනනාහු පළමු සව්බරණින් සැදී ලදරුවන් හා ලදැරියන් නනා යවූහු ඉක්බිති රජකුමරුවන් හා රජකුමරියන් නනා යවූහු. ඔවුන් ඉක්බිති තුඹුහු ගොස් ගඳින් මලින් පුදමින් බුදුන් ගෙණ නිග්‍රොධාරාමයට වැඩූහු. බුදුහු ඔවුන්ගේ විසිදහසක් සඟුන් පිරිවරා පැනවූ බුදුඅස්නෙහි වැඩහුන්හු. සැහැරජහු අභිමානයෙන් සිදුහත් කුමරු අපට ලදරුය අප මල අප බෑනෝය පිත්ය මුනුබුරුයයි සිතා ලදරු ලදරු රජකුමරනට තෙප වඳුව ඇප් තොප පිටිපස සිටුම්හයි කීහු. ඔවුහු එසේ හුන් කල්හි බුදුහු ඔවුන්ගේ අදහස් දැන මා නෑයෝ නොවඳිති,ඔස මොවුන් වැඳවූව මැනවැයි සතර වන ධ්‍යානයට සමවැද හුනස්නෙන් නැඟී ඔවුන් හිස පියා පස් ඕනවුන් සෙසීත් අහසට නැඟී සියල් සිරුරින් ගිනිකඳ දියකඳ විහිදමින් සවණක් රස් විරම්න් යමාමහපෙළහර දක්වූහු. පියමහරජානෝ ඒ අසිරිමහ පෙළහර දැක වහන්සේ මම නොප උපන් දවස් කුලුදෙව් නම් මහතාවිස්පානන් වඳවන්නට එලවූවන්ගේ පා පෙරළී ඔහු මුදුනෙහි පිහිටි සේ දැක තොපවහන්සේ වැන්දෙමි, මේ මාගේ පළමුවන වැඳීමය. වප්මගුල් දවස් දඹරුප්පය සිටියහන් මතුයෙහි පළක් බැඳ වැඩහුනනා දැක දඹසෙයන් නොපෙරලෙන සේ දැක වැන්දෙම්මය, මේ දෙවන වැඳීමය. දැන් මා නුදුටු විරූ පෙළහර දැක වඳිමි, මේ මාගේ තුන්වන වැඳීමයයි රජානෝ වැඳි කල්හි බුදුන් නොවැද සිටිනට නිසි එක් රජෙකුදු නොවී හැමදෙනාම වැඳියෝ.

මෙසේ බුදුහු නෑයන් වඳවා ගෙණ අහසින් බැස පැනවූ අස්නෙහි වැඩහුන්හු. බුදුහු වැඩහුන් කල්හි නෑයන්ගේ සමාගමය මුදුන් පැමිණ හැමදෙනා ම එකග සිත් වූහු. එසඳ මහමේ නැගී පොකුරුවැසි වට, ඒ වැසෙසන් තෙමෙම්හයි සිතුවෝ තෙමෙති, නොතෙමෙම්හයි සිතුවන් වෙර එක් දියබිඳකුදු නොහෙසි. ඒ අසිරි පෙළහර දුටු රජහු විස්මපත්වූහු. බුදුහු දැන් මතු නොවෙයි මාගේ නෑ සමාගමයෙහි අතීතයෙහිදු පොකුරුවැසි වටැයි වෙසතුරු දා වදාළහ. ඒ දම්දෙසුම් අසා පැහැද හැමදෙනා නැගී වැද නුවර ගියෝ. එක් රජෙක් හෝ ඇමැතෙක් අනික් දවසට පැවරූ කෙනෙකුන් නොදවූහ. බුදුහු අනික් දවස් විසිදහසක් සඟුන් පිරිවරා කිඹුල්වත් නුවර සිඟනනට වැඩියෝ. පෙරමගට පැමිණ පා ගත් කෙනෙක් හෝ පැවරූ කෙනෙක් නොද වූහ. බුදුහු එළිපත වැඩසිට පෙර බුදුහු කුල නුවර කිසේ පිඩු සුරූහ හෝ ගෙ පිළිවෙළ පියා ඉසුරුජනන් ගෙට එලඹියහ හෝ නොහොත් සපදන්සැරි සුරූහ හොයි බලනුවෝ ගෙ පිළිවෙළ පියා එක් බුදුකෙනෙකුදු නොවැඩිය සේ දැක දැන් මම්ද එම වංශය රකනා මැනවැයි අනාගතයෙහි මාගේ සව්වෝ මා අනුව නික්මෙනාහු සපදන්සැරිවත පුරණුවෝ වෙතියි කෙළවර ගෙනි පටන් ගෙණ සිඟමින් වඩිත්. අප ගිමි සිදුහත්කුමරු පිඩු සෙරෙති යි දෙබුමු තුන් බුමු ඈ පහාගි සිත්මැදුරු විවර කොට බලන ජනයෝ දැක්මෙහි වසවට වූහ. යසොදරාදෙවි වනාහි ම ගිමි මෙම නුවර රුවන්රිය අරා දෙව් පිරිස් බඳු මහපිරිස් පිරිවරා පළමු සැරිසැරූ විරිය. දැන් මුඩුව කාකහවත් හැඳ පෙරව පා කබලක් ගෙණ අහර සිඟාලාහෝ ඕහට හොබි හොයි නොහොබි හොයි සිහිමැදුර විවර කොට බලනනී බුදුහු නන් විසිතුරු පැහැයෙන් දිලියෙමින් සිරුරුරසින් පුර මහවේ බබුළුවමින් ඝනම්ප්‍රභායෙහි ගැලී සිටි අසූ අනු ව්‍යඤ්ජනයෙන් බබලන දෙතිස් වරලකුණෙන් සැදූම්ලද රූප කාය ඇතියවුන් නිරුපමාන බුදුසිරින් වොරජනුවන් දැක ගිස පටන් ගෙණ පතුල් දක්වා නරසීගා නම් අට ගයකින් බුදුන් වණා සුදෙවූන් මහරජනන් කරා ගොස් තොප පුතනුවෝ අතුරු වේ බැස සිඟති යී කීවා.

මහරජනෝ බියපත්ව සළුව හඳිමින් වෙලෙව්ව ගොස් බුදුන් පෙරට සිට වහන්සේ මට කුමට ලජ්ජාකරව කුමක් සඳහා සිඟව මා මේ සඟනට බත් නොදිය හෙත්දැයි කීහ. මහරජ මේ

අපගේ වංශයයි වදාළහ. වහන්සේ තොපගේ මහසම්මත වංශ
යෙහි එක රජෙකුදු සිඟුයේ නොවෙයි කීහ. මහරජ ගේ තො
පගේ වංශය, අපගේ වූ කල බුඩවංශය හැම බුදුහුම සිඟා වැටූ
නාහයි අතුරුවෙය සිට ගාථාවක් වදාළෝ. ඒ අසා රජු සෝවා
න්වූහ. දෙවන ගය අසා සැදෑගැමි වූහ. මහ දම්පල් දා අසා
අනාගැමි වූහ. මියන කල සේසත් යට සිරියහන් මත්තේ
හෙව රහත් වූහු. රජානෝ සැදෑගැමි වූයේ බුදුන් අතින් පා ගෙ
ණ විසිදහසක් සඟුන් හා බුදුන් පහයට වඩා සිනිඳු මියුරු බත්
දුන්හු. බත් වලඳා හුන් කල්හි සතළිස් දහසක් නාඪවෝ බුදුන්
වැන්දාහ. යසොදරාදෙවී වනාහි බුදුන් වදනට එවයි කියෙන්
සැබවින්ම මම් ඔහුට ගුණවත් වීම්නම් ඔහුම මා කරා එති එ
කල මම් වඳිම් යී නොගියා. බුදුහු පිය මහරජානන් ලවා පය
ගෙන්වා ගෙණ දෙඅගසව්වන් හා සමග ඇයගේ සිරියහන්ගබ
ට එලඹ පැනවූ අස්නෙහි වැඩහුන්හු. දෙවිහි වෙලෙව්ව ගො
ස් ගොප්මස අල්වාගෙණ පා පිට හිස් තබා වැහැස වැළප රිසි
සේ වැද. රජානෝ ඇය බුදුන් කෙරෙහි සනා බුහුමන් ඇති ප
රිදි කියනනාහු වහන්සේ ම දූ තොප කහවත් හන්හ යනු අසා
කහවත් හන, තොප එක් වේලේ වලඳනු යනු අසා එක් වේ
ලේ වලඳනනීය, තොප මහන් සම්පත් පී බැව් දැන මහත්සම්
පත් පිව, මහයහන් පීහ යනු අසා මහයහන් පියා මිටිහැදෙක
හොවී. තොප මල් ගඳ නොපලඳනා බැව් දැන මල් ගඳ විලවු
න් හල. තමා නෑයන් කෙරෙන් ඇප් ඇප් පස් වටම්හයි හසුන්
දුන් කල එක් රජක්හුදු කියෙඟි නොගිව්සසීය. ම දූ මෙසේ ගුණ
වති යයි කීහ. මහරජ දූන් තොප විසින් රක්නාලදදිය මෙසේ
වැටෙනු කිසි පෙළහරයෙක් නොවෙයි පෙර කිසිකෙනෙකුන්
විසින් නොරක්නා ලදදී නොපිරිපැසුනු නුවන දුන් මා රැකකයි
වදාරා සන්කිඳුරුදා දෙසා ඇය අස්වසා හුනස්නෙන් නැගී වැ
ඩියෝ.

දෙවන දවස් තම මල් නන්දකුමරහුගේ තනතුරු මගුල් ගෙ
වදනා මගුල් විවාමගුල් යන මේ තුන්මගුලට සරහන කල්හි
ඔවුන්ගේ ගෙට එලඹ පැනවූ අස්නෙහි වැඩහිඳ මගුල් වදාරා
ඔහු පැව්ජි කටැවිව පය අත නගා තබා හුනස්නෙන් නැඟී වැඩි
යෝ. ජනවුකල නම් රජකුමරි බුදුන් හා යන කුමරහු දැක
ගිම් යා පිතු වහා එයි කියා කර දික් කොට කවළුයෙන් බැ
ලූව. ගේ බුදුනාට පය ගන්වා වහන්සේ සී කියනනාට නො
පොහොසත් වූයේ බුදුන් හා ම වෙහෙර ගියේ. බුදුහු ඔහු නො

කැමනි සේ පැවිජි කරවූහු. මෙසේ බුදුහු කිඹුල්වත්නුවර ගො
ස් තුන්වන දවස් නන්දකුමරහු පැවිජි කළහ. සත්වන දවස්
යසොදරා දෙවීගි තම පුත් රාල්කුමරහු කුමරබරණීන් සදා, විසි
දහසක් මහණගණයා පිරිවරණ ලද උතුම්වූ රන්වන් රූ ඇති ම
හබඹනු සෙයින් දිලියෙන මහණ තා පියෝය, ඔහුගේ මහා නි
ධි සතරෙක් ඇති ඔහු නික්ම ගිය තැන් පටන් ගෙණ ගේ නුදුටු
මිහ, උහු කරා ගොස් දායාද ඉල්වා ගෙණෙවයි පියන් නැති දෙ
යක් නම් පුතුන් ගැනී වේදැයි නගා යැවූය. කුමරු බුදුන් කා
රා ගොස් මුහු ම පියානෝය යන සෙනහයෙන් සතුටු සිත් ඇති
යේ මහණ තාගේ සෙවන සුවයයි ලද බොලඳ බස් බෙණෙයි,
බුදුහු වලඳා අනුමෙවෙනි කොට හුනස්නෙන් නැගී වැඩියෝ.
කුමරු දායාද ඉල්වමින් බුදුන් හා ම ගියේ. බුදුහු දරුවානන් නැ
වතූහු. පරිජනයෝද බුදුන් හා යන්නාහු නවතන්නාට නොපො
හොසත් වූහු. මෙසෙයින් බුදුන් හා සමග අරම් ගියෝ. එසඳ
බුදුහු මේ පිය අයත් ධන ඉල්වයි මොහුට සසර වැසිකරණ ධ
න නුදුන මැනව මහබෝමැඩ හිඳ ලත් සත්වැදෑරුම් වූ අරිධන
දුන මැනව ලොවුතුරා දායාදයෙනි මොහු හිමිකළ මැනවැයි සැ
රියුත් මහතෙරුන් කැඳවා මුහු පැවිජි කරවයි වදාළහ. ඔහු
රාල්කුමරු පැවිජිකළෝ. ඔවුන් පැවිජි වූ කල්හි සුදොවුන් මහ
රජානන්ට බලවත් දුක් උපන. අධිවාසනා කරන්නාට නොපො
හොසත්වූවාහු බුදුන් කරා එළඹ මවු පියන් නො අනුදත් දරුව
න් පැවිජි නොකරන්නාට වරයක් මට වදාරණු මැනවැයි වහන්
සේ සී කීහ. බුදුහු ඔවුන්ට ඒ වරය දුන්හ. අනෙක් දවස් බුදු
හු රජගෙහි වලඳා වැඩහුන් කල්හි රජානෝ වහන්සේ මම ප
ධන්නියොග කාරණ කල්හි එක් දෙවිදුවක් අවුදු මහරජ තා පුත්
මෙළේය කී කල්හි ම පුත් බුදුව මිස නොමියෙයි දෙවිදුව කීවා
නොහැදහිම් යි කීහ. බුදුහු මහරජ තෙපි දැන් කිසේ හදහව,
පෙර තා පුත් මෙළේසී ඇට ඇර පෑ කල්හිදු නොහැදහුව යී ව
දාරා මහදම්පල් දා දෙසූහ. දෙසුම් අවසන්හි රජානෝ අනා
ගාමිඵල පසක් කළෝ. මෙසෙයින් බුදුහු පියානන් තුන්මග
තුන් ඵලය පමුනා සඟපිරිස් පිරිවර කිඹුල්වතින් නික්ම රජ
ගහනුවර ගොස් සීතවනයෙහි වැඩවිසූහු.

එකල්හි සැවැත්නුවර අනේපිඬුමහසිටුහු පන්සියයක් ගැලින්
බඩු ගෙන්වා ගෙණ රජගහනුවර තමා සබඳ සිටුගෙට එළඹ
එහි සිට බුදුන් උපන් බැව් දැන රෑ බොහෝ වේලෙහිම දෙවියන්

හළ දෙරින් නික්ම බුදුන් කරා එළඹ බණ අසා සෝවාන්ව
අනෙක් දවස් බුදු පාමොක් මහසඟනට දන් දී බුදුන් සැවැත්නුව
ර වඩනට ගිවිස්වා ගෙණ අතරමග පන්සාළිස් යොජනක් තන්
හි ලක්‍ෂ ලක්‍ෂ විසදා යොජනෙහි යොජනෙහි මහ වෙහෙර කා
රවා සැවැත්නුවර ගොස් ජෙතවන නම් රජකුමරහුගේ උයනා
මසු සූලස්න් අතුට අටලොස් කෙළකින් විකිණි උයන් ගෙණ
ඒ රමණී උයන් මැද බුදුනට ගඳකිළි කරවා ඒ වටා සෙනසුන්
කරවා පව්රු දෙරටු යොදා රුවටන් දිවාවටන් සක්මන් හල් පිරි
පොකුණු කරවා අටලොස් කෙළක් ධන විසදා මනරම්කොට වෙ
හෙර නිමවා බුදුන් කරා [පරිජනයන්] යවී. බුදුහු මහසඟුන් පිරිව
රා රජගහනුවරින් නික්ම අනුක්‍රමයෙන් සැවැත්නුවර වැඩියහ.
මහසිටුහු වෙහෙර මහත්කොට සරහා බුදුන් දෙව්රම්වෙහෙර ව
ඩනා දවස් සව්බරණින් පුතු සදා එසෙයින්ම සැදි පන්සියයක් ද
රුවන් දී බුදුන් පෙරමගට යවූහු. දරු සහපිරිවරින් පස් පැහැයෙ
න් දිලියෙන පන්සියයක් දද ගෙණ බුදුන් පෙරට ගියේය. ඔවුන්
පසුපස මහාසුභද්‍රානම් චූලසුභද්‍රානම් දෙසිටු දූහු සව්බරණින්
සැදී පන්සියයක් කුමරියන් හා සමග පූන්කලස ගෙණ නික්
මුණාහ. ඔවුන් පසුපස සිටුදූ එසෙයින්ම සැදුනු පන්සියයක්
අගනන් හා පූන්කලස ගෙණ නික්මුණාහ. ඔවුන් ඉක්බිති
කොසොල්රජහු දූ සමන්රජකුමරියන් පන්සියයක් සමග රන පිරි
වරින් ගඳ මල් ගෙණ නික්මුණාහ. හැමදෙනාගට පසුව මහ
සිටුහු දහවලු හා පිළි හැද තමන් සෙයින්ම දහවලු හන් පන්සිය
යක් සිටුන් හා සමග ගඳ මල් ගෙණ බුදුන් කරා ගියෝ. බුදුහු
මේ උපාසක පිරිස් පෙරටු කොට මහසඟුන් පිරිවරා සවණක් ඝන
රසින් දසනුදෙස බබුලුවමින් අනත් අපරිසේ බුදුරසින් චොරජ
මින් දෙව්රම්වෙහෙර වන්හු. එකල්හි සිටු බුදු පාමොක් මහසඟ
නට වෙහෙර දින. බුදුහු අනුමෙවෙනිකළහ. සිටු අනෙක් අට
ලොස් කෙළක් ධන විසදා වෙහෙර මහත් කරවී. මෙ සෙයින්
බුදුහු තමන් "පුරිසදම්මසාරථි" වන බැවින් දම්සක් පවත්නෙහි
පටන් ගෙණ අනෙක ඉර්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් හා දෙශනා විලාස
යෙන් මහණතුදු බමුණු සැහැරජ ඈ අනේ සිය දහස් සතුන්
සතන්හි දූලද බිද දමා අමාමහනිවන් පමුනුවමින් ගොස්
අනේපිඩු මහසිටුහු සුපණස් කෙළක් ධන විසදා කරණලද දෙ
ව්රම්වෙහෙර හැම බුදුහු වුසූ තන්හි අමාරස වහන සුපුන්සඳ
ක් සෙයින් විනේකුමුදූවන දුබුදුවමින් වැඩවුසූහු.

[මෙතෙකින් නොවියත් හුදීජනයන් සඳහා කරණ ලද
අමෘතප්‍රවාහයෙහි] පරසන්තාන දමනා නම් තුන්වෙනි පරිච්ඡෙ
දය නිමි.

---

# 4 වෙනි පරිච්ඡෙදය.

මෙසේ බුදුහු දෙව්රම්වෙහෙර දහම් අමා වහරේ වස්වමින්
වැඩවසනුවෝ තුන්ලෙව්හි සැරිසැරූ උපාලි ග්‍රහපතිහු ඈ සිටි
නුදු කූටදන්ත ඈ බමුණනුදු අජාසත් ඈ රජුනුදු අඟුල්මල් ඈ
සොරුනුදු සබිය ඈ පරිබ්‍රාජකයනුදු සච්චක ඈ නිවටනුදු පාසි
කපුත්‍ර ඈ දිගම්බරයනුදු සච්චබද්ධ ඈ ජටිලයනුදු බාවාරික ඈ
තවුසනුදු ශාක්‍යභික්ෂු ඈ මහණනුදු නන්දොපනන්ද ඈ නාගරා
ජයනුදු නාලාගිරි ඈ මහානාගයනුදු ආලවක ඈ යකුනුදු රා
හු ඈ අසුරයනුදු සක්දෙව් ඈ දෙව්යනුදු බක ඈ බඹුනුදු දමා
අමාමහනිවන් පැමිනවූහු.

මෙහි උපාලි ග්‍රහපතිහු දැමූ පරිදි කියේය යත්, එක් සමයෙක්
හි බුදුහු මිණිකවච පෙරව් ගැදෑතුන් බඳු රත්පවුල් පෙරව් මහා
නුභාව සම්පන්න සඟපිරිස් පිරිවරා දෙව්රමින් නික්ම ගම් නිය
ම්ගම් නුවර දනව් මඩුලු ගල් වල් සවණක් ඝන බුදුරැස්හි කුමු
වූවමින් දනව් සැරිසැරීමෙන් ගොස් මගබරට නාලන්දානම් නු
වර නිසා පාවාරික නම් සිටුහුගේ අඹඋයන්හි වැඩවෙසෙති; එ
කල්හි නිගණ්ඨනාථපුත්‍ර නම් නිවටහු මහත් නිවට පිරිස් පිරිවරා
නාලන්දායෙහි වෙසෙසි; උහුගේ දීඝතපස්වී නම් නිවටෙක්
තෙම නාලන්දායෙහි වලඳා පාවාරික නම් අඹ වනයට බුදුන් කා
රා එළඹ සාමීචි කොට අවසර ගෙණ එකත්පස්ව හුන්නේය. හු
න්නාහට බුදුහු කියග තපස්විය නිගණ්ඨනාථපුත්‍රතෙම පව්කා
ම් කිරීමට කගි කමක් දක්වයි වදාළහ. ගොප්පම්ගොතුව කැමය
කැමැයි නොදක්වයි දඬ දඬයන් මිසය යී කීය. එසඳ බුදුහු නිව
වූන්ගේ සමයෙන් පුළුවුස්නාහු ගේ පව්කම් කිරීමට කගිදඬය
ක් දක්වයි වදාළහ. කායදණ්ඩ මනොදණ්ඩ වාග්දණ්ඩ යන තු
න් දණ්ඩයක් දක්වයි කී. එහි පළමුවන දණ්ඩය නිවටහු අචි
ත්තකකොට දක්වත්. කියේය යත්, සුලඟ හමන කල අතු සැ
ලෙයි දිය සැලෙයි එහි සිත් නැති එසේ හෙයින්ම කායදණ්ඩද
අචිත්තකවෙයි. යම්සේ සුලඟ හමන කල තල්පත් ආදීහු හඬ
ත්මය දිය හඬාමය එහි සිත් නැති එසේහෙයින් වාග්දණ්ඩයත්

අචින්තක වෙයි යෙත්. මෙසේ මේ දණ්ඩවය අචින්තක කොට
දක්වති [ඔහුට] සිත් වූ කල මනොදණ්ඩ මහත් කොට දක්වත්.
එසඳ බුදුහු උහුගේ නෙපුල් ඇසියපිව කියග තපස්විය කායදණ්ඩ
ය අනෙකෙක්මය හෝ වාග්දණ්ඩය අනෙකෙක්මය හෝ මනො
දණ්ඩය අනෙකෙක්මය හොයි වදාළෝ. ගොපුම්නොතුව කාය
දණ්ඩය අනෙකෙක්මය වාග්දණ්ඩය අනෙකෙක්මය මනොද
ණ්ඩය අනෙකෙක්මය සී කී. [එසඳ බුදුහු] මේ තුන් දණ්ඩයන්
කෙරෙන් පව් කම් කිරීමට නිගණ්ඨනාථපුත්‍රයා කවරදණ්ඩය මහා
සාවද්‍ය කොට දක්වයි වදාළෝ. ගොපුම්ගොතුව කායදණ්ඩය
මහාසාවද්‍ය කොට දක්වයි කී. කායදණ්ඩය යෙහි තපස්විය සී
වදාළෝ. කායදණ්ඩය යෙම් ගොපුම්ගොතුව සී කී. මෙසේ
බුදුහු තුන්යලක් උහු මේ කථාවසතුව පිහිටිවූහු. බුදුහු කුමට මෙ
සේ කළහ යත් මේ කථාවසතුව ගෙණ ගොස් මේ තමාගේ සථ
විරවූ මහතුවටහට කියයි, එම පිරිස්හුද උපාලි මහසිටිහුද ඒ
අසා මට වාදාරොපනයට එයි, මම් උහු පූර්වූත් පැණ විසජම්,
ගේ පැහැද තුන්යලක් සරණයෙයි. ඉක්බිති සිවුසස් දෙසම්, ඒ දෙ
ස්නෙන් සෝවාන්වෙයි. අනනට වැඩ සඳහාය මා බුදුවූයේ යි දක්
නා බුදුහු තුන්යලක් ඔහු මේ කථාවසතුව පිහිටිවූහු, එකල්හි නිවට
ගොපුම්ගොතුව පව්කම් කිරීමට කහිදණ්ඩයක් දක්වයි කිය. තප
ස්විය තථාගත දණ්ඩ දණ්ඩයයි නොදක්වයි කැම කැමය සී වදාළ
හ. එසඳ නිවට බුදුන්ගේ සමයෙන් පූළුවුස්නේ ගොපුම්ගොතුව
පව්කම් කිරීමට කහිකමක් දක්වයි කිය. තපස්විය මම් කායකම්
ය වාග්කම්මය මනසකම්මය යන තුන්කමක් දක්වම් වදාළෝ. සැ
කෙවින් මෙහි ත්‍රිවිධ කායදුශ්චරිත කායකම්ම නම් වෙයි, චතුර්විධ
වාග්දුශ්චරිත වාග්කම්ම නම් වෙයි, ත්‍රිවිධ මනොදුශ්චරිත මනඃක
ම්ම නම් වෙයි, කායවාරයෙහි පැවති චෙතනා කායකම්මය, වාග්
වාරයෙහි පැවති චෙතනා වාග්කම්මය, මනොවාරයෙහි පැවති
චෙතනා මනඃකම්මයි, කුමට චෙතනා කම්මනම් විය යත්; [කුස
ලාකුසල සඞ්ඛාත කම්යන්හි] චෙතනා මුල්කොට ඇත්තේය, ක
ම්මය එයින් කියත්; මෙහි අකුසලයට පැමිනි කායකම්ම වාග්කම්ම
මහතැයි කියන්නේ නොකළකිරෙයි කුසලයට පැමිනෙයි මනඃක
ම්ම මහතැයි කියන්නේ නොකළකිරෙයි; කිසේයයත් පස්අනන්ත
රුකම්හිම මවුන් මරණු ආදි සතරකම් කයින් කෙරෙයි. නිරය කප්
දහස් පස්නා සංඝභෙදකම් වග්වාරයෙන් කෙරෙයි. මෙසේ අකු
සලයටපැමිනි කායකම්ම වාග්කම්ම මහතැයි කියන්නේ නොකළ
කිරෙයි කියනුනම්වෙයි. එකාධ්‍යානචෙතනායෙන් සුවාසූදහසක්

කාප් සුගිසපුව වලදයි. එකමාගීවෙනනායෙන් හැම අකුසල් නසා
රාත්කෙරෙයි. මෙසේ කුසලයට පැමිනි මනඃකම්ම මහතැයි කිය
න්නෙ නොකළකිරෙනුනම්වේ. මෙතැන බුදුහු අකුසලයට පැමි
නි මනඃකම්ම මහාසාවද්‍යකොට දක්වනනාහු නියතමිසදිටු සඳහා
වදාරත්; එයින් කීහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි එවං ම
හාසාවජ්ජං යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨි පරමානි භි
ක්ඛවෙ වජ්ජානි"යි.

එකල්හි නුවට කියනාහට නියි අනෙකක් නොදක බුදුහු ගත්
මග ගෙණ කිම ගොපුම්ගොතුව කායකම්ම අනෙකෙක්මය හෝ
වාග්කම්ම අනෙකෙක්මය හෝ මනඃකම්ම අනෙකෙක්මය හොයි
කීය. තපස්විය කායකම්ම අනෙකෙක්මය වාග්කම්ම අනෙකෙක්
මය මනඃකම්ම අනෙකෙක්මයයි වදාළෝ. මේ තුන්කම්මයන් කෙ
රෙහි පව්කම් කිරිමට කවර කම්මය මහාසාවද්‍යකොට දක්වයි කීය.
මනඃකම්මය මහාසාවද්‍යකොට දක්වම් වදාළෝ. මනඃකම්මය යෙ
හි ගොපුම්ගොතුව යී කීය. මනඃකම්මය යෙම් තපස්විය යී වදාළ
හ. මනඃකම්මය යෙහි ගොපුම්ගොතුව යී කීය. මනඃකම්මය යෙ
මි තපස්විය යී වදාළහ. මෙසෙයින් දිඝීතපස්වී බුදුන් මේ කථාවු
සතුව තුන්සලක් පිහිටුවා හුනස්නෙන් නැගී නිගණ්ඨනාථපුත්‍රයා
කරා ගියේ. හේ මහත්නුවටපිරිස් පිරිවරා හුන්නේය. උපාලිග්‍රහප
තිදු තමාගේ බාලකලොනකාර නම් [ගොදුරු] ගමෙකින් අය අ
ල මිනිස්නට එව අප සතරහු දක්නට යම්හ යී පිරිස් පිරිවරා නිග
ණ්ඨනාථපුත්‍රයා කරා ගොස් වැද එකත්පස්ව හුන්නේය. එසඳ නි
ගණ්ඨනාථපුත්‍ර දිඝීතපස්වී ආවාහුදක කොයට ගොස් ආහි පිළිවිත.
හේ මහණගොපුම්හු කරා ගොස් ආම් කීය. උපන් කථා කිමැයි කී
යෙන් බුදුන්හා තමා කළනාක් කථා හැම කීය. එකල්හි නිගණ්ඨ
නාථපුත්‍රයා දිඝීතපස්වීහට සාධුකාර දී සතරහුගේ සස්න දත්තෙ
හිනම් තෝය ලාමකවූ මනොදණ්ඩය මහත්වූ කායදණ්ඩය හා ස
මවන්නේ නොවෙයි පව්කම් කිරීමට කායදණ්ඩයම මහාසාවද්‍ය
ය වාග්දණ්ඩ මනොදඬ එසේවන්නෝ නොවෙයි කී. එකල්හි උ
පාලි ග්‍රහපති දිඝීතපස්වීහට ඔහු සේම සාධුකාර දී නිගණ්ඨනාථ
පුත්‍රයාහට වහන්සේ මම් මේ කථාවසතුව මහණගොපුම්හට වාද
රොපනය කරනාහට යෙමි, යම්සේ බල ඇති පුරුෂයෙක් දික්ලො
ම් ඇති එළුවක්හු ලොම් ගෙණ ඔබට මොබට ඇද ආකර්ෂණ පරිකා
ර්ෂණ සම්පරිකර්ෂණ කෙරේද එසෙයින්ම මහණගොපුම්හුගේ වාද
යෙන් වාදකොට කථාමාගීයෙන් දෙස් දක්වා ඔබට මොබට යා

නොදී ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම්සේ සුරාධූර්තයෙක් රහපරහණ මවුලු කසටදෙවියැයි වූයේ කසට හරණ සඳහා දෙකණ ගෙණ ඇද කිබ්සිනිකොට පිඹපියාද උද්ධුරුකොට පිඹපියාද * පුන පුනා ගසා පියාද එසෙයින්ම මම් මහණගොයුම්හු හා වාදයෙන් වාදකොට අවධූනී නිර්ධූනන නිප්ඵොටන කෙරෙම්. යම්සේ බල ඇති මිනිස්නු සණ පිළී කරණු සඳහා සණවැහැරි ගෙණ මිටිමිටි කොට බැඳ දියෙහි ගලාතබා විලිකෂගිය කල්හි තුන්වන දවස් ඒ තුබූ තැනට ඇඹුල් ඇඹුරුහර ඈ උපකරණ ගෙණ ගොස් දකුණත්පස පුවරුවක් තබා වමත්පස පුවරුවක් තබා පෙරට පුවරුවක් තබා කෙළවර අත් ලා හර ගෙණ එක්යලක් දකුණුපුවරුයෙහි පැහැර එක්යලක් වමත්පුවරුයෙහි පැහැර එක්යලක් පෙරටුපුවරුයෙහි පැහැර කනනාහු බොනනාහු සණදෙවූන්කෙළි කෙළෙත්ද මම්ද සණදෙවූන්කෙළි කෙළෙනා මිනිසුන් සෙයින් මහණගොයුම්හු හා වාදකෙළියෙන් කෙළපාමි. යම්සේ රජුගේ ඇත් සණදෙවූන්කෙළි කෙළනා මිනිසුන් දුක ගැඹුරුදියට වැද සොඬින් දිය ගෙණ එක්යලක් කුඹ එව එක්යලක් පිට එව එක්යලක් දකුණත්පස එව එක්යලක් වමත්පස එව එක්යලක් කලවා අතුරෙහි එව කෙළිද එසෙයින්ම මම්ද මහණගොයුම්හුහා වාදයෙන් වාදකොට සණදෙවූන්කෙළි කෙළෙනා ඇතක්නු සෙයින් ඔබට මොබට ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙම්, එකල්හි නිගණ්ඨනාථපුත්‍ර මහසිට මහණගොයුම්හු හා වාදයට මම් නොනියෙසම් දීඝතපස්වී හෝ තෝ හෝ නිසෙසහි කිය. එකල්හි දීඝතපස්වී නිගණ්ඨනාථපුත්‍රයාහට වහන්සේ උපාලිමහසිටුහු මහණගොයුම්හු හා වාදයට යනු මට නොරුස්නේය ශ්‍රී මායාවිය අනුන්ගේ සවවන් ආවෘතනනයකොට ගන්නා මායාවක් දන්නේයයි කී. එසඳ නිගණ්ඨනාථපුත්‍රයා තපස්විය උපාලිමහසිටු මහණගොයුම්හුගේ සව්බවට නොනිසස මහණගොයුම්හු උපාලිමහසිටුහුගේ සව්බවට නිසස තෝ යා මහසිට සී කී. මෙසේ තුන්යලක් දීඝතපස්වී කියතුදු උපාලිමහසිටු කුමට නගා යවයි යත්, නිගණ්ඨනාථපුත්‍ර බුදුන් හා එක්නුවර නිසා වසතුදු බුදුන් නුදුටුවිරිය, යමෙක් බුදුහු මියන පිළින කෙළේවීනම් ඒ පිළින නොපියා ගේ බුදුන් දක්නට නොනිසස, එයින් මේ බුදුන් නුදුටුවිරිවන එයින් බුදුන්ගේ දශිනසම්පතුදු නෛයනිකකථාදු නොදත්නේ සිටුහු බුදුන් කරා යන්නට අවසර දින්. දීඝතපස්විවනාහි කලින් කල බුදුන් කරා එලඹ

* කිබ්සිනිකොට බිමපියාද-උධූකුරුකොට බිමපියාද. සී-බොහෝ

සිට පැණ පුළුවුසී, හේ බුදුන්ගේ දශිනසම්පත්හු කථා නෛයසිා
නිකපරිදිදු දනී එයින් හේ මේ සිටු ඉතා නුවන ඇත්තේය, මහණ
ගොයුම්හු කරා ගොස් දක්මෙහිදු නෛයසිානිකකථායෙහිදු පහ
දදී එසේ වනාහා හා පෙරලා අප කරා නොවඩ්දියි තුන් යලක් නො
ගියමනා සේ කීය. එකල්හි උපාලිගෘහපති නිගණ්ඨනාථපුත්‍රයා
ගේ තෙපුල් ඉතා මැනව වහන්සේ යී පිළිගෙණ හුනස්නෙන් නැ
ගී වැඳ පැදකුණුකොට පාවාරිකනම් අඹවනයට ගොස් බුදුන් කා
රා එළඹ වැඳ එකත්පස්ව හුන්නේය. බුදුන් දුටු කලම පහනනා
හු වදිත්මය නොපහනනාහුද බොහෝසේ වදිත්මය නොවදනා
හුද බුදුහු ඉතා උතුම්කුලෙහි උපන්නාහ ගිහිගෙයි වසනුවන් විසි
න් වැන්ද යුතුයයි එයින් වදිත්. මේ සිටු වූ කල පහන්නේම වැඳද
ක්වම්න් බුදුන් කෙරේ ප්‍රසාද කෙළේ. මෙසේ බුදුන් වැඳ එකත්
පස්ව හුන් උපාලිමහසිටු වහන්සේ දීඝිතපස්වී මෙයට ආයෑ හො
යි කීය. ආය මහසිට යී වදාළෝ. උහු හා උපන් කථාවෙක් ඇත
හොයි කීය. ඇත මහසිට යී වදාළෝ. කුමන කථායෙක හොයි
කීය. බුදුහු උහු හා උපන් කථා තාක් වදාළෝ. එසඳ උපාලිමහ
සිටු දීඝිතපස්වීහට සාධුකාර දී සතරහුගේ සස්න දත්තේනම් හේ
මය ලාමකවූ මනොදණ්ඩය මහත්වූ කායදණ්ඩය හා සමවන්නේ නො
වෙයි පව්කම් කිරීමෙහි කායදණ්ඩය මහාසාවද්‍යය වාග්දණ්ඩ මනොද
ණ්ඩ එසේ වන්නේ නොවෙයිකී. බුදුහු ඉදින් මහසිට තරකොට ගිද
වූ වැඹක් සෙයින් නොසෙල්වී සැබව පිහිටා සිටින්නේ වීනම් තා
හා කථා කරම්හයි වදාළෝ. වහන්සේ මම් සැබව පිහිටා සිටිම් ව
දාරණු මැනවැයි කී. කීයග මහසිට මේ ලොකයෙහි සිහිල්දිය නො
ගෙණ හුණුදිය වලඳකරණ නිවටෙක් බලවත් ලෙඩක්ව සිහිල්දි
ය නොලදින් මෙළෙව්නම් නිගණ්ඨනාථපුත්‍ර උහු කොහි උපදීයි
යෙහියි වදාළහ. වහන්සේ මනසසත්‍යනම් දෙව්කෙනෙක් ඇති
ඔවුන් කෙරේ උපදී මනස්හි බැඳී මෙළෙනනා යි කීය. ඔහු සිහිල්
දිය වලඳනොකරණු කුමටය යත් නිවටහු දියෙහි දිව්ඇති යන සි
තින් සිහිල්දිය නොගණිති එහි කුඩාදියබිඳු කුඩාපණුවහ යෙත්
මහත් දියබිඳු මහත් පණුවහ යෙත්, මෙසේ පණුවහ යන සිති
න් සිහිල්දිය වලඳනොකරණුවහට පිතනවාරයක් ඇතිව ඕහට හු
ණුදිය බොනු හෝ අත් පා දොනේ හෝ පරිභෙක කරණුහෝ
නොරිසියෙයි රොගය බලවත් වෙයි එයින් රොගය නොසන්හිඳී.
මෙවනාහි හුණුදියම වලඳකෙරෙයි ඒ නොලදකල කාඩි වලඳ
කෙරෙයි පිහිත්වූ කල සිහිල්පැන් බියවිවෙයි එයින් සිහිල්දිය වූව
මැනව ඔහුගේ මනොදණ්ඩය එහිම බිඳෙයි යේ කායදණ්ඩ වාග්දණ්ඩ

රක්තේ මම් සිහිල්පැන් බියටියෙමි මට සිහිල්පැන් දෙව සී කිය
නනාට නො තිසස ඔහු මෙසේ රක්නා‍ද කායදඬ වාග්දඬයෝ චු
තිය හෝ පිළිසැද හෝ අරණට නෙ හැකකහ. මනොදඬයවනා
ඞ් බුත්නේද චුතිත් පිළිසැදත් අරමය. මෙසේ දුබ්ලවන බැවින්
කායදඬ වාග්දඬයෝ ලාමකයහ මනොදඬයම මහත්වේ. මෙසේ
උපාලිග්‍රහපතිහු මනොදඬ ඇති නිවටහු මනඃසත්‍යනම් දෙව්යන්
කෙරෙහි උපදී කීකල බුදුහු මහසිට සිනිඑලවා කියා තා කායදඬ
මහතැයි පළමු කී බස් හා දැන් මනොදඬ මහතැයි පසු කියන බ
ස් සටිත නොවෙයි වදාළෝ. මේ සිටු බණන කලම්සිනි මෘච්ඡාව
ශයෙන් සඥනැතතාහට අසස් පසස් නොපවනි සිත ඇති තාක්
කල් මළහයි නොකියහැකකැයි යම්කලෙක්හි ඔවුන් සිත නොප
වත්නි ඒනම් එකල ඔහුමළහ ඇර දවා පියව යෙනි කායදඬ නිරි
හන නිව්‍යපාරය වාග්දඬයත් එතෙක්මය ඔවුන්ගේ චුතින් පිළිසැ
දත් සිතින්ම වෙයි මෙසෙයිහුදු මනොදඬයම මහතැයි බිඳිත් චුති
ද පිළිසඳද දෙන බැවින් අද අපගේ මහනිවටහුගේ කථා අනෛ
යඹිනිකයයි සලකා බුදුන්ගේ විසිතුරු පැණ විසඳුම් ඇසියටිව
එසේදහොත් වහන්සේ කායදඬයම මහාසාවද්‍යයයි කී. එසඳ බුදු
හු අනෙක කාරණයන් දක්වනනාහු මහසිට මේ ලොකයෙහි යම්
නිවටෙක්තෙමේ සතුන් නොදමරයි නොදමරවයි සමාදම්නොද
කෙරෙයි සොරකම් නොදකෙරෙයි නොදකරවයි සමාදනුදු නො
දකරයි බොරු නොදකියයි නොදකියවයි සමාදම්නොදකෙරෙ
යි පස්කම්ගුණ අනුභව නොදකෙරෙයි නොදකරවයි සමාදම්
නොදකෙරෙයි සිනිල්දිය මළදඹු පරණලං හා සුරු කැබිලිති පණු
වහ යෙහි, ගේ ඇක්මෙන්නේ බොහෝ පණුවන් මිරිකාමරයි උ
හුට නිගණ්ඨනාථපුත්‍රයා කිනම් විපාකයෙක් දක්වයි වදාළහ. චෙ
තනා නැතෙතත් මහාසාවද්‍යකොට නොදක්වයි කිය. ඉදින් චෙ
තනා ඇත්නම් කවරකොටස එව දක්වයි වදාළෝ. මනොදඬයෙ
හි එව දක්වයි කී. මහසිට සිනිඑලවා කියා තා පළමු කී බස් හා දැ
න් පසු කියන බස් සටිත නොවෙයි වදාළෝ. මේසිටු බණන කල
ම සිනි අපගේ මහනිවට චෙතනා නැති කම් අල්පසාවද්‍යකොට
චෙතනා ඇති කම් මහාසාවද්‍යකොට දක්වා චෙතනාවට මනො
දඬය යෙනි ඔහුගේ කථා අනෛයඹිනිකයයි සිතා මොවුන්ගේ
මේ කථා නෛයඹිනිකයයි සිතා වැළිදු බුදුන්ගේ ප්‍රසනන විසිතු
රු ව්‍යාකරණ ඇසියටිව නොඅනුදත්. එසඳ බුදුහු අනික්කාරණයක්
දක්වනනාහු මහසිට මේ නාලනදානම් නුවර බොහෝ ඇතුන් අ
සුන් මිනිසුන් විසින් ගහණය, ඉදින් පුරුෂයෙක් කඩුවක් ගෙණ

අවුදු මේ නාලන්දැයෙහි යම්තාක් සත්හු ඇත්නාහුද ඔවුන් එකපහ
රින් මරා මස්රැසක් කොට පියම්යි කියන්නේවීනම් හේ ඒ කරන්
නට නිසසහොයි වදාළහ. වහන්සේ පුරුෂයෝ දහසක් දෙනෙකු
දු එයට නොනිසසහ එක්පුරුෂයෙක්නම් කුමට නිසිදැයි කීය. කි
යග මහසිට මේ ලොකයෙහි ඉඩිමත් මහණෙක් හෝ බමුණෙක්
හෝ අවුදු දැහැව්ව මේ නාලනදැව එකවට හසමකොට පියම්යි කි
යන්නේ වී නම් හේ එය කරනනට නිසසා හොයි වදාළහ. වහන්
සේ මෙවැනි දශනාලනදැවකුදු විසි තිස් සතළිස් පණස් නාලනදැ
වකුදු එකවට හසමකරනනට නිසස එකනාලනදැයෙක්නම් උහුට
කිමෙක්දැයි කීය. මහසිට සිනි එලවා කියා තා පළමු කී බස් හා දැ
න් පසු කියන බස් සවිතනොවෙයි වදාළෝ. මේ සිටු බණනක
ල මේ සිනි, කායප්‍රයොගයෙහි මිනිස්හු පණස්දෙනෙකුදු එකනා
ලනදැව එක්මස්රැසක් කරනනට නොහැකකහ ඉඩි ඇති එකෙක්
දවනාහි එකවට දැහැව්ව හලුකරනනට නිසස අප මහනිවටනුගේ
කථා අනෛයඝානිකය බුදුන්ගේ කථා නෛයඝානිකයයි සලකා
වැළිදු බුදුන්ගේ විසිතුරු ප්‍රතිභාවනා දැකනැවිව නොඅනුදත්. එ
සඳ බුදුහු අනෙක් කාරණයෙක් දක්වනනාහු මහසිට දණ්ඩකාර
ණ්‍ය කාලිගාරණ්‍ය මෙධ්‍යාරණ්‍ය මාතගාරණ්‍ය වල්වූ පරිදි ඇසූවිරු
දැයි වදාළෝ. ඇසූවිරිමි වහන්සේ යී කී. ඒ කිමෙකින් වල්වීද යනු
ඇසීදැයි වදාළහ. ඍෂින්ගේ දැහැවිලින් වල්විය යනු ඇසිම්යි කී. හේ
වනාහි රජු ඍෂින්ට කළ අපරාධ දැක දැහැවි දෙවියන් විසින් ඔවුන්
ගේ රට නසනලද. එහි දණ්ඩකාරණ්‍ය වල්වූ පරිදි කිසේය යත්,
“සරභඞගබොධිසත්වයන්ගේ තවුස් පිරිස් අතිවිපුලභාවයට ගිය
කල්හි බොධිසත්වයන් අතවැසි සත් තවුසන් කෙරෙන් කිසවච්ච
නම් තවුස්පානකෙනෙක් විවිත්තවාස කටැව්ව තවුස්ගණ පියා
ගොදාවරිහෝතෙරෙහි ගිවූළුවනයෙන් නික්ම කලිඟුරට දණ්ඩකී
නම් රදැගේ කුම්භවතී නම් නුවර නිසා උයන්හි වෙසෙති. ඔවුන්
ට සෙනාපති උපස්ථාන කෙරේ. එකල්හි ඒ නුවර ගණිකාවක් ර
තයටනැගී පන්සියයක් මාගමුන් පිරිවරා නුවරහොබවමින් ඇවිදි
න්නී මහජනයෝ ඈ බල බලා පිරිවරා ගෙණ ඇවිදිත්. මිනිසුන්
ගේ ගැලීයාමෙන් මහවේ නොපොහොයි. [දණ්ඩකී] රජ සිහිමැඩු
රෝරේ සිට බලනුයේ ඇය දැක [පරිජනයක්හු අතින්] හෝ කව
රයයි පිළිවිත. මහරජ තොපගේ නගරසොභිනියයි කී. හේ ඊශ්‍යා
යෙන් කිම නුවර ඈය විසින් හොබීද තෙමේ තමා විසින්ම හොබී
දැයි ඇය කෙරෙහි උදහස්ව තනාතුරු හරවා ගත. හෝ ඔවුනොවු
න් හා සසගකොට තමහට වහල්වනුවන් සොය සොයා අවිදින්

නී එක්දවසක් රජුගේ උයනට වැද සක්මන්කෙළවර ආලම්බනප
ලකයෙහි වැතිර පහණසලවට හුන් තව්ස්පානන් දැක මේ තව්ස්
කිලිටිපසඟින් යුතෙත්ය උඩුදැළියෙන් මුවය වැසූතේය යටිදැළියෙ
න් ලමැඩිය වැසූනේය දෙකිසිලෙලෙහි කෙහෙ දිග මම් එක්දූයක්
සඳහාය ඇවිද්නෙම් දැන් කාලකන්නියක්හු දිටිමි මා ඇස් දෙනට
දියගෙණෙව සී දිය දැහැටි ගෙන්වාගෙණ දැහැටි කකා තව්ස්පා
නන් වෙර පිඩු පිඩු කොට කෙල ගසා දැහැටිදඬු දළම්වුළුමුදුනෙහි
බහාලා මුදුනෙහි දිය එව මාඤසින් කාලකන්නිහු දුටු ඇස් දෙව
නාලද පව් දුවහනලදැයිකියා ගියා. එදවස් රජ ඇය සඳහන්කො
ට නගරසොභිනි කොහිය පිළිවිස මෙමතුවරය යනු අසා ඇගේ
තනතුරු ඇයටම දෙන්නේයයි දෙව්. හෝ තමා පෙර කළ පිණි
න් ලද තනතුරු තව්ස්පානන් සිරුර කෙල ඔනෙනන් ලදිමැයි සි
තුවා. එයින් කිහිපදවසක් ගියකල රජ පෙරෙව්බමුණාගේ තනතු
රු ගත. හේ නගරසොභිනී කරා ගොස් සොඳුර ති කුමක් කොට
තනතුරු පිළි ලදුදැයි පිළිවිත්. බමුණ අනෙක් කළ මනා දෙයක්
ඇතෙත්නොවෙයි රජ උයන්හි කූටජටිලයෙක් ඇති හේ කාලක
න්නියෙක උහුගේ ශරිරයෙහි කෙල ඔව එසේ වන්නා හා තනතු
රු ලැබෙයි කිව. ඉතා මැනවැයි එයට බමුණු ගොස් ඇය කළතා
ක් දැ කොට ගියේ. රජ එදවස් උහු සඳහන්කොට බමුණු කොහි
යයි පිළිවිස මෙම තුවරය යනු අසා අපව්සින් නොපරීක්‍ෂාවෙන්
හරණලද උහුගේතනතුරු උහුටමදෙවයි දෙව්. හෙද තමා පෙර
කළ පිණින් ලද තනතුරු තව්ස්පානන් සිරුර කෙල ඔතෙතන් ල
දෙම් යී සිනී. එයින් කිහිපදවසක් ගියකල රජුගේ පසල්දනව් කු
පිතව්ය. රජ පසල්දනව් සන්හිඳුවම්යී සිවුරඟසෙනඟ ගෙණ නික්
මිනා. පෙරෙව්බමුණු නොස් රජහට ජයකියා සිට මහරජ තෙප් ජ
යකැමතිය වූදැයි කියා එසේවූවහොත් රජඋයන්හි කූටජටිලයෙක්
ඇති හේ කාලකන්නියෙක උහුගේ ශරීරයෙහි කෙල ඔව යී කීය.
රජ උහුකියමන් ගෙණ උයනටවැද ගණිකාව විසිතුදු පෙරෙව්බ
මුණාව්සිතුදු කළතාක් දැ කොට ඇතොවූරන්ටද මේ කූටජටිලයා
ගේ ශරීරයෙහි කෙලඔවයි යෙදිය. ඇතොවුරෝද ඇතොවූරන්
රක්නාහුද එසේම කළෝ. ඉක්බිති රජ උයන්දොරටුයෙහි රැකව
ල්ගන්වා මා හා එනතාක් දෙනා තව්සා සිරුර කෙල එව මිස නො
යා දෙන්නේයයි යෙදී. එකල්හි බලකායෝද හැම මෙහෙතැන්
වැසෙසෝද එම්නියායෙන් තව්ස්පානන් මුදුනෙහි කෙලද දැහැටිද
මුවදෙව් දියද ඔත්හ. කෙලෙන් හා දැහැටින් [තව්ස්පානන්ගේ] සි
යල්සිරුර මුවහවී. සෙනාපති පසුව එපවත් අසා මාගේ පින්කෙත්

සඟපුරට රුවන්ගිණි ඉඳුහුමත්සතරහට වරද කාලේ‍රාල සී කාකි
යන හදවත් ඇතිව කටින් සුසුම් විහිඳුවමින් වහා උයන් ගොස්
කෙලෙන් හා දූහැටින් මූවහව හූත් තව්ස්පානන් දැක කැසපට
හලා හැඳගෙණ දෙයතින් දැහැටි පාකොට පිය නගා ගිඳුවා දිය
ගෙන්වා නාහවා වෙර බෙහෙත්ගල්වා දෙව සිවුදූහඳින් උලා සී
හූම්සළුයෙන් පිස පෙරට ඇඳිලිබැඳ සිට වහන්සේ මිනිසුන්විසින්
කළදෑ නොයෙදෙසි ඔවුනට කිමෙක් වෙයිහොයි පිළිවිත. එකල්
හි තව්ස්පානෝ සෙනාපතිය දෙව්යෝ තුණක්ව බුත්හ, ඇතම්
කෙනෙක් රජුම නසම්හයි යෙත් ඇතම්කෙනෙක් රජුගේ පිරිස්
හා සමග නසම්හයි යෙත් ඇතම්හු රජුගේ රට නසම්හයි යෙත්
සී තුමූ මදකෝපයකුත් නොකොට ලොවට සෙත්සදහා උපායක්
දක්වනනාහු වරදෙක්නම් නොවේ දැන් මා කමැවූ තැනින් ම
නෙතහි සෙත්වෙයි කීහ. සෙනාපති නයලදින් රජුකරා ගොස් ම
හරජ තෙපි නිවරද මහත්ඉදුහු ඇති තව්ස්පානන්ට බැරිකමෙක්
කරණලද, දෙව්යෝ තොපට දැහැවියාහුල කමැවූ කල සෙත්වෙ
සි රට නොනසව තව්ස්පානන් කමව සී කී. රජ තමහට කළ දෙ
ස්දැක එසේ කියති සී මම් ඔහු නොකමම්සි කීය. සෙනාපති තුන්
යලක් අයද රජු නොගිවිස්නෙන් මහරජ මම් තව්ස්පානන්ගේ
බල දන්මි ඔහු මුසවා නොකියති නොදැහැවියහ මෙඩිඳු සතුන්
කෙරෙහි කුළුණින් කියති ඔවුන් කමව සී කීකල බැණ නොකම
වම් සී කීයෙන් ඔස මහරජ සෙනෙව්තැන් අනෙකක්හට දෙව මම්
තොපගේ අණසක් පවත්නා තැන්හි නොවෙසෙම් සී කීය. තෝ
ඊසිවූ තැනකට යා මම් මට සෙනාපතියක්හු පිළි ලබම්සී කී. එකා
ල්හි සෙනාපති තව්ස්පානන් කරා ගොස් වැඳ වහන්සේ කුමක්කා
රම් හොසී කීය. සෙනාපතිය යම්කෙනෙක් තා කීවා කෙරෙත්ද
ඔවුන් හැමදෙනා ගෙණ ධන ගෙණ වලඳ ගෙණ සරක් ගෙණ ස
ත්දවසකින් ඈතුළත රාජ්‍යසීමායෙන් පිටත්ව යා. දෙව්යෝ ඉතා
ම දැහැවියහ එකාන්තයෙන් රට නසතිසී කීහ. සෙනාපති එසෙ
සිත්ම නික්ම ගියේ. රජ යෙම්න්ම සතුමථනයකොට ගොස් ජය
කඳවුරෙහි ගිඳ සැදී නුවර වන. එකල්හි දෙව්යෝ පළමුවට වැසි
වැස්වූහ, මහජනයෝ කුටජටිලයාහට වැරදූ තැන් පටන්ගෙණ
අප මහරජහට වැඩවිය ව්ජයකොට ආ දවස් වැස්වටහයි සතුටුවූ
හ. දෙව්යෝ වැළිඳු සමන්මල්වැසි වැස්වූහ, මහජනයෝ ඉතාම
සතුටුවූහ. ඉක්බිති කුඳුමසුවැසි වැස්වූහ, ඉක්බිති කහවණුවැසි
වැස්වූහ, ඉක්බිති රුවන්අබරණවැසි වැස්වූග, මහජනයෝ සත්
බුමුමහපහය සත්වන මාලයෙහි සිටියාහු බැස දිවඅබරණ පලද

නාඟු කූටජටිලයාවෙර කෙලපී තැන් පටන්ගෙණ අප මහරජහට වැඩව්ය රුපූච්ජයකෙළ නුවරවත් දවස් දෙව්යෝ සිපුම්මල්ධාරා ඇති දිලියෙන සමන්මල්වැසි වට කහවණුවැසි වට රුවන්අබරණවැසි වටහයි සතුටුව බණනනාඟු රජු කළ පව් අනුමෙව්යහ. එ කල්හි දෙව්යෝ සිපුම්ධාරාඇති දිලියෙන සත්වැසිවැස්වූහ. මහජනයෝ සත්වැසෙසන් පුවරුයෙහි තබා කපන මස් සෙයින් සුන්සුන්ව ගියහ. ඉක්බිති දුම් නැති ජල නැති කැහැලමල් සුදුසු අඟුරුවැසි වැස්වූහ. එයින් ඉක්බිති කුළාරගේසා රත්කළ ලොහොපිඩු සෙයින් දිලියෙන පහණවැසි වැස්වූහ. එයින් ඉක්බිති ඇතුළුම්ටි නොසිටිනා පමණ සියුම් ගිනිවන් වැලිවැසි වස්වා පොළොවින් අසූහතක් තැන් පූරාපිහ. ඒරජුගේ විජිතයෙහි කිසවච්ඡ නම් තව්ස්පානත් හා සෙනාපතිහු හා ඔහු පූස්නා රාම නම් වෙදදරුවකු හා මේ තුන්දෙනා දිව්ලත්හු. ඒ රජුගේ පව්කම්හි නොසහ සෙසු තිරිසන්ගතිය සත්නට පැන් ඇති තන්හි පැන් නොවීය, තණ ඇති තන්හි තණ නොවීය, ඔවුහු පැන් කොහිය හෝ තණ කොහිය හෝ සොයමින් ගොස් සත්දවස ඇතුළතම රාජ්‍යසීමායෙන් පිටත් වූහු; එයින් කිහ සරභඞග බොධිසත්වයෝ.

කිසංහි වච්ඡං අවකිරිය දණ්ඩකී
උච්ඡින්නමූලො සජනො සරට්ඨො
කුකකුල නාමා නිරයම්හි පච්චති
තසස පුලිඟානි පතන්ති කායෙ.

මෙසෙයින් දණ්ඩකාරණ්‍ය වල් වූ පරිදි දතයුතු.

කාලිගාරණ්‍ය වල්වූ පරිදි කිසේය යත්, කලිඟුරට නාළිකෙර නම් රජක්හු රජකරණ කල්හි හිමව්යෙහි පන්සියයක් තව්සෝ බ්‍රහ්මචාරිව අඳුන් දිවිසම් හැඳ දළමඩුලු වල්කලාබරව වනමුල් පලලව ඵල වලඳා වසනනාහු බොහෝ දවසක් ගියකල ලුණු ඇඹුල් සෙව්නා සඳහා මිනිසුන්වසන තැනට අවුදු අනුක්‍රමයෙන් ගොස් කලිඟුරට නාළිකෙරරජුගේ නුවරට පැමින පා සිව්රු ගෙණ හැඳ පෙරව දළම්ඩුලුබැඳ අඳුන්දිවිසම් එකස්කොට බහාගෙණ පැවිජ්බවට හොබනා උපසම්සිරි දක්වමින් අහරසඳහා නුවර වන්හු. මිනිස්හු බුඬොත්පාද නැතිකල්හි තව්ස් පැව්ජියන් දැක පැහැද හිඳිනා තැන් සන්විධානකොට අතින් භික්ෂාභාජන ගෙණ වඩාහිඳුවා අහරතන්කරවා දුන්හු. තව්සෝ බත්වලඳා හිඳ අනුමෙවෙනිකළහ. මිනිස්සු බණ අසා සතුටුව භවත්හු කොයට වඩිති සී පුළුවුත්හු. සැපඇති තැනකට යම්හයි කියෙන් වහන්සේ බැහැර නොවඩව රජඋයන්හි වසව අප බත් කා ගොස් බණ අසම්හයි කීහු. තව්සෝ

ගිවිස උයන් ගියෝ. නුවරවැසෝ බත් කා සුදුපිළී හැඳ උතුරු
සළු එකස්කොට බණඅසම්හයි රැස්ව උයන් යෙත්. එකල්හි රජු
උඩුමහල්හි සිටියේ ඔවුන් දැක මොවුහු කොයට යෙති මොවුන්
කෙරෙහි නටන ගයන වයන මිනිස්නු හා ඇත් දැයි පිළිවිස නැත
මහරජ මොවුහු තව්සන්කෙරෙන් බණඅසනනට උයන් යෙති ය
නුඅසා ඔස මම්ද යෙම් මා හා සමග යන්නේයයි යවා කියවිය. නු
වරවැසෝ අපගේ රජ සැදැහැ නැතෙත්ය සිල්වත් ගුණවතුන්
කෙරෙහි නොපහන්නේය සුසීලතව්සන් නිසා නොදැම්වූරජ දැමි
වූවෙයි සතුටුවූහ. රජ නික්ම ඔවුන් පිරිවරා උයන්ගොස් තව්සන්
හා පිළිසඟරකොට එකත්පස්ව හුන්නේය. තව්සෝ රජු දැක පරි
කථාකරනනට නිසි තව්සක්හු රජහට බණකියනු කළහ. තව්ස්,
පිරිස් බලා පස්දුසිල්කම්හි ආදිනව හා පන්සිල්හි අනුසස් කියනු
යේ පණිවා නොකටයුත්තේය අයිනාදන් නොගතයුත්තේය මිස
හැසර නොසෙවියයුත්තේය මුසවා නොකියයුත්තේය රහ නො
බියයුත්තේය. පණිවා කෙළේ නිරය ඉපිද අනේ වා දහස් සුවහ
ස් නිරය පැසී සතරඅපායෙහි වෙහෙසි මිනිස්පියට ආයේ වීනම්
සම්පත් නොවලඳ නවයෝනෙහිම මියෙයි. අයිනාදන් ගත්තේ
දිළිඳුවෙයි, මිසහැසර සෙවියේ සතුරන් ඇතිවෙයි, මුසවා කියේ
අභූතයෙන් අවමාකරණුලැබෙයි, රහ පූයේ උමතුගති ඇතිවෙ
යි, සී පස්දුසිල්කම්හි ආදිනව දැක්වී. රජ සැදැහැ නැත්තේ දුස්සීල
යාහට ශීලකථා කණ යවුල් දෙන කල් වැනි වෙයි එයින් රජ මම්
මොවුන් සගන්මියි ආයෙම් මොවුහු මා ආ තැන් පටන්ගෙණ ඔවි
ජපිරස්මැද තෙපුල් කෙරෙති මොවුන්ට කළ මනා දෑ දන්මියි සි
තා බණ සමහරකළ කල සෙට මාගේ ගෙයි වලඳනනට වඩනේ
යයි කියා ගියේ. ගොස් දෙවනදවස් මහත් මහත් සැලි ගෙන්වා
ගෙණ එහි අසූචි පුරුවා කෙසෙල්පතින් මුව වසා බැඳ තන්හි තා
න්හි තැබ්බවිය. බොල්මීතෙල් වැනි බෙලසුල්කෙලින් කුඹු පූරුවා
හිණිහිස තැබ්බවිය.මලලවයන් කැඳවාගෙණ තෙප් කැසපට ගන්
වාගෙණ හැඳ මුගුරු ගෙණ හිණිහිස සිට කුට තාපසයන් පහයින්
බස්නා කල බෙලසුල් කෙලබඳුන් සිරුර පියා හිස මුගුරෙන් පැ
හැර කර අත්ලාගෙණ හිණින් හෙලා පියව සී යෙදී. හිණිපාමුල
කැකුළුබලලන් බඳවා සිට්විය. තව්සෝ සෙට රජගෙයි වලඳනනා
ට ගිය මැනව රජගේ නම් සසකය සභය පැවිජියන් විසින් සදෙ
රව හමුවූ සඅරමුණෙහි සකසුම ඇතිවිය යුත්තේය. දුටු දුටු අර
මුණෙහි නිමිත්තා නොගතයුත්තේයයි ඔවුනොවුන්ට අවවාදකො
ට ගේලාබලා තව්ස්පිරිකරධරව භිසෂාභාජන ගෙණ පිළිවෙළින්

රජගෙට නැංගහ. රජ ඔවුන් මහලට නැගිබැව් දැන සැලමූවපිරි
බද කෙහෙල්පත් මුදවා පීය. තව්සන් නාසායෙහි දුගඳවා පහළ
නිස්මුල් වැහැර යන පමණ පිළිකුල් වී. මහතව්සනට රජ මෙහි
තොප කනපමණකව ගෙණයනපමණ ගෙණයව තොපට මේ අ
හරපිණ්ස නිසස මම් ඊයේ තොප සගන්මි සී ගියෙම් තොපි ම
ඔව්ජපිරිස්මැද බුණුහ මේ තොපට නිසි භොජනය වලඳවසී මහ
තව්සනට විලුඹින් අසූචි ගෙණ එලවිය. මහතව්ස් දිග් දිග් සී ගරහ
මින් පස් පස්ව බට. තෙපි මෙතෙකින් යටිනොසා සී ගිණිගිස තුබූ
බෙලසුල්කෙලබඳුන් ඔසවාපියා සී මලලවයන්ට ගිහිකෙළේ. ම
ලලවයෝ මුගුරෙන් හිස් පැහැර පලා කර අත්ලා ගෙණ ගිණිත්
හෙලා පිහ. ගිණිමුල හුනු හුනුවත් ප්‍රචණ්ඩ බලෙලෝ පටත් පටත්
යන අනුකරණ ඇතිකොට සිඳ බිඳ කා පිහ. ඔවුන්කෙරෙන් ය
මෙක් නැගී පලායේද හෙද ගොස් බිඳ තුබූ වලහෙයි බලෙලෝ ඔ
හුද ලුහුබැඳ ගොස් කත්මය. මෙසේ ඒ රජ සිල්වත් ගුණවත් පත්
සියයක් තව්සත් එක්දවසින්ම දිවි ගැලවී. ඉක්බිති දෙවියෝ උ
හුගේරට පෙරසෙසින්ම නවවිධවරුෂා වැස්වූහ. උහුගේ රට සැට
යොදුනක් තැන් උස අසූහනක් වැලිතෙලෙන් පිළිසන්වී; එසින්
කිඟ සරභඩග බොධිසත්වයෝ.

යො සඤ්ඤතෙ පබ්බජිතෙ අවඤ්චසි
ධම්මං භණන්තෙ සමණෙ අදූසකෙ
තං නාළිකෙරං සුනඛා පරත්ථ
සංගම්ම ඛාදන්ති විඵන්ද මානං.

මෙසෙසින් කාලිඞ්ගාරණ්‍ය වල්වූ පරිදි දතයුතු.

මෙධ්‍යාරණ්‍ය වල්වූ පරිදි කිසේය යත්; අනිතයෙහි බරනැස්නුව
ර සතළිස්කෙළක් ධන ඇති සිටක්හුගේ දිට්ඨමඞ්ගලිකා නම් එක
ම දුවක් වූවා පැහැපත්රූපසම්පතතින් හා කුලසම්පතතින් හා
භොගසම්පතතින් සම්පන්නාවන බැවින් බොහෝදෙනා විසින් ප
තනලද. යමෙක් යමෙක් ඇය කැමතිවේද ඔවුනොවූත් දැක ඔවුන්
ගේ ජන්මයෙහි හෝ අත් පා ආදියෙහි හෝ දෙස්දක්වා උහුකෙ
රෙහි කව්රු වෙසෙති උහු නෙරාපියව සී පියවා මෙසේවූවක්හු දි
ටිම් මා ඇස් දෙවනට දියගෙණෙව සී දිය ගෙන්වාගෙණ ඇස්
දෙවී. එසින් හෝ දිට්ඨමඞ්ගලිකා නම්වූවා පළමු නාම් අතුරුදන්වී.
හෝ එක්දවසක් ගඟදිය කෙළනට යායටිව තොට සඳවා බොහෝ
කන බොන දෑ ගැල්පුරාලා සරසවාගෙණ ගඳ මල් ඈ ගෙණ පිළි
සන්යානාවකට නැගී නෑ නො නෑ පරිජනයන් පිරිවරා ගෙන් නි
ක්මුණ. එකල්හි අපමහබෝසත් කාම්බපරවසව සැඬොල්කුලයෙහි

ඉපිද පිටිනුවර සම්ගෙයක වෙසෙයි, උහුට මාතඟ යන නමෙක් විය. හේ සොළොස්හැවිරිදි කල්හි කිසියම්කාර්ය්‍යයක් සඳහා ඇතුළුනුවරට වැදියට්වූයේ එක් නිල්පියලලක් හැඳ එක් නිල්පියලලක් අතබැඳ එක්අතකින් පැසක්ගෙණ එක්අතකින් ගණ්ඩාවක් ගෙණ ගෙත් පහව සැඬොලෙක්මි යී දන්වනුසඳහා [ගණ්ඩාව] වයමින් යටත්සිතින් දුටු දුටුවන් වඳිමින් නුවරවන. එකල්හි දිට්ඨමඞ්ගලිකාතොමෝ ගණ්ඩායෙහි හඬ අසා ජවනිකාඅතුරෙන් බලන්නී ඔහු දුරින් එනනාහු දැක මේ කවර යී පිළිවිස සැඬොලෙක යනු අසා අපි කිනම් අකුසලයක් කෙළෙම්හ මේ කවරපාපයාගේ විපාකයෙක් හෝ මා නස්නා කලෙක් වන්නේය පිරිසුදුවනනට යනුයේ සැඬොලක්හු දිටිම්යි රතය නවතා පෙරලාගොස් දියගෙටවැද ඇස් දෙව පහයට නැංගා. රහසොඬආදිහුද ඇයගේ පරිජනයෝද සැඬොල්හු නිසා රහ මස් ආදිය වලඳකරණු නොලදුම්හ මොහු ගතමැනවැයි ගොස් නිවරද මාතඟපණ්ඩිතයා තජ්ජනයකෙරෙමින් කෙහෙයෙහි ගෙණ බිම පැහැර හෙලාපියා විලුඹින් වැළම්විත් පහණින් තළා මළහ යී සිතා පය ගෙණ ඇද කසලගොඩ දමා පියා ගියෝ. මහසත් සඥාලදින් අත් පා පිරිමැඩ ගෙණ මට මේ දුක් දිට්ඨමඞ්ගලිකාව නිසා උපන්නේය ඉදින් මම් පිරිමියෙක් වීම්නම් ඇය මට පාදපරිචාරිකාකරම් යී සිතා වෙව්ලමින් ඇය ගෙට ගොස් දිට්ඨමඞ්ගලිකාව ලදහොත් මෙතැනින් නැගෙමි නොලද්දෙම්නම් මෙහිම හෙව මියම් යී ගෙයඟනෙහි හොනී.

එසමයෙහි දඹදිව යමක්හුගේ ගම්දොර සැඬොලෙක් දැහැව හෙව මෙළෙර්වීනම් යම්කෙනෙක් ඒ ගම වෙසෙත්ද ඔහු ඇම සැඬොල්වෙති; ගෙමැද හෙව මෙළෙර්වීනම් ගෙහි වැසෙයෝ හැමදෙනා සැඬොල්වෙති; දොර හෙව මෙළෙර්වීනම් ඉක්බිති ගෙහි ඇතෙතෝ සැඬොල්වෙති; ගෙයඟනෙහි හෙව මෙළෙර්වීනම් දෙපසින්සත් සත් ගේ බැගින් තුදුස්ගෙයක මිනිස්සු සැඬොල්වෙති යන ව්‍යවස්ථාවයි. එකල්හි මහසත්වනාහි ගෙයඟනෙහි හොත්තේය. එසඳ සිටිහුගේ පරිජනයෝ ස්වාමියාගෙඅඟනෙහි සැඬොලෙක් හොත්තේය යී කිහ. කුමට හොත්තේ දොහෝයි ගොස් පිළිවිස බලා මේ මසස ඔහුට දී නගාපියව යී යවිය. ජනයෝ ගොස් මේ මසස ගෙණ නැගී යා යී කීහු. මම් මසසක් නිසා හොතෙනම් නොවෙම් දිට්ඨමඞ්ගලිකාව නිසා හොතෙනම් යී කී. ඇය කළ වරද කා වරදැයි කියෙත් මා නිරපරාධයහට ඈ ගැතතත් කළ දෑ නොයෙදෙයි ඇය ලදිම්නම් හොත් තැනින් නැගෙම් නොලද්දෙම්නම් නොනැගෙම් යී කී. සිටු එපවත් අසා දුවගේ දොස්බැව්දැන එක්

කහවණුවක් දී යවීය. මම් දූරිය කැමැතෙතම් කහවණු නොකැ
මැතෙතම් සී කී. සිටිහුද අප සිනැහැති එකම දූව, වංශය රක්නට
නිසි අනෙක් දරුවෙක් ඇත්තේ නොවෙයි බියපත්ව යව දරුවෙනි
අපනොනසව යමෙක් උහුමැරුයේවීනම් අපහැමදෙනාම නස්න
මෝ උහු රක්වයි වවා ඕහට රැකවල්දෙවා සී හවුදී බත් දී යවීය.
හේ එයිත් පිළිකෙව්ගෙකළේ. මේ නියායෙන් දවස් යත් යත් දෙ
පස්හි සත් සත් ගෙහි මිනිස්හු නැගී අප තොප නිසා සැඩොල්ව
නනට නොහැකකම්හ අප නොනසව දූරිය දී ඔහු හොත් තැනි
න් නගායවයි කීහු. එකල්හි සිටු ක්‍රමයෙන් සියයක් දී දහසක් දී ල
ක්‍ෂයක් දී යවීය. උහු එයිත් පිළිකෙව්කෙළේ. මෙසේ සදවසක් ගි
යකල දෙපස්හි තුදුස්ගෙහි මිනිස්හු රැස්ව අප සැඩොල්හු නොවූ
වමැනව තොපි නොකැමැතිද අප ඕහට දූරිය ඇර දෙම්හයි කීහු.
මවු පියෝ සොකපත්ව සන්‍යනැතිව ගොස් යහන්හි වැතිර හො
ත්හු. ඔවුහු දූරියගේ සිරියහන්ගබට වැද දැරිය ඇරගෙණ සුපිපි
කැහැලරුකෙක්හි මල් අතු බිඳිනනවුන් සෙයින් ඇයගේ සව්බර
ණ ගලවා නියනේ සීවාගනදක්වා සැඩොල්කෙහෙ බැඳ නිල්පිළි
යක් හඳවා නිල්පියලලක් අතබැඳ තන තුඹුපට පලඳවා තලපත්
පැසක් දී දෙයත් කර ගෙණ පහයින් බහවා ඇර නි සැමියා හා ය
වයි මහසත්හට දුන්හු. නිල්මහනෙල්මලසුදු ඉතා බරැයි නොප
ලඳනා ඉතාසිවුමැලි දැරි නැගෙව ගිම් කියන්නි “උටඨාහිසාමි” කී
ව. මහසත් මම් උටඨ නම් නොවෙම් කීහ. වැළි කුම් යෙම් දැයි
නැගෙව ගිම් මාතඞයයි කිව. ඇය එසේ කිකල්හි තිගේ මිනිස්හු
මා නැඟී ගිඳින පමණ ශක්ති නැතිකළහ දෙයත් කර ගෙණ න
ගා ගෙණ යා සී කීහ. ඇය තමා නගාගනනා කල නැගෙනුවන්
පෙරළි බිම වැටී ගිඳ දිටඨමඞගලිකාව විසින් නටම් පළවූ මා තමා
ගේ මිනිසුන් ලවා තළවා දැන් ගතාමෝ තළායී හැඩිය. එකල අ
ත්ලා නගා ගිඳුවා යම්හ ගිම් සී කියන්නී “නඩජාම සාමි” කිව.
මහසත් ගවජයෝ නම් වල්නි වෙති මම් නි ගැතනත් විසින් ත
රකොට තළා පියනලදෙඳම් පයිත් නොයාහෙම් පිටින් මා ගිඳුවා
ගෙණ යා සී කීහ. හෝ නැමී පිට දී මහසත් තමා පිටට නැගී ක
ල කොයට ගෙණ යම්ද ගිම් සී කිව. පිටිනුවරට ගෙණ යා සී කීහ.
හෝ පැදිදෙරතුරසට ගොස් ගිම් තා වසන්නේ මෙහි වේදැයි කි
ව. මේ කොතැනෙක්දැයි කියෙන් පැදිදෙරතුරසයයි කිව. පැදි
දෙරතුරසෙහි සැඩොලුන් නොවිසියහැකකැයි කීහ. මෙසේ තමා
වසන තැන් නොකියා ඇය හැමදෙරතුරසෙහි ඇවිදැවී. මෙසේ
කුමට කෙළේය යත්, බවඅක් දක්වා නැගි මිනිසුන්ගේ මත් බිඳිනු

සඳහා කෙළේ. මහජනයෝ තොප තබා මැයගේ මත් බිඳිනට
නිසි කෙනෙක් නැතැයි ගුගුළෝ. හෝ පැළඳෙරතුරසට පැමිණ
ගිම් හා වසන්නේ මෙහි වේදැයි පුළුවත. මේ කොතැනෙක්දැයි
කී කල්හි පැළඳෙරතුරසයයි කිව. හෝ එයට ගොස් මේ සම්ගෙය
හාවසනතැන්දැයි කියෙන් මා වසනතැනැයි ඇයපිටින් බැස සම්
ගෙට වනී. එනි සතටදවසක් වසන මහබෝසතාණෝ ඇයගේ ජ
න්මහෙදනොකොට දවස්යවා ඉදිත් මේ කුලඳු මා නිසා මහත්ය
සස් නොලදදිනම් මා සූවිසිබුදුන් අතවැස්සේනම් නොවෙම්යි
මෑ පා දෙව් දිය මුළුදඹදිව රජනට අභිෂෙකොදක කළමැනවැයි
සිතා ගිනිම්නිස්ව ඒ නොපලකොටහැකක පැවිජ්වූව මැනවැයි සි
තා දිටඨමඩගලිකාව මා හුදකලා කල මෙහෙකොටදු නොකො
ටදු වැටෙනනට නිසෙසම් දැන් වූකල නො හුදකලාබැවින් මෙ
හෙනොකොට වැටෙනනට නොපිළිවන මා එන තැන් දක්වා නී
උකටලිනොවයි කියා ගොස් වනයට වැද සොහොත්පියළි සො
යා හදනා පොරෝනා සිව්රුකොට පෙරවගෙණ පැවිජ්ව කිසිනු
පිරියම්කොට සත්දවසින් ඇතුළත අටසමවත් හා පස්අභිඥ නිප
යා, දැන් කලී දිටඨමඩගලිකාවට වහල්වනනට නිසෙසම්යි අහසි
න් ගොස් සැඩොල්ගම්දෙර බැස සිගමින් දිටඨමඩගලිකාවගේ
ගෙදෙරට ගියෝ. හෝ දෙර සිටියවුන් දැක නොහැඳින වඩව
වහන්සේ සැඩොල්ගෙයකැයි කිව. ඔවුන් නොගොස් එහිම වැඩ
සිටියෝ. හෝ පුන පුනා බලත්නී [සෑෂියානන්] හැඳින ලෙහි අ
ත් පැහැර හඩ හඩා පාමුල්හි හී ගිම් තොපට මෙවැනි සිතක් ඇ
නි බැවින් මා මහත්යසසින් පිරිහෙලා කුමට අනාථකළහයි නො
යෙක් සේ වැළප වැහැස ඈස කඳුලු පිසපියා නැගී අතින් පය ගෙ
ණ ඇතුළුනෙහි වඩාහිඳුවා බත් දුන. වලඳා හිඳ දිටඨමඩගලිකාව
නි රොස්නොවා, මම් නී පෘ දෙව් දිය මුළුදඹදිව රජනට අභිෂෙ
කොදක කරනනට පොහොසත්මි නී මා කිවා කරා; නුවර වැද මා
සැමි සැඩොලෙක් නොවෙයි මහබඹහයි හඩගසා ඇවිදුවයි කී
හ. හෝ මම් මාගේ මුවදෙරින් දුක්පත්විම් එසෙ කියනනට නො
නිසෙසම් කිව. එකල්හි [සෑෂියාණෝ] මා ගිහිම්නිස්කලද බොරු
නොකියම් දැන් පැවිජ්ව කුමට බොරුකියම්ද අද පුරඅටවක තෝ
අන්සත්දවසකින් පුණුරැසිපොහොදවස් ම සැමි මහබඹ සඳමඩල
පලාපියා මා කරා එයි මුළුනුවර හඩගහයි කියා නැගී ගියෝ.
හෝ හදහා සූරව සතුටුව සවස රැඳුම්හි නුවර වැද කී පරිදෙන්
හඩගහයි, මිනිස්නු අත්පිඩුගසා "බලව දිටඨමඩගලිකා අපට සැ
ඩොල්දරුවා මහබඹ කෙරෙයි" යෙමින් කෙළිකෙරෙත්. හෝ

අනෙක්දවස්හිද එසෙසින්ම සවස රැසිම්හි නුවර වැදූ අන්සදවස
කින් පස්දවසකින් සතරදවසකින් තුන්දවසකින් දෙදවසකින් එ
ක්දවසකින් ම හිමි මහබඹ සඳමඩල පලා පියා මා කරා එයි හඬගැ
හූ. එකල්හි බමුණෝ මේ දිට්ඨමඞගලිකාව ඉතා සූරව කියසි සැ
බෑවෙක්වන්නේවෙයි ඒ දිට්ඨමඞගලිකාවගේ ගෙය සදම්හයි ගො
ස් ගෙයවටා වැලි එවූහු. හෝ පුණුරුසිපොහොදවස්හි රැසිමෙම
හි නුවර වැද අද ම හිමි මහබඹ එයි හඬගැහූ. බමුණෝ මෝ නු
දුරුකොට කියසි අද මහබඹ එලඹ වසන තැනක් බලම්හයි ගො
ස් සම්ගෙය පිළියෙන් වසා බිම සිවුදෑගඳින් තවරගෙණ උඩ සෙල්
වියන් බැඳ ගඳදුමින් මල්දමින් සැදූහු. ගෙය සදත් සදත් සඳු එප්
සිත. මහසත් සඳු නැගෙත් නැගෙත් ඉඳුහයෙන් දෙලොස්යො
දුන් බඹවෙසක් මවාගෙණ අහසට නැගී සඳවිමන් ඇතුළට වැද
උදයගිරිඅනානයෙන් නැගෙණ සදබිඳ නික්ම මහජනයෝ සඳම
ඩලට පෙරටුව මා දකිත්වයි ඉටූහු. ජනයෝ ඔවුන් දැක දිටුමගුල්
කී දූ සැබව එන්නේ මහබඹනු පුදම්හයි ගඳ මල් ආදිය ගෙණ ඇ
යගේ පිරිවරා සිටියෝ. මහසත් නුවර මුදුනෙනිගෙණ සත්යලක්
වටා ඇවිද මහජනයා දුටුබැව් දැන දෙලොස්යොදුන් අත්බැව්
අතුරුදහන්කොට මිනිස්පමණව මැවී හැමදෙනා දක්නා සේ ස
ම්ගෙට ගොස් වනු. ජනයෝ දැක අපගේ මහබඹ බටහ යී ජව
නිකා ගෙන්වාගෙණ වටා බැඳ පිරිවරා සිටියෝ. මහසත් යහන්
මැද වැඩහිඳ දිට්ඨමඞගලිකාව ති ඔසප්වෙහිදැයි කිහ. එසේය හි
මි සී කිව. මා දුන් පුතක්හු ගණුව යී ඇඟිලෙලන් නැබමඩුලූ පිරිම
ටහ. එමවිගස ගැප් පිහිටිය. මෙපමණකින් ති පා දෙව් දිය මුළුද
ඹදිව රජනට අභිෂෙකොදකවෙයි තෝ සිට යී කියා බඹඅත්බැව්
මවා හැමදෙනා දක්නා සේ නික්ම අහසට නැගී සඳමඩලට ගො
ස් වනි. හෝ එතැන් පටන්ගෙණ බ්‍රහ්මපජාපති නම්වූව. බමුණෝ
මහබඹනු අඹු ඇතුළුනුවර වුවමැනවැයි ඇය සව්බණිත්සඳ සව
ණිසිවිකායෙක හිඳුවාගෙණ සත්වන කුලකෙළවර දක්වා නොපි
රිසුදුකුල ඇතියන් සිවිගේ නොගත දී පිරිසුදුකුල ඇති බමුණන්
සොළොස්දෙනෙකු ලවා සිවිගේ ගන්වා ගඳින් මලින් පුදමින් නුව
රට ගෙණවැද බ්‍රහ්මපජාපතිය ඉඳුල්ගෙයි නොවිසියහැකක බිම්පි
ස ගෙයක් කරවම්හයි කරවනා තත් දක්වා [ගෙය කරණ තෙක්]
මඩුයෙක වුසුවමැනවැයි මඩුවෙක වාසයකරවූහු. එතැන් පටන්
ගෙණ ඇස්සමුයෙහිසිට ඇය වැන්දූවියෝ කහවණුවක් දී වඳිත්.
බස් ඇසෙන තැන සිට වැන්දැවියෝ සියයක් දී වඳිත්. ලඟ සිට
වැන්දැවියෝ පන්සියයක් දී වඳිත්. පා විට හිස්තබා වැන්දැවියෝ

දහසක් දී වඩිත් පාදෙව් දිය කැමැතතාහු දශදහසක් දී ගණිත්.
පිටිනුවර පටන්ගෙණ ඇතුළුනුවර මඩුතැන් දක්වා ඒ නියායෙ
න් ලත් ධන සියක්කෙළක් පමණ විය. සියලුදඹදිව හැමරජහු
බ්‍රහ්මපජාපතියගේ පා දෙව් දියෙන් අභිෂෙකකරම්හයි පිටිනුවර
පටන්ගෙණ ඇතුළුනුවර මඩුතැන්දක්වා ලක්‍ෂ ලක්‍ෂ දී ගෙන්වා
ගෙණ ඇය පා දෙව් දිය මුදුනෙහි ඔති. මඩුයෙහි වෙසෙමින්
පුතකු ලද. මහපුරිසා පිණිස උපන් කුමරු ඔහුසේම යහපත්වූ
හැමලකුණෙන් පරිපූණිවිය. මහබඹු පුතෙක් උපනැයි සියලුද
ඹදිව එකකොලාහලවිය. කුමරහට කිරිමිළ වැලම්ළය * යි ඒ ඒ
දිගින් අල ධන දශදහසක් කෙළය. පහයත් නවාම් දශමසකින්
නිමියේය. කුමරහු නම් තබම්හයි ගෙය සදා දරුවා ගඳදියෙන් න
හවා කුමරබරණ පලඳවා පහයට වඩා මඬපයෙහි උපන්නෙත්
මණ්ඩපප නම්කළෝ. කුමරු සුවසේ මහත් පෙළහරින් මහත් පි
රිවරින් වැඩී සත්හැවිරිදිවියපැමිනි කල්හි සියලුදඹදිව සිල්පදන්හා
තාක් දෙනා අවුදු සිල්ප උගන්වති, දරු නුවනැත්තෝ ඇසූ ඇසූ
වා මුතු අවුනන්නක්හු සෙයින් උගන්නී උගත් උගත් දෑ රත්බජ
නෙහි ඔත් සිහතෙල් සෙයින් තහවුරුව දරයි. උගන්නා තාක්
දැයින් උහු නොඋගත් දෑ නැති. බමුණෝ උහු පිරිවරා ඇවිදිනි
හේ බමුණන් කෙරෙහි භක්නිඇත්තේ සොළොස්හැවිරිදිකල්හි
පටන්ගෙණ බමුණන්ට බත්දෙයි. නිතෙතත් ගෙහි බත්කන්නා
හු අසූදහසක් බමුණන් හ, ඔවුන් සතරවන දොරටුයෙහි හිඳුවා
බත්දෙයි. එසේ දන්දෙමින් සිටිකල එක්දවසක් ගෙහි කිරිබත් ප
ක්හ. අසූදහසක් බමුණෝ සතරවන දොරටුයෙහි හිඳ ගිතෙලින්
හා මීකඩ සකුරෙන් කිරිබත්කති. දරු සව්බරණින් සැදී රන්මර
වැඩියට නැගී අතින් ලද දඬුවක් ගෙණ මොහුපෙරට සකුරු තබව
මොහු පෙරට ගිතෙල් ඔසව මිහි ඔසව යී කියමින් විචාරමින් ඇ
විදී. එකල්හි මාතඬගසෘශීහු හිමවත්හි ආශ්‍රමපථයෙහි වසනුයේ
දිටඪමඬගලිකාව පුතුගේ පවත් කිමහොයි බලා දුලද සැඬ සළා
කිඹුල් මූවර සියෝ නොතොටට බට බව දැන අද ගොස් දරුවා
දමා යම්කෙනෙක්නට දුන් ධන ඵල මහත්වේද ඔවුන්ට දන් දෙ
වා අව මැනවැයි සිතා අහසින් ගොස් අනුදත් දහතළායෙනි
දෑහැටි වලඳා රත්ගල්තෙලෙහි සිට දෙපටසිව්රු හැඳ පටිය බැඳ ප
වුල් සඟලසිව්ර පෙරවා මැටිපය ගෙණ අහසින් ගොස් සතරවෙ
නිදොරටුයෙහි අසූදහසක් බමුණන් බත් කන තැනම වැඩසිටි
යෝ. මඬපපකුමරු බලනුයේ මහසත්හු දැක දෑහැව තා පහයින්

* බැලම්ළ. යී, අස්ගිරියේ පොතේ.

නොගත් බැවින් කසලපිඩසක් වැනි තොට පියළි ගොතා හත්
බැවින් ලාමකවූ මාගේ දන් ගන්නට නොනිසිවන, අදක්ෂනි
යවූ තෝ මාගේ පරමදක්ෂනීයවූ බමුණන් හුන් තැනට කුමට අ
හි කීය. ඒ අසා මහසත් මෙලෙක් සිතින් අවවාදකරණුයේ යසස්
විය තාගේ බත් පූතුකෙළේය ඒ බත් වලදකරනහාහු බොහෝ
භජනවත්හු සැමතන්හි ලබත්, සැඩොල්නට නොදෙනුවෝ කව
රහ මට නොදැහැව මා යැපෙන පමණක් දෙවයි කීහ. එසද කුම
ර මේ බත් මට වැඩසඳහා සැදැහැයෙන් ජන්මවත්බමුණන්ට පූතු
කෙළේය අපවැනෙනා් තාවැනි සැඩොල්නට දන්නොදෙමු කුව
ට සි–හිඳැයි කීය. මහසත් දන් නම් ගුණවත්නාටද නොගුණවත්න
ටද දියයුත්තේය, යම්සේ දෙනද ගොඩ වපුළබිජු පොහෝසරු
දු දියසරුදු එලදෙයි එසෙයිත්ම එලනොදෙන දෙනෙක්නම් නැ
ති එබැවින් යම්කෙනෙක්නට ම දියයුත්තේය එතෙකුත්හොත්
සශ්‍යඑල කැමැතතාහු ගොඩත් දෙණත් අමුණෙණින් බිජුවපූරත්
වැසි බොහෝවීනම් ගොඩ වපුළ බිජු එලදෙයි තුබූතැන වපුළ බි
ජු මියෙයි සමවැසිවීනම් තුන්තැනම වපුළ බිජු එලදෙයි මහවැයි
වූයේද නියගවූයේද තුන්තැනින් එක්තැනෙක වපුළ බිජු එලදේ
මය. තොද එසෙයිත්ම එලකැමතිවීනම් ආනාක් දෙනාහට සැදැ
හැයෙන් දන් දෙව එසේ දෙනකල සිල්වත් ගුණවත්කෙනෙක්
සමුවූහුනම් සරුකෙත් වපුළ බිජුසෙයින් තට එලමහත්වෙයි කීහු.
කුමර මම් කොත් හැඳින බිජුපිගිප්වම් ජාතිමත් වෙද දනහා බමු
ණෝ සරුකෙත්හයි කීය. මහසත් ජාති මද මාන ලොභ වෙෂ
මොහ යන මොහු යම් යම් කෙනෙකුන් කෙරෙහි ඇත්ද එව්හු ඇ
සිවැසත් පිරුණු තුඹස්වැනනාහ, එවුනට දුන් දන්හි එල මහත්
නොවෙයිකීහ. මෙසේ මහසත් යම්කෙනෙකුන් කෙරෙහි ජාති
මද මාන ලොභ වෙෂ මොහයෝ නැත්ද මෙත් කුළුණු නුවන
ඇත්ද ඔවුහු සියම්පූරු පිරුණු රුවත්බඳුන්වැ නනාහ ඔවුනට දුන්ද
න්එල මහත්වෙයි ඒ දන් තට සුගිසපුව ගෙණදෙන්නේයයි කීහ.
මෙසේ මහසත්හු දූන පුනා සිල්වත්ගුණවත්නට දුන් දන්එල මහ
ත්පරිදි කියත් දඬුයෙන් පහළ ඇසිවසක්හු සෙයින් කුපිතව මේ තු
න්දෙරටුයෙහි ගොපෙවා් කොයට ගියහයි කීය. ඔවුහු වෙලෙව්
ච අවුදු වැද සිටි කල්හි මොහු කුමට වැඇදූන්හයි කීය. වදනාකල
නුඹුටුම්හ මෙනම් තැනෙකින් ආය යනු නොදනුම්හ මහාමායා
කාරයෙක්දෝ හෝ විද්‍යාධරයෙක්දෝ හෝ නොදන්නමෝ අපවි
සින් කළමනා කිමෙක්දැයි කීහු. මොහු මුහුන පැහැර දඬුයෙන් නු
නපත්තෙත් සිපා පිට වරුඑනගා පියා කරගෙණ සතරවන දොර
වූයෙන් පිටතට නෙරාපියවයි කීය. මහසත් ඔවුහු ලඟනොවනතු

රුම අහසට නැගී සිට හෝ විදුරුගල් නියෙන් කැඩියටියෙහි වහ නොදැන කැයටියෙහි ගිනි ගිලියටියෙහි කියා ඔහුදු බමුණනුදු දක්නා සේ අහසට නැගී ගියෝ.

එසින් වදාළහ බුදුනු.

ඉදං වත්වා න මාතඞ්ගො ඉසි සච්ච පරක්කමො
අන්තලික්ඛස්මිං පක්කාමි බ්‍රාහ්මණානං උදික්ඛතං.

මහසත් පැදුම්දෙස බලා ගොස් එක්වෙයෙක බැස මාපියවර දිට්ඨමඞ්ගලිකාවට පැණේවයි ඇත් අස් ආදීහු විසින් නොමකාවයි ඉටා එකෙණෙහි අහරසිඟානෙණ එක්ශාලාවෙක වලඳයි. එනුවර දෙවියෝ අපගේ සිල්වත් ගුණවත් වහන්සේට උහු බුණු සේ නොයෙදෙයි දැහැවිච ගොස් ඔවුන් කෙරෙහි නායකදරුවා ග්‍රීවා ච ගෙණ පෙරළාතිබී. සෙසුයකකු සෙසුබමුණන් ග්‍රීවා ගෙණ පෙරළා තුබූහු. මේ මහපුරිසා පිතැයි මෙළෙක්සිනින් නොමැරුහ. කුමරහු මූහුන පෙරළි පිටිපස් බලා තුබූයේය ඇස් පෙරළි මළ මිනිසුන් ඇස්වැනිවිය සෙසුබමුණෝ මූවෙන් පෙනනගමින් පෙරළි අත් පා සපත්, ඔහුගේ පරිජනයෝ ගොස් එපවත් දිට්ඨමඞ්ගලිකාවට කීහු. හෝ වෙලෙව්ව පහසින් බැස නොස් මපුත්හට මේ කළාහු කවරහයි කිව. ජනයෝ මෙයට ආ පවුල් පෙරවි මහණෙක් මේ කෙළේයයි කීහු. හෝ ඒ අසම්ත්ම අනික් කෙනෙකුගේ බල නොවෙයි මට මහත්සම්පත් දුන් මාතඞ්ගපණ්ඩිතයන්ගේ බලය දූතූ පමා සේ දැක ආයේය හේ මෛත්‍රීභාවනායෙන් සම්පන්නාය මෙතෙක්දෙනාහට මෙසේ දුක් පත්කොට පියා නොයෙයි සිතාගේ කොයට-ගියහයි පිළිවිස පුන්සඳක්මෙන් තෙව්මින් පැදුම්දෙසබලා අහසින් ගියේය යනු අසා මපුතු දිවිසදහා ඒ උතුමා අයදනට ගියමැනවැයි රන්කලස රන්මලා ගන්වාගෙණ දැස්ගණ පිරිවරා ගොස් මහපුරිසා පියවරදැක මේ ම හිමියා පියවරයයි බලමින් නොස් ඔවුන් පුටුයෙක හිඳ වලඳනනාවුන් දැක වැද සිටියා. මහසත් ඇය දැක මදබතක් පය තිබීය. හෝ රන්කලසයෙන් දිය ගෙණ මහපුරිසා අත් පා දෙවා මපුත්හට මේ දුක් කළාහු කවරහයි කිව. තී පුතු තපස්වීන්ට කළ ආක්‍රොෂ දැක ඔවුන්ගේ ගුණ දන්නා දෙවියෝ උහුට මෙතෙක් දැ කළාහයි කීහ. මම් පුත්‍රසොකයෙන් ආම් තොප සරණ යෙමි ම පුත්හට නොදැහැව යී කිව. තී පුතු මට ආක්‍රොෂ කල හෝ අයදනාකල හෝ මා සිත දෙම්නස් ඇත්තේ නොවෙයි ගේ වෙදමදයෙන් මත අඥානෝ නොදත්නී කීහ. උහු දිවිගැලවී නොයන තුරු ඒ බාලයාහට ක්‍ෂමාකරන්නේය වහන්සේ සී කමවා වැන්ද. එසේ බැවින් යකුන් පලා යනුසදහා

නිට අමාඹසසක් දෙම් මා ඉඳුල් බත් ගෙණ යා යී කීහ. මැනව ව
හන්සේ යී රන්මලාව එලවුව. මහස එගි ඉඳුල්බත් එව ඉඳුල්දි
ය එව මෙයින් සමහරක් නි පුතුවූවෙගි ඔව තුබූවා සැල දිය න
ගාපියා එගිලා අලලා සෙසු බමුණන් මුවෙගි ඔව ඔනු හැමදෙනා
නිරොගිවෙතැයි කියා අහසට නැඟී හිමවත් ගියහ. හෝ ඒ රන්
මලාව හිසින් ගෙණ අමාඹයසක් ලදිමැයි කියමින් ගෙට ගොස්ප
ලමු පුතු මුවෙගි ඔන. නායකදෙව්රජ සඩාඕහු තමා බෙහෙත් ක
රණ කල අප කිසිදූ නොකොට හැකකැයි පලාගියහ. දරු වෙර
ධූලි පිසමින් නැගී අම්ම මට මේ කෙළෙ කිමෙකැයි කීය. තා කළ
දූ තෝම දනෙනගි ඒ තා පරමදක්‍ෂනිය කොට ගත් බමුණන්ගේ
විකාර බලවයි කිව. ගේ බමුණන්ගේ විප්‍රකාරය දැක විපිළිසර ඇ
තිවිය. එකල්හි උහු මවු පුත මඩපපය තෝ බාලයෙහි දානඵල
මහත්වන තැන් නොදනෙනගි දක්‍ෂවූනරයෝ නම් මෙසේ
නොවෙති මාතඞගපණ්ඩිතයන් සෙවෙනි මෙතැන් පටන්ගෙණ
මේ දුස්සීලයන්ට දන් නොදෙව සිල්වත්නට දන් දෙව මේ බල
තාගේ කුඑපගයන් අමාඹයු පොවා නිරොගිකරම්හයි ඉඳුල්කැද
දිය සැල ලා අසූදහසක් බමුණන් මුවෙගි එවූහු. බමුණෝ වෙර ධූ
ලී පිසමින් නැංගහ. එකල්හි සෙසුබමුණෝ ඒ බමුණන් සැඩොල්
හු ඉඳුල්දිය පීහයි නොබමුණුකළහ. ඔවුහු ලජ්ජාඇතිව පලාගො
ස් මෙධ්‍යමහරජහු කෙරේවිසූහු. මණ්ඩපකුමරු බරනැසම විසී./
ඉක්බිති වෙත්‍රවතිනම් නුවර නිසා වෙත්‍රවතිනම් හෝතෙර ජන්
මවත් බමුණෙක් පැවිජ්ව ජන්ම නිසා මහත් මන්කොට වෙසෙයි.
මහසත් උහුගේ මන් බිඳිම්යි එයට ගොස් හුඩුහොය වසනුයේ එ
ක්දවසක් දූහැටි කා මේ ජාතිමත්හුගේ ජටායෙහි ලගණවේවයි
ඉටා හොයදියෙහි බහා පීහ. දූහැටි ගොස් නානනහුගේ ජටායෙ
හි ලගනවිය. ගේ දැක දූහැවිව හුඩුහොයට යනුයේ මහසත්හු දැ
කා තාගේ කවරජාතියයි පිළිවිස සැඩොල්ජාතියයනු අසා තෝය
දියෙහි දූහැටි බහා ලූයෙහි පිළිවිස මමය කියෙන් තා සැඩොල්
කොලු මෙහි නොවසා යටහෝ වසායී කීය. යටහෝ වසනනාහු
විසින් බහා ලූ දූහැටි හුඩුහොයට ගොස් ජටායෙහි ලගනවූ කල්හි
යටන ඉදින් තෝ මෙහි වෙසෙසිනම් සත්වනදවස් තාහිස සත්
කඩක් කොට පලම්යි කීය. මහසත් ඉදින් මම් මුහුට දැහැව්යෙ
ම්නම් මාගේ සිල් නොරැකෙයි උපායෙන් මුහුගේ මන් බිඳ පිය
මැනවැයි සත්වනදවස් හිරු නොනැංගදුන. මිනිස්හු ප්‍රතිහතව
රජු ගෙණ ජාතිමත් තව්සා කරා ගොස් තොපිය හිරු නොනැංග
දෙන්නෙහියි පුළුවූත්හ. ගේ මා කළ දැයෙක් නොවෙයි හෝතෙ
ර එක්සැඩොලෙක් වෙසෙයි උහු කළ දෙයෙක් වන්නේවෙයි කී.

මිනිස්නුඹනුකරඑළඹ නොපියවහන්සේ හිරුනොනැංගදෙන්නේ යයි පුළුවුත්හ. මමයයි කීහ. කුමට හිරු නොනැංගදෙවයි පුළුවුත් කල්හි තොපගේ කුලයට එළඹෙන තවුස් මා නිවරදහට සාපකෙළේ උහු අවුදු මා කමවා පාවිට හොත් කල්හි හිරු විහිදුවමි කීහ. ඔවුහු ගොස් ඒ තවුසා අත් පා අත්ලා ඇදගෙණ අවුදු මහසත්හු පාමුල හොවා වන්දවා හිරු විහිදුවා වහන්සේයි කී කල මම් වූ කල් ක්ෂමාකෙළෙම් උහු ක්ෂමා නොකළ තාක් කල්හි හිරු නොවිහිද හැකැකැයි කීහ. ඔස වහන්සේ කුම් කරම්හයි කීහ. මහසත් මැටිපිඩක් ගෙණෙවයි ගෙන්වාගෙණ මේ මැටිපිඩ තවුසා හිසත බාමුහු දියට බහා දියෙහි සිටුවයි සිටුවා හිරු වුහූටහ. හිරුරැස් පහළ විගස මැටිපිඩ සත්කඩක්ව පැළී ගියේ. තවුස් දියෙහි ගැලී කිමිද අනික්තොටකින් නැගී ගොස් එතැන් පටන්ගෙණ ජාතින් කම්නැති පැවිජියත් සිත ගුණ දහමත් මිසයයි මත්විසිනොව විසී. මහසත් උහු දමා අශුදහසක් බමුණෝ කොයි වෙසෙති හොයි අවජනෙන් මෙධ්‍යනම් රජුකෙරෙහි වසනුවන් දැක ඔවුන් දමනු ස දහා ඉදුහයෙන් ගොස් නුවර අබියෙස්හි බැස පය ගෙණ නුවර වැද ස්හනාට වන. බමුණෝ දැක හැඳිනා මේ මෙහි එක්දෙදවසෙක් විසිනම් අපට පිහිට නැතැයි වෙලෙව්ව ගොස් මහරජ මායාකාර එක්විඪාබරයෙක් මේනුවරට ආය උනු වහාම මරවයි කීහූ. රජ මැනවැයි ගිවිසස. එකල්හි මහසත් අහර සිගාගෙණ එක්නැනෙක්හි හිද වලඳා උයන් ගොස් අතීතයෙන් හා අනාගතයෙන් අසූකපක් දනුතුදු ආවජ්ජනා නැතිව නිවරදවන බැවින් සැක නැතිව මගුල්සල්වට වැතිර හෙව හූන්නේය. රජ අනුන් කියමන් ගෙණ තෙමේම ගොස් කඩුයෙන් මහසත්හු හිස සිඳ පීය. හේ මිය බඹලොව උපන. දෙවියෝ දැහැව්ව පෙර කී සෙයින්ම නවවිධවරුෂා වැස්වූහ. මෙහි අටවනුව හුනුකළ ලොහොදිය බදු ලොහොමඩවැසි වට, නවවනුව එබඳු හුණුකලල්වැසි වට. මෙසේ කැලණිමහරජු සහනට කළ වධයෙන් ඔහුගේ රජය මුහුදු ගිලුවා සෙයින් මෙම මෙධ්‍යනම්රජු මාතඞ්ගනම් ඍිහට කළ වධයෙන් උහුගේ රට නොරටවිය, ඒ රජ සහපිරිවරින් ගොස් මහානරකයෙහි උපන. එයින් කීහ සඞ්කිච්චපණ්ඩිතයෝ.

උපහච්චමනං මෙජ්ඣා මාතඞ්ගස්මිං යසස්සිනො
ස පාරිසජ්ජො උච්ඡිනො මෙජ්ඣාරඤ්ඤං තදා අහු.

මෙසෙයින් මෙඬ්ඣාරණ්‍ය වල්වූ පරිදි දනසුනු—මාතඞ්ගඹිහු නමින් ගේ මාතඞ්ගාරණ්‍ය නම්වී.

මෙසේ බුදුහු දණ්ඩකාරණ්‍යාදින් ඍීත්ගේ දැහැවිලින් වල්වූ පරිදි

වදාළෝ. එසඳ උපාලිගෘහපති වහන්සේ, මම පළමු උපායෙන්ම
ප්‍රසාදකොළෙම් එතකුදුවුවත් භවත්හුගේ විසිතුරුප්‍රශ්නව්‍යාකරණ
ඇසියටිව මිරුඩයක්හුමෙන් වීමි යි පැහැද සරණගියේ. මහසිට සි
තා පිරික්සාලා සරණයනුමැනව තොපවැනනාවුන් මා දක සරණ
යනකල නුවටුන්ලවා මේ උපාලිමහසිටු දුටු දූටුවන් සරණයෙයි
යනු නොකියවුව මැනව තොපවැනි ප්‍රසිඬමිනිස්හු සිතා පවත්නා
තැන යෙදෙයි වදාළෝ. වහන්සේ මම සිතා පිරික්සා සරණයනු
මැනව යන මෙසිත්ම ඉතාසතුටුවම් තීර්ථකයෝ සවවත් ලත් ක
ල අසවල්රජ අසවල්ඇමති අසවල්සිටු අප සරණගියේ සව් වීයයි
දද නගා නුවර හඬගහා ඇවිදිති තමන් මහත්බැව් පහළකරණු
සඳහාය, මා ලත් කල සිතා පිරික්සා සරණයන්නට වදාරණදූය ව
හන්සේ මම දෙවනවටදු සරණයෙමියි සරණගියේ. බුදුහු මහසිට
තාගේ ගෙය බොහෝදවසක් නුවටනට පැන්පොකුණක් සේ සි
පියේය පෙර තොප ආ තාක් දෙනාහට නැතැයි නොකියා දෙයි
දූන් මා සරණගියබැවින් ඕනට දෙන දූ නොසිඳ ආ කෙනෙක්න
ට දෙන්නේයයි වදාළහ. වහන්සේ මම නිවටුන් කියනසේ ඇසූ
වෙමි මහණගොයුම් මටම දන් දියයුතෙත්ය මාගේ සවවන්ටම
දන් දිය යුතෙත්ය මට දුන්නෙහි ඵල මහත මාගේසවවන්ටම
දුන්නෙහි ඵල මහත අනුන්ගේ සවවන්ට දුන්නෙහි ඵල මහත්
නොවෙයි කියන්නාය දූන් වහන්සේ නුවටුන්කෙරෙහිද දන් ස
මාදම් කරවනදූය මම එයට කටයුතු දන්මි වදාරණ දැයට සතුටි
මි වහන්සේ මම තුන්වනවටද සරණයෙමියි මෙසේ තුන්යලක්
තුණුරුවන් සරණගියේ. එකල්හි බුදුහු ඔහුට සිවුසස් දෙසූහ, ගේ
සෝවාන්ඵල පසක්කොට දුටුදම් ඇතිව දත් දහම් ඇතිව වහන්
සේ ඇප් බොහෝ කාර්‍ය ඇතනම්හ යී කීහ, කල්දැන මහසිට සී
වදාළෝ. එකල්හි උපාලිගෘහපති හුන් තෙනින් නැඟී බුදුන් වැඳ
පැදකුණුකොට තමාගේ ගෙට ගොස් දොරටුගොව්වා කැඳවාගෙ
ණ අද පටන්කොට ගෙණ නුවටුන් ගෙට නොවැදැ දෙන්නේය
බුදුන් සඟුන් උපාසක උපාසිකාවන් ආ කල වැදැදෙන්නේය ඉදි
න් කිසියම් නුවටෙක් ආනම් උහු කැමත බත් ගෙන්වා දෙන්නේ
යයි යොදා ගෙට වන. එකල්හි දීඝතපස්වී උහු බුදුන් කරා ගිය
තැන් පටන්ගෙණ සිටු නුවනැත්තේය මහණගොයුම්හු දර්ශනස
ම්පත් ඇත්තේය නෛර්යාණික කථාඇත්තේය ඔහුගේ දර්ශනයෙ
හිදු පහදැ පැහැද සරණයෙයි තව සරණගියේ හෝ නොගි
යේ හෝ පිරියෙස්මින් ඇවිදිනේ ඔහු සරණගිය පරිදි අසා නි
ගණ්ඨනාථපුත්‍රයා කරා ගොස් උපාලිමහසිටු මහණගොයුම්හු සර
ණගියේල යී කීය. හේ ඒ අසා උපාලිමහසිටු මහණගොයුම්හුගේ

සව්බවට නොනිසිවෙයි මහණගොයුම්හු උපාලිමහසිටුහුගේ සව්
බවට නිසැයි කීය. මෙසේ දීඝතපස්වී උපාලිමහසිටු මහණගො
යුම්හුගේ සව්බවට ගියපරිදි තුන්යලක් කියා නිගණ්ඨනාථපුත්‍රයා
නොහදහන සේ දැක වහන්සේ මම් උපාලිගෘහපතිහු මහණ
ගොයුම්හුගේ සව්බවට ගියේ නොගියේ යනු ගොස් දනුම් හොයි
කීය. මැනව ගොස් අතුරු දැනැයී කීය. එසඳ දීඝතපස්වී උපාලි
ගෘහපතිහුගේ ගෙට ගියේ, දොරටුගොව් ඔහු නොවැද්දදී සිට අප
මහසිටු මහණගොයුම්හුගේ සව්බවටගියේය තොප නොවැද්දෙ
මි බත්කැමත මෙහි සිට මෙයට ගෙණෙති යී කීය. මට බතින් ක
ම් නැතැයි එහිම සිට නැවත නිගණ්ඨනාථපුත්‍රයා කරා ගොස් උ
පාලිමහසිටු මහණගොයුම්හුගේ සව්බවට ගියේ සැබව මම් මුලම
කීම් වහන්සේ උපාලිමහසිටු මහණගොයුම්හට වාදාරොපනයට
යනු මට නොරිස්සුනේය ගේ මායාවිය අහුන්ගේ සවවත් ආවෘතන
නයකොට ගන්නා මායාවක් දන්නේය දැන් තොපගේ උපාලිම
හසිටු මහණගොයුම්හුගේ ආවෘතනීය මායාවෙන් ආවෘතනනය
වීයයි කීය. එකල්හි නිගණ්ඨනාථපුත්‍ර දීඝතපස්වීහු [යළිදු පෙර
සෙයින්ම] තුන්යලක් කිවා නොහදහා මම්ම ගොස් දන්මියි මහ
ත් හුවටපිරිස් හා සමග උපාලිගෘහපතිහුගේ ගෙට ගියේ. දොරටු
ගොව් ඔහු නොවැද දී සිට අපමහසිටු මහණගොයුම්හුගේ සව්
බවට ගියේ තොප නොවැද්ද දෙම්හ බත් කැමැතතහුනම් මෙහි
සිටුව මෙයට ගෙණ එති කීය. ගේ බලවත් සොකයෙන් අභිභූත
ව මෙහිම සිටුව යන බස නොසලකා තෝ ඔහු කරා ගොස් මා අ
වුත් දොරටුයෙන් පිට තමා දැකකැටිව සිටි පරිදි කියා සී කීය. දො
රටුගොව් ගොස් සිටුහට කී. උපාලිමහසිටුහුගේ පහය වටා සත්
පව්රු සත්දොරටුය ගේ දොරටුගොව්හට මධ්‍යයෙහි සතරවනදො
රටුයෙහි තමා හිඳිනා අසුන් පනවන්ට කීහ. ගේ අසුන් පනවා
ගොස් කීය. සිටු එයට ගොස් හැමට උතුම් අස්නෙහි හිඳ නුවටුන්
එවයි කීහ. එනුකරයී කියා දොරටුගොව් ගොස් නුවටුන්ට කීය.
එකල්හි නිගණ්ඨනාථපුත්‍ර මහත්නුවටපිරිස් හා සමග සතරවන
දොරටුවට ගියේ. පෙර උපාලිමහසිටු නිගණ්ඨනාථපුත්‍රයා එන කා
ල දුරම දැක පෙරමගට ගොස් අතවටගෙණ ගෙට ඇර හැමට උ
තුම් අස්නෙහි උතුරුසළුයෙන් පිස පියා එමඋතුරුසළුව බඩ වටා
ඔමින් ආචාර්‍ය්‍යය සෙමෙන් හිඳුව සෙමෙන් හිඳුවයි යෙමින් මහත්
තෙල්කලයක් බහාතබන්නකු සේ දොඅතින් ගෙණ බහා හිඳුව
යි. ගේ දැන් හැමට උතුම් අස්නෙහි තෙමේ හිඳ තිළු [නුවටනට]
හිඳුවයිකීහ. එකල්හි නිගණ්ඨනාථපුත්‍ර බලවත්සොකයෙන් අභිභූ

තව මහසිට ඇලලග්ගෙයෙහි මහණගොතුම්හට වාදාරොපනයට
ගොස් මහත් වාදබන්ධනයෙහිබැඳී ඔහුගේආවෘත්තනීය මායාවෙ
න් ආවෘත්තනිතව ආයෙහි කී. එකල්හි සිටු තමා පිළි ලත් සෝවාන්
මග සඳහා වහන්සේ ආවෘත්තනීයමායාව භද්‍රය සූකරය කල්‍යාණ
ය මාසිනැගැනී නෑයෝ මේ ආවෘත්තනීය මායාවෙන් ආවෘත්තනිත
වෙත්වා, මේ මා සිනැහැ ති නෑයන්ට බොහෝ කල් හිතයට සුවය
ට වැටෙයි හැම රජ්ජුරුවෝ හැමබමුණෝ හැමවෛශ්‍යයෝ හැම
ශූද්‍රයෝ හැමදෙවියෝ හැමමිනිස්හු මේ ආවෘත්තනීය මායාවෙන්ආ
වෘත්තනිතවෙත්වා යේ ඔවුන්ට බොහෝ කල් හිතයට සුවයටවැටෙ
යි තොපගේ සසුන් අනෛර්‍යාණිකය අපබුදුන්ගේ සසුන් නෛ
ර්‍යාණිකය තොපට උපමාවක්දක්වමි ඒ නුවනැති කෙනෙක් දනි
ත්. "පූර්වයෙහි එක්තරා මහළුබමුණෙක්හුගේ ළදැරිභාර්‍යාවක් වූවා
හෝ ගැබ් ගෙණ වදන වර වූ කල යා බමුණ ඇවිනිදොර දිව් ඇ
හී නැති කෙළිබඩු තබා විකුණත් තිලින් මිළයක් ගෙණ ගොස්
ම පුතු කෙළෙනට නිසි වඳුරුපැටවෙකු විකිණීගෙණ එවයි කීව.
දැන් බල නි වැදූ කල පිතෙක් වීනම් වඳුරුපැටවෙකු ගෙණ එම්
දුවක් වූනම් වඳුරුපැටියකු ගෙණ එම් කීය. යළිදු ඇය දෙනුන් ය
ලක් කී කල්හි කැමැත්ත කළ මැනවැයි බමුණු ඇවින්දොරින් ව
ඳුරුපැටවෙකු විකිණීගෙණ ඇර පුතු කෙළෙනට මූහු බලාගන්නැ
යි කී. එකල බැමිණි බමුණ මේ වඳුරුපැටවා රඟ පොවන රදාදරු
වා කරා ඇර රන්වන්කොට පොවා තළා ගුලා මටකොට ඇර දක්
වා දෙනුකරයි කීව. බමුණු ඇය කැමැත්ත කළමැනවැයි රදාදරු
වා කරා ගොස් මුහු රන්වන්කොට පොවා තළා ගුලා මටකොට
දෙවයි කී. එකල්හි රදාදරු දිවි ඇතිවත් නැතිවත් අනියත මේ ව
ඳුරු පැටවහු රන්වන්කට නොහැකක කද තබා කොලනමුගුරෙන්
කුස පහළ කල කුසම්රිකෙයි වසුරු නික්මෙයි හිසපහළ කල හිස
මිරිකෙයි මුල් නික්මෙයි මිටිවහන තබා ගුලන කල ලොම් නැතී
වෙයි සිවිදූ නැතිවෙයි සිවි නැතිවත්නාහූ තළන කල කඩ කඩව
යෙයි ගුලන කල සුණුව යෙයි මේ වඳුරුපැටවහු රඟක්ෂම නොද
වෙයිආක්‍රොටනක්ෂමනොදවෙයි විමර්ජනක්ෂම නොදවෙයි"කීය.
එසෙයින්ම බාලවූ නුවටුන්ගේ කථා ප්‍රියව රාගමාත්‍රයක් රජනාවන
බැවින් රඟක්ෂම නොද වෙයි පණ්ඩිතජනයන් විසින් නුවටුන්
ගේ කථාද සෙසු භාරත රාමායණාදී නිරර්ථක කථාමාගීද විමසා
බලත් බලත් තොහො පැහැර සහල් සොයන්නා සෙයින් කෙ
හෙල්ගස හර සොයන්නා සෙයින් සිස්වන බැවින් අනුයොගක්ෂ
මනොදවෙයි විමර්ජනක්ෂමනොදවෙයි.ඒබමුණු අනෙක් සමයෙ

කැ ගා පිළී සඟලක් ගෙණ රගපොවන රදෘදරුවා කරා ගොස් මේ සඟළ රත්වත්කොට පොවා තළා ගුලා මටකොට දෙවයි කීය. ඒකල්හි රදෘදරු වහන්සේ මේ සඟල වූ කල රගඤමය ආක්‍රොටන ඤමය විමාජ්ජනඤමයයි කී. එසෙයින්ම අප සම්මාසම්බුදුහුගේ සිවුසස් දිස්නා කථා පණ්ඩිතජනයන්ට ප්‍රියවන බැවින් රගඤමය අනුයොගඤමය අනුමාජ්ජනඤමය හැවුද්දූ සියඝකුදු අසත් තෘප්ති නැති, මහමුහුදු සෙයින් ගැඹුරුවෙයි කීහ. එකල්හි නිගණ්ඨ නාථපුත්‍ර මහසිට දූවියෙහි තා අපගේ සව් බැව් දනිමු දැන් තා කාගේ සව්ය යනු දනුම්හයි කී. එසඳ උපාලිගුහපති හුනස්නෙන් නැගී උතුරුසළුව එකස්කොට ලා බුදුන් වසන දෙසට ඇදිලි බැඳ මම් යමක්හුගේ සව්යෙම්ද ඔහුගේ ගුණ අස්වයි බුදුන්ගේ ගුණ වණනුයේ තමා සැකෙව්න් කී දැයක් අනෙකාකාරයෙන් දන්නා උඝඝටිතඥපුඝුල්වන බැවින් හා සෝවාන් මගින්ම ආ පිළිසිඹියා විසයෙහි සිටින බැවිනුදූ.

ධීරස්ස විගත මොහස්ස—පභින්න ඛිලස්ස විජිතවිජයස්ස.
අනීඝස්ස සුසම චිත්තස්ස—වුඩසීලස්ස සාධු පඤ්ඤස්ස
වෙස්සන්තරස්ස විමලස්ස—භගවතො තස්ස සාවකොහමස්මි.

යනාදි විසිත් දශගාථායෙකින් සියක් පදයෙකින් බුදුන්ගේ ගුණ වණා මම් මෙබඳු ගුණ ඇති බුදුන්ගේ සව්යෙම් කීහ. එකල්හි නිගණ්ඨනාථපුත්‍ර තා මහණගොයුම්හු කරා දැන්ගොස් අව එව්ගස මේ ගුණ කෙසේ කියන්නට නිසිවෙහි කීය. එසඳ සිටු යම්සේ නානා පුෂ්පයන්ගේ මහත් මල්රැසක් දක්‍ෂවූ මලලරෙක් තමා දක්‍ෂ වන බැවිනුදු මල්හි නොයෙක් පැහැ ඇතිවන බැවිනුදු විසිතුරු කොට ගොතාද එසෙයින්ම බුදුන්ගේ නන් ගුණ කුසුම් ගොතන්නට මා වැනි දක්‍ෂපුරුෂයෙක් නොනිසිවෙහිදැයි කීහ. ඒ අසා නිගණ්ඨනාථපුත්‍ර මේ සිටු අප කෙරෙන් පහව්ය දැන් කළි නටහ අපගේ බත්කුඹ බුනැයි සිතන්නාහට බලවත් සොක උපන හද වත කකියා ගියේ පයක් පමණ ලේ කටින් නැග එහිම දනින් ගිනා. ඔහු හිදෙදූයෙකින් පිටිනුවර ඇර හැදෙකින් පාවාරිකනුවර ඇරගෙණ ගියහ. ගේ පාවාරිකනුවර මෙළේ. මෙසෙයින් බුදුහු තමන් "පුරිසදම්මසාරථී" වන බැවින් උපාලිමහසිටුහුද ආදිශබ්දයෙන් ගත් දශමහාගුහපතිසිටිහුද දමා අමාමහනිවන් පැමිනවූහ.

[මෙතෙකින් නොවියත් හුදිජනයන් සඳහා කරණලද අමෘත ප්‍රවාහයෙහි] ගුහපති දමනා නම් සතරවෙනි පරිච්ජෙදය නිමි.

# ගැටපදවිවරණය.

——XoX——

අට ඉස්බ, බඹ 280. ඉස්බක් පන්තිස් බඹයක්වේ.
අවිජහිත, නොහරණලද.
අමාඅරළු, අමෘත හරීතකී.
අබවස්හි, අභ්‍යවකාශයෙහි-අතු ආදියෙන් නොවැසුනු අහසෙහි.
අසස් පසස්, ආශ්වාස ප්‍රාශ්වාස.
අපිස් සතොස්බව, අල්පෙච්ඡසන්තුෂ්ට භාවය.
අභිෂෙකොදක, අභිෂෙකකරණු පිණිස නහන ජලය.
අනත් අපරි සේ ලෝදුනි, අනන්තාපරිමාණ ලොකධාතූනි.
අටතුරසියක්, අටක් අධිකකොට ඇති සියය.
අභිනූතව, මිරිකී-එඩිතරබැවින් තොරව.
අටලොස්හත්පවුර, 18 රියනක් උස්වූ ප්‍රාකාරය. (වනාව.
අහරපිළිකුල්සඤ්ඤාභාවනා, ආහාරයෙහි පිළිකුල්බව මෙනෙහිකරණ භා
අනුලොම් පිළිලොම්, අගපටන් මුලදක්වාත් මුලපටන් අගදක්වාත්.
අනාගැමි, අනාගාමි මාර්ගය.
අතුරුවේ, අනතුර වීථිය.
අධිවාසනා, ඉවසීම.
අමාවහරේ, අමෘත වර්ෂාව.
අයිනාදන්, අනුන් අයිති වස්තුව පැහැරගැන්මේ
අටසමවත්, අෂ්ටසමාපත්තිය.
අනාථ, අසරණ.
අමාඹසස, දිව්‍යමය බෙහෙත.
අවජනේ, සොයන්නේ.
ආලම්බනපළකය, හාන්සිවන ලෑල්ල.
ආක්‍රොශ, නපුරුකොට බිණීම.
ඇනවමින්, ආඥාකරමින්.
ඇවිනිදෙර, සල්පිල.
ඇසලපුණුපොහොය, ඇසළමස පසළොස්වක් පොහොය.
ඇතුළුවාත, ඇතුළත හැසිරෙණ.
ඇසනොපහළවිරි, ඇසින් දුක නුපුරුදු.
ඇගෑ, අඟසිකා-පහන්.
ඇසිවැසන්, ආශිර්විෂයන්-නයින්.
ඉටා, අධිෂ්ඨානකොට.
ඉකුත්දෑ, අතික්‍රාන්ත (පසුගිය) ජාතිය.

උදන්අැඳුනු, ප්‍රීතිවාක්‍ය පැවැත්වූනු.
උපගත, ලඟට පැමිණි.
ඔච්ජ, නිඳුව.
ඔසප්, මල්වරය.
කම්මපරවසව, කම්මයට වහල්ව.
කම්මජවාත, කම්මයෙන් උපන් වාතය,
කසුන්පය, රත්රන් භාජනය.
කලි නටහ, සැපත නැසින.
කාමපඩකය, කාම නැමති මඩ.
කිලිල්, කලිර-ඉදි පොල් ආදි බඩවගීය.
කිසිනුපිරියම්, කයින්පරිකම්.
කුඹල්සක, වලන් ඉදිකරණ පෝරුව.
කුදුම්සුවැසි, කුඩාකහවණුවැසි.
කූළාරගේ, කූටාගාර-ඉතා උස් විශාල ගෘහ.
කෙහෙලි, ඛජවිශෙෂයක්.
කෙලෙස්බැරියේ, කෙලශයෙන් බරවූ පරිදි.
කොහොන්පිළිවෙත්, කුහක ප්‍රතිපත්ති.
ගජඹ, ගාන්ධර්වනම් දෙවතා කොට්ඨසක්.
ගදවු, ගී.
ගතැව්වුව, ගැණීමට කැමතිවිය,
ගෙයහන, මිදුල.
ගැනිබව, අයිතිබව.
තිලින්මිලයක්, මින් මුදලක්.
තුන්විතක්, කාම-වහපාද-විහිංසන.
තුඹුපට, ඊයම් තෝඹුව.
දූගද, උරැමය-දැමැද්ද.
දුහුල්සුඹුළුව, සිහින්වස්ත්‍රය.
දුඑවස්, නපුරු වචන.
දෙලොස්නුනුව, 12 000000000000000000000000000. (පාදය.
දෙලොස්අභින්යුත් පිළිසඹුපාව්ට, වාදශාඩගයෙන් යුක්තාවූ ප්‍රතිභාව සමුත්
දූහැව්ව, කොපව.
නතුනතුව, නැමිනැමී.
නෛයඹිනික, නිද්දේශ.
නොසරැප්, නුසුදුසු.
නොනටයේ, නොනැසුනුපරිදි.
පස්විකා, ප්‍රත්‍යවෙක්ෂාකොට.
පහණසලවට, වටවූ ගල.
පලක්බැද, පයඹ්බකබඹව-කකුල්ගොතා

පස්අනතුරුකම්, පඤ්චානන්තරියකර්ම.
පණිවා, ප්‍රාණඝාත.
පහසින්නොගත්බැවින්, අලඞ්කාරවිධියෙන් යුක්තනුවූහෙයින්.
පාවිට, පාදයනිමුනුතැන.
පිළිවුදු, ප්‍රතිවේදකළාවූ.
පිළියැද, ඉපදීම,
පුවෙණිවස්නුවන, ප්‍රවේණිවාසනුවන.
පුවරුව, කඩ-ලෑල්ල.
පුළුවුස්සී, පරිපුච්ඡාකරයි-විචාරයි.
පුවහනලදුයි, පහකරණලදුයි.
බඹසරවස්, බ්‍රහ්මචර්‍ය්‍යාවාසය.
මහරහපළ, මහාශීපයෂ්ඨික.
මවුමටන්, මාතෘඋපස්ථාන.
මලලර, මල්ගොතන්නා.
මූඑදී, රැස්ව.
රන්කොතුරුව, රත්රන් කොතලය.
රන්මලාව, රුවන්බදුන.
රත්පලසහුය, රක්තකම්බලනූව.
රුවාරූඅටසම්වත්, රූපාරූප අෂ්ටවිධධ්‍යාන.
රුක්සේවලලල, වෘක්ෂජාතාවලලල.
රුවන්වැලිසියෝ, ස්වර්ණවාලුකාවෙන් ගැවසුනු.
රොහැණිව, කොපව.
රෑවටන්, රාත්‍රියෙහි උපස්ථානකරන්නෝ.
වප්මඟුල, වැපිරීම් මඞ්ගල්‍යය.
වලකට, විකාරමූඛ.
විවිකතාවාස, වෙන්වවිසීම.
විවට, වෙන්කොට.
වුහුටහ, විනිදවූහ.
වැටෙනතාක්, පවත්නාපමණ.
සළාවැටුම, වක්කලම.
සක්මන්කෙළවර, සක්මන්මලුව කෙළවර.
සපා, සපශීකොට.
සපදන්සැරි, ගෙපිළිවෙළින් හැසිරීම,
සිල්කොටපියන්නාසේ, සිදුරුකොටලන්නාක්මෙන්.
සිව්ගෙය, පල්ලැක්කිය.
සිඹිදිමින්, සිත්හිකෙරෙමින්.
සිරුරුකිය, ශරීරකෘත්‍යය.

සිපා, සපර්ශකොට.
සුගිනෙමෑක්මග, සර්වඥගෙ නොපාවාශීඃ.
සුදවස්වැසි, සුද්ධාවාසනම් බඹලොවවැසි.
සුගිසඳුව, සර්වඥසම්පත.
සෙල්මුවා, ගලින්තැනූ.
සේයක්සෙයින් පානොවී, සෑවනැල්ලක්මෙන් වෙන්නොවී.
සැව, චූතව.
සැඳගැමි, ශකෘදගාමිවාශීඃ.
සිදෙලුව, දෙලාව.
හෙවුනු, බැහැවූ.
හොවී, නිදයි.
හැදමාගෙණ, සන්ධානකොටගෙණ, බඳගෙණ.

---

## ශු ද්ධි ප ත්‍ර ය.

| පිට. | පේළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 8 | 19 | මවී | මවූ |
| ,, | 20 | ,, | ,, |
| 11 | 32 | කනාතක | කනාථක |
| 14 | 5 | නොදනුම්යි | නොදනුම්හ යි |
| 14 | 20 | වෙලෙවී | වෙලෙව්ව |
| 15 | 30 | උත්හනැයි | උත්හ යි |
| 18 | 34 | රුපසුව | රූසපුව |
| 21 | 25 | යක්සෙයින් | සේයක් සෙයින් |
| 21 | 2 | භාවභාවයෙන් | භාවභාවයෙන් |
| 28 | 27 | හතම | බඹම |
| 36 | 27 | බැදි | බැඳී |
| 38 | 24 | කිසවටව | කිසවටජ |
| 48 | 35 | පහයින් | පහයින් |
| 45 | 16 | නියනේ | කියකේ |

"ඔවින්" "ඔවිනු" යයි සමහර තැන්වල වැටී තිබෙන "වි" වෙනුවට "වු" විය යුතුයි.

# AMÁWATURA.

## PART II.

WITH

## A Glossary.

REVISED AND EDITED BY

HENDRICK JAYATILAKA.

PUBLISHED BY

HERAT PERERA.

---

# අමාවතුර.

ද්වි තී ය භා ග ය.

හෙන්ද්‍රික් ජයතිලක අප්පුහාමි විසින්

**පූර්වභාගය සෙයින් සකස් කරණ ලදින්**

හෙරත් පෙරේරා මහත්මයා විසින්

මුද්‍රාඞ්කණය කරවා ප්‍රසිද්ධ කරණලදී.

---

COLOMBO:

1885.

## අ මා ව තු රු ද්වි තී ය භා ග ය.

පූජ්‍යාචාය්‍ය්‍ය ගුරුළුගෝමීන් විසින් කරණ ලද අධිකාර දහඅටකින් පිරිසුන් වූ මෙම අමෘතප්‍රවාහයෙහි පූර්‍වභාගය, ක්‍රිස්තු වර්‍ෂ 1884 වැන්නෙහිදී හෙන්‍රික් ජයතිලක අප්පුහාමි විසින් මෙම 2 වෙනි කාණ්ඩයමෙන් සකස්කොට මුද්‍රාඞකණය කරවා ප්‍රසිද්ධ කරණලදින්: එහි ඇති ආපතාව මධුරත්වාදිය නිසා 'භවගත්නාලද මහාප්‍රීති ඇති සාධුජනයන් විසින් ද්විතීයභාගය ලැබීමෙහි ද වාසනා ඇති බැව් කියා, එම ජයතිලක අප්පුහාමි වෙත අයදුම් පත් රාශියක් එවනලද බැවින්: නොවියත් ලිපිකරුවන් විසින් හෙලනලද දුර්මතික විෂමපාඨයන් බැහැරකොට ගූඪ ශබ්ද විවරණයකුදු යොදා අධිකාර සයකින් යුත් මෙම ද්විතීය භාගය මුද්‍රාඞකණය කරවා ප්‍රසිද්ධ කරණු පිණිස මෙහි අත්සන් කරණ මට භාරකෙළේය. මෙම ප්‍රකරණය සම්බන්ධ වූ කථාශරීරය හා වෙනත් කිය යුතු විශෙෂ ගුණයන් ද එම පූර්‍වභාගය ප්‍රාරම්භයෙහි ප්‍රකාශිතයි—මෙසේ වරින් වර භාග භෙද කොට පොත අව සානය තෙක් ප්‍රසිද්ධ කිරීමෙන් මේ පොත් ගන්නා අයට පහසු බැවින් තුන්වෙනි කාණ්ඩයට පරිච්ඡෙද 8 ක් ඉතිරි කොට තබනලදී—5 වෙනි පරිච්ඡෙදය පටන් දසවැන්න අවසන් කොට ඇති මෙම ද්විතීයභාගය ජනසඞ්ග්‍රහ සඳහා මෙසේ මුද්‍රාඞකණය කරවා ප්‍රසිද්ධ කෙළෙමි.

HERAT PERERA.

වර්‍ෂ 1885 දෙසැම්බර් මස 31 දින
කොළඹ දෙමටගොඩදීය.

න ම ව් රූ ව න් ති යා.



# අමාවතුර.

## 5 වෙනි පරිච්ඡෙදය.

කූටදනත නම් බමුණා දැමූ පරිදි කියේය යත්; එක්සම යෙක්හි බුදුඇසින් දශදහස් ලෝද්‍ බලන බුදුන්ගේ නුවන දැල්හි කූටදනත නම් බමුණා පැණිනි. එ කල්හි බුදුහු මේ බමුණු මාගේ නුවනදැල්හි පැණෙයි, මුහුට උපනිශ්‍රය ඇති හොයි බලනනාහු මා එයට ගිය කල උහු අතවැසෙසා සො ලොස්ආකාරයෙකින් බමුණාගේ ගුණ කියා මා කරා නො යා දෙත්, ඔවුන්ගේ වාද බිඳ එකුන්තිස්ආකාරයෙකින් ගේ මාගේ ගුණ කියා මා කරා අවුදු පැන පූළුවුසයි, මා පැන විසඳු කල සරණ යේ ඊ පන්සියයක් සඟුන් පිරිවරා මගධරට සැරි සරමින් ඛානුමතන නම් බමුණුගමට පැමින අඹයට්ඨයන්හි වැඩවෙසෙත්. එකල්හි බිම්සරමහරජහු විසින් බඹදෙසෙන් තමහට පමුනුකොට දුන් ඛානුමතන නම් බමුණුගම්හි වසන කූටදනත නම් බමුණු මහත්යාගයක් කරන්නට සැරසිව්ය.

සත්සියයක් ගොණුන්, සත්සියයක් දෙනුන්, සත්සියයක් වස්සන්, සත්සියයක් වැස්සියන්, සත්සියයක් එළුවන්, සත්සිය යක් එළුදරුමැඩවුන්, නොයෙක් මුවන් ලිහිණියන්, සත් සත්

සිය බැගින් මරා යාගකරනනාට යාගශාලාවෙහි වැඩ ඈර
බැඳ සිටිවිය. එකල්හි යාග අනුභවකරනනට රැස්වූ බමු
ණෝ "තං ඛොපන භගවන්තං ගොතමං එවං කල්‍යාණො
කිත්තිසද්දො අබ්භුග්ගතො" යනාදින් පැවැති බුදුන්ගේ
යසශ්‍රී අසා බුදුන් දක්නට අඹයට්ලයන් යෙත්. එකල්හි කූට
දන්ත නම් බමුණු තමා වසන පහය උඩුමාලෙහි දිවයහන්හි
හෙව කවුළුයෙන් බලන්නේ බුදුන් දක්නට යන බමුණන්
දැක පුළුවුත් පුළුවුත් දැ කියන ඇමැතතා කැඳවාගෙණ මේ
බමුණෝ කොයට යෙති සී පිළිවිස බුදුන් දක්නට යන පරිදි
අසා මහණගවත්ගොයුම් තුන්යාගසම්පත් හා සොළොස්පරි
වාර දනිල, මම ඒ නොදන්මි මහා යාගද කටැපියෙමි, මහ
ණභවත් ගොයුම්හු කරා ගොස් ඒ පිළිවිසගත මැනවැයි සිතා
බමුණන්ට, කූඩාවරිණී මදක් බලනනැ! මම්ද එම් කියා යවී.

බමුණෝ උහු බුදුන් දක්නට යන පරිදි අසා මේ කූටදන්ත
බමුණු උතුම් බමුණෙක් වේ; බොහෝසේ සෙසුබමුණෝ
මහණභවත්ගොයුම්හු සරණගියාහුය, මෙම සරණ නොගි
යේය, ඉදින් මේ එයට ගියේ වී නම් උහුගේ ආවෘතන නියමායා
වෙන් ආවෘතනිතව සරණ යෙයි, එසේ වනනා හා මුහුගේ
ගෙ දොර බමුණනට ශූන්සෙනක් වැනිවෙයි, උහුගේ ගම
නට අනතුරය කළ මැනවැයි බැණගෙණ තමාගේ ගුණ කී
කල සතුටුනොවන සතෙක්නම් නැති, උහුගේ ගුණකියා
වලකම්හ සී උහු කරා ගොස් සබඳ තා මහණභවත්ගොයුම්හු
කරා යන්නේ දැ සී පිළිවිස සැබැවැයි කීයෙත් තෝ උහු
කරා නො යා, උහු දක්නට යන්නට තෝ නොනිසෙසහි,
ගේ තා දක්නට එනනට නිඃස, ඉදින් තෝ උහු කරා ගියේ
නම් තාගේ යසස් පිරිහෙයි, උහුගේ යසස් වඩී. තෝ අභිජා
තයෙහි, මහත්ධන ඇතෙනහි, ත්‍රිවෙදයෙහි පාරයට ගියෙහි,
අභිරූපයෙහි, සිල්වත්හි, ප්‍රියතෙපුල් ඇතෙනහි, තුන්සිය
යක් බමුණුදරුවනට ඇදුරෙහි, නොයෙක් දිශාවෙන් බමුණු
දරුවෝ අවුදු තා කෙරෙහි සිල්ප උගනති, තෝ මහලෙලහි,
මහණභවත්ගොයුම් ලදුරිය, තෝ බිම්සරමහරජහු විසින්
පුදනලදෙහි, පොක්ඛරසාතිබමුණු විසින් පුදනලදෙහි,
මගධරජහු තට බඹදෙසෙන් දුන් පමුනුයෙහි වාසකෙරෙහි,
තෝ මහණභවත්ගොයුම්හු දක්නට යන්නට නොනිසෙසහි,
ගේ තා කරා එනනට නිසස සී බිණුහු. එකල්හි කූටද
න්ත නම් බමුණු මේ බමුණෝ ජාති ආදින් මාගේ ගුණ කි
යති, තමාගේ ගුණ වර්ණනාවෙහි රුදෙනු යෙදෙන්නේ නො

වෙයි, එසේ බැවින් මොවුන්ගේ වාද බිද මහණභවත්ගො
යුම්හුගේ මහත්බැව් හඟවා මොවුන් එයට යත්නු කළ මැන
වැයි සිතා තෙපි මා හා කියනු අසව්। මම් කවරම්, මහණ
භවත්ගොයුම්හුගේ ජන්මසම්පත් ආදි ගුණයෝ කවරහ, මෙ
රගල්පිණිස සිදුහත් සෙයින්, මහමුහුදු පිණිස බොලට ගැ
ලෙන දිය සෙයින්, සඳත්දහතලා පිණිස පිනිබිඳු සෙයින්,
මහණභවත්ගොයුම්හුගේ ජන්මසම්පත් ආදි ගුණයන් පිණිස
අපගේ ගුණයෝ ලාමකයහ; එබැවින් මහණභවත්ගොයුම්හු
දක්නට යන්නට අපි නිසසම්හ, මහණභවත්ගොයුම්හු අභිජා
තය, මවු පියන් විසින් කිය හැකි දෙස් නැතියේය, ඔහුගේ
මෑතියන්ගේ පක්ෂයෙහි අසූදහසක් කුලවැයෙසෝහ, පියා
නන්ගේ පක්ෂයෙහි අසූදහසක් කුලවැයෙසෝහ, මෙ සෙයින්
එක්ලක්ෂ සැටදහසක් කුලවැසසන් පියා පැවිජිවූයේය, බිම
නිධානකොට තුබූ ධන මිස ඔවුහු උපන් දවස්ම සඬ්ඛ නම්,
පල නම්, උප්පල නම්, පුණ්ඩරීක නම්, සතරනිධිකුම්භියෙක්
නැංග; එහි සඬ්ඛ නම් නිධිකුම්භිය ගවු පමණය, පල නම්
නිධිකුම්භිය දෙගවු පමණය, උප්පල නම් නිධිකුම්භිය තුන්
ගවු පමණය, පුණ්ඩරීක නම් නිධිකුම්භිය යොදුන් පමණය,
එහි ගත් ගත් තැන් පිරෙයි; මෙසේ මහත්ධන පියා තුරුණු
වියෙහි සොඳුරුයොවුනෙහි ගිහිගෙන් නික්ම නොස් පැවිජ්
වූයේය, මවු පියන් නොකැමැති සේ කඳුලුවුසු මුහුනු ඇති
නෑයන් වළප්වා පැවිජි වූයේය, අභිරූපදර්ශනීයප්‍රසාදජන
කය, පැහැසපුවෙන් උපෙතය, මහබඹහු සෙයින් දිලියෙයි,
රාහු අසුරිඳුහුදු පමණ නොගත හැකි අපමණ අවකාශ
ඇත්තේය, සිවුපිරිසුදු සිල්වත, කලණ මිහුරු වියත් තෙපුල්
ඇත්තේය, ආදි මධ්‍යාවසාන ප්‍රකට කොට කියනු වූයේය, ඔහු
ගේ එකි එකි දහම් දෙස්නෙන් සූවාසූදහස් සුවාසූදහස්පමණ
දෙව් මිනිස්හුදු මගඵල අමා වළඳත්, එයින් බොහෝ දෙ
නාහට ඇඳුර, කාම රාග පැහුයෙන් අචලය, කම්මවාදිය,
ක්‍රියාවාදිය, නවලොව්තුරාදහම් පුරයැසරකොට වැවෙයි, සැරි
යුත් මහමුගලන් මහසුප් ඈ මහණබමුණෝ උහුට පිරිවරව
වැවෙත්, තමහට විරුඬවූ බමුණනට අවිරුඬව හිතකාමිව
වැවෙත්, උතුම් කුලෙන් පැවිජිවූයේය, නොනට කුලෙන්
පැවිජිවූයේය, පරරටින් ක්ෂත්‍රිය පණ්ඩිත ආදිහුද දෙව් බඹ නා
ගජඹ ආදිහුද පැන පුළුවුස්නට ගොස් තමා විසජනනට පැ
න නොපොහොසත් සේ ඊනා නොපිළිවිස නොබැණ ගිදිත්;
ඇතම්හු පුළුවුස්සී, ගේ ඔවුන් පැනයෙහි උත්සාහජනවා

ක්‍ෂයවයි, මෙසේ ඔවුන් හැම්දෙනාගේ විමතිවෙරළ පැමිණ බිදෙන මහමුහුදු රළ සෙයින් උන් කරා පැමිණෙමින් බිදෙති, නොඑක් දෙව් දහස්හු දිවියෙන් ඔහු සරණ ගියාහුය, මහණභවත්ගොයුම්හුගේ "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො" යනාදී යසගොස් දශදෙසෙහි පතළේය, ගේසුපිගිරි පතුල් ඈ දෙතිස්මහපුරිස්ලකුණෙන් සැදුනේය, දෙව් මිනිසුන් ගිහිගේ සසුන්වැසසන් කෙරෙහි තමා කරා ආවනට පළමුව එවසුව දෙයි, කණට සුව මෙළෙක් වදන් බෙණෙයි, පිළිසතරෙහි දක්‍ෂවූ සිවුවනක් පිරිස්වැසසන් ආ කල ගමන් ශ්‍රම නිවනනාවූන් සෙයින් පෙරට වස්වාගණු කෙරෙයි, සිවුවනක් පිරිස් දුටු කල ඔවුහට ලඟිරුරැසින් පුබුදුනා පියුමක් සෙයින් මුවපියුම් විදහති, පුන්සඳක් බඳු සොම්මුහුනු ඇතිවෙයි, ඇතම්හු පිරිස්හු දුටු කල කර බහාගෙණ නොබැණ ගිඳිත්, මහණභවත්ගොයුම්හු වූ කලී සුලභකථා ඇත්තේය, උහු කරා ආවත් අප මෙයට කුමට ආම්හ යන විපිළිසර නොඋපදීය, දම්දෙසුම් අසා සතුටුවෙත්, කාලයුකනි ප්‍රමාණයුකනි වූ අර්ථවත් තෙපුල් බෙණෙයි, සිවුවනක් පිරිස්වැසසන් විසින් පුදනු ලද්දේය, දෙව් මිනිස්හු පානාභාහ, යම් ගමෙක හෝ නියම්ගමෙක හෝ වසන්නේ වී නම් මහෙශාක්‍යදෙවියෝද අරක් ගතනි, යකුන් විසින් එහි මිනිස්නට උපද්‍රව නොවෙයි, ඔවුහු උහුගේ ආනුභාවයෙන් දුරුවෙති, උහුගේ මෛත්‍රීබලයෙනුද් යක්‍ෂයෝ මිනිසුන් නොපෙළත්මය, තමා විසින් නිපදවනලද දහම් ඇත්තේමය, එසෙයින්ම නිපදවනලද මහණගණන් ඇත්තේමය, ගනඅදුරු අනුදශීනයෙහි සිටියේය, ඇතම් මහණබමුණුකෙණෙකුන්ගේ යසස් යම් යම් ප්‍රකාරයෙකින් වඩී, මහණභවත්ගොයුම්හුගේ යසස් වූ කලී එසේ නොවෙයි, අනුනාරවූ විජ්ජාචරණසම්පන්නින් වඩී, බිම්සරමහරජ අඹුදරුවන් ඇමැතනන් හා සහපිරිවරින් ප්‍රාණයෙන් භවත්ගොයුම්හු සරණගියේය, කොසොල්රජ එසෙයින්ම සහපිරිවරින් සරණගියේය, පොක්ඛරසාති බමුණා සහපිරිවරින් සරණගියේය, සොණදණ්ඩබමුණා එසෙයින්ම සරණ ගියේය, මහණභවත්ගොයුම් බිම්සරමහරජහු විසින් පුදනු ලදුයේය, කොසොල්රජහු විසින් පුදනුලදුයේය, පොක්ඛරසාති බමුණා විසින් පුදනුලදුයේය, සොණදණ්ඩබමුණා විසින් පුදනුලදුයේය, දැන් මහණභවත්ගොයුම් ඛානුමතන නම් බමුණුගමට අවුද් අඹයට්ඨුලයන්හි වෙසෙසි. යම්කාවර මහණ බමුණුකෙණෙක් අපගේ ගම්කෙතට ආහුද

උහු අපට අමුත්තහ, අමුත්තනට අප සත්කාර කළ මැනව,
එබැවින් මහණභවත්ගොයුම් අප දක්නට එන්නට නො
නිසසහ, අපම ඔවුන් දක්නට යන්නට නිසසම්හ, මා දන්නේ
මහණභවත්ගොයුම්හුගේ මෙපමණ ගුණයෙක, ගේ මෙ
තෙක් ගුණ ඇත්තේ නොවෙයි, උහු සේම සව්නේ ගෙවා
දන්නා බුදුකෙණෙක් කියතුදු නොගෙවෙන ගුණ ඇත්තේය,
අප වැන්නෝ නම් කුම් කියති සී කිය. එකල්හි බමුණෝ
කූටදන්තයා කියන බුදුගුණ අසා යම්සේ බමුණු මහණභ
වත්ගොයුම්හුගේ ගුණ කියාද ගේ උතුම් ගුණ ඇත්තේය, මෙ
සේ උහුගේ ගුණ දන්නා ආචාර්‍ය්‍ය විසින් මෙතෙක් දවස් වූසු
සේ [මිත්මතුදු] වෙසේය, එබැවින් උහුම අනුවබණම්හයි
අනුව බණනානාහු භවත්ගොයුම් මෙයට සියක්යොජනයෙ
හිඳු වෙසේ නම් සැදූහැති කුලපුතක්හු විසින් පාථෙය්‍ය ගෙ
ණ ගොස් දක්නට නිසස, එබැවින් අප හැම්දෙනා එම් මහ
ණභවත්ගොයුම්හු දක්නට යම්හයි කීහු. එකල්හි කූටදන්ත
බමුණු මහත්බමුණුගණන් හා සමග අඹයටි උයන් ගොස්
බුදුන් කරා එළඹ සාමීචි කොට එකත්පස්ව හුන. ඇතම්
බමුණන් හා ගහපතිහු බුදුන් වැඳ එකත්පස්ව හුන්හු, ඇත
ම්හු බුදුන් හා සරාණීය්‍යකථා බැණ එකත් පස්ව හුන්හු,
ඇතම්හු බුදුනට ඇඳිලිබඳමාත්‍රයෙකින් එකත්පස්ව හුන්හු,
ඇතම්හු නාම් ගොත් කියා එකත් පස්ව හුන්හු, ඇතම්හු
නොබැණ එකත්පස්ව හුන්හු.

එහි බුදුනට ඇඳිලිබැන්දෑහු ලදගත්තාහු හා ඉදින් මිසදිට්හ
ගත්තාහු තෙපි මහණගොයුම්හු වඳුව යී කීහුනම් ඇඳිලිබඳ
මාත්‍රයෙකින් වඳුව, සම්දිට්හගත්තාහු බුදුන් කුමට නොවඳුවයි
කීහුනම් හිස බිම පැහැරම වැන්ද මනාද අත් නගා දුර දුට
නොවඳුම් වේ ද සී කී, ඇඳිලිබැන්දෑහු නම් කියනනාහු, මම්
අසුවල්හු පුත්මි, සුදත් නම්, සුමිත් නම්, මෙයට ආයෙම් යී නම්
කියති. ගොත් කියනනාහු මම් වාසෙට්ඨගොත්‍රයෙම්, කච්චාය
නගොත්‍රයෙම්, මෙයට ආයෙම් යී ගොත් කියති. මෙසේ
නම් ගොත් කියන්නාහු දිළිඳුකුලෙහි උපන් දරුවන්හු පිරිස්මැද
නම්ගොතින් පාළුවම්හයි කළෝ. නොබැණ හිඳිනාහු
කෛරාටිකයන් හා අන්‍ධ බාලයෝයි. එහි කෛරාටිකයෝ
එකක් දෙබස් බණනා හා විස්වස්කෙරෙති, එසේවනනා හා
එක්දෙදෑ අහර දුන මනා වෙයි, නොබැණ හුන්හ. අන්‍ධබා
ලයෝ තමන් නුවන නැති වන බැවින් කිබිසිනිකොට බහා

ලූ මැරිපිඩු සෙයින් නොබැණ බැස හුන්නු. මෙසෙයින් හැම දෙනා පිරිවරා හුන් කල්හි එකත්පස්ව හුන් කූටදන්තබමුණු බුදුනට තොප තුන්යාග සම්පත් හා සොළොස් පරිවාරදනිත්ද යනුඇසී. දනුමැයි වදාළෝ. මම් ඒ නොදන්මි මහත්යාගයක් කවැරියෙම් ඒ මට කියමැනවැයි කීය. ඔස බමුණ සතසා අසා, මම් කියම් සී වදාළහ. හේ ඉතාමැනවැයි ගිවිසස. එසඳ බුදුහු පොළොව තුබූ නිධිකුම්භියක් නගා පෙරට රැස්කර ණුවන් සෙයින් භවයෙන් පිළිසන් මහවිජිතරජහුගේ චරිත ඇර දක්වූහු. කිසේය යත්; අතීතයෙහි දඹදිව මහවිජිත නම් රජෙක් විය, හේ හුනුදින් පිරිහුන් මහපොළෝමඩල දුහුයෙන් මහවිජිත නම් වී. ඒ රජ ආඪ්‍යමහාධනය, මහා භොගය, බොහෝ රන් රිදී ඇත්තේය, සතන්සොම්නස් උප දවන රජත මණි කනක බඳුන් ඈ බොහෝ උපකරණ ඇත්තේය, බොහෝ ඇතුන් අසුන් හා රත ඇත්තේය, බොහෝ ධනයෙන් ධාන්‍යයෙන් පිළියෙන් පිරුණු නොයෙක් දහස් කොටාර ඇත්තේය. ඒ රජ එක්දවසක් සත් රුවනින් පිරුණු කොටාර දහස් බලා මේ ධන කා රැස් කළෝදැයි භාණ්ඩාගාරයන් පිළිවිත. මහරජ තොප පියන් මුත්තන් ඈ සත්වන කුලපරම්පරාවෙනි වූවෝ රැස්කළ ධනයයි කීහු. ඔවුන් කොයට ගියාහු යී පිළිවිස මිය පරලෝ ගියාහයි කීයෙන් තමන් විසින් ඉපදවූ ධන නොගෙණ ගියාහුද සී කීහු. මහරජ කුමක් කියව? ධන තබා මිය යනුමිස ගෙණ යනනාහු නොවෙයි කීහු. එ කල්හි රජ වැළි සිරි යහන්හබට ගොස් හිඳ "මම් මිනිස්ලොව මහත්භොග ලදිම් මුළුදඹදිව දිනා වෙසෙම් මෙසේ පරලෙව්හිදු මා සුව විඳිනා සඳහා මහත් යාගයක් කළ මැනවැ" සී සිනී. [යාගශබ්දය දෙවපූජාවෙහිදු සඞ්ගතක්‍රියාවෙහිදු දානයෙහිදු වැටෙයි, මෙ තැන වූ කලී යාගශබ්දයෙන් දන් කියත්] දන් දෙනෙහෝ එක් පණ්ඩිතපුරුෂයෙකු හා බැණගෙණ දුන මැනවැයි තමාගේ පෙරෙවිබමුණා නෙත්වාගෙණ "ආචාය්‍යීය මම් මහායාගයක් කවැරියෙම්, පරලොවද සුව විඳුනා සඳහාය, මට අනුශාසනා කළ මැනවැ"සී කීය. එකල්හි පෙරෙවිබමුණු මේ රජ මහදන් දියට්වන, ජනවියෙහි සොරහු බොහෝහ, ඔවුන් නොසන්හිඳුවා දන් දෙන කල [ඒ සඳහා] ගෙණෙනා කිරි දී විහි සහල් ඈ දනසම්භාර වොලොගනිති, ජනපදය සොරුන් විසින් ආකුලවෙසී එසේ වනහා හා රජුගේ දන් බොහෝකලක් නොපවතනි, උහු සිතට සුවද නොවෙයි සිතා

මහරජ තාගේ රට සොරන් බොහෝහ ඔවුන් නොසන් හිඳුවා වධකරවත්නේ දහම් නොවෙයි, සොරුන් මැරුව හොත් ඔවුන්කෙරෙන් දිවි තුබූ කෙණෙක් තාගේ රට වැසසන් පෙළත්, තාගේ මේ සංවිධානයට පැමිනා සොරන් සංහිඳිත්, එබැවින් තාගේ රට ගොව්තැන් කටැවියනට බිජු බත් හුදලු සිඟි වැල් දෙනුමැනව, වෙණඳහම් කටැවියනට බඩු මිළ දෙනු මැනව, සම්වැටියනට ඔවුනොවුන් තුබූ පරිදෙදන් නිබද දිවෙල් තනතුරු ගම් නියම්ගම් දෙනු මැනව, එහි මිනිස්සු තම තමන් විසින් කළ මනා ගොවිකම් වෙළඳාම් ඈ කැමෙහි යෙදුනෝ රට නොපෙළත්, එසේවනනා හා රට ධනධාන්‍යයෝ රැස්වෙත්, සොරුන් නැතිවනනා හා රටවැසෙසෝ භය නැතිව සතුටුව දරුවන් ළමැඩියෙහි නටවමින් දොර නොපියාලා නියකව දවස් යවනුවෝ වෙති යී රජහට අනුශාසනා කෙළේ එකල්හි රජ ඉතා මැනවැයි ගිවිසගෙණ ගොවිකම් කටැවියනට බිජු බත් හුදලු සිඟිවැල් දින, වෙණඳහම් කටැවියනට බඩු මිළ දින, තමා සම්වැටිය නට ඔවුනොවුන් තුබූපරිදෙදන් නිබද දිවෙල් තනතුරු ගම් නියම්ගම් දින, ඒ මිනිස්සු තමන් කැමෙහි යෙදුනාවූ රජු ගේ රට නොදපෙළූහ, රජහට ධනධාන්‍යයෝ රැස්වූහ, සො රුන් නැතිවනබැවින් රටවැසෙසෝ සතුටුව දරුවන් ළමැඩි යෙහි කෙළවමින් දොර නොපියාලා නිසකව වෙසෙති. එකල්හි රජ හැමසේම රට සමෘඬිබැව් දැන පෙරෙව් බමුණු කැඳවාගෙණ ආචාර්‍ය්‍යය තාගේ උපායෙන් රට සොරන් නැතිවූහ, ධන ධාන්‍යයෙන් කොටාර දහස් පිරින, රටවැස් සනටද භය නැතිවිය, මම් මහායාග කටැවියෙමි, පරලොවද සුවවිඳිනාසඳහාය මට අනුශාසනා කරණු මැනවැයි කීය. එකල්හි පෙරෙව්බමුණු මේ රජ මහාදන දෙනනට මහත් උත්සාහ ඇත්තේය, ඉදින් තමාගේ රට රජ ආදීන්ට නො කියා දෙන්නේවීනම් ඔහුහැමදෙනා නොසතුටුවෙති ඔවුනු සතුටුවන නියාවක් කළමැනවැයි සිතා මහරජ තා මහදන් දියටිවන බැවින් තාගේ රට රජනටදු තා සිනැහැති ඇ මැතනත්වදු පිරිස්වැසසන්ටදු බමුණුමහසල්කුලයටදු සිටු මහසල්කුලයටදු නියම්ගම්වැසසන්ටදු දනව්වැසසන්ටදු මම් මහායාගකටැවියෙමි පරලොව මට සුවසඳහාය එයට අනු දන්නේමැනවැයි කියනනට යෙදී. රජු ඉතාමැනවැයි තමා ගේ විජිතයෙහි රජආදින්ට කීය. ඔවුනු මේ රජ ඉසුරුම්යී අභිභවා දන් නොදී අපට කියයි, නොකී කල දන් ලබන්ටදු

නොයනි යී සතුටුව මහරජ දෙය්‍යධම්ම නැතිකලදු මෙ බදු දන් දෙනනට නොපිළිවන, නෝ මහත් ධන ඇත් තෙණිය ලදරුයෙණිය ඉතාමැනව මහායාග කරන්නේය යී කීහු. බමුණ මේ සතරඅනුමතිදායකයෝ යාගයට පිරිවරවෙතියි වදාළෝ. මහවිජිතරජ අටඟෙකින් සමූපෙතය, කවර අටඟෙකින්ය යත්. අභිජාතය, අභිරූපය, මහාධන ඇත්තේය, සිවුරඟසෙනඟ ඇත්තේය, මහත් සැදහැ ඇත්තේය, බහු ශ්‍රැතය, කී කී බස අර්ථදන්නෙන් පණ්ඩිතය, ව්‍යක්තය, අතීතානාගත වර්තමාන [සඞ්ඛ්‍යාත කාලත්‍රය සම්බන්ධවූ] අර්ථ සිතීමෙහි සමර්ථය. කිසේය යත්, මම මෙසේ සම්පත් අතීතයෙහි පින් කෙළෙත් ලදෙමි යී සිතනුයෙන් අතීතාර්ථයන් සිතනනට සමර්ථනම් වෙති; දැන් කළ පින් අනාගතයෙහි සම්පත් ලබනනට නිසිවෙයි සිතන්නෙන් අනාගතාර්ථයන් සිතනනට සමර්ථනම් වෙයි; මේ පින්කම් නම් හැම මහා පුරුෂයන් විසින් ඇසුරුයේ මාගේ භොග ඇති යී දානවෙතනාද ඇතිව පින්කම් කෙරෙමි යී සිතනුයෙන් වර්තමානාර්ථයන් සිතනනට සමර්ථනම් වෙයි. මේ අටඟින් සමූපෙතව දෙනනහුගේ දනට හැමදෙසෙන් මහජනයෝ එළඹෙති. අජත්මවත්තෙමේ ගේ කෙතෙක් කල් දේද දන්ම පිරිසාර ඇතිව සිදපියනි යී මේ ඈ නොයෙක් සිතිවිලි සිතා කිසි කෙණෙක් නොඑළඹියපිවෙති. මේ අටඟින් සමූපෙතව දෙන දනට එළඹියපිවෙති. මහවිජිත නම් රජ මේ අටඟින් සමූපෙතවනබැවින් මේ අටඟද මෙම යාගයට පිරිවර වේ. ඒ රජුගේ පෙරෙවිබමුණු සතරඅඟෙකින් සමූපෙතය, කවර සතරඅඟෙකින්ය යත්, "අභිජාතය, තුන්වෙදයෙහි පාරයට ගියේය, සිල්වත්ය, නුවනැත්තේය, අභිජාතාදි ගුණයෙන් යුත් පුගුලන්ගේ සංවිධානයෙන් දෙන දන බොහෝකල් පවත්නියනි හැමදෙසින්ම මහජනයෝ අගර්හිතවන බැවින් එළඹෙත්මය" මෙසේ ඒ රජුගේ පෙරෙවිබමුණු සතරඅඟෙකින් සමූපෙතයි. මේ සතරඅඟද ඒ මහායාගයට පරිවාර වේ. එකල්හි පෙරෙවිබමුණු රජුගේ යාගයට පෙරටුවම සිතී, "දන්දෙනනහු තුන් තැනින් එක් තැනෙක චලිතවෙති මේ රජු තුන්තැන්හිම පළමු අචලකළමැනවැ"යී රජහට තුන් විධාන දෙයී. කිසේය යත් "මහරජ තා යාග කටැටියහු විසින් කිසි කවර විපිළිසරයක් නොකළමැනවැයී; මාගේධන නස්සී කියා යාගකරනනහු විසින් කිසි කවර විපිළිසරයන් නොකළ මැනව, මාගේ ධන නස්මින් සිටියේය කියා යාග

කළාහු විසින් කිසි විපිළිසරයක් නොකළ මැනව, මාගේ ධන
නාටහ සී කියා පසුව නොතැවුන මැනව, පූර්වචේතනා අච
ලකොට පිහිටියුත්තේය, එසේ වනහා හා දානයෙහි ඵල
මහත්වෙයි, මධ්‍යමචේතනා අපරචේතනාදු එසෙයින්ම අච
ලකොට පිහිටියුත්තේය, එසේ වනනා හා දානයෙහි ඵල
මහත්වෙයි, එසේ නොකරනනාහට දානඵල විපුලනොවෙයි,
උළාරවූ සම්පත් ලද කලද රෞරුවමහානරකයෙහි උපන්
අපුතුකසිටු සෙයින් සම්පත් වලඳා රිසි නොඋපදදී" මෙසේ
මහවිජිතරජුගේ පෙරෙව්බාමුණු රජුගේ යාගයට පෙරටම
ආදි මධ්‍ය අවසාන චේතනාවන් පිරිසිදුකළ පරිදි දක්වනුයේ
තුන්විධාන දෙසී. ඉක්බිති ඉදින් මේ රජු දුස්සීලයන් දක මා
ගේ දානය නසී දුස්සීලයන් වලඳනනාහ යී සිල්වතුන් කෙ
රෙහි විපිළිසර උපදවූයේ වී නම් දානය මහාඵල නොවෙයි,
විපිළිසර නම් දායකයනට පිළිගණුවන් කෙරෙන්ම උපදදී,
එසේ බැවින් පළමුම ඒ විපිළිසරය නොඋපද දුන මැනවැයි
දශආකාරයෙකින් පිළිගණුවන් කෙරෙහි විපිළිසර නොක
ළමනා පරිදි කියනුයේ "මහරජ තාගේ දන් ගනනාහු ප
ණිවා කරනනාහුද නොකරනනාහුද එත්, එයින් යම් කෙ
ණෙක් පණිවා කරතොත් වූහු නම් ඒ පාපයෙන් අනිෂ්ට
විපාක උන්ටම වෙයි සෙසසන්ට වන්නේ නොවෙයි; එහි
යම් කෙණෙක් පණිවා නොකෙරෙත්ද ඔවුන් සඳහා දන්
දෙන්නේයයි සිත් පහදවන්නේයි. එසෙයින්ම අයිනාදන්
ගනනාහුද නොගනනාහුද කාම මිථ්‍යාචාරයෙහි පවත්නාහුද
නොපවත්නාහුද මුසවා කියනුවෝද නොකියනුවෝද
අනුන් අයුණු කියනනාහුද නොකියනනාහුද අන්හට කර්කශ
තෙපුල් බණනනාහුද නොබණනනාහුද සම්පප්‍රලාප බණ
නනාහුද නොබණනනාහුද අනුන්ගේ සම්පතට ලොභකර
නනාහුද නොකරනනාහුද අනුන් කෙරේ ඝටනනාහුද නො
ඝටනනාහුද මිසදිටිග ගතනාහුද නොගතනාහුද තාගේ දන්
ගනනට එළඹෙත්; එහි යම් කෙණෙක් අයිනාදන් ඇ ගත්
නාහු වූහුනම් ඒ පාපයන්ගේ අනිෂ්ටවිපාක උන්ටම වෙයි
සෙසසන්ට නොවෙයි; එහි යම් කෙණෙක් අයිනාදන් ඇ
නොගනනාහු වූහුනම් ඔවුන් සඳහා මං දන් දෙන්නේයයි
සිත් පහදවන්නේය" යී මෙසේ දශආකාරයෙකින් පිළිගණු
වන් කෙරෙහි විපිළිසර නොකළ මනා පරිදි යාගයට පෙරට
වම කියා ගිව්ස්වීය. ඉක්බිති මහරජ තා මෙසේ දන්දෙනකල
අපට නොකියා රජ යාගකෙරෙයි කියන්නට නිසි යමෙක්

නැති යනාදිය විසින් සොළොස් ආකාරයෙකින් රජහට සො
මිනස් උපදදි.· ඒ යාගයෙහි ගෙරින් නොදමැරුහ එළුවන්
නොදමැරුහ කුකුළන් නොදමැරුහ ඌරන් මුවන් ලිහිණින්
ඈ නොඑක් සතුන් නොදමැරුහ යූපයට රුක් නොදසුන්හ
ඉළුප්ඳ නොදඅලහ. දැසි දස් ඈ කම්කරුවෝ යාගකරණ
තැන මෙහෙකටැව්වුව කෙරෙත් නොකටැව්වුහු නම් නො
කෙරෙත්, දඬු මුගුරු ගෙණ මෙහෙකෙරෙහි ද නොකෙ
රෙහිඳැ සී කියනාහානු නැති; ඉඳින් මෙහෙ කෙරෙහිනම්
කරා නොකෙරෙහිනම් තළම්හ බඳිම්හ යන්නෝ නැති;
කඳුළු මූසු මුහුනු ඇතිව වැළප වැළප මෙහෙකරනෙනෝ
නම් නැති; මිහිරි තෙපුල් බෙණෙමින් මෙහෙ කළාහු;
එනි දස්නට දස්යයි නොදකියති, කම්කරුවනට කම්වරු
වහ යී නොදකියති, ප්‍රියතෙපුල් බැණ අඹුත් පිරිමින් කෙ
රෙහි බල ඇතියනට නිසි නිසි මෙහෙ දක්වා දී මෙහෙ කර
වහි, ඔවුහු තම තමන් සිත් තුබූ පරිදෙන් මෙහෙ. කළෝ.
ගිතෙල් වෙඬරු දී මිහි සකුරු ඈ දී යානකොට නිමූහු නි
සේය යත්; රජු පිටිනුවරත් සතර දොරත් ඇතුළුනුවරත්
නුවර මැදත් මෙසේ සත්තැන්හිම මහදන්හල් කරවා
එකෙකි දන්හල එකෙකි ලක්‍ෂය බැගින් දවස දවස සත්
ලක්‍ෂය බැගින් ධන විසඳ, හිරු නැගි තැන් පටන්ගෙණ ඒ
ඒ කලට නිසි බොජුන් සියඅතින් රන්කෙණෙසස ගෙණ
පිණිවූ ගිතෙල් වෙඬරු දී මිහි සකුරු හා මුසුකොට හැඹු
කැඳ මාලු බොන දූ ආදියෙන් මහජනයා සැතැපපී; ගෙණ
යායටියනට එසෙයින්ම බදුන් පුරා දෙව්, සවස්වේලෙහි පිළිත්
ගඳින් මලින් [කුලදෙවියන්] පුදයි; ගිතෙල් දී ඈ මහසැල
පුරා යමෙක් යමෙක් වැළඳියටි ඒ නම් ගෝ වළඳව යී නො
එක් සිය තන්හි තැබබිය; එකල්හි රජුගේ රට රජනූඳ
ඇමැතෙනෝද පිරිස්වැසෙසෝද බමුණුමහසල්කුල වැසෙසෝද
ගැහැවිමහසල්කුල වැසෙසෝද නියම්නම් වැසෙසෝද දනව්
වැසෙසෝද මේ රජ ගිතෙල් ආදිය ජනපදවාසීන් කෙරෙන්
ගෙන්වා නොගෙණ තමා ගැති දූ වියදම්කොට මහදන්
දෙයි, අපට කිසිදෙයක් නොකියයි අප නොබැණ හිඳිනා
තැන් නොයෙදේ සී රජගෙයි ධන අපමණය එතකුදුවුවත්
ධන ඇර දූන මනාමැ සී ගම්න් නියම්ගමින් නුවරින් ධන
නගා ගෙණ වෙන වෙන ගැල් පුරා රජු කරා ගෙණ ඇර
මහරජ මේ ධන බලාගන්නේ මැනවැසී කීහ. රජ මාගේ
ධන බෙහෙව ඒ දැහැමින් සෙමෙන් රුස් කෙළේය තෙලෙ

ධන නොපටම් වේවා යී මොබින් ගෙණ යායි නොනත. මහජනයෝ එක්නැනෙක ගොස් සිට බැණගෙණ මේ ධන නැවත අපගේ ගෙට ගෙණ යන තැන් හොබින්නේ නොවෙයි, රජ මහායාගකෙරෙයි අපි අනුයාග කරම්හ යී යම් සේ පැදුම්දෙසෙන් එනානු අපගේ දන්හල හමුවී බත් වලඳා නුවර වදිත්ද එබඳු තන්හි අනුයාග කරම්හ යී රජ්ජුරු ආදීහු පැදුම්දෙසෙහි දන්හල් කරවා දන් දුන්නු. එසෙයින්ම දකුණුදෙසෙහි ඇමති ආදීහු දන්හල් කරවා දන් දුන්හු. පැළදෙසෙහි බමුණු ආදීහු දන්හල් කරවා දන් දුන්නු. උතුරුදෙසෙහි ගොවි ආදීහු දන්හල් කරවා දන් දුන්හු. ඔවුන්ගේ යාගයෙහිද ගෙරින් නොදමැරූහ එළුවන් කුකුළන් හූරන් මුවන් ලිහිණින් ඈ නොඑක් සතුන් නොදමැරූහ, රුක් නොද සුන්හ, ඉළුප්දා නොදඅලහ, දාසි දස් කම්කරුවන් නොදකලකිරුවා ගිතෙල් වෙඬරු දී මීහි සකුරු ආදියෙන් යාගකොට නිමවූහු. මෙසේ රටවැසසන් අතින් ගත් සතරඅනුමති හා රජුගේ අටඅග හා පෙරෙවි බමුණාගේ සතර අග හා තුන්විධාන හා තුන්යාගසම්පත් හා මෙය බමුණ සොළොස්පරිවාරය යී වදාළෝ. එකල්හි බමුණෝ ගිතෙල් ආදින් නිම්මාවට ගිය යාගවිධි අසා ලොකයෙහි යම් මිනුරෙක් ඇත්ද මහණගොයුම්ය එම; එසේ හෙයින් යාග පසසම්හ යී සතුටුසිත් ඇතනාහු යාග මෙසේ වුව මැනව යාගසම්පත්නම් මේය යී ගුගුළෝ. එකල්හි කූටදනත නම් බමුණු මතොහනි කිය මනා අර්ථයක් සිතා නොබැණ හුන්නේය. බමුණෝ ඔහු නොබැණ හුන් සේ දැක හැයි තෝ මහණභවත්ගොයුම්හුගේ කථා නොඅනුමෙව්හි නොයි කිහ; එකල්හි කූටදනතබමුණු මම් ඒ නොඅනුමෙව්නි නම් නොවෙම්, යමෙක් මහණභවත් ගොයුම්හුගේ කථා නොඅනුමෙව්හි නම් උහු හිස් සත්කඩක්ව පැලෙයි, ඒකානතයෙන් මහණභවත් ගොයුම්හු එකල්හි යාගස්වාමිවූ මහාවිජිතරජු හෝ වූව මැනව යාගකාරුවූ පුරොහිතයා හෝ වූව මැනවැයි සිතා හුනෙනම් යී කිය. වැළි කූටදනතබමුණු තෙපි ඒ කාලයෙහි රජවූද පුරොහිතවූද යී ඉඳුරා කියනු හර සර නොවෙයි යන සිතින් පරියායෙන් පුළුවූස්නේ මෙබඳු යාග කළාහුද කරවූවහුද කුමක් වෙයි හොයි කිහ. බමුණ මෙබඳු යාග කළාහුද කරවූවහුද ස්‍වගතිය උපදී, මම් ඒ කාලයෙහි මහා විජිතරජහුගේ යාගකාරුවූ පෙරෙවිබමුණෙම් වදාළෝ. එකල්හි කූටදනතබමුණු මේ තුන්යාගසම්පතට හා

සොළොස් පරිවාරයට වඩා මහත්ඵල ඇති අනෙක්යාගයෙක් ඇතහොයි කීහ. එයට වඩා නිතොතත් සිල්වත්නට දෙන දන්හි ඵල මහත් සේ වදාළහ. එයට වඩා සෙනසුත් දන්ඵල මහත් සේ වදාළහ. එයට වඩා සරණාගමනයෙහි ඵල මහත් සේ වදාළහ. එයට වඩා පන්සිල් රැක්මෙහි ඵල මහත් සේ වදාළහ. ඉක්බිති බුද්ධොත්පාදයෙහි පටන්ගෙණ අශීත්ඵලය පයඞිනාතකොට "ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො" යනාදි විසින් දම් දෙසා අශීත්ඵලයට වැඩි අනෙක් උතුම් පිණ්යාගයෙක් ඇත්තේ නොවෙයි වදාළෝ. එකල්හි කූටදන්තබමුණු බුදුහු වදාළ දම් දෙස්නෙහි පැහැද වැද තුණුරුවන් සරණ ගොස් වහන්සේ මම් යාගශාලාවෙහි සත්සියයක් ගොණුත් සත්සියයක් වැස්සන් සත්සියයක් වැස්සියන් සත්සියයක් එළුවන් නොඑක් මුවන් ලිහිණින් සත් සත් සිය බැගින් ගෙණ ටැඹඇර බැඳ සිටිවූවන් මිදුවම් දිවි දෙමි සීතිල්තණ කා සිහිල්පැන් බොත්වා සී ඔවුන්ගේ ශරීරසරත නිවමින් සුවඳ මෙලෙක් සිහිල්සුලඟ හමාවා යී එක්පුරුෂයක්හට කැඳවාබැණ ඔවුන් මුදව යී යෙදීය. හේ ගොස් හැමසතුන් මුදවා පියා අවුදු බමුණාට කීය. හේ අසා සතුටුවී. බුදුහු දම් දෙසූහු. බමුණු සෝවාන්ව බුදුන් සඟුන් පවරා වැද පැදකුණු කොට ගෙට ගොස් අලුයම්හි සිනිඳු මිහිරු පිණ්බොජුන් සූතුකරවා කල්දන්නේ මැනවැයි යවා කියවිය. බුදුහු සුගත් මහපවුල් පෙරවි පන්සියයක් සඟුන් පිරිවරා ගොස් පැනවූ අස්නෙහි වැඩහුන්හු. බමුණු සිය අතින් දන් දී වැද එකත්පස්ව හුන්නේය. බුදුහු ඔහට දම් දෙසා හුනස්නෙන් නැගී වැඩියෝ. මෙසෙයින් බුදුහු තමන් "පුරිසදම්ම සාරථි" වන බැවින් කූටදන්තබමුණුදු ආදිශබ්දයෙන් ගත් වඩහීසාදි අනේ සියදහස් බමුණන්දු දමා අමාමහනිවන් පැමිනවූහු.

[මෙතෙකින් නොවියත් හුදීජනයන් සඳහා කරණලද අමෘතප්‍රවාහයෙහි] බ්‍රාහමණ දමනා නම් පස්වෙනි පරිච්ඡේදය නිමි.

---

# 6 වෙනි පරිච්ඡේදය.

---

අජාසත් මහරජහු දූමු පරිදි කියේය යත්; බුදුහු තම හට විරුඬ දෙව්දත්තෙරුන් ලද ගත් තමන් ගිහි කල්හි යහලු බුදු කල්හි අරිසව් බිම්සර මහරජහු මරා රජය ගෙණ අජාසත්හු පුළුවුත් පැණ විසජා දම් දෙසා සරණ සිල් පිහිට

වූහු. කිසේය යත්; මගධරට රජගහා නම් නුවරෙක් වී; ඒ නුවර මන්ධාතු මහාගොවින්දාදි රජුන් විසින් පිරිනා කර ණුලද බැවින් රජගහා නම් විය; බුදුන් දවසදු සක්විත්තන් දවසදු නුවර වෙයි; සෙසුකල්හි සිස්ව යකුන් විසින් පිරිගාකරණු ලදුව ඔවුනට වසත්උයන් සෙයින් සිටි; බුදුහු ඒ නුවර නිසා අඩතෙළෙස්යල් සියක් සඟුන් පිරිවරා ජීවකයන්ගේ අඹවනඋයන්හි වැඩවෙසෙති; ඒ වනය කිසේ වූයේය යත්; එක්සමයෙක්හි ජීවකයෝ මහනෙල්මල් ගිඹ ලවා බුදුන් දෙස් හැර පජ්ජෝතමහාරජහු තමන් කළ පිළියම පැහැදී එවූ පිළිසඟලත් දී අනුමොදනාවසානයෙහි සෝවාන්ව එක්දවසකට දෙතුන්වටෙක බුදුන් කරා ගිය මැනවැයි වේළුවනඋයන් දුර මාගේ අඹවන උයන් ආසන්නය බුදුනට වෙහෙරක් කළ මැනවැයි තමන්ගේ අඹවනඋයන්හි වෙහෙර කොට අටළොස්හත් මහපවුරෙන් පිරිකෙව්කොට බුදු පාමොක් මහසඟනට දුනනු. මෙසේ බුදුහු ජීවකයන්ගේ අඹවනඋයන්හි වැඩ වෙසෙති, එයට පෙරටුව සැවැත්නුවර මහකොසොල්රජහු දූ රජගහානුවර බිම්සරමහරජහට බිසෝව අජාසත්කුමරහට ගැබ් ගත. ඔහු කුස වසන කල බිසවට දොළෙක් උපදනේ "රජු දකුණු දසරුවෙන් ලේ බොන දොළෙක්" උපන. හෝ තමහට උපන් දොළ කිසිකෙණෙකුත්ට නොකියා වැහැරගියා; රජ පිළිවිස බලා නොකියන්නෙන් නි මට විපරිතවනු කුමටය යි ප්‍රයත්නයෙන් පිළිවිසනෙණ කටුවූ දොළෙක් නිට උපන්නේයයි වෙදුන් ගෙන්වාගෙණ රන්සැතින් දසරුව පලා රන්තැටියෙන් ලේ ගෙණ දිය හා මුසුකොට පොවාලිය; දොළ සන්හිඳින; නෛමිත්තකයෝ ඒ ගැබ රුදු සතුරුදරුවෙක ඔහු විසින් රජ නසසී කිනු. බිසව් ඒ අසා ගැබ හෙලා පියටිව උයන් ගොස් කුස මඩවයි, ගැබ නොහෙයි. රජ ඇය එක්වත් උයන් යන සේ දක පරිජනයන් පිළිවිස අතුරු දැන නී කුසැ පූතකු බැව් දුවකු බැව් නොදැනෙයි, අසුවල් රජ තමහට උපන් දරුවක්හට මෙසේ කරවීල යන මහත්අගුණරාශියක් දඹදිව්තෙලෙහි පැතිරෙයි එසේ නොකරු යී වටා ලා රැකවල් දෙවී. හෝ උහු උපන් කල මැරුව මැනවැයි සිතුව. දරු උපන් කල රැකවල සිටි මිනිස්සු දක රජහුගේ කීමෙන් කුමරහු [මරණීන්] පා කළුහ. කුමරු මහත්වූ කල ඇර මවුබිසව් දක්වූහු. හෝ උහු දක පුනුසනා කළා, එයින් උහු මරනාහට නොපො

හොසත්වූව; රජදු අනුක්‍රමයෙන් උහුට යුවරජතන් දින. එකල්හි දෙව්දත්මහතෙරහු සිතූහු, "සැරියුත්මහතෙරහුදු මුගලන්මහතෙරහුදු මහසුප්මහතෙරහුදු වෙන වෙන පිරිස් ගෙණ වාසකෙරෙයි; මසිත් පිරිසක් කොට ගත මැනවැයි ලාභ විනා පිරිස් කොට ගත නොහැක්ක, එසේ බැවින් ලාභ උපදුව මැනවැ"යි ජිනයෙහි තී නියායෙන් අජාසත්කුමරහු ඉසිමත් පෙළහරින් පහදවා සවසඳු රැසිමෙමගිඳු පන්සියයක් රතපිරිවරින් තමන් කරා එළඹෙන සේ විස්වස්කළ සේ දැක ඔහුහට මෙසේ කිය. "කුමාරය පෙර මිනිස්සු බොහෝ කලකට ආ ඇත්තාහු, දැන් එසේ නොවෙසි. තොප පියා මරා රජ වෙව! මම් බුදුන් මරා බුදුවෙමි"යි පිය රජ මරනනට යෙදී. එකල්හි රජකුමරු අප වත්හිමියෝ දෙව්දත්තෙරහු මහත්ආනුභාව ඇත්තාහුය, ඔවුන් නොදත් දෑයෙක් නම් නැතැයි කලවයෙහි සිරියක් බැඳගෙණ වෙව්ලමින් ගොස් රජගෙට වනි. එකල්හි ඇමැතෙතෝ උහු තිරුකොට ගෙණ සැබව දැන කුමරහුද මැරුව මැනව දෙව්දත්හුද මැරුව මැනව හැම මහණහුද මැරුව මැනවැ යි බැණගෙණ සැලකොට කළ මැනවැයි රජහට කීහු. රජ කුමරු මරම්හයි සිතූ ඇමැත්තන් ඇත මෙහෙවර ගෙණ නොමරම්හයි සිතූ ඇමැත්තනට මහත්මෙහෙවර දී කුමක් සඳහා මා මරම් යි සිතූයෙහිදැයි කුමරු පිළිවිස රජය සඳහා යයි කීගෙන් ඉතාමැනව තා කැමති රජය බලාගන්නැ යි රජය ඔහුහට දක්වා දින. හේ මාගේ මනොරථය නිපනනැ යි දෙව්දත්තෙරුන්ට කිය. එකල්හි දෙව්දත්තෙරහු තෝ මියන් ඇතුල්කොට බෙර බඳින මිනිසක්හු වැනෙහි, කිහිපදවසකින් තා පියා තාගේ නිහසර සඳහන් කොට බලා රජය ගන්නි කීහු. ඔස වහන්සේ කුමක් කෙරෙමි යී කීය. රජු මරා පිය මැනවැයි කීහු. මා පියරජහට සැතින් වධනොකොට හැකෙක්කමි කිය. නැවෙනනට නිසි ගෙයෙක ලා අහර වලා මරා පියව යී කීහු. හේ පියරජු නැවෙනනට නිසි ගෙයෙක බහාපියා අනනිය මිස අනිකක්හු ගෙට නොවැද්ද දෙත්තේයයි යෙදීය. එතැන් පටන්ගෙණ දෙවිහි රන් තැටියෙක බත් එව ගිස තබා ගෙණ ඇර දෙයි; රජ ඒ වලඳා යැපෙයි; හේ මපියානෝ කිසේ යැපෙති යී පිළිවිස එපවත් අසා ඇය නිසින් යම්දෑයෙක් ගෙණ නොවැද්ද දෙත්තේයයි යෙදීය. එතැන් පටන් ගෙණ දෙවිහි බත් මුනුලය තබා ගෙණ වදී. එසිදු අසා අනනිය කෙහෙ බැඳ

නොවැදූ දෙන්නේයයි යෙදිය. එතැන් පටන්ගෙණ දෙවිඹ රත්මරවැඩියෙහි බත් එව පියාලා පයින් ගෙණ වදී. රජ ඒ අසා අනනිය මරවැඩි ලා නොවැදූ දෙන්නේයයි යෙදී. එතැන් පටන්ගෙණ දෙවිඹි ගඳදියෙන් නහා වෙර සිවුම්සුරු ගල්වා පිළි පෙරවගෙණ වදී, රජ ඔවුන් සිරුර ලෙව යැපෙයි. වැළිත් පිළිවිස එපවත් අසා අනනිය නොවැදූදෙන්නේයයි වැලකීය. දෙවිඹි දෙරටු ගෙ මුල සිට හිමි බිම්සරමහරජ ලදරු කල මරා නොපිය දැන් තොප සතුරා තෙපි නැසී මේ තොපගේ නිම්මා දැක්මය මම් මෙතැන් පටන්ගෙණ තොප දකිනු නොලබම් මාගේ වරදෙක් ඇත් නම් මා කෙරෙහි ක්‍ෂමාකරන්නේයයි වැළප වැහැස නැව තන. එතැන් පටන්ගෙණ රජහට අහර නැතිවිය.

සෝවාන්රජ මගපලසුවයෙන් සක්මන්කොට යැපෙයි, රජු සිරුර දිලියෙයි. අජසත් කිසේ යැපෙයි පිළිවිස සක්මනින් යැපෙන සේ සිරුර දිලියෙන සේ අසා සක්මන් නොකොට දැන මැනවැයි පියානන් පතුල කරයෙන් පලා ලුණු තෙල් ගල්වා කිහිරඟුරෙහි චිචි යන අනුකරණ ඇතිකොට පක්හ. ඒ රජ පූර්වජන්මයෙහි දැගැබෙක්හි වහන් ලාගෙණ ගියේය, සඟුන් ඉඳිනට අතුළ කලාලක නොදෙව් පයින් ඇක්මින, මේ එහි ඵලයි. රජහට මහත් වෙදනා උපන, අහො බුඩො අහො ධම්මො අහො සඞෙඝා යී තුණුරුවන් සඳහන් කරණුයේම දැගැබ් අස්නෙහි බහා ලූ මලක් සේ මෙළේ, සව්මහරජ දෙව්ලෙව්හි වෙසමුණු මහරජානන් පිරිවර ජනව සහ නම් යක්‍ෂයක්ව උපන. පළමු සවරෙක්හි එහි උපද මහත් සම්පත් වැළඳූයේය. දැන් සත්වන වර සපුරමින් ගොස් උපන් දවස්ම අජාසත්නු පුතෙක් උපන; පුතු උපන්බැව්දූ පියානන් මළ බැව්දූ දන්වන්නට දෙපත එක්වටම අලඟ. ඇමැත්තෝ පළමු පුතු උපන් බැව් කියම්හ යී ඒ පත රජු අත තුබූනු. රජහට එකෙණෙහි ම පුත්‍රසනා උපද සියල් සිරුර පැතිර ඇට මුල් පැහැර සිටියේය. එකල්හි පියරජහුගේ ගුණ සඳහන්කොට මා උපන් කල මපියානන් වද් සනා මෙසේම උපන්නේය යව මපියානන් මුසිත්වයි යෙදී. කුමක් මුදම්හ මහරජ යී අනෙක් පත අතු තුබූනු. ගේ පත් බලා වළප්මින් මෑනියන් කරා ගොස් අනා මපියානන් මා කෙරෙහි සනා විය හොයි පිළිවිත. හෝ බාල සුත කුම් කියහි තා ලදරු කල ඇඟිලෙලහි පොලෙක්

නැඟී, එකල්හි වළප්නාහු සංහිඳවිය නොහැකිව විනිස්මබ
ලෙහි හුන් තා පියරජු කරා ගෙණ ගියේය. ගේ තා ඇ
හිලල මියෙන් ඉරීය, පොළ මියෙහිම සිල්විය. ගේ තා
කොරෙහි සෙනහයෙන් ලේ මුසු පූයා දමා නොපියාම
ගැල පීය, පූත තා පියා තා කොරෙහි සනා මෙබන්ද සී
කිව. ගේ වැළප වැහැස පියානන් සිරුර හළුකිස කරවී.
දෙව්දත්මහතෙරහුද අජාසත්රජු කරා ගොස් බුදුන් මරනනට
යොධ දුනුවායන් ඉල්වාගෙණ නගා යවා එයින් කරණු
නැති සේ දැක තුමූ ගිජුකුළුපව්වට නැඟී ගලපාත සක්මන්
කරණ බුදුන් මුදුනට සෙල් විහිද එයිනුදු කරණ දැ නොදැක
නාලාගිරිඇතු විහිද එයිනුදු බුදුන් මරනනට නොපොහො
සත්ව ලාභ සත්කාරයෙන් පිරිහී බුදුන් පස්වරයක් ඉල්වා ඒ
නොලදින් සතුරුව සඟුන් පත්ෂියයක් දෙනා බිඳහැරගෙණ
ගොස් සැරියුත් මහමුගලන් දෙඅගසව්වන් තමන්ගේ පි
රිවරසඟුන් ගෙණ ගියකල්හි කටින් හුණු ලේ නගා නවම
සක් දවස් ලෙඩව හෙව තමන් කළ තාක් දෙයට විපිළි
සර උපයා දූන් බුදුහු කොයි වෙසෙති හොයි පිළිවිස දෙව්
රම්හි වෙසෙති යනු අසා හැඳෙකින් මා ගෙණ ඇර බුදුන්
දක්වා වයි කියා ගෙණ යනු ලඇහු බුදුන් දක්නට නිසි
පිණක් නොකළ බැවින් දෙව්රම්පොකුණුතෙර දෙකක්ව
පැලී ගිය පොළොවට වැද අවීචිමහනරකයෙහි පිහිටියේය.
එකල්හි රජගහානුවර සැණකෙළියෙක් විය. නුවරවැසෝ
ඒ නුවර දෙව්නුවරක්සෙයින් සදා සැණවෙස් ගෙණ දෙව්
යන් සෙයින් සැණකෙළි කෙළිත්. අජාසත්රජ පුණුරුසිපො
හොදවස රෑ සරාසඳුරැසින් රිදීකෙළින් නික්මුණු කිරිදහරු
සෙයින් රිදීවිමනින් නික්මුණු මුතුවැල සෙයින් සමන්කුසුම්
දම් සෙයින් දිලියෙන රාත්‍රියැ නීරිඳුමඩලෙහි ඇමති මඩුළු
පිරිවරා ජ්සත්යට ගනරන්මුවා අස්නෙහි හුන්නේය.
කුමට හුන්නේය යත්, නිදිවලකනුසඳහා හුන්නේය, මෙසේ
ජියා මළ තැන් පටන්ගෙණ නිදනනට ඇසිපියා ලූ ඇසිල්
ලෙහි සියල්සිරුර සැත් දගස් ඔත් කල් සෙයින් හඬමින්
පුබුදී, මහරජ කිමැයි පුළුවුත් කල්හි වලහයි එයින් ඔහුට
නිදි නොරිසෙසහි. මෙසේ නිදි වලකනු සඳහා හුන් රජ
මේ රැ සඳරැසින් රමණීයය, අභිරූපදශිනියය, සිත් පහදවයි
කවර මහණ බමුණු කෙණෙකුන් කරා යම්හ කා කරා ගිය
කල අප සිත් පහදී සී උපදන් ඇනී. ඒ අසා එක්තරා රජ
මහඇමැතෙක් මක්ඛලිගොසාලයා කරා එළඹෙන්නේයයි

කීය, අනෙකෙක් පූරණකාශ්‍යපයා කරා එළඹෙත්නේය යි කීය, එකල සිත් පහදී යී කීය, රජ ඒ අසා නොබිණීය, අනෙකෙක් අජිතකෙශකම්බලයා කරා එළඹෙත්නේය යී කීය, අනෙකෙක් පකුධකච්චායනයා කරා එළඹෙත්නේය යී කීය, අනෙකෙක් සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍රයා කරා එළඹෙත්නේය යි කීය, එකල සිත් පහදී යී කීහු. මෙසේ ඇමැත්තෝ තම තමන් ලද ගත් නුවටජරත් කී කල්හි මිහුරුරස ඇති රත් වන් අඹපක් කැයටි පුරුෂයක්හු තමා අත තුබූ කදුරුප කක් දමාපියත්නාහු සෙයින් නොගිවිස නොබැණ හිඳ තම හට නුදුරු නත්හි හුන් ජීවකයන්ට හැයි සබඳ නො බැණ හුන්නෙහිහුයි කීය. රජ මෙතෙක් පරිකථා කරණු ජීවකයන් සඳහා කෙළේයි. කුමටය යත්? තමා ඇර බු දුන් දක්වනු සඳහාය. තෙමේ ගොස් දක්නට නොනිසිද යත්? තමා මහාපරාධයෙන් ගොස් දක්නට නොනිසි ජීව කයන් පිටුපසැ හිඳ බුදුන් දුට මැනවැ යී මෙතෙක් පරිකථා කෙළේ. රජුගේ අභිප්‍රාව ජීවකයෝ නොදනිත්ද යත්? දනිත්මය; වැළි කුමට නොබැණ හුනාහ යත්? විකෙවි පසිදුනා සඳහාය. කිසේය යත්? ඒ පිරිස නුවටජරත්ගේ ලද ගත් ඇමැතෙතෝ බොහෝ දෙනා රැස්වූවාහු මං බුදු ගුණ කියනනට වන් කල අතරතුරෙහි නැගී තම තමන් ලද ගත් නුවටුත්ගේ ගුණ කියත්, එසේ වනනා හා මා කියන බුදුගුණ නිමමාවට නොයේ, රජ වූ කල් පෙර මම් මො වුත්ගේ නුවටජරත් කරා එළඹ නිස්සාර වූ බැව් දනෙනම් ඔවුත්ගේ ගුණකථාවෙහි නොසතුටු වූ මා පුළුවුස්සී එකල්හි මම් බුදුත්ගේ ගුණ කියා රජ බුදුන් කරා ගෙණ යෙමි යී රජුගේ අභිප්‍රාව දනුතුදු විකෙවි පසිදුනා සඳහා නොබැණ හුනාහු. එකල්හි රජ ඇමැතතන්ගේ බස් අසා මම් යම ක්හු බස් නොඇසියටියෙම්ද හෙම බෙණෙයි, යමක්හු බස් ඇසියටියෙම්ද හෙම් නාරජ මස් වලඳා සිටි ගුරු ළක්හු සෙයින් නොබෙණෙයි, මට මහත් පිරිහිනෙකැයි සිති. සිතා බලා ජීවක උපසාන්තවූ බුදුත්ගේ සවිය තෙමේද උපසානතය බැවින් වත්සපත් මහණක්හු සෙයින් නො බැණ හුන්නේය. මා නොබුණු කල ගේ නොබණීසී, ඇතක්හු මඩනා කල ඇතක්හුගේ පයින්ම මැඩිය මැනවැ යී සිතා ජීවකය මේ ඇමැතෙතෝ තම තමත් ලද ගත් මහණුත්ගේ ගුණ කියත්නම් මූව නොපොහොයි, මොවුන් සේම තොද ලද ගත් මහණහු නැත්ද යී පිළිවිත්; එකල්හි

ජීවකයෝ තමා ලවා රජු බුදුන්ගේ ගුණ කියවියට බැව්
දැන දැන් මා නොබැණ ගිඳිනාහට කල් නොවෙයි යම් සේ
මේ ඇමැතිනෝ රජු හමුවෙහි තම තමන් ලද ගත් නුවු
වුන්ගේ ගුණ කීහුද මා එසේ බුදුන්ගේ ගුණ නොකිව
මැනවැ යි හුනස්නෙන් නැඟී බුදුහු වසන දස බලා පසඟ
පිහිටුවා වැද නියරසින් දිලි ඇඳිලි බැඳ මහරජ මා යන්තම්
මහණක්හු කර එළඹෙතැයි නොසිතව අප බුදුහු මවුකුස
පිළිසිඳගන්නා කලදු මවුකුසින් නික්මෙණ කලදු මහබිනික්
මන් කරණ කලදු බුදුවන කලදු දම්සක් පවත්වන කලදු දශ
දහසක් සක්වළ කම්පිතවිය, මෙසෙයින් යමාමහපෙළහර
කළහ, මෙසේ දෙව්ලොවින් බටහ, අප බුදුන්ගේ ගුණ
කියම්, එකඟ සිත් ඇතිව අසා මහරජ යී බුදුන්ගේ ගුණ
කියන්නාහු "අයං දෙව භගවා අරහං සම්මාසම්බුද්ධො අමහා
කා අම්බවනෙ විහරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪ
තෙළසෙහි භික්ඛු සතෙහි තං ඛොපන භගවන්තං ගොතමං
එවං කල්‍යාණො කිත්තිසද්දො, අබ්භුග්ගතො ඉතිපි සො
භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුග
තො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙව
මනුස්සානං බුද්ධො භගවාති. තං තං දෙවභගවන්තං පයිරු
පාසතු අප්පෙව නාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො
චිත්තං පසීදෙය්‍යන්ති" යී, බුදුන්ගේ ගුණ කියන්නාහු මහරජ
අපබුදුහු මාගේ අඹවනයෙහි අඩතෙළෙස් යල්සියක් සඟුන්
පිරිවරා වැඩවෙසෙති; තොප වැනි සියනූදු දහස්නූදු සුව
හස්නූදු සිත් නෙණ බණ කියති රිසිසේ එළඹ පැන පුළු
වුස්නේය යී කීහ. රජ බුදුන්ගේ ගුණ අසත් අසත් සියල්
සිරුර පස්වණක් ප්‍රීතින් අතුරු නැතිව පිරී ගියේ. ගේ එම
විගස බුදුන් කරා යායටිව මා මෙ වේලේ බුදුන් කරා යන්නා
හට අන්කිසි කෙණෙක් යානාවක් යොජන්නට නොනිස්සහ
ජීවකයන් විනායයි සිතා සබඳ ජීවකය තොම ඇතුන් සදව
යී කීය; අනෙක් අශ්වයානා රතයානා ඇතද ඇතුන්ම සදා
එළවන්නට කියනු කුමටය යත්, උත්තමයන් කරා යන
කලට උත්තමයානාවෙන් ගියමැනව්නූදු අශ්වයානා රත
යානා දුර එන්නෙහිත් හඬ ඇසෙන්නෙනූදු පසුයන්නාහ
ටද හස්තියානාවෙහි හඬනොඇසෙන්නෙනුද තනිව බුදුන්
කරා නිව්යානාදියෙන් ගිය මැනවැයි සිතා ඇතුන් සදා එළ
වන්නට යෙදී. ජීවකයෝ රජ මෙ වේලේ බුදුන් දක්නට
යෙම්යි යෙයි, රජ්ජුරුවන් සතුරෝ බොහෝහ, ඉදින් අතර

මග කිසි අන්තරායෙක් වීනම් අන්හු මා ගරහති, ජීවක අකාලයෙහි රජු ගෙණ නික්මෙයි කියා බුදුහුදු ගරහති, මහණ ගොයුම් තමා කීවා කෙරෙත් කියා කල් නොනගමා තථා කෙරෙයි කියාය, එබැවින් මාත් බුදුහුදු නොගරහන නියායෙන් යම් සේ රජහට රැකවල් සුසංගිත වේද එසේ කෙරෙම් යී සිතූහ. ඉක්බිති අඹුන් මිනිසුන් නිසා පුරුෂයන්ට භයනම් නැති සුවයෙන් අඹුන් මිනිසුන් පිරිවරින් යෙත් යී පන්සියයක් ඇතින්නන් සදවා පන්සියයක් මාගමුන්ම පිරිමිවෙස් ගන්වා අසි තෝමර ගත් අත් ඇතිව රජු පිරිවරත්වා යී කියා; වැළිදු සිතූහු, මේ රජහට මේ අත්බැව මගඵලයට උපනිශ්‍රය නැති, බුදුහු උපනිශ්‍රය බලා දම් දෙසති එසේ බැවින් මහජනා රැස්කරවම් එසේ වනනා හා බුදුහු කිසිකෙණෙකුන්ගේ උපනිශ්‍රය හෙයින් දම් දෙසති ඒ දෙසුම් මහජනයාහටද උපකාරයටම වෙයි, එබදනට කියායවා අද රජ බුදුන් කරා යෙයි හැමදෙනා තමු තමන් කැරමිනිතැවූ පරිදෙදන් අවුදු රජහට අරක් ගන්නේයයි යෙදූහු. එකල්හි මහජනයෝ රජ බුදුන් දක්නට යේල, ඒ දම් දෙසුම් කිබද හෝ සැණකෙළියෙන් කිව එයට ගම්හ යී හැම දෙනා ගඳ මල් ගෙණ ගොස් රජු පෙරමග බල බලා මග සිටියෝ. එසද ජීවකයෝ මහරජ ඇතුන් සඳ, එළවූයේය කල් දත්තේ මැනවැ යී කීහු, රජ පන්සියයක් මාගමුත් පන්සියයක් ඇතුන් නගා තෙමේ මගුලැතු නැගී මිණිදඹුවැටපහනින් [පූරවේ] එකලුකොට මහත් අනුභාවයෙන් නුවරින් නික්මිණි. එකෙණෙහි පන්සියයක් මාගම්මු පිරිමිවෙස් ගෙණ හිස් වෙළා දසරුයෙහි කඩු තබා මිණිතෝමර ගෙණ නික්මුණාහු. ඔවුන් ඉක්බිති සොළොස් දහසක් නළුවෝ රජුපිරිවැරූහු, ඔවුන් ඉක්බිති කුරු කුදු කිරාතාදිහුය, ඔවුන් ඉක්බිති රජගේ රක්නා රජුකෙරෙහි විස්වස් ඇමතියෝහ. ඔවුන් ඉක්බිති විසිතුරු විලාසධරවූ සැටදහසක් මහාමාත්‍යයෝහ. ඔවුන් ඉක්බිති නොඑක් පලඳනායෙන් සැදී නාන් අවු ගත් විද්‍යාධරතරුණයන් බඳු අනූදහසක් පමණ රැට්දරුවෝහ. ඔවුන් ඉක්බිති සියයක් වටනා පිළි හැඳ පන්සියයක් වටනා පිළි එකස්කොට බහා ලා නාහා ගඳ විලවුන් ගත් රන්මල් ආදිනත්බරණින් සැදුහු දශදහසක් බමුණෝ දකුණුඅත් ඔසවා ජයශබ්ද හෝහිමින් යෙත්. ඔවුන් ඉක්බිති පසඟතුරුගත් පුරුෂයෝ පසඟතුරු වයමින් යෙත්. ඔවුන් ඉක්බිති දුනුබෙළය. ඔවුන් ඉක්බිති ඔවුනොවුන් වෙර පැහැර යන

ඇත්පඬකාතිය. ඔවුන් ඉක්බිති ගෙළෙන් ගෙළ පැහැර යන
අස්පඬකාතිය. ඔවුන් ඉක්බිති එකිනෙක පැහැරසිටි රතප
ඬකාතිය. ඔවුන් ඉක්බිති දසරුයෙන් දසරුව පැහැර සිටි
යෝධයෝහ. ඔවුන් ඉක්බිති තම තමන්ට නිසි ආභරණ
සම්පතින් වොරජනා අටලොස්සෙණීහ. යම්සේ කෙළ
වර සිට වූනුවූ සැරයක් රජු කරා නොපැමිණේද එසෙයින්
ජීවකයෝ රජුගේ පිරිස සංවිධානකොට ඉදින් රජහට කිසි
උපද්‍රවයෙක් වේනම් හැමදෙනාහට පෙරටුව රජහට දිවි
දෙමි සී තුමූහූ රජු වැලත ගෙණ යෙත්. ලියවැට මිණිදඬු
වැට පහත් මෙතෙක් සියය මෙතෙක් දහසය යන පමණ
නැති. මෙසේ මහත් රාජානුභාවයෙන් ඒ රජ දෙතිස් මහ
දොරක් හා සූසැට සුලුදොරක් හා ඇති රජගහනුවර පැදුම්දිග
දොරින් නික්ම නුවර පව්ර හා ගිජුකුළුපව්ව හා දෙඅතුරෙහි
ජීවකයන්ගේ අඹවනයට වෙත් ගිය කල්හි බුදුන් කරා යන
කල නිස්සබ්දව ගිය මැනවැ සී රජගෙහිම සිට ජීවකයෝ
කියෙන් බෙර නොගැසියදිය, මහත් කොට නොබිණිය දිය.
රජහට භය උපන; කුමටය යත්? අඩතෙළෙස් යල් සියක්
සඟුත් වසන අඹවනඋයන්හි කිබිසිනා හඬකුදු පවා නැති,
ජීවක මා නුවරින් පිටතට නෙරාගෙණ පරරටින් බලකායක්
දක්වා මා මරා නෙමේ රජවියටිය, මේ පස්ඇතක්හට බල
ඇත්තේ මා වැලත ගෙණ යෙසී, මා කෙරෙහි ආයුධ ගත්
එක් පුරුෂයෙකුදු නැති මට කැරුණේ මහත්පිරිහිනෙකැසී
සිතා බියපත්ව ජීවකය මා නොනස්හි; සී කිය. එකල්හි
ජීවකයෝ මේ රජ මාගේ මාත්‍රා නොදන්නේය මම් ලිහි
ඕලලකුදු දිවි නොගලවම් රජු නොඅස්වැසීම්නම් නස්සී සී
සිතා තරකොට අස්වසනාහු මහරජ තොබා! තෙලෙ බලග!
අගනමණ්ඩල මාලකයෙහි පහන් දිලියෙනනාහ සී කිහ;
එකල්හි රජ දොරටුවෙන් පිටතම සිට ඇත් පිටින් බට.
බැස බිම සිටි විහසුව බුදුන්ගේ තෙජස් රජු වෙර පහළ.
එකෙණෙහි රජහට සියල්සිරුරින් හත් සළු පෙරළා පියන
පමණ ඩහදිය වැගිරින. තමාගේ අපරාධ සඳහන් කෙළේ
මහත්භය උපන. ඉග් ඉඳුරා බුදුන් කරා යන්නට නොපො
හොසත්වූයේ ජීවකයන් අත ගෙණ අරන් සැරිසරන්නාක්හු
සෙයින් ජීවකය තා මේ කැරවූයේ යහපතකැසී ගුණ කිය
මින් අනුක්‍රමයෙන් මණ්ඩල මාලකයට සම්ප්‍රාප්තව සබඳ
බුදුහු කොහියදි පිළිවිත. කුමට පුළුවුස්සීය යත්? ඇතම්හු
නොහඳුනන්නෙත් පිළිවිත්. මේ එසේ නොවෙයි තමා

ලදරු කල පියරජහු හා ගොස් බුදුන් දුටු විරිය පැසුලූ පාප මිත්‍රයන්ගේ සසගින් පියරජහු මරා බුදුන් මරනුහාව දූනුවා යත් මෙහෙයා නාලාගිරිහි විනිද මහත් අපරාධයක් කොට සිටියෙත් බුදුන් කරා නොඑන්නා මිස නොහඳුනන්නේ නොවෙයි. බුදුහු වනාහි දෙතිස්වරලකුණෙන් හා අසූ අනු ව්‍යඤ්ජනයෙන් සැදී සිරුරු ඇතියවුහු සවණක් රසින් දිලියෙමින් සියලුඅරම් බබුලුවා තරුපිරිවරණලද පුන්සඳක් සෙයින් මහණගණ පිරිවරා මණ්ඩලමාලක මධ්‍යයෙහි වැඩ හුන්නාහ. බුදුන් කවර නොහඳුනති? මේ රජ තමාගේ ඉසුරු ලීලායෙන් පිළිවිත. හඳුනනුදු නොහඳුනන වන් පුළුවුස්නේ රජුන්ගේ තිරිති. ජීවකයෝ වනාහි රජුගේ බස් අසා මේ රජ පොළොව සිට පොළෝ කොහි යනනක්හු වැනන; අහස බලා හිර සඳ කොහි යනනක්හු වැනන; මෙරමුල සිට මෙරගල් කොහි යනනක්හු වැනන; බුදුන් පෙරටසිට බුදුහු කොහියයි පුළුවුස්නේය. එසේබැවින් මුහු බුදුන් දක්වමි යී ඇඳිලිබැඳ මහරජ අපසමම්මාසම්බුදුහු මැදටැඹ නිසා පැදුම් දස බලා සඟපිරිස් පිරිවරා වැඩහුන්නාහ යී කීහු. රජ බුදුන් කරා එළඹ සඟනට ගහටනොකොට එක්තැනෙක්හි බුදුන් නොවැදම සිට නිවාතතැනෙක්හි පිපි රත්පියුම්වනයක් සෙයින් නොබැණ වැඩහුන් සඟුන් දිටි. එහි එක්කෙණෙකුදු අතක් සොලවනුවෝ නොදඇති පයක් සොලවනුවෝ නොදඇති සව්බරණින් සැදී නළුපිරිස් පිරිවරා බුදුන් පෙරට සිටි රජ හෝ රජපිරිස හෝ එක්කෙණෙකුදු නොබැලූහ; හැම සමග සවණක් පැහැයෙන් දිලියෙන බුදුන් බලා හුනනු. රජ සඟුන්ගේ උපසමයෙහි පැහැද මඩ නැති පහත් විලක් සෙයින් සංහුන් ඉඳුරන් ඇති සඟුන් පුන පුනා බලා මේ උපසමය ම පුත් උදාකුමරහට වේවායී සිතා උදන් ඇනී. ඔහු පැවිජිව මේ සඟුන් සෙයින් උපසානන වනු සඳහා නොවෙයි මේ රජ සඟුන් දැක පැහැද පුතු සඳහන් කෙළේ; දිලුබ්ඳයක් ලදින් හෝ අපුවිදයක් දැක හෝ ප්‍රියවූ නෑයන් මිතුරන් සඳහන්කරණු ලොකයාගේ තිරිති. එසඳ බුදුහු රජුගේ සිරිත්හසර දැක මේ රජ මා හා සමග කථාකරන්නට නොපොහොසත්වූයේ බික්සඟුන් බලා පුතු සඳහන්කෙළේ. මා නොබණන කල්හි මේ රජ කිසිදෙයෙක් කියනනට නොනිසස මුහු හා කථාකළ මැනවැ යී මහරජ යම් සේ උස්තැනවට දිය නතු තැනට යේද එසෙයින්ම සිත් තම පුතු කරා නාතුවිය යී වදාළෝ. එසඳ රජ සතුටුව බුදුගුණ අවිනාත

පරිදි මම් දැන් දත්මි මා සේ බුදුනට අපරාධ කළ කෙණෙක් නම් නැති මාම විසින් බුදුන්ගේ අග්උවටා රජු මරණලද; දෙව්දත්නු ක්‍ෂයමන් ගෙණ දුනුවායන් මෙහෙයීම් නාලාගිරින් වියිදවීම් මා නිසා දෙව්දත්නු ගල්කුළු වුහුවුයේය මෙසේ අපරාධ ඇති මට බුදුහු ප්‍රියනෙපුල් කරණ දය අහෝයහ බුදුහු පස්වැදෑරුම්වූ මහසත් ගුණයෙහි පිහිටියාහ මෙබඳු ගුණමුහුදු සතරුන් තබා බැහැර සතරුන් පිරියෙස්නේ කුමට සී සොම්නස්ව පුතු තමහට ප්‍රියපරිදි කියා බුදුන් පසඟ පිහිටුවා වැඳ සඟුන් වඳුත් බුදුනට පිටු පෑ වැන්ද මනා නොවේයී සඟනට ඇඳිලිබැඳ එකත්පස්ව හිඳ පැණ පුළුවුස්නට අවසර ගත්. එසඳ බුදුහු රිසිසුනු දෙයෙක් පුළුවුස මහරජ යී සර්‍වඥ පැවරුණෙන් පැවරුහ. මෙසේ බුදුහු සර්‍වඥ පැවරුණෙන් පැවරු කල්හි රජ පැන පුළුවුස්නේ වහන්සේ ඇත්අරු අස්අරු රියසැරි ආදිහු නම තමන් දන්නා සිල්පයෙහි ඵල මෙම ජන්මයෙහි ලබති රජකුලයෙන් මහත් සම්පත් ලදින් තුමූ බුදිසුවයෙන් වැටෙති මවූ පියනුදු අඹු දරුවනුදු මිත්‍රයනුදු ඇමැතනනුදු සුවයෙන් පස්වටති. මහණ බමුණනට සුගතිය උපද මහත්සම්පත් වලඳනාට තිඝ දනුදු දෙති වහන්සේ එසෙයින්ම මෙම ජන්මයෙහි මහණුවම්හි ඵල දක්කා හැකි හොසී පිළිවිත. බුදුනු පැන නොවිසජාම සිතුහු තිත්‍ථිකයන්ගේ ලදගත් ඇමැතෙනා මෙයට ආවාහුල; හල මනා පක්‍ෂයද ගත මනා පක්‍ෂයද දක්වා කියන කල්හි අප මහරජ මෙයට මහත් උත්සාහයෙන් මේ අය; ඔහු ආ තැන් පටන්ගෙණ මහණගොයුම්හු මහණුන්ගේ කොලාහල හා සටන් කියයි යෙමින් සකස්කොට බණ නොඅසත්; රජ කියන තුරු විසජනු නොතිස්සහ රජුම අනුව පවති එබැවින් රජුම භාර කළ මැනවැයි මහරජ මේ පැන සෙසුමහණ බමුණන් පුළුවුත් විරි සේයක් හා ඇත්ද ඔවුනොවුන් කී දෑ තා සඳහන් ඇතහොත් කියා යී වදාළෙෝ. එකල්හි රජ පණ්ඩිතප්‍රතිරූපකයනට කියනුදෑක ඔහු පෙදෙහි පෙදෙහි අතුරෙහි දෙස් දෙති එකානතායෙන් පණ්ඩිතයෝ වූ කලී කියනු අසා මනාකොට කිව පසසති නොසෙ කී දයක් ඇත ඉඳින් නටකොට දෙති එකානතායෙන් බුහුත් හා සම පණ්ඩිතකෙණෙක් ඇතතානු නොවෙති එබැවින් කිය මැනවැයි සිතා වහන්සේ මම් එක්සමයෙක්හි පූරණකාශ්‍යපනම් නුවටහු කරා ගොස් මෙමම නියායෙන් පැනපුළුවුත්මි, ගේ පව් කැම්දු පින්කැම්දූ ඵල නැති යනාදි විසින් තමාගේ දෘශිනා

ති. "අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය" යනුවෙන් මා පුළුවුත් දු තබා අනෙකක් කියසි මම් උහු කී දැය නොගිවිස අසවල්රජ තමාගේ විජිතයට ගිය මහණ බමුණනට මෙ නම් දෙයෙක් කෙළෙල්ල යනු නොකියවුව මැනවින් නො බැණ නැගී ගියෙම් සී කීය. මේ නියායෙන් සනුවටජරත් කාර එළුඹ පැන පුළුවුත් සේ ඔවුත් පුළුවුත් දු තබා තම තමන්ගේ දශීන දක්වූ පරිදිදූ එහි තමා නොසතුටුවූ පරි දිදු කියා වහන්සේ මම් වැලි පෙළා තෙල් නොලබනනක්හු සෙයින් නිඝණ්ඨකයන්ගේ දශීනයෙහි සාරයක් නොලදින් පැන පුළුවුස්නට ආම්. වහන්සේ මෙමජන්මයෙහි මහණුවමෙහි ඵල දක්නාහැකි හොයි කීය. එකල බුදුහු කියග මහරජ තා මම් පුළුවුස්මි; තාගේ කිකරුදසෙක් මේ අජාසත්රජුදු මිනිස මාද මිනිස මේ රජ පස්කම්ගුණෙන් පිණ පිණා දෙව් රජක්හු සෙයින් රජකෙරෙයි මම් ඔහුගේ දස්මි මා වූහු සේව මහත්පින් කළ මැනව ඉදින් දන් දෙම්නම් රජු එක්දවසක් දුන් දන් සියක් සියක් භාගකළ කල එයින් එක් භාගයක් පමණ දනක් මම් දිවිපමණින් දෙන්නට නොනිසෙසම් ඔස මයිත් පැවිජිව සිල් රකකා මැනවැයි පැවිජිව සිඳුවත්ව අපිස්සතොස්ව වෙසෙසි; උහු එසේ වසන කල මා දසු මට මෙහෙයට එන්නේයයි හා කියනෙනාගිදැයි වදාළෝ. වහන් සේ එසේ නොකියම්හ අප ඔහු වැඳ පුදා දන් දෙම්හ යි කීය. කියග මහරජ ඉදින් එසේ වීනම් මෙම ජන්මයෙහි මහණුවම මේ ඵල නොවේදැයි වදාළෝ. වහන්සේ එකා න්තයෙන් මෙම ජන්මයෙහි මහණුවම මේ ඵලයයි කීය. මහරජ මෙසේ මා විසින් මේ ජන්මයෙහි මහණුවම පළමු වන ඵල පනවන ලදැයි වදාළෝ. වහන්සේ මෙසෙයින්ම මහණුවම මේ ජන්මයෙහිම අනෙක් ඵලයක් හා පැනවිය හැක්ක හොයි කීය. මහරජ එයින් තාම පුළුවුස්මි, තට උපයා දෙන ගොවියෙක් තාගේ විගි දක මයිත් පින් කළ මැනවැයි කුඩු මහත් සැපත් පියා පැවිජිව සිල්වත් ගුණ වත්ව වැටෙයි; ඔහු එසේ වසන කල මාගේ ගොවිගි මට උපයා දෙන්ට එන්නේයයි හා කියනෙනාගිදැයි වදාළෝ. වහන්සේ එසේ නොකියම් අප ඔහු වැඳ පුදා සතරපසයෙන් දන් දෙම්හයි කීය. කියග මහරජ ඉදින් එසේ වේනම් මෙම ජන්මයෙහි මහණුවම ඵල වේද නොවේදැයි වදාළෝ. වහන්සේ එකාන්තයෙන්ම මෙම ජන්මයෙහි මහණුවම ඵලයයි කීය. මහරජ මෙසේ මා විසින් මෙම ජන්මයෙහි

මහණුවම දෙවෙනිඵල පනවනලදැයි වදාළෝ. වහන්සේ මෙම ජන්මයෙහි මෙයට වැඩි මහණුවම අනෙක් අනි සඵලයක් හා පැනවිය. හැකකහොයි කීය. ඔස මහරජ අස දැන සී "ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො" යනාදි ක්‍රමයෙන් බුද්ධොත්පාදයෙහි පටන්ගෙණ අග්‍රීත්ඵලය පර්‍ය්‍යන්තකොට අහස්ගඟ වතුරු සෙයින් දම් දෙසා මහරජ මෙම ජන්මයෙහි මහණුවම මේ ඵලය මෙයට වඩා උතුම් අනෙක් අතිසඵලයෙක් නැතැයි වදාළෝ. [මෙහි විසතර දීඝනිකාය "ශ්‍රාමණ්‍යඵල" සූත්‍රයින් දන්නේය] එකල්හි රජ තන්හි තන්හි සාධුකාර දී ආදි මධ්‍යාවසාන සකස්කොට අසා මම් මේ පැනයත් බොහෝ දවස් බොහෝ මහණ බමුණන් පුළුවුස්නෙම් මිස තොහො කොටා සහල් සොයන්නාක්හු සෙයින් කිසි සාරයක් නොලදිම්, බුදුන්ගේ ගුණසඳුව මහත බුදුහු මට පහන් දහස් දල්වා අඳුකරන්නාක්හු සෙයින් මේ පැන විසඳූහ බොහෝ දවසක් මම් බුදුන්ගේ ගුණානුභාව නොදැන බැඳිනිම් සිතා බුදුගුණ සඳහන්කිරීමෙන් උපන් පස්වණක් ප්‍රීතින් පිණනලද සිරුරු ඇතිව දිවි පියත් බුදුසරණ නොපියම් සී තුණුරුවන් සරණ ගොස් තිසුණුකඩුවෙකින් හිස් සිඳුතුඳු බුදුන් නොබුදුයයි නොදකියම් දහම් නොදහමැයි නොදකියම් සඟුන් නොසඟහයි නොදකියම් මා සරණගිය බැව් උපාසකබැව් කැපහරුබැව් දන්නේ මැනවැයි දන්වා තමන් පියරජහු මැරූ වරද කමවා වැඳ තුන්යළක් පැදකුණුකොට නියරසින් දිලියෙන ඇඳිලිබැඳ මුදුනෙහි පිහිටුවා පැණෙන තාක් තැන් බුදුනට අභිමුඛවෙමින් ගොස් අසුන් විජහන තැන් සිට බිම පසඟ පිහිටුවා වැඳ බුදුන්ගේ ගුණ සදහන්කෙරෙමින් නුවර ගියේ. ඔහු ගියකල බුදුහු මහණෙනි මේ රජ පියා නොමැරුයේ වීනම් දැන් මෙනිම ගිඳ සෝවාන්වූයේය, පාපමිත්‍ර සංසර්ගියෙන් එයට අන්තරාය විය, එතකුදුවුවත් යම් හෙතුවකින් මේ රජ තථාගතයා කරා එළඹ තුණුරුවන්හි සරණ ගියේද ඒ හෙතුවින් මාගේ සස්නෙහි මහතින් යම්සේ කිසිවෙක් මිනිසෙකු මරා මල්මිටක් පමණද දී ගැලවේද එසෙසින්ම මේ රජ ලොහෝකුම්භිනිරය උපද තිස්වා දහසකින් පත්ලටබැස තිස්වාදහසකින් මුවවිටට නැගී ගැලවී යෙයි වදාළෝ. මේ රජ පියා මැරූ තැන් පටන්ගෙණ රෑ දවල් නිදිනොලබයි, බුදුන් කරා එළඹ මියුරු දම් දෙසුම් ඇසූ තැන් පටන්ගෙණ නිදිලද, තුණුරුවනට මහත්සත්කාරද කෙළේ

ජුහුදුන් සැදැහැතතන් කෙරෙහි මේ රජු හා සමයෝ නැති, අනාගතයෙහි "විජිතසෙන" නම් පසේබුදුව පිරිනිවෙයි.

මෙසෙයින් බුදුහු තමන් "පුරිසදම්මසාරථී" වන බැවින් අජාසත් රජ පූර්වූත් පැන විසජා දම් දෙසා සරණ සීලයෙහි පිහිටවී. ආදිශබ්දයෙන් ගත් පායාසි පොක්සි ඈ රජුන් දමා අමාමහ නිවන් පැමිනවූහු [මෙතෙකින් නොවියත්හුදිජන යන් සඳහා කරණලද අමෘතප්‍රවාහයෙහි] රාජදමනා නම් සවෙනි පරිච්ඡේදය නිමි.

---

# 7 වෙනි පරිච්ඡේදය.

---

අඟුල්මල් සොරහු දැමූ පරිදි කිසේය යත්; කොසොල් රජහුගේ භාගීව නම් පුරෝහිතයා පිණිස මන්තාණී නම් බැමිණි ගැබ් ගෙණ රුපුතකු පසවකළා. උහු මවු කුසින් නික් මෙණ කල සියලු නුවර ආයුධ දිලිහින, රජුගේ යහන් තුබූ මඟුල්කඩුවද් සෙසු අවිද් දිලිහින, බමුණු ගෙන් නික්ම නකත්තරු බලන්නේ සොර නැකතින් දරු උපන් බැව් දැන [උදය] රජු කරා ගොස් දවස් ගිය සේ සුවදැ යී පිළිවිත. රජ දවස් ගිය සේ නොසුවය, රෑ මාගේ මඟුල්අවි දිලිහින රජයට හෝ දිවියට හෝ අනතරය වෙයි යන සිතින් නිදි නොලද්මි යී කීය. [එකල්හි බමුණු] මහරජ නොබව මාගේ ගෙහි කුමරෙක් උපනා උහුගේ අනුභාවයෙන් තොපගේ මතු නොවෙයි සියලු නුවර ආයුධ දිලිහින යී කීය. එකල්හි රජ කිමෙක් වෙයි පූර්වූත්තෙන් සොරෙක් වෙයි කීය; එක් සොරෙක් වෙයි හෝ බොහෝ සොරුන් ගෙණ රට පහරණට නිසි සොරෙක් වෙයි හෝ කීය. එක් සොරෙක් වෙයි මහරජ යී කීය. එසේ කියා තමා සිත් ගන්නා සඳහා උහු හැර පිය මැනව හොයි කීය. එක් සොරෙකු බැවින් කුම් කෙරෙයි පිළිදගුව උහුය යී කීය. උහු නම් තබනනාහු සියලු නුවර දිලියෙන ආයුධයෝ කිසි කෙණෙක්නට හිංසා නොකළ හෙයින් "අහිංසක" නම් තුබූහු. උහු විය පත් කල්හි මවු පියෝ සිල්ප උගන්නාට තක්සලා නුවර යවූහු. හේ ධම්මාන්තෙවාසිකව සිල්ප උගනනී, වත්සපන, කී කී දැයෙක් වහ වහා සපයයි, මන වඩන නියායෙන් හැසිරෙයි,

පෙම් වඩන නියායෙන් බෙණෙයි, සෙසු දරුවෝ ඉටන් වූහූ; ඔහු අහිංසක මානවකයා ආ තැන් පටන්ගෙණ අප නොපෙණෙන්නම්හ යී උහු කිසේ බිඳුවම්හ යී බැණ ගන්නාහු, හැම දෙනහට වඩා නුවනැති බැවින් නුවන නැත්තේය යී නොදකිය හැකක, වත් සපනින් නොවත් සපනැ යී නොදකිය හැකක; ජනම ඇතෙතන් අජනම වනැයි නොදකිය හැක්ක; කුම් කරම්හ යී "ආචාර්‍ය්‍ය අඹුව හා සමග ඇත්තේය" යී බිඳ පියම්හ යී බැණගෙණ තුන් රැසක්ව පළමු ඇතම් කෙණෙක් ආචාර්‍ය්‍ය කරා එළඹ වැද සිටියාහු. කිම දරියෙනි කීයෙන් මෙහි ඇසෙන දෙයෙක් ඇතැයි කිහු; කිමෙක හොයි කීයෙන් අහිංසකමානවකයා තොපට වැරැද්දැ යී දතම්හ යී කීහු; ආචාර්‍ය්‍ය උන්ට දැගැව යටත්ති ම පුතු මා කෙරෙහි බිඳපියයි නෙරපීය. අනෙක් වට අනෙක් රැස ඇතෙතා් ආහුය; අනෙක්වට අනෙක් රැස ඇතෙතා් ආහුය; තුන් රැස ඇතෙනා්ම අවුද් එසේම කියා අප නොහදහා නම් තෙපිම පිරික්සා බලව යී කීහු. ආචාර්‍ය්‍ය ඔවුන් තමා සනා ඇතිව බණන සේ දැක ඇය හා උහු සමග ඇතිසේය යී බිඳි උහු මරම් යී සිතී; ඉදින් උහු මැරුයේවී නම් දිසාපාමොක් ඇදුරු තමන් කරා සිල්ප උගන්නට ගිය දරුවන් දෙස් දක්වා මරයි කියා වටලා සිල්ප උගන්නට එන්නෝ නොවෙති; එසේ වන්නා හා මට ලාභ පිරිහෙයි; එසේ බැවින් සිල්ප සම්පාදනයට උපචාරය යී කියා මිනිස් දහසක් මරන්නට කියම් එකාන්තයෙන් එයින් එකෙක් උහු මරයි සිතා පුත මිනිස් දහසක් මැරුව මැනව එසේ වන්නා හා සිල්පයට උපචාර කෙළේ වෙයි; අපි අනුනට හිංසා නොකරණ කුලෙහි උපන්නම්හ; එසේ නොකට හැකකැයි කියා සිල්පයට උපචාර නොකරන්නා හා ඵල නොදෙයි පුත යී කීය. හේ [ඒඅසා] පඤ්චායුධ ගෙණ ආචාර්‍ය්‍යයා වැඳ අටවියට වැද අටවියට වදනා තන්හිදු අටවි මධ්‍යයෙහිදු අටවියෙන් නික්මෙණ තන්හිදු සිටි මිනිසුන් මරයි; පිළි ඈ කිසිඅයතියක් නොගනී; එකෙක දෙකෙකැ යී ගණන් මතුකෙරෙමින් යෙයි; මොහු නුවන ඇත්ද පණිවා කර නුවනසිත් නොපිහිටන බැවින් කල් යත් යත් ගණනුදු නොදත; එකි එකි ඇඟිලි කපා ගෙණ තබයි; තුබූ තුබූ තැන ඇඟිලි නසයි. ඒ නස්නා සේ දැක ඇඟිලි විද මාලා කොට දැරීය; එයින් හේ "අඞ්ගුලිමාල" නම් විය; හේ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළේ, දර පලා සඳහා වල් යන්නාහු නැති; රෑ ගමට

වැද පයින් පැහැර දොර ගලවා පියා එනි හොතතත් *
මරා පියා එකෙක දෙකෙකැ යී ගැණ ගෙණ යෙයි;
එකල්හි ගම පියා ගොස් නියංගම් වන. නියංගම් වැසෙසෝ
ගොස් නුවර වන්හු; තුන් යොජනක් තැන් මිනිස්සු ගෙ
පියා දරුවන් අත ගෙණ ගොස් සැවැත්නුවර වටා කදවුරු
බැඳ රාජාඞගනයෙහි රැස්ව "මහරජ තාගේ රට අඞුල්මල්
නම් සොරෙක් විය" යී කියා වළපිත්. පියබමුණු ම පුත්
වන්නේය යී සිතා මවු බැමිණියට "අඞුල්මල්" නම් සො
රෙක් උපන; ගේ අනෙකෙක් නොවෙයි නි පුත් "අහිංසක
කුමරය" දූත් රජ උහු ගන්නට යෙයි කුමක් කටයුත්තේද
යී කිය. යා ගිම් ම පුතු ගෙණ එව යී කිව. සොඳුර මම්
යන්නට නොනිසෙසම් සතරදෙනෙකු කෙරේ විස්වස් නැ
නි යී; "සොර පෙර මා සබඳය යී විස්වස් නොදකට යුත්
තේය, තමා පළමු අතුට හුන් කොළ මා පෙර වැලඳ ගත්
තේය යී විස්වස් නොද කටයුත්තේය, රජහා සබඳය යී
විස්වස් නොදකට යුත්තේය, සත්‍රී මට සිනැහැතැයි විස්
වස් නොද කටයුත්තේය" යී කිය; මවු වනාහි ලය මෙ
ලෙක් වෙයි එයින් හෝ මම් ම පුතු ගෙණ එම් යී නික්
මුණ. එ දවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම්සමාහි
ලෝ බලන්නාහු අඞුල්මල්සොරහු දැක මා ගිය කල
උහුට සෙත් වෙයි ගම් නැති තැන මහවල්හි හිටියේ සිවු
පද ගයක් අසා මා කෙරෙහි පැවිජ්ව රාත් වෙයි, ඉදින්
නොගියෙම් නම් මවු මරා සසරින් නොනැගිය හැකි වෙයි;
උහුට සඞග්‍රහ කළු මැනවැ යී පෙරවරු සුගත් මහපවුල්
හැඳ පෙරවැ නුවර වැද වලඳා වෙහෙර ගොස් උහුට සඞග්‍රහ
කටැව්ව දෙව්රමින් නික්ම අඩන්මග පිළිපන්හු. එකල්හි
ගොන් රක්නාහු වසත් රක්නාහු සහන්නාහු බුදුන් එක
ලාව බුදුරැස් නොවිහිද වඩනවුන් දැක නොගැඳින මහණ
මෙ මගට නොයා! මෙ මග "අඞුල්මල්" නම් සොරෙක
දරුණු ලේ මුසු අත් ඇත්තේය, සතුන් කෙරෙහි කුළුණු
නැත්තේය, ගම් නොගම් කෙළේය, නියංගම් නොනියං
ගම් කෙළේය, දනවු නොදනවු කෙළේය. මිනිසුන් මර
මරා ඇඟිලි විද මාලා කොට දරයි, මහණ තෙලෙ මගට
පුරුෂයෝ දසදෙනෙකුදු විසි තිස් සතළිස් පණස් දෙනෙ
කුදු සැක ඇතිව සන්නාඩව වන වගව යෙති, ඔහුදු "අඞුල්
මල්" සොරහු අත නසිති යී කිහු. බුදුහු ඔහු තුන් යළක්

* හොතුවත්, යී ද පාඨයි.

කියතුදු නොබැණ නැඟී වැඩියෝ; සොරදු එසමාෂි දුබේහා
ජනයෙනුදු දුඃඛසෙයතයෙනුදු උකටලීව්, ඔහු මැරූ මිනිසුන්
එකක්හු උනු දහස්දෙනය, ගේ වනාහි එකකු විසින් දහස
පිරෙයි යන සිත් ඇතිව යමක්හු පළමු දිටිම් ද උහු මර
ගණන් සපුරම් යී සිල්පයට උපචාර කොට දැලි කපවා නාහා
පිළී හැඳ මවු පියන් දක්මි යී අටව්යට වදනා තැනට අවුදු
මගින් පහව සිටියේ බුදුන් දැක විස්මිතව මේ මගට පුරු
ෂයෝ දසදෙනෙකුදු විසි තිස් සතළිස් පණස්දෙනෙකුදු
සැක ඇතිව සනාඩව වග වනව එති, ඔහුදු මා අත නසිත්,
එනෙකුත් හොත් මේ මහණ එකලාව මා අභිනවමින් මෙන්
එයි; මේ මහණහු මැරුව මැනවැ යී කඩු පලඟ නෙණ
දුනු ගියවුර බැඳ බුදුන් පස් පස් ලුහුබදමින් යෙයි. යම්
සේ අඟුල්මල්සොරහු බුදුන් පියව්ගමනින් වඩනවුන් බල
පමණින් දිවතුයේ හඹා නොගත හෙද එ වැනි අධිෂටා
නයක් කළෝ. කිසේය යත්! මහපොළොව නැඟි නැඟී
බස්නා රළ සෙයින් උහු ඇර බග බහා සිටුව යී තිස්
සනක් පමණ තැන් පියා යෙයි; ගිය කල බුදුහු පෙරට
මහත් අඟනයක් දක්වා තුමූහු මධ්‍ය වෙති ගේ අනත වෙයි,
දැන් මුහු හඹා ගන්මි යී බල පමණින් දිවෙයි, බුදුහු එ අඟ
නයෙහි කෙළවර වෙති සොර මධ්‍යයෙහි වෙයි, ගේ මෙතැ
නදී මුහු හඹා ගන්මි යී වෙලෙව්ව දිවෙයි, බුදුහු එහි පෙරට
වලක් හෝ ගොඩක් හෝ දක්වති, මේ නියායෙන් උහු
තුන් යොජනක් තැන් ගෙණ වැඩියෝ. සොර කලානත
විය; මියෙහි කෙල සිඳිගියේය, සිරුර ඩහදිය බසසී; එක
ල්හි අඟුල්මල්සොර විස්මිතව "මම් පූර්වයෙහි දිවන ඇතුන්
ලුහුබැඳ ගණිම්මය, අසුන් ලුහුබැඳ ගණිම්මය, රථ ලුහු
බැඳ ගණිම්මය, දිවන මුවන් ලුහුබැඳ ගණිම්මය, එතෙකුත්
හොත් මම් මේ මහණහු පියව්ගම්නින් යනාහු බල පම
ණින් දිවතුයෙම් හඹා නොගත හෙම්" යී සිට බුදුනට
සිට මහණ යී කීය. බුදුහු මම් සිටියෙම් තොද සිට යී
වදාළෝ. එසඳ අඟුල්මල්සොරහු මේ හැම මහණහු සැබෑ
බස් කියති මේ මහණ යත්හුයේම මම් සිටියෙම් තොද සිට
යී යෙයි; යම් කාරණයෙකින් මේ මහණ යතුයේ සිටියානම්
වේද? මම් සිටියෙම් නොසිටියා නම් වෙම්ද? ඒ කාරණය
පිළිවිස බැලුව මැනවැ යී සිතා මහණ තෝ යන්නේ සිටි
යෙම් යී යෙහි, මා සිටියාහට නොසිටියෙයි යෙහි, තෝ
කිසේ සිටියෙහි මම් කිසේ නොසිටියෙම් යී පුළුවුත්. එසඳ

බුදුහු අඞ්ගුලිමාලය හිංසා සඳහා සතුන් කෙරෙහි පැවැත්විය යුතු යම් දඬෙක් ඇත්දැ? එ හැම කල්හි පියා ක්‍ෂාන්ති මෛත්‍රිය සිටිවන බැවින් මම් සිටියෙම් නම් වෙමි; මෙතෙක් දහස් සතුන් මරණ තා ක්‍ෂාන්ති මෛත්‍රිය නොසිටි බැවින් තෝ නොසිටියේ නම් වෙයි, දැන් තෝ ඉරියව් විසින් සිටියේද? නිරය හෝ සිටියෙහි තිරිසන් යොන හෝ ප්‍රේතවිෂයෙහි හෝ අසුරකායෙහි හෝ සිට්හි වදාළෝ. එකල්හි අඟුල්මල්සොර බුදුන්ගේ දෙශනා අසා මෙ වැනි සිංහ නාදයෙක් අනෙකක්හට ඇත්තේ නොවෙයි මේ මහා මායාදේවී පුත් සිදුහත්මහණරජහුගේ ගර්ජනාය; මම් නිපුණු නුවන ඇති සම්මාසම්බුදුන් විසින් දක්නා ලදුයෙමි බුදුහු මට සඞ්ග්‍රහ සඳහා මෙයට වැඩියහ සී සිතා දෙව්මිනිසුන් විසින් පුදනලද බුදුරජ බොහෝ කලක් ගිය කල මට වැඩසඳහා මේ මහවලට වැඩියහ; මෙ තැන් පටන්ගෙණ පව්නොදකෙරෙම් සී තොපගේ මිහුරු කථා අසාය සී තමාගේ පඤ්චායුධ ප්‍රපාතයෙහි බහා පියා බුදුන් වැඳ පැවිජ් අයදිය. බුදුහු ඕහට එහිභික්ඛුභාවයෙන් පැවිජ් දුන්හු; බුදුන් මුහු පැවිජ් කරණ කල සර සෙව්ව මැනව පා සිවුරු සෙව්ව මැනව යන කිසි නැති; මොහු පූර්වයෙහි සිල්වත්නට අටපිරිකර දුන් බැව් දැන එව මහණ සී දකුණත දික් කළහ. එකෙණෙහි ගිහිවෙස් අතුරුදන්ව මහණ වෙස් පහළ විය. ඉඩීමය පා සිවුරු ශරීරයෙහි ප්‍රතිමුක්ත විය. හෙම ඕහට පැවිජ් විය, හෙම උපසපත් කම්ම විය, එහිභික්ෂුභාවයෙන් උපන්නාහට සඟුන්ගේ වෙන උපසපත් කම් ඇත්තේ නොවෙයි; මෙසේ බුදුහු අඟුල්මල්සොරහු දමා මහණ කොට පා සිවුරු ගන්වා ගෙණ සැරිසරමින් සැවැත්නුවර ගොස් දෙව්රම් වෙහෙර වැඩවෙසෙති. එ දවස් ඔවුන් මවු ඒ වනයට ගොස් අට ඉස්ඹක් පමණ තැනින් අන්තරිතවූ "පුත අහිංසකය කොහි සිටියෙහි කොහි හුනෙහි කොයට ගියෙහි පුත මා හා නොබෙණෙහි" කියමින් වැද ඇවිද නොදැක ගෙට ගියා. එ කල්හි මහජනයෝ කොසොල්රජු ගෙට ගොස් දොර රැස්ව සිට මහරජ තොපගේ රට අඟුල්මල් නම් සොරෙක දරුණු ලේ මුසු අත් ඇත්තේය, සතුන් කෙරෙහි කුළුණු නැත්තේය ගම් නොගම් කෙළේය, නියංගම් නොනියංගම් කෙළේය, දනව් නොදනව් කෙළේය, මිනිසුන් මරා ඇඟිලි විද මාලා කොට දරයි උහු වලකා සී කියා මහඬින් හැඬූහ; රජ නොඑක් වර උහු ඇතැත්යෙන් නිරු

කොට ගන්නේය යි ඇතුන් දී යවිය; අසනියෙන් නිරුකොට ගන්නේය යි අසුන් දී යවිය; රතනියෙන් නිරුකොට ගන්නේය යි රත දී යවිය; ඔවුන් ගොස් ඒ වටාගත් කල්හි උහු නැඟී "මම් අඟුල්මල්මි" යි හඬ ගගනනා හා අවි පෙර ළනනාට නිසි එකක්හුදු නැති, ගේ හැම්දෙනා කොටා මරති; ඇතනු වල්ඇතනු වෙති; අසසු වල්අසසු වෙති; රත එහිම තිබී නස්සී; එකල්හි රජ මහජනයාගේ ගිගිරියෙන් මා ම ගිය මැනව ඉදින් සොරහට පරාජය වී නම් සල්හු පලායෙම් යි පත්සියයක් අසුන් සඳ, නෙණ සිවුරඟසෙනඟ ගෙණ සැවැත්නුවරින් නික්ම සොරු කෙරේ බිරින්සිතින් නොයා යටිවූයේද ගරගතු බියෙන් යනුයේ බුදුන් දැක ගිය මැනවැ යි දෙව්රම්වෙහෙර ගියේ. කුමක් සිතා ගියේය යත්? ගොස් බුදුන් වැඳ එකත්පස්ව හිඳිමි කවර හෙයින් බලාගෙණ නික්මිණිහි යි බුදුහු මා පුළුවුස්නා දැය; එකල [සොරු ගන්නා සඳහා යන සේ] මම් කියමි, බුදුහු වනාහි මට හුදුපරලොවිත්ම සඞ්ග්‍රහ කරනනාහු නොවෙති මෙ ලොවිනුදු සඞ්ග්‍රහ කෙරෙත්මය; ඉදින් මට ජය වේ නම් නොබැණ වැඩහිඳිනා දැය, පරාජය වේ නම් මහරජ එක් සොරෙකු සඳහා තා නොගිය මනා වෙයි වදාරණ දැය; එකල මහජනයෝ රජ සොරු නසනනට යන්නේ බුදුන් විසින් නවත්නාලද යනු දනති. එසේ වනනා හා මා නොගරහති යන සිතින් වෙහෙර ගියේ. ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්නේය. එකල්හි බුදුහු කිම මහරජ තට බිම්සරමහරජ කුපිත විය හෝ විසාලාමහනුවර වැසි ලිච්ඡවිරජහු කුපිතවිය හෝ සෙසු ප්‍රතිපක්ෂ රජකෙණෙක් කුපිත විය හොයි වදාළහ. වහන්සේ මට දැහැවි රජකෙණෙක් ඇනනානු නොවෙති මාගේ රට "අඟුල්මල්" නම් සොරෙක් විය, උහු ගන්නට යෙමි යි කීය. එකල බුදුහු ඉදින් මහරජ තෝ අඞ්ගුලිමාලයා කෙහෙ බා සිව්රු හැඳ පෙරවැ පැවිජිව පණීවා ඈ පව්කමින් විරතව එක් වේලේ වලඳා බඹසරවස් රැක සිල්වත්ව කළණදහම් පුරා වසනනාහු දිටිහි නම් උහුට කුමක් කෙරෙහි යි වදාළහ. වහන්සේ අප ඔවුන් වඳුම්හ, දුටු කල හුනස්නෙන් නැගෙම්හ, හිඳිනා හසුන් දෙම්හ, සතරපසයෙන් උපසථාන කරම්හ යි කීය. කියා තබා බුදුහු ඔහුගේ උපනිශ්‍රය බලා උහු ඇර පැව්ජි කළාහු වූහු නම් යහය යි සිතා බුදුන් පිරික්සනු සඳහා වහන්සේ ඒ දුසිල් පව්වූහට මෙබඳු සීලසංගමයෙක් කොහි වේදැ යි කීය. එසමාහි

අඟුල්මල්තෙරහු බුදුනට හුදුරු තන්හි වැඩනුන්නාහ, බුදුනු දක්‍ෂණන නගා මහරජ මේ "අඟුල්මලැ" සී වදාළහ. එකල කොසොල්රජ බියපත්ව වෙවුලා ගියේ, තුබූ මහජනයෝ බිය පත්ව කඩු පලඟ දමා පියා ඒ ඒ දිග පැලැ. නුවර වැද දොර පියාලා අගුලු බගාගෙණ අටලලට නැගී බලමින් සිටියාහු. "අඟුල්මල්සොර රජු මා කරා එයි යනු දැන පළාවු අවුදු දෙව්රම්හි හුන්නේය, රජු ගත ඇප් පලා ආවමෝ දිවි ලදූම්හ" සී කීහු. බුදුහු රජහට භය උපන් බැව් දැන නො බව මහරජ මේ දැන් කුහුඹුවකුදු දිවි නොගලවයි මුහු කෙරෙන් තට භය නැතැයි වදාළෝ. බුදුහු මෙසේ වදා රත්ම රජහට භය සංහිඳින, රජ අඟුල්මල්මහතෙරුන් කරා එළඹ වහන්සේ අඟුල්මල්දූය හොයි කීය. එසේය මහරජ සී කීය. රජ පැවිජියනට දරුණුකැමින් ලද නම් කියනු නොයෙදෙයි මවු පියන්ගේ ගොත් විසින් බැවහර කරණු මැනවැයි සිතා වහන්සේ තොප පියෝ කවර මවු කවර සී පිළිවිත. මහරජ මා පියෝ "හාගීව" නම් බමුණුය, මවු "මන්තාණී" නම් බැමිණිය සී කීහ. වහන්සේ අපටත් හිමියෝ හාගීවයෝය මන්තාණී පුත්‍රයෝ සස්නෙනි අභිරත වෙත්වා සී මම් සතරපසයෙන් උපසථාන කරමැයි කියමින්ම බඩ බද සළුව ඇරගෙණ මහතෙරුන් පාමුල තිබීය. මහ තෙරහු තමත් තෙලෙස්ධුතඟ සමාදත්ව පවුල්සිවුරු පොරෝගනත් මහරජ තුන්සිවුරු සැපිරු ඇති කීහ. රජ බුදුන් කරා එළඹ වැද එකත්පස්ව හිඳ වහන්සේ ආශ්චර්‍ය්‍යය අත්භූතය, වහන්සේ යම්තාක් අදාන්තසතුන් දමනදූය, නොපිරිනිව්සතුන් කෙලෙස් පිරිනිවනින් නිවනදූය, වහන්සේ ඇප් දඬිනුදු සැතිනුදු සතුන් දමනනට නොහැක්කාම්හ, වහන්සේ නොදඬින්ම නොසැතින්ම සතුන් දමනදූය, වහන්සේ ඇප් යම්හ බොහෝ කාර්‍ය්‍ය ඇතහම්හ සී කීය. කල් දැන මහරජ සී වදාළෝ. රජ බුදුන් වැද පැදකුණුකොට ගියේය. මහතෙරහු කුලගම සිඟනනට ගිය කල මිනිස්සු ඔවුන් දැක වෙව්ලත්මය, පලත්මය, දොර පියා ලත්මය, ඇතම්හු අඟුල්මල් යන නම අසමින් පලා වලට හෝ වදිති; ගෙට හෝ වැද දොර පියාලා අගුල් ලාගණිති; පලා නොයා හෙනනාහු පිටු පෑ සිටිති. මහතෙරහු සහළුවක් හඹුදු කෙණෙසක් බතුදු නොලබත්, අහරින් කලානාවෙති, අහර නොලබනනාහු නුවර නම් සව්සාධාරණය සී නුවරට වදිත්, යම් දොරකින් වන්හුද එහි මිනිස්සු "අඟුල්මල්" ය සී කල

දහස් බිඳිමින් පලත්, එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙර වරු පා සිවුරු ගෙණ සැවැත්නුවරට වැදී සපදන් සැරිවන බැවින් ගෙපිළිවෙළින් කෙණෙසිඅහර සිඟනාහු මූඪගබ්ව නොවදහෙන මාගමක් දැක කරුණාවෙන් කම්පිතවූහු, ඔවුත් පෙර එකක්හු උනූ දහසක් මිනිසුන් මරනනානට එක් දවස කුදු කුලුණු නූපන, මූඪගබ්මාගම දුටු පමණින් කුළුණු කිසේ උපන යත්? පැවිජ්බලයෙන් උපන, එකල්හි අඟුල්මල්මහ තෙරහු අහරකිස කොට බුදුන් කරා එළඹ වැඳ එකත්පස්ව හිඳ වහන්සේ සැවැත්නුවර කෙණෙසි අහරසිඟනෙම් එක් මූඪගබ්මාගමක් දිටිම්, ඇය විඳිනාදුක් මට නොරිසිය සී කීහු. එසේබැවින් තෝ ඈ කරා ගොස් මා උපන් තැන් පටන් ගෙණ දැන දැන සතක්හු දිවි නොගැලවීම් නම් එ සසින් තිටදු ගබටදු සෙත් වේවා සී සස්කර සී වදාළෝ; වහන්සේ ඒ මට "මුසවා වෙයි, මා විසින් බොහෝ සතුන් දැන දැන මරණ ලදහ සී කීහු. අංගුලිමාලය ගේ තා ගිහිමිනිස් කලැ; ගිහිමිනිස්සුනම් සතුන් මරණු ආදී කෙරෙත්, දැන් තට ආයඝී නම් ජතියෙක් ඇති එසේ බැවින් තෝ මා උපන් තැන් පටන්ගෙණය සී කියන තැන කුසුස් ඇතිවිහි නම් ආයඝීජාතිය උපත් තැන් පටන්ගෙණය සී කියා සී නගා යවූහු. මහ තෙරහු මැනව වහන්සේ සී එයට ගොස් තමන් සස්කොට සෙත්කරන්නට ආ පරිදි කියා සී තිවූහු. මිනිස්සු වටා ජවනිකා බැඳ මහතෙරණට ජවනිකායෙන් පිටත පුටුවක් තුබූහු. මහතෙරහු එහි වැඩහිඳ "මා ආයඝීජාතින් උපන් තැන් පටන්ගෙණ දැන දැන සතක්හු දිවි නොගැලවීම් නම් එ සසින් තිටදු ගබටදු සෙත් වේවා" සී සස්කළහ. ඒ සස් තෙපුල් හා සමග ඩබරායෙන් ගුලු දියක් සෙයිත් දරු නික්මිණි. දිපත් මවුනට සෙත් වී, මහතෙරුන් හිඳ සස්කළ තන්හි පිළක් කළහ. මූඪගබ්වූ තිරිසත්ගතිය සත්හුදු ඇර එහි හොවති, එ විගසම සුවයෙන් බර මුසිත්. යමක්හු දුබී ලද ගෙණ එනනට නොහැකිද ඇයට පිළ දෙව් දිය ඇර හිස ඔත් කල් එම්කෙණෙහිම බර මුසී. සෙසු රොගදු සංහිඳී. මෙකැප සිටිනා පෙළහරයි. කිම හෝ බුදුහු මහ තෙරුන් ලවා වෙදකම් කෙරෙව්වා වෙති හෝ යත්? එසේ නොවෙති; කිසේය යත්? "මහතෙරුන් දැක මිනිස්සු බා පලති. ඔවුන් කෙණෙසිඅහර නොලදින් කලානතව මහණුවම් කරනනාට නොතිසසහ. මෙසේ වනනා හා දැන් අඟුල්මල්තෙරණු මෙත්සිත් පිළි ලදින් සස්කොට මිනිස්නට

සෙත් කෙරෙත් සී මිනීසූ මහතෙරුන් .කෙරෙහි නොබා
එළඹියපි වෙත්; එකල අහරින් ක්ලාන්ත නොව මහණු
වම් කරනහට නිසිවෙත්". එයින් බුදුනු ඔවුන් කෙරෙ අනු
ග්‍රහයෙන් සත්‍යක්‍රියා කරවූහු. සස්කොට සෙත් කරණු වෙද
හම් නොවෙයි. මහතෙරහු මහණුවම් කෙරෙම් සී කම්ටහන්
ගෙණ හුන් කල්හි අටවියෙහි මිනිසුන් මැරූ තැන්ම පහළ
වෙයි, වහන්සේ දුගිම් බොහෝ දරු බිලිඳුන් ඇතෙනම්
මට දිවි දෙව සී මරණබියෙන් වළප්නා පරිදිදු අත් පා සිපන
පරිදිදූ අපාතට එයි ඔවුන් විපිළිසර ඇතිව හුන් තෙනින්
නැගීයෙනි. එයින් බුදුහු ඔවුනට ඒ ජාතිය අබෙබාහාරික
කොට එසේ වනහා හාම විදසූත් වඩා රත්බැව් ගණිත්
සී පැවිජ් වූ තැන් මුල්කොට ආයඝීජාතින් සත්‍යක්‍රියා කරවූහු.
එකල්හි අඟුල්මල්මහතෙරහු නොපමාව මහණුවම් කොට
රාත්වූනු. මහතෙරුන් කෙණෙසිඅහර සිඟනහට නුවර වත්
කල්හි කවුඩු බලු ආදීන් නෙරණු සඳහා වටා හිස්සනක්
පමණ තන්හි කවර දිශාභාගයෙකින් දමාලූ දඬු පහණ
හකුරු අවුද් මහතෙරුන් වෙර හෙයි. ඔවුන් ඉසින් ලේ
වගුරුවමින් බුත් පා ඇතිව හිරුණු සිවුරු ඇතිව බුදුන් කරා
ගියාහු. බුදුහු ඔවුන් දැක බ්‍රාහ්මණය අධිවාසනා කරා!
යම් කමක්හුගේ විපාකයෙන් සසර සිටිය හොත් නො
එක් වා දහස් සූවගස් නිරය පස්හි; ඒ කමහුගේ විපාක
තෙමේ මෙමඅත්බැව ශවයි වදෑළෝ. මෙහි සත්වන ජවත්
සිත්හි කුසල් හෝ අකුසල් හෝ උපන. පළමු ජවන්සිත
මෙම අත්බැව විපාක දෙයි. මෙම අත්බැව විපාක දෙනනට
නොපොහොසත්වී නම් විපාක නොදෙන බවට පැමිනේ.
සත්වන ජවන්සිතින් අනතුරු අත්බැව විපාකදෙයි. දෙන්
නට නොපොහොසත් වී නම් වටලා විපාක නොදෙන බවට
පැමිනේ. ඒ දෙදෙනා අතුරෙහි පස්වන ජවන් සිත් අනා
ගතයෙහි යම් කලෙක අවකාශ ලද නම් එ කල විපාක
දෙයි, සසර සිටිනා තාක් කල් විපාක නොදෙන බවට නො
පැමිනේ. [මේ කර්‍මයන්ගේ විභාග ධර්‍මප්‍රදීපිකා නම් මහා
බොධිවංශ පරිකථාවෙන් දන්නේය, ඒ බුඩ ධර්‍මය; මේ බුඩ
චරිතය.] මේ මහතෙරණට වූ කලී විපාක නොදෙන බව
අනතුරුඅත්බැවද් අනාගතයෙහි යම් කලෙකද් විපාක
දෙන කර්‍මයෝ රත්මගින් කැඩූනහ. මේ අත්බැව විපාක
දෙන කර්‍ම වූ කලී රත්බව පතානටද වෙයි, එයින් වී. එ
කල්හි අඟුල්මල්මහතෙරහු රහොගතව වැඩහිඳ ඵලසමවත්

ක්‍ෂුව විද එසින් නැඟී බුදුහු තමනට වහල් වූ සේ සිතා සොම්නස්ව උදන් අනනාහු "දණ්ඩකෙනෙවදමයන්ති–අංකුසෙහි කසාහිච–අදණ්ඩෙන අසත්‍ථෙන–අහං දන්තොම්හි තාදිනා" යනාදි ගාථාවෙන් උදන් ඇනූහු. මෙසෙයින් බුදුහු තමන් "පුරිසදම්මසාරථි" වන බැවින් අඟුල්මල්සොරහුද් ආදිශබ්දයෙන් ගත් සංකිච්චනම් හෙරණපානන් අනවැසි සත්සියයක් සොරුනුද් කෙළරුවන්කල මහතෙරුන් අතවැසි නවසියයක් සොරුනුද් මේ ඈ නොඑක් සිය නොඑක් දහස් සොරුන් දමා අමාමහනිවන් පැමිනවූහු.

[මෙතෙකින් නොවියත්හුදීජනයන් සඳහා කරණලද අමෘතප්‍රවාහයෙහි] අඟුල්මල් දමනා නම් සත්වෙනි පරිච්ඡෙදය නිමි.

---

# 8 වෙනි පරිච්ඡෙදය.

---

සභිය නම් පරිව්‍රාජකයා දැමූ පරිදි කිසේය යත්; එක් සමයෙක්හි බුදුහු රජගහනුවර නිසා ගනනිල්වේලුවනයෙන් පිළිකෙව්ලදවන බැවින් වේලුවන නම් ලද් අටළොස්හත් පවුරු හා දොරටු ඇති පරමරමණීය වූ උයන්හි වැඩවෙසෙති. එකල්හි සභිය නම් පරිව්‍රාජකයෙක් ගොස් බුදුන් පැනපුළුවුත්. කිසේය යත්? පෙර කසුප්සම්මාසම්බුදුන්වහන්සේ නොඑක් කප් කෙළ සුවහස් මතුයෙහි පැරුම් පුරා අවුදු තුසීපුරෙහි උපද දසදහස් ලෝදෑහි දෙව් බඹුන් අයැජමෙන් මිනිසුන් විසිවාදහසකට ආ ඇති කල්හි තුසී පුරෙන් සැව බරනැස්නුවර බඹදත් නම් බමුණු පිණිස ධනපති නම් බැමිණිය කුස පිළිසඳ ගෙණ දසමස් ඇවෑමෙන් ඉසිපතන් උයන්හිදී මවුකුසින් නික්ම ගොත් විසින් කසුප් නම්ව හංශවත නම් සොමවත නම් ශ්‍රීනන්‍දනම් තුන්පහය අටසාළිස්දහසක් නළුවන් පිරිවරා දෙවාදහසක් ගිහිගෙහි වසස කොට අනමෙහෙසුන් නන්‍දනම් බැමිණිය විජිතසෙනනම් පුතකු ලද කල්හි සතරනිමිතන දැක මහබිනික්මන් කෙරෙම් යී සිතු විගස පහය අහසට නැඟී මහජනා මනනුවන් වුළුඹමින් ගොස් නුගම්හබෝ ඇතුළුකොට බිම පිහිටි කල්හි පහයින් නික්ම පැවිජිව නළුගණ පහයින් බැස

දෙගවුවක් පමණ තැන් ගොස් සහපිරිවරින් කැඳවුරු බැද හුන් කල්හි; තමන් අනුව පැවිජි වූ කෙළුක් දෙනා පිරිවරා සති යක් පධන්හිසැරූ; සුනන්‍දා නම් බැමිණිය දුන් පිඬු වලඳා කිහිරිවනයෙහි දිවාවිහාර කොට සවස්හි සොම නම් යව පාලයක්හු දුන් අටමිටක් කුසතණ ගෙණ නුගරුක් මුලට එළඹ තුන් යළක් පැදකුණු කොට පසළොස් හත් තන පළඟ මතුයෙහි පැදුම් ලෝ දෑ බලා වැඩහිද මාරවිජය කොට සම්මාසම්බුදුව උදන් අනා සත්සතිය ගලවා මහබඹුන් අයජමෙන් අහසින් ගොස් ඉසිපතන්හි දම්සක් පවත්වා කෙළ දහස් දෙනා සසරමුහුදින් නගා තිස්නම් භාරවාජ නම් දෙඅගසව්වන් හා සව්මිත්‍ර නම් අග්උවටා මහතෙරුන් හා අනුලා නම් උරුවෙලා නම් දෙඅගසව්වන් සමග අනේ දහස් සඟුන් පිරිවර නොඑක් දහස් මිණිදඬුවැටපහන් මැද දිලියෙන පහන්රුකක් සෙයින් චොරජමින් සැරිසරා දහම් වහරේ වස්වා කෙලෙස්රජ සලා සංහිඳුවා සොළොස්වා දහසක් සිට කසීරට සෙතව්‍යපුර නම් නුවර අබියෙස්හි සෙ තව්‍යවන නම් උයන්හි අනුපදිසෙස් නිවන්දසින් පිරිනිවි යාහු. ධාතු නොසුන්ව කසුන්කඳක් සෙයින් සිටියේය. සියලු දඹදිව් වැසෝ රැස්ව ගනරත්උළුයෙන් යොදුන් උස රත්දාගැබක් බැන්දාහුය. මෙසේ රුවන්දාගැබ් පිහිටි කල්හි කුලදරුවෝ සත්දෙනෙක් බුදුසස්නෙහි මහණව සැරුඅනුරු කමටහන් ගෙණ පසත් දනව් ගොස් වල මහණුවම් කරන්නාහු අතරතුරෙහි බණ අසනනට නුවර එත්; ආවාහු සඟුන් පිළිවෙත් නොපෙළහර සේ දැක සස්නා අතුරුදන් නොවන තුරු අපට පිහිට කොට ගත මැනවැ යී රුවන් දාගැබ වැඳ අරණ්‍යයට වැද එක් පර්වතයක් දැක දිවියෙහි ආශා ඇති කෙණෙකුන් නවත්නේ; නැති කෙණෙකුන් නැගෙන්නේය යී හිණි බැද හැමදෙනා පර්වතයට නැගී හිණ හෙලා පියා මහණුවම් කළෝ. ඔවුන් කෙරෙහි මහලුමහතෙරහු තමන් උපනිශ්‍රය ඇතිවන බැවින් එමද, රැ රුත්ව ඉඩියෙන් හිමව්වට ගොස් අනොතත්දහතෙලෙහි මූව දෙව නාලියදැහැටු වලඳා උතුරුකුරුදිව් ගොස් බත්කිස නිමවා පා පුරා අහර හා අනොතත් පැන් හා නාලියදැහැටු ගෙණ ඔවුන් අවුදු ඇවැත්නි මේ උතුරුකුරුදිවින් අල බත, මේ හිමව්යෙන් අල දැහැට, මේ දහතලා පැන, මේ දියෙන් මුව දෙව මේ දැහැටු කා මේ අහර වලඳා මහණුවම් කරා! මෙ සෙයින් මම් නොපට හැම කල්හි උපස්ථාන කෙරෙමි යී

කීහු. වහන්සේ පළමු යම් කෙණෙක් රාත්වූහුදු ඔවුන් අල
අහර වලඳා මහණුවම් කරම්හ සී මුල අප කළ කතිකා
යෙක් ඇතහොයි කීහු. නැති ඇවැත්නි කීහ. ඉදින් අපදු
තොප සේම නිපනහමෝ නම් අහර වලඳම්හ සී නොගි
විසෙසා්. අනෙක් දවස් මගලුමහතෙරහු අනාගාමිව එසෙ
සිත්ම අහර හා දිය දැහැවූ ගෙණ අවුදු වලඳා මහණුවම්
කරනනට කීහු. වහන්සේ මගලු මහතෙර අහර නොවලඳා
අනුතෙරුන් අල අහර වලඳම්හ සී මුල අප කළ බ්‍යවසථා
යෙක් ඇත හොයි කීහු. නැති ඇවැත්නි කීහු. ඉදින් අපදු
තොප සේම නිපනහමෝ නම් ඇපිම ඇර වලඳම්හ සී
නොගිවිසෙසා්. අනෙක් දවසද් අවුද් එසෙසිත්ම අයජනා
සේ දැක වහන්සේ මොබ හා කරණ කථාමාත්‍රයකුදු අපට
ප්‍රපඤ්චය සෙද වඩනේ කුමටදැ සී කීහු. ඔහු යම් කවර පරියා
යෙකින් ඔවුන් නොගිවිසසියදි නැගී වැඩියෝ. ඔවුන් කෙ
රෙහි රාත්වූ මහතෙරහු පිරිනිවියාහු, අනාගාමි වූ මහතෙ
රහු සුදවස්බඹතෙලෙහි උපන්හු. තුබූ පස්දෙනා කිසිවිශෙෂ
යක් නොලදින් වියලී සත්වනදවස් මිය කාමාවචර දෙව්
ලෙව්හි උපද සදෙව්ලොව අනුලොම් පිළිලොම් විසින් දෙව්
සැපත් වලඳා මෙම බුදුබවයෙහි දෙව්ලොවින් සැව එක
කුලෙහි උපන්හු. ඔවුන් කෙරෙහි එක් කෙණෙක් පොක්සි
මගරජ වූහු. එක් කෙණෙක් කුමරකසුප් මහතෙර වූහු,
එක් කෙණෙක් දරුවීරි මහතෙර වූහු. එක් කෙණෙක්
දම්පල්පුත්තස් මහතෙර වූහු. එක් කෙණෙක් සභිය පරි
ව්‍රාජක වූහු. එහි සභියපරිව්‍රාජිකාව කුස පිළිසඳයක් ගත්.
කිසේය යත්? හෝ එක්තරා රජදුවකු ඇය සමයනතර උගන්
නාසඳහා එක් පරිව්‍රාජකයක්හට දක්වා දුනාහු. ඔහු අතවැසි
පරිව්‍රාජකයෙක් ඇය හා සමග කෙළේ. හෝ එසින් ගබ්
ගත්. ඇය දූරිය ඇති සේ දැක පරිව්‍රාජකයෝ ඇය නෙරා
පීහු. හෝ අනික් තැනෙක යනනී අතරමග සභායෙක
වැදුවා. එසින් ඕහට සභිය නම් කළා. සභිය තමා විය
පත් කල්හි පරිව්‍රාජිකාපැවිජෙජහි පැවිජිව නොඑක් වාද
උගෙණ මා හා වාදකරා සී සියලුදඹදිව්තෙලෙහි ඇවිදිනේ
තමා හා සුදුසු වාදයක් නොදැක නුවරදොර ආශ්‍රමපථයක්
කරවා ගෙණ රජකුමරු ආදින් ශික්මවමින් එහි වෙසෙයි.
එකල්හි බුදුහු දම්සක් පවත්වා අනුක්‍රමයෙන් රජගහනුවර
අවුද් වේථවනඋයන්හි වැඩවෙසෙති. හේ බුදුන් උපන් බැව්
නොදනනී. ඒකල්හි පෙර ඔහු හා ගල් නැගී මහණුවම්

කාළ දෑ සුදවස්වැසි මහබඹ සමවතින් නැඟී මම මේ සූව කාගේ ආනුභාවයෙන් ලදිම් හොයි බලනුයේ කාස්සපසම්මා සම්බුදුන්වහන්සේගේ සස්නෙහි මහණුවම් කළ පරිදිද් ඒ සබඳුනුද් සදහන් කොට එක් කෙණෙක් පිරිනිවි පරිදි දැක තුබූවෝ කොහි වෙසෙති හොයි අවජනේ දෙව්ලොවින් සැව දඹදිව් උපන් බැව් දැන ඔවුන් කෙරෙන් සභිය බුදුන් උපන් බැව් නොදන්නෙන් උහු බුදුන් කරා යන පරිදෙක් කළ මැනවැ යී විසි පැනයක් සිතාගෙණ රැ අවුදු අහස සිට "සභිය" යී කැඳවී. හේ නිදමින් හොත්තේ තුන්යළක් එ හඬ අසා නික්ම දිලියෙන මහබඹහු දැක ඇඳිලි බැඳ සිටියේය. එසද බඹ සභිය මම තට විසිපැනයක් අලමි, උගණෑ යී කියා විසිපැනය කී; පරිව්‍රාජක මහබඹහු කෙරෙහි විසිපැනය පිළිවෙළින් එක් වටින්ම උගත. එම මහබඹ කුමරකස්සපමහතෙරණට පසළොස්පැනය කිවා සෙසින්ම විසිපැනය උහුට කියා දැරුවිරිමහාතෙරුන්ට කිවා සෙසින් බුදුන් උපන් පරිදි නොකියා මෙහි අඬ සොයන පරිව්‍රාජකතෙමේම බුදුන් හැඳිනගන්නි මෙයින් පිටත් මහණ බමුණන් සිස් බැව් දන්නී යන සිතින් සභිය යම් මහණෙක් හෝ බමුණෙක් හෝ තා මේ පැන පුළුවුත් කල විසජුයේ වී නම් නෝ උහු කෙරෙහි බ්‍රම්සරවස් සරා යී කියා බඹලෝ ගියේ. එකල්හි සභියපරිව්‍රාජක දඹදිව ප්‍රසිඬ වූ බොහෝ දෙනා විසින් සම්මත වූ පන්සිය පන්සිය ශිෂ්‍යයන් පරිවාර ඇති පූරණකාශ්‍යපය, මක්ඛලිගොසාලය, අජිතකෙසකම්බලය, පකුධකච්චායනය, සඤ්ජයබෙලලට්ඨපුත්‍රය, නිගණ්ඨනාථපුත්‍රය, යන සවනේ ගෙවා දත් මහබුදුන්හ යී පිළින කරණ නුවටජරන් සදෙනා කරා ගොස් පැන පුළුවුස්සී. ඔහු එ පැන නොවිසජියහී ක්‍රොධ කොට දැහැව ඔහුම පුළුවුසිත්. හේ ඔවුන් සිස් සේ දැක යම් තෙනෙක සාරයක් නොදැක ගිහිම්නිස්ව පස්කම්ගුණ අනුභව කළ මැනවැ යී සිති. ඉක්බිති මහණගොයුම් සාධුජනයන් විසින් සම්මතය, ඔහු කරා ගොස් පැන පුළුවුස්මි යී සිති. [එයින්] ඉක්බිති මෙ වැනි මහලුසම් දරා වැස සිටි නුවටජරන් නොවිසජූ පැන ළදරුමහණගොයුම් කුමක් විසජා යී සිති. ඉක්බිති විතක් විසී නොව වැළිඳු පිරික්සනුයේ මහණුන් දරුවත්හ යී අවඥ නොකළ මැනව ඔහුදු මහත් ඉඩි ඇති මහත් ආනුභාව ඇති වෙති; මහණගොයුම්හු කරා ගොස්ම මේ පැන පුළුවුත මැනවැ යී අනුක්‍රමයෙන් සැරිසරමින් රජගහනුවර ගොස්

වේලුවනවෙහෙර බුදුන් කරා එළඹ සාමීචි කොට එකත්
පස්ව හිඳ බුදුන්ගේ රූපසම්පතාත් ගැහෙනා සව්ඥභාව
යෙහි බුහුමන් කොට සංහුන් සිත් ඇතිව පැන පුළුවුස්නට
අවසර ගත්. එසඳ බුදුහු සභිය තෝ පැන විසජනුවන්
සොයා සත් සියයක් යොදුන් තැන් ඇවිද දුර සිට ආයෙහි
තා කැමති දැයෙක් පුළුවුස මම් ඒ කියම් යී සව්ඥපැවරු
ණෙන් පැවරූහු. එකල්හි පරිව්‍රාජක විසම්තව සෙසු මහණ
බමුණන් කෙරෙන් මෙපමණ අවකාශයකුදු නොලද්ම් යී
සතුටුව විසි පැනය පිළිවෙළින් පිළිවිත. බුදුහු නිරවසෙස්
නෙන් විසජූහු. [පරිව්‍රාජකයා පැන පුළුවුත පරිදිද් බුදුහු
පැන විසජූ පරිදිද් සූතානිපාතයෙහි සභියසූතින් දන්නේය]
එකල්හි සභියපරිව්‍රාජක කැපෙනා සැනෙකින් මහනෙල්ද
ඹුකලඹයක් කපනනාත්හු සෙයින් බුදුන්ගේ විසිතුරු පැන
විසජුම් අසා සතුටුව තන්හි තන්හි සාධුකාර දී සමහරයෙහි
හුනස්නෙන් නැඟී උතුරුසළුව එකස් කොට බුදුනට ඇඳිලි
බැඳ "යාමෙකංඛාපුරෙ ආසි තමෙම ව්‍යාකාසි චක්‍ඛුමා-අඩා
මුනිනි සම්බුඬො නත්‍ථි නිවරණං තව" යනාදි විසින් අටගය
කින් බුදුනට සතුතිකොට වහන්සේ මා මුඳුනෙහි පලදනට
තොප පාපියුම් වදූරව යී දෙපත්ල ඉල්වා හිස තබා ගෙණ.
පසඟ පිහිටුවා වැඳ තුණුරුවන් සරණ ගොස් පැවිජ් අය
ජිය. එසඳ බුදුහු සභිය තිත්‍ථිකයෝ මේ සස්නෙහි පැවිජි
වනා කල සාරමසක් පිරිවෙස් වෙසෙති සාරමස් අවසන්හි
ආරාධිතසඟහු පැවිජි කෙරෙති යී වදාළෝ. ඉදින් වහන්සේ
තිත්‍ථිකයෝ මේ සස්නෙහි පැවිජ්වියටි කල සාරමසක් පිරි
වෙස් වෙසෙත්ද සාරමස් අවසන්හි සඟහු ඔවුන් පැවිජි කෙ
රෙත්ද වහන්සේ මම් සතරඅවුරුද්දක් පිරිවෙස් වෙසෙම්
සතරඅවුරුදු අවසන්හි මා පැවිජි කරන්නේය යී කීය. එක
ල්හි බුදුහු ඔවුන් පැවිජ් කරවූහු. ඔහු රාත්වූහු. මෙසෙයින්
බුදුහු නමන් "පුරිසදම්මසාරථි" වනා බැවින් සභිය පරිව්‍රා
ජකයනුද් ආදිශබ්දයෙන් ගත් සකුලදායී ඈ පරිව්‍රාජකයනුද්
දමා අමාමහනිවන් පැමිනවූහු.

[මෙතෙකින් නොවියත්හුදිජනයන් සඳහා කරණලද අමෘත
ප්‍රවාහයෙහි]පරිව්‍රාජක දමනා නම් අටවෙනි පරිච්ඡෙදය නිමි.

---

# 9 වෙනි පරිච්ඡෙදය.

---

සවචක නම් නුවටදරුවා දැමූ පරිදි කියේය යත්; එක්සමි
යෙක්හි බුදුහු විශාලාමහනුවර නිසා මහවනා නම් වෙහෙර
කූටාගාරශාලා නම් ගඳකිළියෙහි වැඩවෙසෙති. එයට

පෙරට එක් නුවටකු හා නුවටක හා දෙදෙන පන්සිය පන්සිය වාද උගෙණ වාදාරොපණය කෙරෙමින් දඹදිව ඇවිදිනාහු විශාලාමහනුවර ලා ලිච්ඡවිරජහු ඔවුන් දැක තෙප් කවරහුය යී පුළුවුත්හු. එකල්හි නුවටු මම් වාදාරොපනායට දඹදිව් ඇව්දිම් යී කීය. නුවටත් එසේම කිව. එසඳ ලිච්ඡවිනි මෙහි ඔබුනොවුන්ට වාදාරොපණය කරා යී කීහු. නුවටු තමා උගත් පන්සියයක් වාද පුළුවුත්හු. නුවටු පුළුවුතනා නුවටත් කිව. එකක්හටදු ජය නොදවිය පරාජය නොදවිය දෙදෙන සම සම වූහු. ලිච්ඡවිහි තෙපි දෙදෙන සම සමව ඇවිද කුම් කරා මෙහිම වසව යී ගෙයක් දී වැටුප් තබා දුන්හු. දෙදෙනාගේ සංවාසයෙන් දූහු සතරදෙනෙක් උපන්හු. සච්චකනම් එක් පුතෙක් උපන. ඔවුන් සතරදෙනා කෙරෙහි එකක් සච්චා නම, එකක් ලලා නම, එකක් පටාචාරා නම, එකක් ආචාවට නම, ඔහු නුවන ඇතතාහු මවු පියන් කෙරෙන් පන්සිය පන්සිය වාද උගත්හු. ඔවුන් විය පත් කල්හි මවු පියෝ අපගේ කුලයෙහි දූරියෝ නම් රන් රිදී ඈ දායාද දී කලත්‍රයට යවූ විරි නැති; යම් ගිහිමිනිසෙක් ඔවුන්ගේ වාද මඩනට නිසිවි නම් ඕහට පාදපරිචාරිකා වෙති; යම් පැවිජ්ජෙකෙණෙක් [ඔවුන්ගේ වාද] මඩනට නිසි වූහු නම් ඔවුන් කෙරේ පැවිජ් වෙති යී තොපි කුමක් කටැටියාහු වේදැ යී කීහු. ඇපිඳු එසේ කරම්හ යී සතරදෙනම පැවිජි වෙස් ගෙණ මේ දඹදිව් නම් දඹරුකින් පැණෙයි අප මුළුදඹදිවට වාද කරණ බැව් හඟවම්හ යී දඹඅතතක් හිසටකොට ගෙණ සැරිසරමින් ගියෝ. යම් ගමකට පත්හුද එ ගම්දොර පස්රැසක හෝ වැලිරැසක හෝ දඹඅතත ධජයක් කොට සිටුවාලා යමෙක් [අප හා] වාදයට නිසිවේද ගේ [මෙම දඹ අතත] මිඩිවා යී කියා ගම් වදිත්. මෙසේ ගමින් ගමට යනනාහු සැවැත්නුවර පැමින එසෙයින්ම නුවරදොර දඹඅතත හිඳුවාලා එහි සිටි මිනිස්නට [අප හා සමග වාද කටැටියක්හු ඇතතාහුද ගේ මේ මඩිවා යී] කියාලා ඇතුළුනුවර වනාහු. එකල්හි බුදුහු සැවැත්නුවර නිසා දෙව්රම්හි වැඩවෙසෙති. දම්සෙනෙව් සැරියුත්මහතෙරහු ලෙඩසඟනට ගිය දවස් පුළුවුස්මින් නොහමට තන්හි තමන් කළ මනා දෑ බෙහෙවින් සෙසුසඟුන් හා නොවැඩ දවව සිඟනනට වඩනාහු නුවරදොර හිඳවූ දඹඅතත දැක කිමෙක මෙය යී දරුවන් පිළිවිස එපවත් අසා එසේ බැවින් මේ මැඩපියව යී වදාළහ.

මඩනට නොහැක්කම්හ බාම්හ වහන්සේ යී කීහු. නොබව කවරහ අපගේ දදය මඩවා පීහු යී කී කල බුදුසව් සැරියුත්මහතෙරහු මඩවා පීහු වාද කටැව්වුව දෙව්රම්වෙහෙර තෙරුන් කරා යව යී කිය දරුවෙනි යී වදාළහ. ඔහු මහතෙරුන්බස් අසා දදය මැඩ දමා පීහු. මහතෙරහු නුවර වැද සිඟා වලඳා වෙහෙර වැඩියෝ. පරිව්‍රාජිකාවෝද නුවරින් නික්ම අපගේ දදය මැඩියාහු කවරහ යී කීහු. දරුවෝ ඒ වූ පරිදි කීහු. ඔහු ඉතාමැනවැ යී නැවත නුවර වැද එකෙකි දෙන එකෙකි විපිය බැස බුදුසව් සැරියුත්මහතෙරහුනම් කෙණෙක් අප හා වාදකෙරෙත්ල; ඇසියටි කෙණෙක් නික්මෙව යී හඬනැහු. නුවරවැසෝ නික්මුණුහු. ඔවුන් හා සමග පරිව්‍රාජිකාවෝ දෙව්රම් ගියෝ. මහතෙරහු අප වසන තෙනට මාගමුන් එනු නොයෙදේ යී වෙහෙර මැද ගොස් වැඩහුනහු. පරිව්‍රාජිකාවෝ ගොස් මහතෙරුන් කරා එළඹ "තෙපිය අපගේ දදය මැඩ පීහු" යී පුළුවුත්හු. "මම් මඩවා පීම්"යී වදාළහ. එසේ බැවින් අප තොප හා වාදකරම්හ යී කීහු. ඉතා මැනව වාදකරව කා පුළුවුස මැනව හෝ කා විසජුව මැනව හෝ යී වදාළහ. තොප මාගම් බැවින් පළමු පුළුවුස්ව යී වදාළහ. එකල්හි ඔවුන් සතරදෙනා සතරදිශායෙහි සිට මවූපියන් කෙරෙහි උගත් වාද දහස පුළුවුත්හු. මහතෙරහු කඩුයෙකින් නෙලූඹුදලි කඩනුවන් සෙයින් පුළුවුත් පුළුවුත් දෑ අවුල් නැතිකොට ගැට නැතිකොට විසජූහු. විසජ වැළිදු පුළුවුස්ව යී වදාළහ. වහන්සේ අප දන්නා දෑ මෙතෙකැ යී කීහු. මහතෙරහු තොප විසින් පුළුවුස්නාලද දහසක් වාද මා විසින් විසජනලද, මම් තොප සතරදෙනා එක් පැනයක් පුළුවුස්මි තෙපි ඒ කියාදූ යී වදාළහ. ඔහු මහතෙරුන්ගේ නුවනවෙසෙස් දැන පුළුවුස්ව වහන්සේ අප විසජම්හ යී කියනානට නොපොහොසත්වූහු දතුමෝ නම් කියම්හ යී කීහු. මහතෙරහු මේ කුලදරුවන් පැවිජිකොට පළමු හික්මවන පැනයයි වදාරා ඒ කිමෙකැයි වදාළහ. ඔහු පැනයෙහි ආදි මධ්‍යාවසාන නුදුටුහු. මහතෙරහු කියව යී වදාළහ. නොදතුම්හ වහන්සේ යී කීයෙන් තොප විසින් දහසක් වාද පුළුවුස්නාලද. ඒ මාවිසින් විසජනලද. එතෙකුත්හොත් මා විසින් කියනලද එක් පැනය කුද් තොප විසින් විසජනානට නොහැකි වූව. මෙසේ බැවින් කාහට ජය කාහට පරාජය යී වදාළහ. වහන්සේ තොපට ජය අපට පරාජය යී කීහු. දැන් කුමක් කරව යී වදාළහ.

මවු පියන් කී දෑ සැලකොට තොප කෙරෙහි පැවිජි වම්හ
යි කිහු. තොප මාගම්වුව, තොප පැවිජිකරණු අපට
නොවරී, අපගේ හසුන් ගෙණ මෙහෙණ වරට ගොස් මානම්
සඟුන් කෙරේ පැවිජිවයි වදාළහ. ඔහු ඉතා මැනව වහ
න්සේ යි මහතෙරුන්ගේ හසුන් ගෙණ මානම්සඟුන් කරා
ගොස් පැවිජි වූහු. පැවිජිවූවාහු නොපමාව දවස් යවා මද
දවසකින්ම රහත්වූහු. සච්චක වනානි නමා බුහුනනියන් සතර
දෙනාහට වඩා නුවන ඇත්තේය මවු පියන් කෙරෙහි දහ
සක් වාද උගෙණ එයට බොහෝ වාද සමයානතරයෙන්
උගෙණ කිසිතැනෙක නොගොස් රජකුමරුන් හික්මවමින්
විසී. ගේ නුවනින් ඉතා පිරි නුවන වන බැවින් මාගේ කුස
පැලීයේ යි බියපත්ව යපටකින් බඩ වැලදගෙණ ඇවිදී.
ගේ එක් කථාමාගී ඇත්තේය. "මා හා සම පණ්ඩිතකෙණෙක්
ඇත්ද යෙයි" යම් යම් නැකතෙකින් යමක් යමක් වෙයි කිද
ගේ බොහෝ සේ එසේම වෙයි. එයින් සාධුය භද්‍රය යි බො
හෝදෙනා විසින් සම්මතය. ගේ විසාලාමහනුවර පිරිසට
මෙසේ බෙණෙයි. "මා විසින් වාදයෙන් වාදාරොපණය
කොට ගෙණ දෙස් දක්වන කල කම්පිත නොවන ප්‍රක
ම්පිත නොවන වෙව්ලා නොයන කයින් ඩහදිය නොහෙන
මහණෙක් හෝ බමුණෙක් හෝ නොහොත් රාත්මි යි
පිළිත කරණුවන් හෝ නොදක්මි. ඉදින් මම් අචෙතනවූ
වැඹටදපවා වාදාරොපණය කෙළෙම්නම් හෙද කම්පිතව ප්‍රක
ම්පිතව වෙව්ලා යෙයි. මිනිසෙක් නම් කිමෙක්ද යෙයි" එක
ල්හි පස්වගමහසඟුන් කෙරෙහි ඇතුළත් අස්සජි මහතෙ
රහු පෙරවරු සිවුරු පෙරවැ පා ගෙණ සිඟන්නට විසාලා
නුවර වත්හු. සච්චක ඒ නුවර රජගෙන් රජගෙට පයින්වැද
ඇවිදිනේ මහතෙරුන් දැක මම් මහණගොයුම්හට වාදා
රොපණයකෙරෙම් යි ඇවිදිමි, ඔහුගේ සමය නොදත්තෙත්
වාදාරොපණය නොකෙරෙම්, පරයන්ගේ සමය දැන වාදා
රොපණය කළ කල මනා වන්නේය මේ මහණගොයුම්
හුගේ සව් අස්සජි නම් මහණ තමා සතරහුගේ සමය
කොවිජකොට දනහි, මම් මුහු පිළිවිස කථා පිහිටිවා
මහණගොයුම්හට වාදාරොපණය කෙරෙම් යි සිතා මහ
තෙරුන් කරා එළඹ "කියග අස්සජිය තොපගේ මහණ
ගොයුම් සව්වන් කිසේ හික්මවයි සව්වන් කෙරෙහි ඔහුගේ
අනුශාසනා බහුලව පවත්නා පරිදි කිසේය" යි පිළිවිත්. මහ
තෙරහු මම් මුහුට දුක්ලකුණු කිම් නම් අස්සජිය තෙපි

ක්‍ෂමක් සඳහා පැවිජ්වූහ යී පූළුවුස්සී, මගඵලසඳහා පැවිජි වූම්හ යී යි කල මේ තොපගේ සස්නෙක් නම් නොවෙයි මහදත්ගෙඩි නම් ඔසුපත්නිර නම් තොපට සුවයෙහි අසා නම් නැති දෙස් දෙයි. එසේබැවින් මුහුව දුක්ලකුණු නො දකිව මැනවැ යී සිතා අනිත්ලකුණු අනත්ලකුණු විසින් දක්වනහාහු ශිතිවෙස්න යී "රූපං භික්ඛවෙ අනිච්චං වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සංඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චා රූපං භික්ඛවෙ අනත්තා වෙදනා අනත්තා සඤ්ඤා අනත්තා සංඛාරා අනත්තා විඤ්ඤාණං අනත්තා. සබ්බෙ සංඛාරා අනිච්චා සබ්බෙ ධම්මා අනත්තා" යී මෙසේ පස් කඳ අනිත් අනත් සේ කියා අප බුදුහු සච්චන් මෙසේ ශික්මවති සච්චන් කෙරෙහි අප බුදුන්ගේ අනුශාසනා බහුලව පවත්නා පරිදි මෙසේය යී වදාළෝ. එකල්හි සච්චක "අස්සජිය ඇපි නොඇසුව මනා දූයෙක් ඇසූම්හ ක්සි දවසක ගියමෝ නම් මේ පච්චිදිට්හයෙන් ඔහු ගලවා පියම්හ" යී කිය. එදවස් පන්සියයක් ලිච්ඡවිහි කිසියම් කාර්‍ය්‍යයක් සඳහා සන්ථාගාරයෙහි රැස්වූහු; එකල්හි සච්චක මම් පූර්වයෙහි සමය නොදන්නාවන බැවින් මහණගොයුම්හට වාදාරෝප ණය නොකෙළෙම්, දූත් උහුගේ සච්චා විසින්ද සමය දන්මි මොහු මා අතවැසි පන්සියයක් ලිච්ඡවිහි රැස් වූවාහු මොවුන් ගෙණ ගොස් මහණගොයුම්හට වාදාරෝපණය කෙරෙම් යී ඔවුන් කරා ගොස් හවත් ලිච්ඡවිහි එත්වා, අද මා හා මහණගොයුම්හු හා කථාසල්ලාප වෙයි; යම් සේ ඔහුගේ අස්සජි නම් ප්‍රසිඬ මහසච්වා විසින් පිහිටා යි දූගෙක් ඇත්ද ඉදින් මහණගොයුම් එසෙයින් එහි පිහිටියේ වී නම් යම් සේ බල ඇති පුරුෂයෙක් දික්ලොම් ඇති එළුවක්හු ලොම් ගෙණ ඔබට මොබට ලා ආකර්ෂණ පරිකර්ෂණ සම්පරි කර්ෂණ කෙරේද, එසෙයින්ම මම් මහණගොයුම්හු හා වාද යෙන් වාද කොට කථාමාර්ගයෙන් දෙස් දක්වා ඔබට මො බට ලා ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම් සේ සුරාධූර්ත්තයෙක් රහ පරහණ මටුළුකසස දෙව්යට් වූයේ කසට හරණ සඳහා දෙකණ ගෙණ ඇද කිබ්සිතිකොට පිඹ පියාද? උඩුහුරු කොට පිඹ පියාද? පූනා පූනා ගසා පියාද? එසෙයින් ම මම් මහණගොයුම්හු හා වාදයෙන් වාද කොට අවධූර්ණ නිර්ධූනන නිෂ්ඵොටන කෙරෙමි; යම් සේ සැණ පිළී කටැපි මිනිස්සු සණවැහැරම්ට් ගෙණ සණ දෙවුත්කෙළි කෙළිත්ද? රජුගේ ඇත් සණදෙවුත්කෙළි කෙළිනා මිත්

සූත් දැක ගැඹුරු දියට වැද සොඬින් දිය ගෙණ සණදෙවුන්කෙළි කෙළිද? එසෙයින්ම මම මහණගොයුම්හු හා වාදයෙන් වාදකොට සණදෙවුන්කෙළි කෙළිනනවුන් සෙයින් ඔබට මොබට ලං ආකඩ්ඪණ පරිකඩ්ඪණ සම්පරිකඩ්ඪණ කෙරෙමි. භවත් ලිච්ඡවිහි එත්වා යී කීය. එහි ඇතම් ලිච්ඡවි කෙණෙක් මහණගොයුම් මුහුට කුමන වාදාරොපණයක් කෙරෙයි මුහුම මහණගොයුම්හට වාදාරොපණය කරත් මිස යී කීහු. ඇතම් ලිච්ඡවිහි සච්චක බුදුනට යක්ව වාදාරොපණය කෙරෙනි හෝ දෙව්ව වාදාරොපණය කෙරෙනි හෝ බඹව වාදාරොපණය කෙරෙහි හෝ පියවි මිනිසෙක්නම් බුදුනට වාදාරොපණය කරනනට නොහැකකාහ යී කීහු. එකල්හි සච්චක පන්සියයක් ලිච්ඡවිරජුන් පිරිවරා හිරිමුදුනෙනි මහවනවෙහෙරට එළඹ මහණගොයුම් කොහිය හොයි පිරිවෙණින් පිරිවෙණට වැද බලනුයේ මිණිකවද පෙරව් ගදැතූත් සෙයින් රත්පවුල් පෙරවැ පිණිබොජුන් වලඳා මහසක්මන්හි සක්මන් කරණ සඟුන් දැක ඔවුන් කරා එළඹ භවත්ගොයුම් කොහිය හෝ ඔහු දැකකැප්යෙමි යී කීය. එදවස් බුදුනු අලුයම්හි මහකුළුණුසමවත් සමවැද දසදහසක් සක්වළ විනේජනයන් බලනනාහු සච්චකයා ඇතුළුවූයේ මහත් ලිච්ඡවි පිරිස් ගෙණ තමනට වාදාරොපණය කටැව්ව එන සේ දැක පෙරවරු සඟපිරිස් පිරිවරා විසාලාමහනුවර වැද අහරකිස සාහා වෙහෙර අවුද් මහපිරිස්නු හිඳිනට සුව තැනෙක්හි හුන මැනවැ යී ගඳකිළියට නොවැද මහවනයෙහි එක් රුක්මූලෙක්හි දිවාවිහාර කොට වැඩහුනනු. ඒ සඟහු බුදුනට වතාවත් දක්වා ආවානු සච්චකයා පුළුවුත් තැන් සිට දුරුව වැඩහුන් බුදුන් දක්ව නනාහු ගිනිවෙස්න අප බුදුහු මහවනයෙහි එක්තරා රුක්මූලෙක්හි දිවාවිහාර කොට වැඩහුන්හ යී කීහු. එකල්හි සච්චක මහත්ලිච්ඡවිපිරිස් ගෙණ මහවනයට වන. පළමු කී පන්සිය උනු අනවැසඟ ඇතුළුවරවනාහි සච්චක පන්සියයක් ලිච්ඡවිහි ගෙණ බුදුන් හා වාදාරොපණයට ගියේය යනු අසා පණ්ඩිතයන් දෙදෙනාගේ බස්කම් අසම්හ යී නුවර හුනනවුන් මැදව නික්මුණහ. සච්චක මෙසේ අපමණ පිරිස් පිරිවරා බුදුන් කරා එළඹ සාමිචි කොට එකත්පස්ව හුන්නේය. එහි ඇතම් ලිච්ඡවිකෙණෙක් බුදුන් වැඳ එකත්පස්ව හුනනාහ. ඇතම්හු බුදුන් හා සාරාණීයකථා කොට එකත්පස්ව හුනනාහ. ඇතම්හු අත් නගා වැද එකත්පස්ව හුනනාහ. ඇතම්හු

බුදුන් පෙරට තමන්ගේ නම් ගොත් කියා එකත්පස්ව හුන්
නාහ. ඇතම්හු නොබැණ එකත්පස්ව හුන්නාහ. එකල්හි
සච්චකයා බුදුනට මම් භවත්ගොයුම්හු කිසි දෑයෙක් පිළිවිස
බැලියවියෙමි අවකාශ හල හොතිනැ යී කීය, බුදුහු තට
රිසියෙන දෑයෙක් පුළුවුස පැන විසජනු මට නොබරැ තා පුළු
වුස්නා දෑ හැම විසජම් යී පසේබුදු අගසව් මහසව්වන් හා අසා
ධාරණ සර්වඥප්‍රවාරණයෙන් පැවරූහු. ඔහු රිසියුනු දෑයෙක්
පුළුවුස්ව යී නොකියති අසා දනුම්හ යී යෙත්. බුදුහු වූ කලී
"පුච්ඡාවුසො යදා කංඛසි" යී අලවුයක්හු සර්වඥප්‍රවාරණයෙන්
පැවරූමය. "පුච්ඡා මහාරාජ යදා කංඛසි" යී අජාසත්රජහු
පැවරූමය. "පුච්ඡා වාසවමං පඤ්හං යංකිඤ්චි මනසිච්ඡසි
තස්ස තස්සෙව අක්ඛස්ස අහං අන්තං කරොමි තෙ" යී සක්
දෙව්රජහු පැවරූමය. "බාවාරියස්සවා තුම්හං වා සබ්බෙසං
සබ්බසංසයං කතාවකාසං පුච්ඡවේහා යංකිඤ්චි මනසිච්ඡථ"
යී තව්සත් පැවරූමය. "පුච්ඡමං සභියා පඤ්හං යංකිඤ්චි
මනසිච්ඡසි තස්ස තස්සෙව පඤ්හස්ස අභිඅන්තං කරොමි
තෙ" යී පරිව්‍රාජකයත් පැවරූමය. "තෙනහි ත්වං භික්ඛු
සකෙ ආසනෙ නිසීදිත්වා පුච්ඡ යදා කංඛසි" යනාදි විසින්
පවරණු ආශ්චර්‍ය්‍ය නොවෙයි, තමන් බොධිසත්වභූමිය ප්‍රදෙ
සිකඥානයෙහි සිටි කල සරභඞ්ගජාතකයෙහි සක්දෙව්
රජු ඈ රජුන් සඳහා සෘෂීන් විසින් අයජනාලදුව "කතා
වකාසා පුච්ඡන්තු භොන්තො යංකිඤ්චි පඤ්හං මනසාභිපත්ථි
තං—අහංහි තං තං ව්‍යාකරිස්සං ඤත්වාසයං ලොක
මිමං පරඤ්ච" යී සර්වඥප්‍රවාරණයෙන් පැවරූමය. සම්භව
ජාතකයෙහි සියලු දඹදිව තුන් යලක් ඇවිද පැන කියන
කෙණෙකුන් නොදැක සුචිරිත නම් බමුණු විසින් පැන
පුළුවුස්නට අවකාශ කරවූ කල්හි සත්හැවිරිදි වයසැ වැලි
වෙයැ පස්කෙළි කෙළිමින් සිට පළක් බැඳ අතුරුවේ බැස
හිඳ "තග්ඝතෙ අචමක්ඛිස්සං යථාපි කුසලො යථා—රාජාච
බොනං ජානාති යදිකාහති වා නවා" යී සර්වඥප්‍රවාරණයෙන්
පැවරූමැයි. මෙසේ බුදුහු සර්වඥප්‍රවාරණයෙන් පැවරූ කල්හි
සච්චක පැන පුළුවුස්නේ" භවත්ගොයුම් සව්වන් කිසේ
හික්මවයි ඔවුන් කෙරෙහි භවත්ගොයුම්හුගේ අනුශාසනා
බහුලව පවත්නා පරිදි කිසේය" යී පිළිවිත්. එකල බුදුහු
භවත්නි මේ දුටුද සව්වා කියේ අනෙකෙක සතරගු කියන්
නේ අනෙකෙක මම් පළමුම කිම් යම් සේ සව්වා පිහිටා කී
දෑයෙක් ඇත්ද ඉදින් මහණගොයුම් එසෙයින්ම එහි පිහිටියේ

ඒ නම් වාදාරොපණය කෙරෙම් මේ වනාහි අනෙකෙක්ම
කියයි එයට කුම් කටහැකිද යී නුවටහු කියන්නට අවකාශ
නොවේවයි පළමු අස්සජි මහතෙරුන් කී නියායෙන් වද
රණ බුදුහු ඔහුගේ ගොත්‍රනාම ගෙණ ගිනිවෙස්න, "රූපං
භික්ඛවෙ අනිච්චං—පෙ—සබ්බෙ ධම්මා අනත්තා" යී
මෙසේ සච්චක් ශිෂ්‍යවම් සච්චන් කෙරෙහි මාගේ අනු
ශාසනා බහුලව පවත්නා පරිදි මෙසේය යී වදාළෝ. භවත්
ගොතුම්ගොතුව මට එක් උපමායෙක් වටහ යී කිය. කියා
ගිනිවෙස්න යී වදාළෝ. යම් සේ ගොතුම්ගොතුව යම් කෙ
ණෙක් කළ බිජු කෙතෙක් නැගී වැඩි විපුල වන්නාහු
පොළොව් නිසා පොළොව් පිහිටා වැඩි විපුල වෙත්ද? බාහු
බලයෙන් කටයුතු ගොවිකම් වෙණදහම් ඈ කර්මාන්තකෙ
ණෙක් පොළොව් නිසා පොළොව් පිහිටා සිට කරණුලැ
බෙත්ද? එසෙයින් රූපය ආත්මකොට ඇති රූප ආත්මය යී
ගත් පුගුල් සංඥයෙහි පිහිටා සිට පින් පව් ප්‍රසවය කෙරෙයි,
වෙදනා ආත්මකොට ඇති වෙදනා ආත්මය යී ගත් පුගුල්
වෙදනායෙහි පිහිටා සිට පින් පව් ප්‍රසවය කෙරෙයි. සංඥ
ආත්මකොට ඇති සංඥ ආත්මය යී ගත් පුගුල් සංඥයෙහි
පිහිටා සිට පින් පව් ප්‍රසවය කෙරෙයි. සංස්කාරයන් ආත්
මකොට ඇති සංස්කාරයන් ආත්මය යී ගත් පුගුල් සංස්කාර
යන් කෙරෙහි පිහිටා සිට පින් පව් ප්‍රසවය කෙරෙයි.
විඥාන ආත්මකොට ඇති විඥාන ආත්මය යී ගත් පුගුල් විඥා
නයෙහි පිහිටා සිට පින් පව් ප්‍රසවය කෙරෙයි. මෙසේ මේ
පස්කඳ සත්නට පොළොව් සෙයින් සිටියේය; සත්හු මේ
පස්කඳ පිහිටා සිට කුසල් අකුසල් සිඩකෙරෙත්. තෙපි
මෙසේ විද්‍යමාන ආත්මයන්ට නිෂෙධ කරනනාහු පස්කඳ
අනාත්මය යී ඉතා සකාරණ කොට උපමා ඈර දැක්වී. [මේ
නුවටහු උපමා අල නියා බැලූ කල සච්නේ දනහා බුදුන්
මිස අනෙක් කෙණෙක් උහුගේ වාද බිඳ සොම්නස් දන
වනහාට පොහොසත්හු නම් නැති. පුගුලෝ දෙවැදෑරුම් ඇති
වෙත්. "බුදුන් විසින් විනායවන පුගුල්, සච්චන් විසින් විනා
යවනා පුගුල් හ" යී. එහි සච්චන් විසින් විනයවන පුගුලන්
සච්චෝද විනයකෙරෙති· බුදුන් විසින් විනයවන පුගුලන්
සච්චෝ විනයකරනහාට නොනිසසහ. බුදුහුම විනයකර
නහාට නිසිවෙත්. මේ නුවටහු බුදුන් විසින්ම විනය වෙයි
එයින් උහුගේ වාද බිඳ දෙස් දෙනහාට අනෙකෙක් නම්
නැති. එයින්] බුදුහු තුමූම උහුගේ වාදයෙහි දෙස් දක්වනු

සඳහා. "කියග ගිනිවෙස්න තෝ රූප මාගේ ආත්මය යෙහි. වෙදනා මාගේ ආත්මය යෙහි. සංඥ මාගේ ආත්මය යෙහි. සඞ්ඛාර මාගේ ආත්මය යෙහි. විඥන මාගේ ආත්මය යෙහි සී වදාළෝ. එකල මහණගොයුම් ඉතාම මාගේ වාද පිහිට්වයි ඉදින් මතෙනහි කිසි දෑසෙක් වී නම් මා හුදක ලාහුම නිගනනි, එබැවින් මේ වාද හැමදෙනා කෙරෙහි බහා ලුව මැනවැ යී සිතා භවත්ගොයුම්ගොතුව මම් රූපය මාගේ ආත්මය යෙමි, එසෙයින්ම වෙදනා සංඥ සංස්කාර විඥන මාගේ ආත්මය යෙමි මේ මහජනයෝද තමතමන්ගේ ආත්මය යී යෙත් යී කීය බුදුහු ගිනිවෙස්න මොහු මා හා වාදයට ආවාහු නොවෙති තොමය සියලු විශාලානුවර වැසසන් ඔසවාගෙණ ආයෙහි එබැවින්ම තාගේ වාද කියා! කුමට මහජනා කෙරේ බහා ලව? යී වදාළෝ. හේ ප්‍රඥකරණුයේ මෙම රූපාදින් මාගේ ආත්මය යී යෙම්යී කීය. මෙසේ බුදුහු ඔහුගේ වාද පිහිට්වා යම්හෙතුවකින් තෝ පස්කඳ ආත්මය විසිව වැටෙයි පිළිනකොරෙහිද හේ ආත්ම පරිදි විසිව නොවැටෙන පරිදි තාම පුළුවුස්මි යී; කියග ගිනිවෙස්න කැතකුලෙහි උපන් අභිසිකතයෝ රජහට ඔහුගේ රට ඉසුරු පවතනී මරවනහට නිසසත් මරවනහමද් ධනහානියට නිසසන් දිළිඳුකරවනහාවද් රටින් නෙරණට නිසසත් රටින් නෙරවනහාවද් කොසොල්රජහු අජාසත්රජනු සෙයින් මේ වැරදි රටවැසිරජනටද් මලරටවැසි රජනවද් ඔවුනොවුන්ගේ රට ඉසුරු පවතනී කැතකුලෙහි අභිසිකත රජහට වූ කල ඔහුගේ රට ඉසුරු පවතනියනොයි කී. මෙසේ නුවට තමාගේ වාද බුදුනට කල කාරණය තමාම මරණු සඳහා කල ආයුබයක් නිපුණුකරනාක්හු සෙයින් වෙසෙස් කොට දැක්වී [මෙහි අභිප්‍රාය කවර යත්; රජු විසින් මරණ මිනිසුන්ගේ නසන මිනිසුන්ගේ නෙරවන මිනිසුන්ගේ රූපාදිහු ඔවුන් විසිය නොවැටුනහ යී සේයි.] බුදුහු ගිනිවෙස්න රූප මාගේය යී තෝ යමක් කීහිද මාගේ රූප මෙසේ වේවා යී මෙසේ නොවේවා යී යන තාගේ ඉසුරු ඒ රූපයෙහි පවතනි හොයි වදාළෝ [මෙහි අභිප්‍රාය කවර යත්? මාගේ රූපය යාපත් වේවා යී සඳ, තුබූ රන්තොරණක් වැනි වේවා යී විසිතුරු මිණියක් සෙයින් සිත් ගණීවා යී මාගේ රූප විවර්ණ නොවේවා යී දුසටගත් නොවේවා යී නරනොවේවා යී කලතලා නොවේවා යී සිතුයෙන් එසේ වත්නේ ගනාවෙයි සේයි.] බුදුහු මෙසේ වදාළ කල නුවට තමා පැරදි බැව් දැන මහණ

ගොයුම් මාගේ වාද බිඳිනට කරුණු අලඟ මම් මාගේ
නොදැන්මෙන් එම වෙසෙස්කොට දක්විම් දත් නටම් ඉදින්
පවත්නි සී කිම් නම් මෙ රද්දරුවෝ නැඟී ගිහිවෙස්න තෝ
රුපයෙහි මාගේ ඉසුරු පවත්නි යෙහි; ඉදින් තාගේ ඉසුරු
රුපයෙහි පවත්නේ වී නම් යම් සේ මෙ ලිච්ඡවිරද්දරුවෝ
තව්තිසා වැසි දෙවියන් සෙයින් වොරජනි අභිරූපයහ ප්‍රසා
දිකයහ තෝ එසේ කුමට නොවී රජහි යෙහි, ඉදින් නො
පවත්නි කිම් නම් මහණගොයුම් නැඟී ගිහිවෙස්න තෝ පළමු
මාගේ ඉසුරු රුපයෙහි පවත්නිහි කියා දත් තෝ නොප
වත්නි සී යෙහි සී මා නිගත්නි; මෙසේ පවත්නි කිව එක් දෙ
සෙක නොපවත්නී කිව එක් දෙසෙක සී නොබිණී. දෙවනව
ටද බුදුහු පුළුවුත්හ. එයිත් ගේ නොබිණී; මෙසේ බුදුහු තුන්
යලක් පුළුවුත් කල නොබණනාහු හිස් සත්කඩක්ව පැලෙසි.
බුදුහු සතුත්ම සඳහා සිවුරුසැකි කප් සුවහස් පැරුම් පිරු
වාහු සතුත් කෙරෙ බලවත් කුළුණු ඇත්තාහුය එයිත්
තුන්වන වට නොපිළිවිස කියහ ගිහිවෙස්න තා නොබ
ණනට කල් නොවෙයි යවෙක් තථාගතයා තුන් යළක්
පුළුවුත් දෑ නොකියන්නේ වී නම් මෙතැනම හිස් සත්කඩක්ව
පැලෙසි වදෘළෙෝ. එකල්හි සක්දෙව්රජ මහත්කැකුළු බඳ
හිහිණී දළ ඇති අගාල මුව ඇති පළල් නළල් ඇති බුන්
බැම ඇති ගොර බිරම් බැලුම් ඇති උඩු බලා දිලියෙන
කෙහෙ ඇති රත්දෙලෙන් අවුල් සිරුරු ඇති හත් විසිතුරු
පට ඇති ගව් සහිත රෙස් සහිත භයානක යක්වෙසක්
මවාගෙණ ප්‍රගත් ගිනිකඳක් බඳු හාත් පසින් දිලියෙන
විදුරවියක් ගෙණ ඉදින් මේ තුවට බුදුහු තුන්යළක් පුළු
වුස්තුද් නොකියත්නෙහි වී නම් මෙතැන මුහු හිස සත්
කඩක් කොට පලා පියම් සී උහු හිස් මත්තට ව අහස සිටි
යේය. මේ කුමට ආයේය යත්? ඔහුගේ දිට්හ විහිදුවත්නට
ආයේය. කිසේය යත්? බුදුන් බුදුව අටවන සතිය අජපල්
නුගමුල වැඩහිද මා දම් දෙසුවත් ගන්නාවුන් නැති කහට
දම් දෙසම්ද සී නිරුත්සාහවූ කල්හි සක්දෙව්රජ මහබඹහු
හා අවුද් වහන්සේ තෙප් දම් දෙසා තොපගේ ආශුයෙහි
නොපවත්නාවුන් ඇපි පවත්වම්හ; තොපගේ දම්සක අපගේ
අනසක සී පිළිත කෙළේ. එයිත් අද සච්චකයා උතුසඑ
කොට පැන විසජුම් කරවම් සී ආයේය. ඔහු බුදුනුද්
දකිති සච්චකද් දකිති. ඉදින් ඔහු අනෙකෙක් දිටිහි නම්
මහණගොයුම් සච්චකයා තමාගේ වාදයට නොබස් සේ

දූක යක්‍ෂයක්හු ගෙන්වා දැක්විය. එකල සච්චක හයින්
ත්‍ය යෙත්. එයින් ඔහු බුදුහුද් දකිනි සච්චකද් දකියි. සච්ච
කයා හට ඔහු දකුත්ම උත්‍රාස ඇතිවිය උවෙග ඇතිවිය
රොමහර්ෂ ඇතිවිය සියල් සිරුර ඛහදිය වැගිනා ඇතුළුකුස
පෙරළිනා මහහඬින් හැඬී. ගේ සෙයෙසා් දකිනි හොයි
බලනුයේ කිසිවක්හුගේ රොමහර්ෂමාත්‍රයකුද් නොදුක මේ
හය මටම උපන්නේය ඉදින් මම් යක්‍ෂයකැ යී කීම් නම්
කිම තටම ඇස් ඇති යක්හු තොම දක්ගි ඇතහොත් ඇපිදු
නොදක්මෝද පළමු යක්‍ෂයක්හු නොදුක මහණගොයුම්හු
විසින් වාදවෘත්තියෙහි බහාලන ලදුයෙහි යක්‍ෂයක්හු දිටගි
කියනු වෙනි සිතා දූන් මට මෙහි අනෙක් පිළිසරණෙක් ඇත්
තේ නොවෙයි මහණගොයුම්හු මිසයයි හගනේ බුදුත්ම තම
හට සරණකොට භවත්ගොයුම් මා පුළුවුස්වා යී කිය. එසඳ
බුදුහු ගිනිවෙස්න රූප මාගේ ආත්මයයි තෝ යමක් කීගිද මා
ගේ රූපය මෙසේ වේවයි මෙසේ නොවේවයි යන තාගේ
ඉසුරු රූපයෙහි පවතනි හොයි වදළෝ. නොපවතනි ගො
යුම්ගොතුව යී කිය. ගිනිවෙස්න සිහිඑලවා කියා තා පළමු කී
දූ හා පසුව කී දූ නොගැළපෙයි පසුව කී දූ හා පළමු කී දූ
නොගැළපෙයි, වෙදනා මාගේ ආත්ම වෙයි තෝ යමක්
කීනිද මාගේ වෙදනා කුසල්හෙයින්ම වේවයි සුවහෙයින්ම
වේවයි අකුසල් හෙයින් නොවේවයි දුක් හෙයින් නොවේවයි
යන තාගේ ඉසුරු ඒ වෙදනායෙහි පවතනි හොයි වදළහ.
නොපවතනි ගොයුම්ගොතුව යී කිය. එසේහෙයින්ම සංඥ
සඞ්ඛාරයනුද් පිළිවෙළින් පිළිවිස ඔවුනුද් අනිත්‍ය පරිදි කී.
එකල්හි ගිනිවෙස්න මාගේ විඥාන මෙසේ වේවයි මෙසේ
නොවේවයි යන තාගේ ඉසුරු ඒ විඥානයෙහි පවතනි හොයි
වදළහ. නොපවතනි ගොයුම්ගොතුව යී කිය. ගිනිවෙස්න
සිහි එලවා කියා තා පළමු කී දූ හා පසුව කී දූ නොගැළ
පෙයි වදරා කියග ගිනිවෙස්න රූපය නිත්‍ය හොයි වදළහ.
අනිත්‍යය ගොයුම්ගොතුව යී කිය. යමෙක් අනිත්‍යද හේ
දුක්වෙයි හෝ සුවවෙයි හෝ වදළහ. දුක ගොයුම්ගො
තුව යී කිය. යමෙක් උපද නස්නා බැවින් අනිත්‍යවීද උදු
විය දුකින් පෙළෙන බැවින් දුක් විද ගේ මා ගත්තේය මම්
හෙයගේ මාගේ ආත්මයයි මෙසේ තෘෂ්ණා මාන දෘෂ්ටි
විසින් දක්නේ යෙදේදූයි වදළහ. නොයෙදෙයි ගොයුම්ගො
තුව යී කිය. මෙසෙයින් බුදුහු යම්සේ නිවුගෙහියෙක් සප්
හුගේ සුහුඹුයෙන් නැගි විෂ එමසප්හු ලවා බහවා හැරපියාද

එසෙයින්ම එම පිරිස් සච්චකයා එම මුවෙන් පස්කද අනිය දුක අනතැ යී කියවූහු. බුදුහු යම් සේ ගිනිවෙස්න හර කැමැති හර සොයන හර පිරියෙස්මින් ඇවිදිනා පුරුෂයෙක් කැපපෙන පොරවක් ගෙණ වනයට වැද මහත් ඉදිලද කෙහෙල්කදක් දැක මුලදී අගදී සිඳපියා අග ගෙණ පත් වටි නඟ නඟා බලනුයේ බොරුද් පවා නොදක හරම කොහිද කීද? එසෙයින්ම මා විසින් තාගේ වාද විචාර බලත් බලත් සිස්වීනි යී වදාළෝ. ගේ පළමු පූරණාදි සත්‍ථවටජරන් කරා එළඹ පැන පුළුවූසයී, ඔනු විසජනනට නොහැකි වෙති, ගේ ඔබුන්ම පිරිස් මැද මහා විසරු බැණ තමා දිනූ පරිදි දක්වා නැඟී යෙයි. සම්මාසම්බුදුහුදු එසේම වෙහෙසම් යන සිතින් අවුද්, යම් සේ ගිඹුල් එරබදු ඈ නිසරු රුක් පළමු විදි විරී එක්තරා සියොතෙක් කිහිරිරුකද විඳැ හැකකැ යී සිතා එහි පැහැර එක් පහරින් තුඩ බිඳී ඇස් නික්ම හිස් පැලුනු කල කඳින් බිම හී වෙදනාවත්ව "අමේහාකො නාමයං. රුක්ඛො—සීනපතෙතා සකණ්ඩකො—යත්‍ථ එකප්පහාරෙණ—උත්තමංගං විසාටිකං" යී වළපීද? එසෙයින්ම සච්චකද සවන්ඤුණහර පැහැර තමා නූවනතුඩු බුන් කල සවන් නැණහර තද බැව් දත්. එකල්හි බුදුහු උහුගේ මුඛර බව ප්‍රකාශකොට නිගනනාහු ගිනිවෙස්න තා විසින් වාදයෙන් වාදකොට දෙස් ගෙණ වන් කල කම්පිත නොවන ප්‍රකම්පිත නොවන වෙව්ලා නොයන කයින් සෙවද නොහෙන මහණෙක් හෝ බමුණෙක් හෝ නොනොත් රාත්මී යී බුදුම් යී පිළිනකරණුවක්හු හෝ නොදක්මි. ඉදින් මම් අචෙතනවූ ටැඹටද වාදාරොපණය කෙළෙම් නම් හෙද කම්පිතව ප්‍රකම්පිතව වෙව්ලා යෙයි. මිනිසක්හුනම් කිමෙක්ද? යී තා විසාලානුවර පිරිස බණිනා ලද්දේය. දැන් තා නළලින් ගුළු ඇතම් ඩහදියබිඳු පොද උතුරුසළුව විනිවිද ගොස් බිම හෙයි; මා සිරුරෙනි වූ කලී සෙවද දැන් ඇත්තේ නොවේ යී බුදුහු ඒ පිරිස රන්වන් සිරුරු දක්වූහු. හැම සිරුරු දක්වූවානු නොවෙති, බුදුහු ගැටවවූ ගත්වා සුපිළිසන් සිරුරු ඇතිව පිරිස දම් දෙසති; දෙසනනාහු ගළයෙන් සිව්රු සතරඟුලක් පමණ තැනට බැහු විගස රුවත් කෙළින් නික්මුණු රන් දහරු සෙයින් රත්වලාගැබින් නික්මුණු විජුලිය කලඹ සෙයින් රන්වත් රස් නික්ම රන් මිණිගයක් බඳු ගළය පැදකුණු කෙරෙමින් අහස දවගත්හු. බුදුහු මෙසේ කුමට කළහ යත්? මහජනාහට සැක හරණ සඳහා කළෝ. එහි මහජනයෝ

ඔනාණි, මහණගොයුම් තමහට සෙව්ද නැතෙත් සේයි; සච්ච කයාහට වූ කලී යසෂාරුඪයක් සෙයින් ඩහදිය ගෙයි, මහණ ගොයුම් ගන දෙපට සිව්රු පෙරවැ හුන්නේය ඇතුළත සෙව්ද ඇති බැව් නැති බැව් කව්රු දතහි යන සැක උපදදී, මහ ජනයාගේ සැක පසිඳුනා සඳහා මෙසේ කළෝ. මෙසේ වදළු කල සච්චක නොබැණ කර බහා ගෙණ ප්‍රතිභාන නැතිව බිම් කැණ කැණ හුන්නේය. එකල්හි නම්න් දුම්මුඛ නම් යහපත් මහත් ලිච්ඡවි කුමරෙක් සච්චකයා හුනානු දැක බුදුනට වහන්සේ මට එක් උපමායෙක් වටහ යී කීය. කියා දුම්මුඛය යී වදළහ. වහන්සේ "යම් ගමකට හෝ නියංගමකට හෝ නුදුරු තන්හි පොකුණෙක් විද? එහි කකුළුවෙක් විද? වහන්සේ එහි බොහෝ දරුවෝ හෝ දැරියෝ හෝ ඒ ගමින් හෝ නියංගමින් හෝ නික්ම ඒ පොකුණට ගොස් බැස ඒ කකුළුවා දියෙන් නගා ගොඩ හෙළූහුද? කකුළු යම් යම් අතක් නැඟීද? උහු නැගු නැගු දළ ඒ දරුවෝ හෝ දැරියෝ හෝ දඬුකඩෙකින් හෝ කබල්කඩෙකින් හෝ සිඳ පිහුද? මෙසෙ නැගු නැගු දළ සුන් කල ඒ කකුළු ගමන් පසුත් බැවින් පෙර සේ ඒ පොකුණට බස්නට නොහැකක. එහිම කවුඩු කොක් ආදීන්ට බත්වෙයි" එසෙයින්ම වහන්සේ සච්චකයාගේ යම් කවර දිට්හයෙක් ඇත්ද? ගේ හැමම වහන්සේ විසින් සිඳ බිඳ පියා ලනලද. වහන්සේ සච්චක වටලා හවත්හු කරා එළඹෙනහට නොනිසස වාද සඳහා දීකි. දුම්මුඛයා මේ උපමා කී කල සෙසු ලිච්ඡවිකුමාරයෝ සිතූහු, මේ තුවට විසින් අප සිල්ප උගනනා තැන බොහෝ කල් අවමන් කරණලද, දැන් මේ අප සතුරා පිටූ දක්නට නිසි කල, ඇපිද් එකෙකි උපමා ඇර අත්පිඩු ගසා ගලින් හුනූ වක්හු මොහොලින් බහතුවන් සෙයින් වටලා පිරිස් මැද හිස් නොනැගිය හෙද? එවැනි දෙයක් උහුට කරම්හ යී උපමා සිතාගෙණ දුම්මුඛයා කථා අවසන් බලා හූනාහු. සච්චක ඔවුන්ගේ අභිප්‍රා දැන මොහු හැමදෙනාම කර ඔසවා තොල පොපියුම් ඇතිව හුනාහු, ඉදින් වෙන වෙන උපමා අලනූ නම් වටලා පිරිස් මැද හිස නගනනට නොහැකි වෙමි. එසේ බැවින් මම් දුම්මුඛයා වලකා යම් සේ අනෙකක්හට අවකාශ නොවේද එසේ කථා පසිඳ මහණගොයුම්හු පැන පුළුවුස්මි යී සිතාගෙණ දුම්මුඛය දැන් සිට, තෝ මුඛරියෙහි අපි තා හා සසඳිලි නොකරම්හ හවත්ගොයුම්හු හා සසඳිලිකරම්හ යී, ගොයුම්ගොතුව සොඃසන්ගේ කථාඃ

නිබියේළු! ගේ ප්‍රලාපමාත්‍රයෙකැ යි බැණ බුදුන් පැනපුළුවුස්නේ, භවත්හුගේ ශ්‍රාවකයෙක් කිපමණෙකින් සසුන්කරුණු නම් වෙයි කීය. ගිනිවෙස්න මේ සස්නෙහි මාගේ ශ්‍රාවකයෙක් "යංකිඤ්චිරූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා දූරෙ වා සන්තිකෙ වා සබ්බරූපං නෙතං මම නෙසොහමස්මි න මෙ සො අත්තා" යන මේ එකොළොස් වැදෑරුම් වූ හැම රූප මා නොගනෙත්ය මම් රූපයෙන් නොවෙම් මාගේ ඉසුරු රූපයෙහි පවත්නේ නොවේ යී යථාභූතය මනාකොට නුවනින් දකීද? එසෙයින්ම යාකාචි වෙදනා යාකාචි සඤ්ඤා යෙකෙචි සංඛාරා යංකිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං ---පෙ--- නමෙ සො අත්තා" යන එකොළොස්වැදෑරුම් වූ හැම විඤ්ඤාණ මා නොගනෙත්ය මම් විඤ්ඤාණයෙන් නොවෙම් මාගේ ඉසුරු විඤ්ඤාණයෙහි පවත්නේ නොවේ යී යථා ස්වභාවය මනාකොට නුවනින් බලාද? මෙපමණෙකින් ගිනිවෙස්න මාගේ ශ්‍රාවකයෝ සසුන්කරණු නම් වේ යී ශෛක්ෂභූමි දැක්වූහ. ඉක්බිති ඒ ශෛක්ෂභූමි පුළුවුස්නේ ගොයුම්ගොත්‍රව මහණ කිපමණෙකින් රහත් නම්වෙයි කිය. ගිනිවෙස්න මේ සස්නෙහි මහණෙක් "යංකිඤ්චිරූපං අතීතානාගත පච්චුප්පන්නං ---පෙ--- න මෙ සො අත්තා" යන එකොළොස් වැදෑරුම්වූ හැම රූප මා නොගත්තේය මම් රූපයෙන් නොවෙම් මාගේ ඉසුරු රූපයෙහි පවත්නේනොවේ යී මෙසේ යථාභූතය මනාකොට නුවනින් දැක අනුපාදා විමොක්ෂයෙන් විමොක්ෂ වීද, එසෙයින්ම "යාකාචි වෙදනා යාකාචි සඤ්ඤා යෙකෙචි සංඛාරා යංකිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං ---පෙ--- න මෙ සො අත්තා" යන එකොළොස් වැදෑරුම් වූ හැම විඤ්ඤාණ මා නොගනෙත්ය මම් විඤ්ඤාණයෙන් නොවෙම් මාගේ ඉසුරු විඤ්ඤාණයෙහි පවත්නේ නොවේ යී මෙසේ යථාභූතාර්ථය මනාකොට නුවනින් දැක අනුපාදා විමොක්ෂයෙන් විමුක්ත වීද, මහණ මෙපමණෙකින් රහත්නම් වෙයි. මෙසේ ලොව්ලොව්තුරා නුවනිනුදු ලොව්ලොව්තුරා පිළිවෙතිනුදු ලොව්ලොව්තුරා විමුක්තිනුදු සමුපෙත වූ විමුක්ති සිත් ඇති මහණ තථාගතයාහට සත්කාර ගරුකාර නමස්කාර කෙරේ. බුදුහු තුමූ සිවුසස් දැන අනුන්දත්වනු සඳහා දම් දෙසති, තුමූ ඉන්ද්‍රිය දමනයෙන් දැමී අනුන් දමනුසඳහා දම් දෙසති. තුමූ කෙලෙසුන්ගේ ශෝභා සංහිඳුවා අනුන්ගේ කෙලෙශශෝභා

සංහිඳුවනු සඳහා දම් දෙසති. තුමූ සසරසයුරු තැරැ අනුන් සසරසයුරෙන් නගනු සඳහා දම් දෙසති. තුමූ කෙලෙස් පිරිනිවනින් පිරිනිවී අනුන්ගේ කෙලෙස්ගිනි නිවනු සඳහා දම් දෙසති. මෙසේ තථාගතයාටම සත්කාර ගරුකාර නමස්කාර කෙරෙයි වදාළෝ. එකල්හි සච්චක ගොයුම්ගොතුව ඇපි භවත්හු හා වාදයෙන් වාදකොට ගටම්හ යී සිතුමෝ නටුවම්හ; ත්‍රිමදගලිත ඇතක්හු පැහැර වැද ගත් පුරුෂයක්හට සෙත් වත්නේ නොවෙයි, දිලියෙන ගිනිකඳක් සිපගත් පුරුෂයක්හට සෙත් වන්නේ නොවෙයි, ඝෝරවිෂ ඇති ආශිර්විෂයෙක් හා පැහැර සිපගත් පුරුෂයක්හට සෙත් වන්නේ නොවෙයි, භවත්ගොයුම්හු කෙරේ ගැහැටු පුරුෂයක්හට සෙත් වන්නේ නොවෙයි කී. බුදුහු ඇත් ආදීන් සෙයින් කිසිවක්හු දිවියට අනතුරුවක් කරනාහු නොවෙති, තුවට මේ තුන්උපමාවන් බුදුනට උත්කර්ෂ සඳහා අලේ නොවෙයි තමහටම උත්කර්ෂ සඳහා අල. යම් සේ රජෙක් සතුරක්හු මරා මෙසේ සූරවූ මෙවැනි බල ඇති පුරුෂයනට යී සතුර හුවන්නේ තමාම හුවාද එසෙයින් මේ තුන් උපමායෙන් බුදුන් හුවන්නේ ඇපිම සූරයම්හ ඇපිම පණ්ඩිතයම්හ ඇපිම බහුශ්‍රැතයම්හ මෙසෙයින් ත්‍රිමදගලිත ඇතක්හු බඳු දිලියෙන ගිනිකඳක් බඳු යී පැන අල, ආශිර්විෂයක්හු බඳු සම්මාසම්බුදුන් කරා වාදසඳහා එළඹෙනාම්හ යී මෙසේ තමහටම උත්කර්ෂ කොට බුදුන් නිමන්ත්‍රණයකරණුයේ ගොයුම්ගොතුව තොපට සත්කාර කරණ මට යම් පුණ්‍යයෙක් ප්‍රීතියෙක් උපදිද ඒ සඳහා සඟුන් හා සමග සෙට මාගෙන් වළඳනුනට වැඩිය මැනවැ යී කීය. බුදුහු ඕහට අනුග්‍රහ පිණිස නොබැණ සිතින් ඉවසූහු. සච්චක බුදුන් ඉවසූ බැව් දැන නොස් ලිච්ඡවිරද්දරුවන්ට මම් සෙට භවත්ගොයුම්හු හා සඟුන් නිමන්ත්‍රණය කෙළෙම් තොප දවස් පතා මට පත්සියයක් බත්සැලි දෙන බැවින් සෙට මහණගොයුම්හට නිස්වන පරිද්දෙන් දෙව යී කී. අනෙක් දවස් ඒ රද්දරුවෝ උහුට පත්සියයක් බත්සැලි දී ගවුහු. සච්චක තමාගේ අරම්හි පිණි කන බොන දෑ පිළියෙළකරවා කල් දැන්විය. බුදුහු මහසඟුන් පිරිවරා උහුගේ අරමට එළඹ පැනවූ අස්නෙහි වැඩහුන්නහු. සච්චක බුදු පාමොක් මහසඟුන් පිණ්ඩිභොජනෙන් සියඅතින් සතපා එකත්පස්ව හිඳ භවත්ගොයුම්ගොතුව මේ දානයෙහි යම් ඵලයෙක් ඇත්ද ඒ දායකයනට සුවයට වැටෙයි හොයි කීය. ගිනිවෙස්න තෘ

පිද්‍ද අවීතරාගයනට දූත් දත්හි ඵල තව දුත් දෘයකයනට වෙයි, මා සේ වූ වීතරාගයනට දුත් දත්හි ඵල තට වෙයි වදෘරා ශූනයනෙත් නැගී වැඩියෝ, අනෙක් දවස් බුදුහු විසාලා නුවර වැඩියටිව පෙරවරු මූරුතමල්කලඹක් බඳු දෙපට සිවුර හැඳ විජුලියක් බඳු කහබහන් බැඳ නුගඵල බඳු පවුල් සකස් කොට පෙරවැ ගදකිළියෙන් නික්ම සඟපිරිස් පිරිවරා අග්දූරියෙහි වැඩසිටියෝ. එකල්හි සච්චක පළමු මම් අප ණ්ඩිතවන බැවින් සියලු විසාලානුවර වැසසන් ගෙණ මහණ ගොයුම්හු කරා ගොස් පිරිස් මැද පරිභූතවිමි. දැන් එසේ නො කොට එකලාව ගොස් වාදෘරොපණය කෙරෙමි, ඉදින් මහ ණගොයුම්හු කෙරේ පරදවන්නට නිසිවිම්නම් මාගේ ලද්හු වාද කියා එම්. ඉදින් මහණගොයුම්හට ජයවීනම් අඳුරුගෙනි නැවුම් සෙයින් දනනාහු නැති සී සනිටුහන්කොට “නිනෑ පැන” නම් පැනයක් ගෙණ මහවනවෙහෙර ගියේය. අනද මහතෙරහු උහු දුරින් එන්නානු දැක බුදුහු මොහොතක් වැඩහුන් කල බුදුන් දක්නා ලැබෙයි බණ අසනු ලැබෙයි ගේ ඕහට බොහෝ කල් හිතයට සුවයට වැටෙයි යන සිතින් වහන්සේ එන්නේ සච්චකය මොහොතක් වැඩහුන මැනාවැ සී අයජ අසුන් පැනවූහු. බුදුනු වැඩහුන්නු. සච්චක බුදුන් කරා එළඹ සාමීචි කොට එකත් පස්ව හුන. “සන්ති හොනොතම එකෙ සමණ බ්‍රාහ්මණා කාය භාවනා යුත්තා විහරන්ති” යනාදි ක්‍රමයෙන් පැන පිළිවිත. “ඉධ අග්ගි වෙස්සන අස්සුතවා පුථුජ්ජනස්ස උප්පජ්ජති සුඛා වෙද නා” යනාදි ක්‍රමයෙන් පැන විසජුහු. [උහු පැන පුළුවුත් පරිදිද් බුදුහු නිරවසෙස්නෙත් පැන විසජූ පරිදිද් මැදුම් සඟිය මහාසච්චකසුතින් දන්නේය.] මෙසේ බුදුන් විසින් මේ නුවටදරුවනට දෙවරෙක දෙසුනක් දෙසනලද, ගේ අධිගම නොදකෙලෙ පැවිජි නොදවිය සරණ නොදපිහිටිය. ඕහට බුදුහු කුමට දම් දෙසූහ යත්? අනාගතයෙහි උහුට වන වැඩ දැක වාසනා සඳහා දෙසූහු. උහු බුදුහු පිරිනිවනින් මතු යෙහි දෙසිය සතළිස්හවුරුද්දක් ඉකුත් කල්හි ලක්දිව සසුන් පිහිටි කල්හි දෙව්ලොවින් සැව මෙරට දැ කිණිගිරිවෙහෙ රට නුදුරු තන්හි එක්ඇමතිකුලයෙක උපද පැවිජිව තෙව ළාඛරව විදසුන් වඩා පිළිසිඹියාපත් රහත්ව කලුබුඩරක්ඛිත මහතෙර නම් වූහු. ඔවුන් සෑගිරිය කලුතිඹිරුක්මුල්හි කාළකාරාම සූත දෙසූ දවස් රජ විසින් සියක්යොදුන් ලක් දිව රජයෙන් පුදනලද පරිදි ප්‍රදිපිකායෙහි කී පරිදෙදන්

දතායුතු. මෙසේ බුදුනු තමත් "පුරිසදම්ම සාරථි" වන බැවින් සච්චකමාණවක නම් නුවටදරුවාද ආදිශබ්දයෙන් ගත් සුභ මාණවකාදීනුදු දමා අමාමහනිවන් පැමිණවූහු.

[මෙතෙකින් නොමියත් හුදීජනයන් සඳහා කරණලද අමෘතප්‍රවාහයෙහි] මාණවක දමනා නම් නවවෙනි පරිච්ඡේදය නිමි.

# 10 වෙනි පරිච්ඡේදය.

පාඨිකපුත්‍රාදී නුවටුන් දමූ පරිදි කිසේය යත්; විසාලානුවර සුනක්ඛත්ත නම් ලිච්ඡවි රාජපුත්‍රයෙක් බුදුසස්නෙහි පැවිජ්ව බුදුනට මෙහෙ කරණුයේ එක් දවසක් බුදුන් කරා එළඹ දිව්‍යැස් ලබනනාටය සී පිළිවෙත් ඇරවිය. ඕහට බුදුහු පිළිවෙත් වදාළහ. ඹේ වදාළ නියායෙන් පිළිපැද දිව්‍යැස් උපයා දෙවියන්ගේ උයන් විමන් කප්රුක් දැක සව්බරණින් සැදි රූ දැක මොවුන් හඬ ම්යුරු වූව මැනව ඒ කිසේ අස්මි හොයි සිතා බුදුන් කරා එළඹ දිව්සෝද උපදනාට නිසි පිළිවෙත් ඇරවිය. ඹේ අතීතයෙහි සිල්වත් පැවිජී කෙණෙකුන් කන්සක පැහැර බිහිරිකොට පීය, එයින් උහුට දිවසෝද නොඋපදී; බුදුහු ඒ නූපදනා සේ දැක එයට පිළිවෙත් නොවදාළහ. ඹේ එපමණෙකින් බුදුන් කෙරේ වෛර බැඳ [මෙසේ] සිති. "එකානතයෙන් මහණ ගොයුම්හට මෙබඳු සිතක් උපන් සේය. මයිත් රද්දරුයෙමි, ඉදින් මොහුගේ නුවන වැඩියේ වීනම් මේ සව්ඥවෙයි යන සිතින් ඊර්ෂ්‍යයෙන් මට [දිවසෝද උපදනා සේ] නොකියයි" සිතා එක්දවසක් බුදුන් කරා එළඹ වහන්සේ පියා යෙමි නිසා නොවෙසෙමි සී කිය. එකල්හි බුදුහු නෝ මා නිසා වසා සී මා තට කී දෑයෙක් ඇත්දෑ? සී වදාළහ. නැති වහන්සේ සී කිය. මම් වහන්සේ නිසා වෙසෙමි සී තා මට කී දෑයෙක් ඇත්දෑ? සී වදාළහ. එයිද් නැතැ සී කිය. මෙසේ තා මට කී දෑ නැති මා තට කී දෑ නැති මට කුමට කියා? සී වදාළෝ. වහන්සේ මට උතුරුම්නිස් දහැමින් පෙළහර නොදක්වන දෑය සී කිය. නෝ මා නිසා වසා මම් තට පෙළහර දක්වමි සී මා තට කී දෑයෙක් ඇත්දෑ? සී වදාළහ. නැති වහන්සේ සී කිය.

මම් වහන්සේ නිසා වෙසෙමි මට පෙළහර දක්වන්නේය යි තා මට කී දෑයෙක් ඇත්දෑ? යි වදාළහ. එසිද් නැති සේ කීය. මා තට ප්‍රාතිහාර්‍ය්‍ය කෙළෙත් කිම? නොකෙළෙත් කිම? එයින් තට කවර ප්‍රයොජනය? ඒ කළද් නොකළද් මාගේ සස්නට වන පිරිහිති නැති; මම් දෙව් මිනිසුන් අමාමහනි වත් පමුනුවනු සඳහා පැරුම් පිරුයෙම්, ප්‍රාතිහාර්‍ය්‍ය කරණු සඳහා පැරුම් පිරුයෙම් නොවෙමි; මා තට කී දෑ නැත තා මට කී දෑ නැත කුමට කියහි? වදාළහ. වහන්සේ මෙනම් දෑයෙක් ලොකයෙහි අග්‍රයයි අගපමණක් මට නොවදාරණ දෑය යී කීය. තෝ මා නිසා වසව මම් තට [මෙනම් දෑයෙක් ලොකයෙහි අග්‍රයයි] අග පමණෙක් කියම් යි මම් තට කී දෑයෙක් ඇත්දෑ? යි වදාළහ. නැති වහන්සේ යි කිය. මම් වහන්සේ නිසා වෙසෙමි මට අගපමණෙක් කියන්නේය යි තා මට කී දෑයෙක් ඇත්දෑ? යී වදාළහ. එසිද් නැති යි කීය. සුනක්ඛත්තය ලොකයෙහි මෙනම් දෑයෙක් අග්‍රය යි කියෙත් කිම? එයින් නිවන් සැහෙන්නේ නොවෙයි වදාළහ. සුනක්ඛත්ත බුදුන්ගේ ගුණ මකම් යි මෙනෙක් විප්‍රලාප බැණ බුදුන්ගේ ගුණකථා අස අසා පිහිට නොලදින් නොබැණ සිටියේ. [එසඳ බුදුහු] සුනක්ඛත්තය විසාලානුවරවැසෙසෝ පෙර තුණුරුවන්හි ගුණ කියන කල මුව නොපොහොයි, දැන් එම මියෙන් අගුණු කියත්. බ්‍රම්සරවස් රක්නට නොපොහොසත් වූයේ තමා බාලවන බැවින් තුණුරුවන්හි අගුණු කියා ගියවෙයි. බුදුහු වූ කලී සවිතේ දනිත් දහම් නියර්‍ය්‍යානිකය සඟහු සුපිළිපන්නාහු යි තුණුරුවනට සෙත්‍රානු කරණ මිනිස්සු තාගේ දෙස් දක්වති යි වදාළෝ. මෙසේ කුමට වදාළහ යත්? ඒ දෙස් උපත් කල සවිතේ දන්නා බුදුහු මේ දෙස් දැක පළමු මට නොවදාළහ යි නොකියවනු සඳහා වදාළෝ. එක් සමයෙක්හි බුදුහු බුමුජනව් නම් ජනවියෙක්හි උතුරු නම් නියංගමක් නිසා වැඩවසනුවෝ පෙරවරු සුනක්ඛත්ත ලිච්ඡවීයා හා සමග ගමට වැඩියෝ, එකල්හි කොරක්ඛත්තිය නම් නුවටෙක් බලුතව් නම් තව කෙරෙයි; දෙදන හා දෙවැලමිට බිම ඔබා ඇවිදදී, බල්ලකු සේ බිම කන බොන දෑ ගිඹ බලා මියෙන්ම කයි බොයි අත් නොපහරයි ලුප්දෙර හළු පීරා පියා වතැටි ගෙණ හොවී. සුනක්ඛත්ත උහු දැක මේ රහත්මහණෙක මොහු හා සම අනෙක් මහණෙක් ඇත්තේ නොවෙයි මේ අපිස්බැවින් පිළි නොහඳී ප්‍රචණ්ඩයෙන් භික්ෂාභාජන නොගෙණ ඇවිදදී බිම

ඔතනාම කයි මේය මහණනම් ඇපි කුමනා මහණම්හ සී සව්
නේ දන්නා බුදුන් පස්පස්ව යනුයේ මේ පවිටු සිත් සිති.
එසඳ බුදුහු මේ සුනක්ඛත්ත පාපාධ්‍යස ඇත්තේය මුහු දූන්
කුම් සිනිය හොයි බලනනාහු උහුගේ අදහස් දැන මේ මොඝ
පුරුෂයා මා වැනි සව්නේ දන්නා බුදුරජක් පස්පස්ව එත්
නේ නුවටහු රත්යයි සිතයි, මේ බාලයා දත්ම නිගතමැ
නවැ සී සිතා තෝ මෙසේ ජ්නාධ්‍යස ඇතෙනාහි මම් මහණ
ශාක්‍යපුත්‍රයෙම් සී කුමට පිළිනකෙරෙහි සී වදාළහ. වහන්සේ
මාගේ කවර වරදෙක්දැ වදාරණුදැය සී කිය. මේ බලුතව
කරණ නුවටනු රත්ය සී ගත්නි තෝ සී වදාළහ. කිම වහ
න්සේ රත්බැව මසුරුදැය හොයි කිය. මොඝ පුරුෂය මම් දෙව්
මිනිසුන් රත්වනු කැමැත්තෙම් ඒ සඳහාය මා පැරුම් පිරු
යෙම් රත්බව මට මිස අනාහට නොදවේවා යන සිත් නැත්
තෙම් නොරතත් රත්හ යන පවිටු දිට්හය තට උපන්නේය
ඒ පියෝ බොහෝ කල් තට අහිතයට වැටෙයි තා රත්ය සී
ගත් කොරක්ඛත්තිය නම් නුවට සත්දවසකින් අලස්‍යයක්ඇ
තිව මිය කාලකඤ්ජකනම් අසුරකායෙහි උපදැදී; එහි ප්‍රෙතයන්
තුන්ගවු පමණ අත්බැව් වෙයි, ලේ මස් නැතිවන බැවින්
පරණලා වැන්නහ, කකුළුවන්ගේ ඇස් සෙයින් ඇස් නික්ම
මුදුනෙයි සිටි, මුවය හිදිකටුසිදක් වැනිව මුදුනෙහිම සිටි,
එයින් ගොදුරු ගන්නා කල නැඹුරුව මිස නොගත හෙත්,
මළ කල බීරණත්ථම්භක නම් සොහොනට ඇද පියති තෝ
කැමතිවීනි නම් [මළ කලැ] උහු කරා ගොස් පිළිවිස දැන සී
වදාළෝ. සුනක්ඛත්ත ලිච්ඡවීහි බුදුන් ඒ ගම වලඳා වෙහෙර
වැඩි කල්හි කොරක්ඛත්තිය නුවටහු කරා ගොස් මහණගො
යුම් තා අත් සත්දවසකින් අලස්‍යයක් ඇතිව මිය කාල
කඤ්ජක නම් අසුරකායෙහි උපදැදී, මළාහු බීරණත්ථම්භක නම්
සොහොනට ඇදපියති සී කීය; තෝ මදකොට කා මදකොට
බෝ මහණගොයුම්හු මුසවායෙන් නිගන්වම්හ සී කීය. ඒ
අසා නුවට බලලකු සේ ලුප්දෑර හොතෙත් හිස ඔසවා
ගෙණ ඇස ඔරවැ බලනුයේ කුම් කියනි මහණගොයුම් අප
සතුරහු උපත් තැන් පටත්ගෙණ ඇපි හිරු නැගි කල කදෝ
පැණියන් වැනි වූම්හ උහු එසේ කිව මනාමය සතුරන්ගේ
බස්නම් සැබෑ වත්නේ නොවෙයි තෝ යා මම් කළ මනා දෑ
දන්මි සී කියා එහිම බැස හොත. එකල්හි සුනක්ඛත්තයා
බුදුන් නොහදහා එක්දවසකට දෙතුන්වටෙක එක්දා ගියේ
දෙදා ගියේ, ගොස් ගොස් [මදකොට කා මදකොට බෝ සී]

කියයි; නූවට උහුගේ බස් අසා සත් දවසක් නිරාහාර විය.
සත්වන දවස් උහුගේ එක් උවටායෙක් අපගේ මහණු ගෙට
නොඑන්නේ අදින් සත්දෑ වෙයි, ලෙඩක් ඇතියේය සී හූරු
මස් පිසවා බත් ගෙන්වා ගෙණ ගොස් පෙරට බිම බහා
තිබිය. නූවට බත් දැක මහණගොපුම්හුගේ බස් සැබෑ බවත්
මැනව බොරු බවත් මැනවැ සී බත් කා සුවයෙන් මළු තැන්
මැනවැ සී දෙඅත දෙදන බිම ඔබාගෙණ කුස් පුරා කැය; රෑ
දිරවත්නට නොපොහොසත්ව අලස්‍යයෙන් මිය කාලකඤ්ජක
නම් අසූරකායෙහි උපන්. එකල්හි තිසීකයෝ උහු මළ පරිදී
අසා දවස් ගැණ බලා මේ වූ කලී සැබෑ විය, දැන් මූහු අනෙක්
නැනෙකට ඇද පියා මහණගොපුම්හු බොරුවෙන් නිගන්
වම්හ සී ගොස් උහුගේ ශරීරය වැලින් බැඳ ගෙණ අදනාහු
මෙතැන පියම්හ මෙතැන පියම්හ සී යෙති, ගිය ගිය තැන්
එක්හෙළි වෙයි, ඔහු හදනාහු තිරණත්ථම්භක නම් සොහො
නටම ඇර සොහොන බැව් දැන බැහැර හැර පියම්හ සී
ඇදෑහු. එකල්හි වැල් සිඳී ගියේ, පැසුලු සොලවනනට නො
නිසිව එහිම සිට නැවැත්ත: එකල්හි සුනක්ඛත්තයා කො
රක්ඛත්තිය නම් නූවටහු තිරණත්ථම්භක නම් සොහොනට
ඇද පීහ යනු අසා මහණගොයුම්හුගේ බස් සැබව දෙකත්
දුටුම්හ, මළ මිනිස්සු හොත් තැනින් නැගී අනෙකස්හු හා
බණනුනම් ඇත්තේ නොවෙයි, එබැවින් ගොස් පිළිවිස
බලනු මැනවැ සී ඉදින් බිණුයේ වීනම් යෙදෙයි නොබිණුයේ
වීනම් මහණගොයුම්හු මුසවායෙන් නිගන්මැයි සොහොනට
ගොස් උහු පිට අත්ලෙන් පැහැර කොරක්ඛත්තිය කොහි
උපන්හි සී පිළිවිත්; ගේ කාලකඤ්ජක නම් අසූරකායෙහි උප
න්මි සී කියාලා එතන්හිම උඩු බලා හින. මළ මිනිසෙක්
නම් නැගී බණනනට නිසි නොවෙයි, මේ කිසේ කිය යත්?
බුඩානුභාවයෙන් කිය. බුදුහු උහු අසූරයෝනින් හැර මළ
සිරුරෙන් පිළිමූසවා කියවූහු. මෙතැන පෙළහර පසෙක් වී.
කිසේය යත්? සත්දවසින් මියෙයි වදාළහ. එසේම මෙළේ.
මේ පළමුවන පෙළහරය. අලස්‍යයෙකින් මියෙයි වදාළහ.
එසේම මෙළේ. මේ දෙවන පෙළහරය. කාලකඤ්ජක නම් අසූර
යොන්හි උපදී සී වදාළහ. ගේ එහිම උපන. මේ තුන්වන
පෙළහරය. තිරණත්ථම්භක නම් සොහොනට ඇද පියනී සී
වදාළහ. එහිම ඇර දමා පීහ. මේ සතරවන පෙළහරය. උප
න්තැනින් අවුද් සුනක්ඛත්තයා හා බෙණෙයි වදාළහ. ගේ
එසේම විය. මේ පස්වන පෙළහරයි—මෙතෙක් පෙළහර

දුටු සුනක්ඛත්ත බුදුන් කරා ගොස් වැද එකත්පස්ව හුන්
නේය. බුදුහු කියග සුනක්ඛත්තය මා කොරක්ඛත්තිය නම්
නුවටහු අරබයා කී දෑ නිපන්ද නොනිපන්ද යී වදාළහ.
නිපන වහන්සේ යී කිය. මෙසේ බැවින් මා උතුරුමිනිස්දහැ
මින් පෙළහර කරණලදද? නොකරණලදද? යී වදාළහ. කර
ණලද වහන්සේ යී කීය. මා මෙසේ පෙළහර දක්වන්නාහු,
තෝ වහන්සේ මට උතුරුමිනිස් දහැමින් පෙළහර නො
දක්වන දූය යෙහි යී වදාළෙෝ. එක් සමයෙක්හි බුදුහු විසා
ලානුවර නිසා මහවනවෙහෙර වැඩවෙසෙති. එකල්හි විසා
ලානුවර කළාරමණ්ඩුක නම් නුවටෙක් ලාභයෙහි යසස්හි
අග්‍රප්‍රාප්තව සත්ව්‍රත පදයක් සමාදන් කොට වැටෙයි. කවර
සත්ව්‍රතපදය යත්? දිවිපමණින් පිළි නොහඳිමි යනු එකෙක.
මෙවුන් දම් නොසෙවෙමි යනු එකෙක. රහ මස් බත්
නොකමි යනු එකෙක. පැදුම් දෙසෙන් විසාලානුවරට
නුදුරු තන්හි උදෙන නම් දෙවාලය ඉක්මවා නොයෙමි
යනු එකෙක. දකුණු දෙසෙන් ගොතම නම් දෙවාලය
ඉක්මවා නොයෙමි යනු එකෙක. පැළදෙසෙන් සතඹ
නම් දෙවාලය ඉක්මවා නොයෙමි යනු එකෙක. උතුරු
දෙසෙන් බහුපුත්‍රක නම් දෙවාලය ඉක්මවා නොයෙමි යනු
එකෙක. හේ මෙසේ සත්ව්‍රත පද සමාදන් කළ හෙයින්
විසාලානුවර වැසසන් විසින් පුදනලද. එකල්හි සුනක්ඛ
ත්තයා බුදුනට මෙහෙකරණ්නුයේ කළාරමණ්ඩුක නම් නුව
ටහු කරා ගොස් තුත්ලකුණෙන් යුත් පැන පිළිවිත. හේ දුදුළු
තන්හි ගමන් යන අන්ධයක්හු සෙයින් ඒ ඒ තන්හි පැකිල
ආදී අනාත නොදක ඇස් පෙරළා උහු බලා නොහික්මුනාහු
කෙරේ වූසුයෙහි අවසර නැති බැව් දැන දැන පැන පුළු
වුසසී යී කියා මිහි නොසිට නොසිට යී දැහැවිය, එකල්හි
සුනක්ඛත්ත මෙවැනි රාත්මහණහු කෙරේ ගැහැටින මට
අකුසල් නොවේවා යී සිතා උළුලෙලන් හිද වහන්සේ මට
කමන්නේය යී කැමවී. නුවටදු මෙතැන් පටන්ගෙණ පැන
නුපුළුවුසසිහි දෑ යී කිය. ඉතා මැනව නුපුළුවුස්මි යී කිය. එසේ
වුවහොත් යා කමමි යී නගා යවී. සුනක්ඛත්තයා බුදුන්
කරා එළඹ වැද එකත්පස්ව හුන්නේය. කියග මොඝපුරු
ෂය සාක්‍යපුත්‍රයෙමි යී කුමට පිළිත කෙරෙහි යී වදාළහ.
වහන්සේ ඒ කුමට වදාරණ දූය යී කිය. තෝ කළාරමණ්ඩුක
නම් නුවටහු කරා ගොස් පැන පිළිවිය උහු දැහැවා මේ රාත්
මහණහු දැහැවූ සේ නොයෙදෙයි මට අකුසල් නොවේවා යී

සිඟිහි යී වදාළහ. තිම වහන්සේ රාත් බව මසුරු දූය හොයි කීය. මම් නොමසුරුයෙමි, හේ තාගේ පව්ට දීව හය තට බොහෝ කලක් දූකට වැටෙයි ඒ පියා යි වදාරා, තා රාතැයි ගත් කළාරමණ්ඩුක නම් නුවට මද දවසකින්ම පිළි හැද කලතු ගෙණ රහ මස් බත් වලදකොට හැම දෙවාලය ඉක්ම ලාභයෙන් යසසින් පිරිනී මියෙයි වදාළහ. හේ හැම ව්‍රතපද හෙදකොට ලාභයෙන් යසසින් පිරිනී මෙළේ. සූනක්ඛත්ත එ පවත් අසා බුදුන් කරා ගියේ. කියග සූනක්ඛත්තය මම් කළාරමණ්ඩුක නම් නුවටහු අරබයා යමක් කීම්ද හේ නිපන්නේ වේ දැ? යී වදාළහ. නිපන වහන්සේ යී කීය. උහු සත්ව්‍රතපදය ඉක්ම ගිය බැවි සත්පෙළහරයක් වන බැවින් උතුරුම්නිස් දහැමින් පෙළහර කරණලදද? නොකරණලදද? යී වදාළහ. කරණලද වහන්සේ යී කීය. මා මෙසේ පෙළහර කරනනාහට වහන්සේ මට උතුරුමිනිස්දහැමින් පෙළහර නොකරණ ලදය යී කුමට කියහි වදාළෝ. ඉක්බිති පාඨිකපුත්‍රනම් නුවටෙක් විසාලානුවර ලාභයෙහිද් යසස්හිද් අග්‍රප්‍රාප්තව වසනුයේ පිරිස මෙසේ කියයි. මහණගොයුම් නුවනින්ම වාද කෙරෙයි, මම්ද නුවනින්ම වාදකෙරෙමි. හේ යොජනක් තැන වහස කෙරෙමින් සිට මා හා වාදයට දෙගවුවක් තැන් ආයේ වීනම් මම් ද උහු කරා දෙගවුවක් තැන් යෙමි. එක් පියවරකුදු වඩා ගියක්හට ජය වෙයි, නොගියක්හට පරාජය වෙයි, දෙදෙනමෝ එසේ උතුරුමිනිස්දහැමින් පෙළහර කරම්හ, මහණගොයුම් උතුරුමිනිස්දහැමින් එක් පෙළහරෙක් කෙළේ වීනම් මම් දෙපෙළහරෙක් කෙරෙමි, හේ දෙපෙළහරෙක් කෙළේ වීනම් මම් සතරපෙළහරෙක් කෙරෙමි, හේ සතරපෙළහරෙක් කෙළේ වීනම් මම් අටපෙළහරෙක් කෙරෙමි, මහණගොයුම් යම්තාක් පෙළහර කරත්නේ වීනම් මම් එයින් දිගුණුකොට කෙරෙම් යී, බුදුන් හා පෙළහර කරනනාට තමා නොහිසි බැව් දනුනුද් උත්තම පුරුෂයන් හා වාදය හිනයනාට ප්‍රසංසා වෙයි යනු දන මෙසේ කීය. නුවර වැසෝ ඒ අසා තමා නොනිසි වූවහොත් මෙසේ ගජ්ජනානොකෙරෙයි, එකානනයෙන් මෙයිත් රාත්යයි සිතා ඕහට මහත් සත්කාර කළෝ. සූනක්ඛත්තතෙම පාඨිකපුත්‍ර නාම් නුවට මෙසේ කියයි යනු අසා හිනාඩකස ඇතිවන බැවින් ඕහට හීනයා දන්නා රිසි උපන්. හේ බුදුනට වතාවත් කොට බුදුහු ගඳකිළියට වත් කල්හි පාඨිකපුත්‍රයා කරා ගොස් තෙදි

මෙනම් දෙයක් කියාල යී පිළිවිත්. සැබව මා එසේ කීයෙම් යී කිය. ඉදින් එසේ වීනම් තෙපි නොබව රිසි සේ පුන පුනා එසේම කියා, මම් මහණගොයුම්හුගේ උවටායෙක්මි, උහුගේ මාත්‍රා දත්මි, හේ තොප හා පෙළහරකරනහට නොනිසස, මම් මහණගොයුම්හට කියා භය උපදවා උහු අනෙක් තැනෙකට ගෙණ යෙම් තෙපි නොබව යී උහු අස්වසා බැණ බුදුන් කරා ගොස් වහන්සේ පාඨිකපුත්‍ර නම් නුවට වහන්සේ හා උතුරුම්නිස් දහැමින් පෙළහර කෙරෙම් යයි කීය. බුදුහු සුනක්ඛත්තය මම් බුදුම් යන නෙප්ල නොපියා බුදුම් යන දිට්ඨ නොවිනිද හේ මා කරා එනහට නොනිසස, ඉදින් ආයේ වීනම් තුවටුයෙන් වගුළ තල්පතක් සෙයින් ගෙළෙන් හිස හෝ කැඩී පලායෙයි, මුදුන හෝ සත් කඩක්ව පැලී යෙයි වදාළහ. එකල්හි සුනක්ඛත්තයා වහන්සේ තෙලෙ බස් රක්නෙ මැනවැ යී කීය. එසේ තුමට කිහි යී වදාළෙත් පාඨිකපුත්‍රතෙම හේ බුදුම් යන නෙප්ල නොපියා සිත් නොපියා දිට්ඨ නොවිහිද සිය් වෙසින් පැණී හෝ නොපැණී හෝ සිහ වන ඈ වෙසින් හෝ වහන්සේ කරා ආයේ වීනම් භවත්හුගේ බස් බොරු වෙයි මුසවායෙන් නිගත්මහ යී කිය. මුහු විනා අනෙකෙක් මුසවායෙන් බුදුන් නිගත්මුහ යී ඒ පන්සාළිස් හවුරුදු මුළුලෙලෙහි කිව්හු නැති; ඔහු තමන් සසර වසන කල මහරජ සලගල් සුලහිත් ඝන්නේ වීනම් සඳ හිරු දෙදෙන බිමිත් යන්නාහු වුහුනම් හැම ගං හෝ හුඩුහෝ බලා යන්නේ වීනම් අහස් පැලෙන්නේ වීනම් මුහුදු වියලෙන්නේ වීනම් පොළොව නස්නේ වීනම් මෙර ගල් සහමුලින් ඉපිර යන්නේවීනම් මම් බොරු නොදකියම් යනු දක්වමින් වදාළහ:—

සචෙපවාතො ගිරිමාවහෙයුං
චනෙද‍්‍ර ච සූරියො ච ඡමාපතෙයුං
සබ්බා චනජ්ජා පරිසොතවෙයුං
නාත්‍වෙවහංරජ මුසාභණෙයුං

නභං ඵලෙය්‍යං උඩ‍්ඩංවිසූසෙස
සංවට්ටයුං භූති ධරා වසුන්‍ධරා
සිලුච්චයෝ මෙරු සමූල පුබ්බහෙ
නාත්‍වෙවහං රාජමුසාභණෙය්‍යං–යී,

මෙසේ තමන් පැරුම් බිම්හි සිටි කල පවා මුසවා නොකිය නුවෝ දැන් තමන් සව්කෙලෙස් පහා සව්නේ දැන බුදුව

සිටි කල මුසවා කුමට් කියනුවහ. තිම වහන්සේ පාඨිකපු
ත්‍රයා සිත් දැන කියන දෑද නොහොත් දෙවියෙකෙණෙක් කිහු
දෑ යී කීය. මම් උහු සිත් දනිම්මය දෙව්කෙණෙකුද් මට කිහු
මය, ලිච්ඡවිරජුන්ගේ අජිත නම් සෙනාපතියෙක් මට උප
ස්ථාන කොට මිය තව්තිසා දෙව්නුවර උපන, ඒ දෙව්පුත්
මා කරා අවුද් වහන්සේ පාඨිකපුත්‍ර නම් තුවට අලජ්ජිය
මුසවා කියයි; මිනිසසු මා සිරුර හළකිස කොට පාඨිකපුත්‍රයා
කරා ගොස් අජිතසෙනාපති කොහි උපන හොයි පුළුවුත්තු.
ගේ මහනරකයෙහි උපද මා කරා අවුද් මම් නොප කිවා
නොකොට මහණගොයුම්හුගේ වාදයෙන් සිට නිරය උප
න්මි යී වළප්ගේන්ය යී කීය. නුවර වැසසනට එසේම කියයි;
වහන්සේ මම් නිරය නොඋපන්මි, තව්තිසා වැසි දෙවියන්
කෙරෙහි උපන්මි යී; වහන්සේ ඒ තුවට බුදුම් යන තෙප්ල
නොපියා ඒ සිත් නොපියා ඒ දිට්හ නොවිගිද හවත්හු කරා
එන්නට නොනිසස, ඉදින් ආයේ වීනම් උහු මුදුන් සත්ක
ඩක්ව පැලෙයි කීය. මම් දනිම්මය සුනක්ඛත්තය යී විසාලා
නුවර පිඩු සැරැ පස්බත දිවාවිහාර සඳහා පාඨිකපුත්‍රයාගේ
අරමට එළඹෙම් දැන් තට රිසියෙන්නේ වීනම් උහුට කියා
යී වදාළෝ. බුදුහු පෙළහර කරනනට යම්හ යී නොකියා දිවා
විහාරයට යම්හ යනු කුමට වදාළහ යත්; ගේ බුදුන් දන්නේ
නොවෙයි පෙළහර කොහි කෙරෙයි, එයින් එසේ නොකියා
දිවාවිහාරයට යම්හ යී වදාරා විසාලානුවර වැද අහරකිස
සාහා දිවාවිහාර සඳහා බුදුහු පාඨිකපුත්‍රයාගේ අරමට වැඩියෝ.
එකල්හි සුනක්ඛත්ත වෙලෙව්ව ගොස් විසාලානුවරට වැද
ප්‍රධාන ලිච්ඡවීන් කරා බමුණු මහසල්කුලන් කරා ගැහැවි මහ
සල් කුලන් කරා මහණ බමුණන් කරා ගොස් බුදුහු දිවාවිහාර
සඳහා පාඨිකපුත්‍රයාගේ අරමට එළඹියහ, වහා එව දෙමහණු
න්ගේ පෙළහර බලන්නටය යී කීය. එකල්හි ලිච්ඡවිරද්දරු
වෝද බමුණුමහසල් කුලෝද ගැහැවි මහසල්කුලෝද නත්
තොටුවෝද මහණ බමුණෝද පාඨිකපුත්‍රාරාමයට ගියෝ. එද
වස් එහි අනේ සුවහස් මිනිස් පිරිස් වීය; එබඳු මහත් පිරිස්
රැස්කරනුට සුනක්ඛත්තයා හැර අනෙක් කිසි කෙණෙක්
ඇතෙනා් නොවෙති, එයින් බුදුහු ඒ තාක් කල් උහු ගෙණ
ඇවිද්දෙ. එකල්හි පාඨිකපුත්‍ර නම් තුවට එපවත් අසා සිහි
"මම් දෙවි මිනිස්නට අගපුගුල්ව සිටි භවත්ගොයුම්හට විරු
ඩවීම්, මාගේ සතන රුත්බැවෙක් හෝ පෙළහර කරන්නට
තිසි ගුණ දහමෙක් හෝ නැති; මහණගොයුම් වනාහි

පෙළහර කෙරෙයි උහුගේ පෙළහර දැක මහජනයෝ තෝ
පෙළහර කරනුනට නොපොහොසත් වූයෙහි තාගේ පමණ
නොදන ලොතයෙහි අහපුගුල්ව සිටි බුදුන් හා සමග
මලලවපූඬ කරණුවක්හු සෙසුන් කුමට ගජ්ජනාකෙළෙහි සී
දඬු පහණින් මා සිපනි'' සී මහජනා රැස්වන බැව්දූ බුදුන්
වඩනා බැව්දූ අසා බියපත්ව දෙගවූවක් තැන් පලා ගොස්
තිඹිරිකනු පිරවැඳ, අරණට වැද සිතට සුව නොලබන්නේ
සැඟවෙන තැන් සොයා වටා වැද ඇවිද්දේ අරන්පසත එක්
ගහණයක් දැක එයට වැද පහණක් මත්තේ හුන්නේය.
එකල්හි බුදුහු සිතූහු, ඉදින් මේ බාල කිසිවක්හු කියමත්
ගෙණ [මා කරා] ආයේ වීනම් නසී, ඒ බාල නොනාසිවා සී
හුන් පහණ උහුගේ ශරීරයෙහි ඇලේවා සී ඉටූහු. ඉටූ සිත්
හා සමග ඒ පහණ උහු සිරුර ඇලිනා. හේ මහා අනා
නෙක්හි මැසූවාක්හු වැනිවිය පා සූනාක්හු වැනි වීමැයි.
එකල්හි පිරස්වැසෙසෝ පාථිකපුත්‍ර කොයට ගියේ හොයි
සොයති; උහු පස් පස් ගොස් වැද හුන් තැන් දැක අ
එක්තරා පුරුෂයෙක් තොපි කා සොයව සී පිළිවිත්. පාථික
පුත්‍රයා සොයම්හ සී කීය, හේ තිඹිරකනු පිරිවැදෑ අරන්හි
හුන්නේය සී කීය. ඒ අසා පිරිස්වැසෙසෝ එක් පුරුෂයෙක්හු
කැඳවාගෙණ තෝ තිඹිරිකනු පිරිවැඳ අරන් ගොස් පාථි
කපුත්‍ර නම් තුවටහට කියා තමාගේ පෙළහර බලනුනට
ලිච්ඡවිරද්දරුවෝද බමුණු මහසල්කුලෝද ගැහැවි මහ
සල්කුලෝද නන් තොටුවෝද මහණ බමුණෝද තමාගේ
අරම්හි රැස්වූහු, බුදුහුද් දිවාවිහාර කොට හුනාහු, වහා
එන්නේය සී කියා යවූහු. ඒ පුරුෂ ගොස් එපවත් සැලකොට
එන්නේය සී කීය. එකල්හි පාථිකපුත්‍ර එම් එම් කියා එහිම
ගැලෙයි හුනස්නෙන් නොනැංගෙහෙයි; එසඳ පුරුෂ තා
හිඳුම ඇට දක්වා පහණ ඇලුනේද පහණ තා හිඳුමෙහි
ඇලුනේද එම් එම් කියා එහිම ගැලෙන්නෙහි අස්නෙන්
නොනැංග හෙන්නෙහි සී බැණ උහු නොගෙණියයි තෝ
නටියෙහි සී ගොස් එපවත් පිරිස්වැසසනට කීය. එකල්හි
බුදුනු හේ මා දක්නට නොනිසස ආයේ වීනම් උහු මුදුන්
පැලෙයි වදාළෝ. එකල්හි ලිච්ඡවිරජුන්ගේ එක්තරා මහ
ඇමැත්තෙක් හුනස්නෙන් නැඟී පිරිස්නට කුඩාකමක් බලව!
මම් උහු මේ පිරිසට ගෙණ එම් සී කියා උහු කරා ගොස්
හැමදෙනා රැස්වූ සේ කියා මහණගොයුම් අවුද් තාගේ අරම
හිද තමා දක්නට නොන්සි සේ කියයි, තාගේ ගමනින්ම
තා දිනුවේ කරම්හ මහණගොයුම් පැරැදකරම්හ සී බැණ
නොගෙණයාහි පිරිසට ගොස් එපවත් සැලකෙළේ. පාථික
පුත්‍ර නටියේමය සී කීය. එකල්හි බුදුහු හේ මා දක්නට නො
නිසස, ඉදින් ආයේ වීනම් උහු හිස් සත්කඩක්ව පැලෙයි
වදාළහ. ඉදින් ලිච්ඡවිනි පාථිකපුත්‍රයා වරබහනෙකින් බැඳ

ගොණුන් සත්සියයක් විසෙන් හෝ දහසක් විසෙන් හෝ අඳවනනාගු චූහුනම් වර හෝ සිඳෙයි බඳ තැනින් පාසිකපුත්‍රයා හෝ කැඩෙයි වදාළහ. එකල්හි ජලිය නම් දාරුපතතිකයා අතවැසෙසක් සිනි, දුන් පෙළහර නිබියේවා, මහණගොපුම් පාසිකපුත්‍රයා අස්නෙනුදු නොනැගෙයි කිය, එසේබැවින් මම් ගොස් කිසියම් උපායෙකින් උහු අස්නෙන් නගා පියම් මෙපමණෙකින් මහණගොපුම්හට පරාජය වෙයි සිතා හුනස්නෙන් නැගී පිරිස්වැසසනට කුඩාකමක් බලව! මම් ගොස් උහු අළියෙම් නම් මැනව යී පාසිකපුත්‍රයා කරා ගොස් පිරිස් රැස්වූ සේ කියා බුදුනු එම අරම්හි දිවාවිහාර ගතවැ වැඩනුත් සේ කියා ගමනින්ම තට ජයකරම්හ මහණගොයුම්හට පරාජය කරම්හ යී බැණ. එම් යී කියා උහු අස්නෙන් නොනැගෙණ සේ දැක උහු පරිභූත බැව් දැක මෙසේ කීය. "පාසිකපුත්‍රය අතීතයෙහි කෙශරසිංහරාජයක්හට මෙවැනි සිතෙක් උපන. එක්තරා වනලුවකට වැද වහසයකරණ තැනක් තන්කොට ගෙණ එහි වැසගෙණ සවස්වේලේ එයින් නික්ම වැජඹ වැජඹ හාත්පස්හි සතර දිශා බලම්. සතර දිශා බලා තුන්යලක් නාද කෙරෙම්. නාදකොට ගොදුරු සඳහා යෙම්. ගොස් උතුම් උතුම් මුවමූළු මරා මියුරු මියුරු මස් කා එම වහසයෙහි වෙසෙම් යී සිති" එකල්හි සිංහරාජ එක්තරා වනලැහැබක් නිසා වහස කෙළේය. එහි වහසකොට සවස්වේලෙහි එයින් නික්ම වැජඹ හාත්පස්හි සතර දිශා බැලීය. සතර දිශා බලා තුන්යළක් සිංහනාද කෙළේ. නාද කොට ගොදුරු සඳහා යෙම් යී ගොස් උතුම් උතුම් මුවමූළු මරා මියුරු මියුරු මස් කා එම වහසයෙහිම වෙසෙයි. එක් දවසක් සිංහරාජ ගොදුරු ගෙණ නවත්නේ තමා දැක බියෙන් බලන බලුකැනහිලක්නු දැක කුළුණු කොට, යහලුව නොබා සිට! තෝ කිනම්හි? යී කීය. මම් ජම්බුක නම් සවාමිනි යී කීය. සබඳ ජම්බුකය තෝ මෙතැන් පටන්ගෙණ මා සැම් වටනට හැකෙකහි දැ යී කීය. සැම් වටනව නිසෙසම් සවාමිනි යී කීය. හේ එතැන් පටන් ගෙණ උහු සැම්වටී. සිංහ ගොදුරු කා එන්නේ මහත් මහත් මස්කඩ ගෙණ එයි, හේ මස් කා නුදුරු තන්හි පහණ පිටෙක වෙසෙයි, හේ කිහිපදිනකින්ම තරවිය, මහත්කඳට වී. එකල්හි සිංහ ඕහට යහලුව මා වජඹනා කල්හි තෝ නුදුරු තන්හි සිට "ගිම් වොරජ ගිම් වොරජ" යී කියනනට නිසෙසහි දැ යී කීය. හේ උහුට වජඹනා කල්හි එසේ කියයි, එයින් සිංහයාට අහංකාර උපදී. එක් දවසක් ඒ ජරසිගල් ගල්කෙමෙක පැත් බොන්නේ තමන් සේය දිට. තමන්ගේ තරසිරුරදු මහත්කඳටදු දැක මම් ජරසිගලෙක්මි යී නොසිතා තෙමේම තමහට මෙසේ කීය. යහලු ජම්බුකහිම්

තා මේ අත්බැව්න් ඉඳුල්මස් කනු යෙදේද? කිම තෝ නොපිරිමියෙක් වීද? උහුගේත් සතරපය දෙදළය දෙකණය එක් වල්පනෙන, තවද මේ හැම ඇති, හුදෙක් කෙසුරුබර තට නැත්තේය යී උහු මෙසේ සිතනනා හට අහංකාර උපනා. හේ මන්දෙස්න් මම් කවරම් මූවරජ කවර මා නොදනෑය නොදස්වාමිය මම් ඕහට කුමට ගසර දක්වම් මයිත් එක් වනලැගැබක් නිසා වහසයක් කොටගෙණ වෙසෙමි, එහි වහසකොට සවස්වේලේ වහසයෙන් නික්මෙමි, නික්ම වැජඹෙමි වැජඹ හාත්පස්හි සතරදිශාබලමි බලා තුන්සළක් සිංහනාදකෙරෙමි, නාදකොට ගොදුරු සඳහා යෙමි, ගොස් උතුම් උතුම් මුවමුළු මරා මියුරු මියුරු මස් කා එහිම වහසයකෙරෙම් යී සිතාගෙණ ඒ ජරසිගල් එක්තරා වනලැහැබක් නිසා වහසයක් කොටගෙණ විසිය. එහි වැස සවස් වේලෙහි එයින් නික්ම හාත්පස්හි සතරදිශා බලා තුන්යළක් සිංහනාදකෙරෙමි යී කැනහිල් හඩින් හැඩි. උහු සෙයිත්ම තොද නොබුදුව ශිලාදි ගුණයෙන් වැඩිසිටි බුදුනට දෙන සතරපසය වලඳ, සම්මාසම්බුදුන් හා ගැහැටෙයි, කෙසුරු සීරජහු හා සමයෙම් යී සිතු ජරසිගල්හු සෙයිනැයි ජලියනම් දරුපතනිකයා අතවැසි මේ උපමා ඇර දක්වාද පාඨිකපුත්‍රනම් නුවටනු ඒ අස්නෙන් සෙලවෙන්නටත් නොපොහොසත් වූ සේ පිරිසට අවුදු පාඨිකපුත්‍ර පරිහූතවෙයි එම් එම් යී කියා එහිම ගැලෙයි හුන් අස්නෙහුද් නැගෙනනට නොනිසැ යී කිය. එකල්හි බුදුහු පිරිස්වැසසනට ඉදින් ලිච්ඡවිහි පාඨිකපුත්‍රයා වරබානෙකින් බැඳ ඇතුන්ලවා අදවන්නාහු වුහුනම් වරබාන් හෝ සිඳෙයි පාඨිකපුත්‍ර හෝ කැඩෙයි හේ ඒ තෙප්ල නොපියා ඒ සිත් නොපියා ඒ දිට්හ නොවිහිද මා කරා එන්නට නොනිසැ, ඉදින් ආයෙහිනම් උහු හිස් සත්කඩක්ව පැලෙයි වදාළෝ. වදාරා පිරිස්වැසසනට දම් දෙසූහු. ඒ දම් දෙස්නෙන් සුවාසූදහසක් දෙනා අධිගම කළෝ. අධිගම කරවා තෙජෝධාතු සමාපතති සමවැද සත්තලයක් පමණ තැන් අහසට නැගී අනෙක් සත් තලයක් පමණ තැනට රස් විහිද නොඑක් සේ දිලි දුමා මහවනවෙහෙර වැඩ සිටියෝ. සුනක්ඛත්තලිච්ඡවි වූ කලී බුදුන්ගේ මෙබඳු පෙළහර දැක තමා පින් නැතිවන බැවින් දුලද ගෙණ සග මොක් සුව දෙන මෙ සස්නෙන් පහවී. මෙසෙයින් බුදුහු තමත් "පුරිසදම්මසාරථි" වන බැවින් පාඨිකපුත්‍රයාගේ සමාගමයට රැස්වූ නුවටනුද් ආදි ශබ්දයෙන් ගත් නුවට ලදගත් නොඑක් දහස්නුද් දමා අමාමහනිවන් පැමිනවූහු.

[මෙතෙකින් නොවියත් හුදීජනයන් සඳහා කරණලද අමෘත ප්‍රවාහයෙහි] දිගඹර දමනා නම් දසවෙනි පරිච්ඡේදය නිමි.

## ගැට පද.

| | |
|---|---|
| අග්උවටා, | අග්‍ර උපස්ථානකරුවා. |
| අහිතයට වැටෙයි, | අවැඩ පිණිස පවතී. |
| අගපුගුල්ව සිටි, | උත්තම පුරුෂයෙක්ව පැවති. |
| අයිනාදන්, | අනුන් අයිති වස්තු. |
| අනුන් අගුණු, | අන්‍යයන්ගේ දොස්. |
| අරිසව්, | ආර්‍ය්‍යශ්‍රාවක. |
| අස්අරු, | අසුන් නැගෙන්නෝ. |
| අනුත්තරවූ, | [තමහට]ඉතිරියක්හු නැත්තාවූ. |
| අනුව බණම්හ යී, | සමගිව කථාකරම්හ කියා. |
| අස්වසා බැණ, | සනසා කථාකොට. |
| අහරකිස සාහා, | ආහාරකෘත්‍යය සලසා. |
| අපර චෙතනා, | පසුවූ සිතිවිලි. |
| අනිෂ්ට විපාක, | නපුරු පල දීම. |
| අනුමොදනාවසානයෙහි, | පින් දීම කෙළවර වූ විට. |
| අතනිය, | මවූ. |
| අරත් පසත, | අරණ්‍යපාර්ශ්වය සමීපයෙහි. |
| අළියෙම්නම්, | පැමිනාවිම්නම්. |
| අභිරූපදර්ශනීයප්‍රසාදජනකය, | යහපත් දැකීමෙන් සතුටු උපදවයි. |
| අගනම්ණ්ඩලමාලකය, | නිවාසය ඉදිරියෙහි වූ මඩුව. |
| අරත්සැරිසරත්නක්හුසෙයිත්, | වනයෙහි ගමන්ගත් කෙණෙක්මෙන් |
| අපිස් සතොස්ව, | අලෙප්පවජ සන්තුෂ්ටව. |
| අසුත් විජහන තැන්, | අශ්ව යන් විහිදුවන තැන. |
| අට්ලල, | අට්ටාලය; මැසස. |
| අදානත සතුන්, | කෙලෙස් නැගී සිටි සත්වයන්. |
| අනුග්‍රහයෙන්, | කාරුණ්‍යවෙන්. |
| අනතුරු අත්බැව, | [මතු ඉපදීම වූ] අනන්තර ආත්මභාවය. |
| අයජමෙන්, | ආරාධනාවෙන්. |
| අතුරුදන් නොවන තුරු, | අන්තර්ධාන නොවන තෙක් |
| අචෙතන වූ, | සිත් නැත්තාවූ. |
| අනිත් ලකුණු. | අනිත්‍ය ස්වභාව. |

| | |
|---|---|
| අනත් ලකුණු, | අගක් නැති ස්වභාව. |
| අග පමණෙක්, | අග්‍ර ප්‍රමාණයෙක්. |
| ආ, | ආයු. |
| ආදි අනත, | මූල; අග. |
| ආතම විසිව, | ආත්මය කෙරෙහි වසඟව. |
| ඇක්මින, | ගමන් කෙළේය. |
| ඇත්අරු, | ඇතුන් නැගෙන්නෝ. |
| ඇතැතියෙන්, | හස්තිබලසෙනායෙන්. |
| ඉටූහු, | අධිෂ්ඨාන කළෝ. |
| ඉසුරුලීලායෙන්, | අධිපති ස්වභාවෙන් |
| ඉරියව් විසින්, | ස්වභා පැවැත්ම වශයෙන්. |
| උත්සාහ ජනවා, | තැත් උපදවා. |
| උළෙලෙන් හිඳ, | උත්කුටුකයෙන් හිඳ. |
| උළාරවූ, | මහත්වූ. |
| උපසපත්කම්ම, | උපසම්පදා කම්ම. |
| උතුරුමිනිස් දැහැමින්, | උත්තරිමනුෂ්‍යධම්මයෙන්;උතුම් (මිනිසුන්ගේ ගතියෙන්. |
| එව සුව, | කැඳවීම් සැපය. |
| ඔසබමුණ, | පින්වත් බ්‍රාහ්මණය. |
| කටුවූ දෙලෙක්, | දුෂ්ටවූ ලොභයෙක්. |
| කණෝපැණියන්, | කණමැදිරියන්. |
| කවළියෙන්, | කවාට (කවුළු) යෙන්. |
| කරයෙන්, | දැළිපිහියෙන්. |
| කල් නොනහමා, | කාලය නොතකා. |
| කම්ටහන්, | කම්මස්ථාන. |
| කලතුයට යවූ විරි නැති, | විවාහයටයවාපුරුදුනැත්තේය. |
| කැපහරුබැව්, | කැපකරුභාවය. |
| කැරමිතිතැවූ පරිදෙන්, | කර්මයෙහි පැවති ස්වභාවෙන්. |
| කුදුමහත් සැපත්, | කුඩා මහත් සම්පත්. |
| කොව්ජා කොට | විමසා. |
| ගජඹ, | ගාන්ධව් [නම් ද්‍රව්‍යවිශෙෂයක්] |
| ගනඅඳුරු අග්‍රදශිනයෙහි, | ඝනාන්ධකාරය කෙළවර දැකී (මෙහි. |
| ගළයෙන්, | ග්‍රීවයෙන්, බෙල්ලෙන්. |
| ගලින් හුනුවන්හු, | පර්වතයෙන් වැටුනු අයෙන්. |
| ගැහැව් මගසල්කුලවැසෝ, | ගෘහපති මහාසාලකුලවාසීහු. |

| | |
|---|---|
| ගුගුළෝ, | ඝොෂාකළෝ. |
| ජයශබ්ද හෝගිමින්, | ජයඝොෂා නගමින්. |
| ඬබරුව, | තව්සන් විසින් පරිභොග කරණ (ලද දියගන්නා භාජනයක්. |
| තමන් සේය, | තමාගේ සෙවනැල්ල. |
| තුවටුයෙන් වගුල, | නටුවෙන් වැටුනු. |
| තුරුණු වියෙහි, | තරුණ වයසෙහි. |
| තෙලෙස් ධුහඟ, | තෙළස ධූතාඞ්ග. |
| තෙවළා ධරව, | ත්‍රිප්ටක ධාරීව. |
| දරුණු කැමින්, | කෲර කම්මයෙන්. |
| දඹු පහණින් මා සිපති, | දඬින් ගලින් මා තළති. |
| දෑහැව, | කොපව. |
| දිලුබ් දෑයක්, | දුලීභ වස්තුවක්. |
| දිවසෝද, | දිව්‍යශ්‍රොත්‍රධාතු. |
| දිටිහ විණිඳුවන්නට, | [මිථ්‍යා] දෘෂ්ටිය පහකිරීමට. |
| දුඳුළු තන්හි, | දුර්ගස්ථාන [කාන්තාර] යෙහි. |
| දූසටහන්, | නපුරු සලකුණ. |
| දෙයසබම්, | [දත්] දෙන ස්වභාව. |
| දොරටු ගෙමුල, | එළිපත. |
| නන් තොටුවෝද, | නොයෙක් තීර්ථකයෝද. |
| නළුගණ, | නාටක සමූහයා |
| නළලින් ගුලූ, | නළලින් ගැලූනාවූ. |
| නිගන්මැයි, | නිග්‍රහකරමැයි කියා. |
| නිහසර, | නොපැවැත්ම. |
| නිවාත තැනෙක්හි; | සුළං නැති තැනෙක. |
| නිගහති. | නිග්‍රහ කරයි. |
| නිවුගෙඩියෙක්, | විෂ වෙදෙක්. |
| නිසා නොවෙසෙමි, | ආශ්‍රයකොට වාසය නොකරමි. |
| නුවටජරන්, | නිඝණ්වාචාර්යයන්. |
| නොනට කුලෙන්, | නොනැසි [ජීවත්වන] කුලයෙන් |
| නොදසුන්හ, | නොකැපුහ. |
| නොඅනුමෙව්නිනොයි, | අනුමත නුවූයේදෝහෝයි. |
| නොසෙ කී දැයක්, | හේතු නැතිව කී දෙයක්. |
| නොවිසජියනී, | විසඳිය නොහැකිව. |
| පවිටි දිටිහය, | පාපිෂ්ට ලබ්ධිය. |
| පස්බත, | පස්වරුකාලය. |

| | |
|---|---|
| පණිවා කරන්නාහු, | සත්වඝාතනය කරන්නෝ. |
| පහණක් මත්තේ, | ගලක් මත්තෙහි. |
| පස්වැදෑරුම් වූ මහසත් ගුණයෙන්, | ආනෘශංස්‍ය; සංවිභාග රුචිතා; තිතික්ෂා; ආදී පස්ආකාර මහා සත්ව ගුණයෙන්. |
| පසව කළා, | වැදූවා. |
| පසිඳුනා සඳහා, | ප්‍රච්ඡේදනය කරණුපිණිස. |
| පැහැසපුවෙන් උපෙතය, | ප්‍රභාසම්පත්තීන් යුක්තවිය. |
| පැලෑ, | පසුකොට ගියා. |
| පා සූන්නාක්හු, | සිඳිගිය පා ඇත්තෙක්. |
| පාදපරිචාරිකා, | විවාහකොට ගත් අඹුව. |
| පිළිමුසවා, | ප්‍රතිමුක්තකොට [නැවතමුදා] |
| පිණිවූ, | ප්‍රණීත (අතිශයින් මධුර) වූ. |
| පිළිනා කෙරෙහිද, | ප්‍රාර්ථනා කරන්නෙහිද. |
| පියා යෙමි, | අත්හැර යමි. |
| පිරියෙස්මින්, | සොයමින්. |
| පිරික්සා, | පරීක්ෂා කොට. |
| පිරිගාකරණුලද බැවින්, | පරිග්‍රහ කරණලද හෙයින්. |
| පිරිකෙව් කොට, | [හාත්පසින්] පරික්ෂෙපකොට. |
| පිළිවෙත් ඇරවිය, | ප්‍රතිපත්ති පිණිස ආරාධනා (කෙළේය. |
| පුත්‍රසනා, | පුත්‍රසෙනහය. |
| පුරසසරව වැටෙයි, | පෙරටුකොට පවතී. |
| පුන පුනා, | නැවත නැවතත්. |
| පුහුදුන්, | පෘථක්ජනයන්. |
| පුළුවුත්විරී සේයක් | ප්‍රකටකොට පුරුදු ස්වභාවක්. |
| පොපියුම් ඇතිව, | චපල [ගති] ඇතිව. |
| බර මුසිත්, | බර මිදෙත්. |
| බමුණුමහසල්කුලෝ, | බ්‍රාහමණමහාසාලකුල වාසීහු. |
| බා පලති, | භයින් පලායත්. |
| බුත් පා ඇතිව, | බිඳෙනලද පාත්‍ර ඇතිව. |
| බුහුනනීයන්, | නැගනියන්. |
| බුදි සුවයෙන්, | භොජන සැපයෙන්. |
| බොලටගැලෙන දියසෙයින්, | උඩුපත්ලවසාසිටිනජලයමෙන් |
| බ්‍රම්සරවස්, | බ්‍රහමචරියා වාසය. |
| මහණුවම්, | ශ්‍රමණකම්. |
| මනනුවන් වුළුඹුම්න්, | සිත් නෙත් අලවමින්. |

| | |
|---|---|
| මසිත් රද්දරුයෙම්, | මම්ද රජදරුවෙක්මි. |
| මා නොගත්තේය, | මට අසිනි නැත. |
| මැද වැඹ නිසා, | මධ්‍යයෙහි වූ කනුව සමිපව. |
| මිණිකවද, | මැණික් සන්නාහ. |
| මිසහැසර, | මිථ්‍යාචාරය. |
| මූව නොපොහොසි. | මුඛය නොපොහොසති. |
| මුසිත්වයි, | මූද, හරිත්වයි. |
| මුහුදිත් පිරිහුත්, | සාගරයෙන් වෙන්වූ. |
| මෙහෙණවර, | ගැහැණුපැවිද්දන්ගේ සමාගම. |
| මොහොලිත්බහනුවත්සෙසින්, | මෝලින් තළන්නන්මෙන්. |
| යුගත් ගිනිකඳක් බඳු, | කල්පාන්තයෙහි [නැගි] ගිනි (කඳක් බඳු. |
| රත් දහරු, | රුවන් දිය. |
| රත් මිහිඟයක්, | රත්රන් බෙරයක්. |
| රියසැරි, | රථාචාරී. |
| රිදිකෙළින්, | රිදීමය ගෙසින්. |
| වටලා, | නැවත. |
| වත්සපත්, | ව්‍රතසම්පන්න. |
| වකැටිගෙණ හොවී, | වක්ව [කුදුගැසී] නිදයි. |
| වාදැවෘත්තියෙහි, | වාදනැමති කැරකීමෙහි. |
| විනයවන පුහුල්, | හික්මවනලද ජනයන්. |
| විවණ, | දුර්වණ. |
| විරතව, | වෙන්ව. |
| විනිස්මඬලෙහි, | අධිකරණ මණ්ඩලයෙහි. |
| විකෙව් පසිඳුනා සඳහාය, | සැකහරිනු පිණිස. |
| විතක් විසී නොව, | කාමාදි විතර්කයන්ට යටහත් (නොව. |
| විසිපැනයක් අළමි. | ප්‍රශ්න විස්සක් පමුනුවමි. |
| වෙණඳහම්, | වෙළඳූම්. |
| වොලොගත්තී, | වචාවෙත් ගණී. |
| සනිටුහන්කොට, | නිශ්චයකොට. |
| සව්මහරජ දෙව්ලෙව්හි, | ශක්‍රදිව්‍යලොකයෙහි. |
| සරා සඳු රැසින්, | ශරද් චන්ද්‍රාලොකයෙන්. |
| සවන් නැණහර, | බුඬඥනනැමති අරටුව. |
| සක්විත්නන්දවසඳු, | චක්‍රවර්තිරජුන් කල්හිද. |
| සැමිවටනට, | අධිපතිකොට ගෙණ විසීමට. |
| සිරියක්, | කඩුවක්. |

| | |
|---|---|
| සිදුහත්, | අබ, පශ්චිමභවිකයෙහි බොධි (සත්වයන්වද නම්. |
| සියොතෙක්, | පක්ෂියෙක්. |
| සිවු මීපුරු, | මී, ගිතෙල්; ආදී චතුමධුර. |
| හළුසිස කොට, | දවා. |
| හඬාගන්මි සී, | ලුහුබැඳ අල්වාගණීමැයි. |
| හිදිකටුසිදක්, | ඉදිකටු සිදුරක්. |
| හිතයට සුවයට වැටෙයි, | යහපත පිණිස සැපය පිණිස (පවතී. |
| හිස් සනක්පමණ තැන්, | ඇස්දළුපිපුමාණ තැනෙක්. |
| ලහිරුරැසින් පුබුදුනා, | තරුණ සූර්යාලොකයෙන් (පිපෙන. |
| ලොවිලොවිතුරු, | ලෞකික ලොකොත්තර. |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු